



★

# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමිණ

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ අධි වප් අව දියවක ලත් ශනි දින | කාණ්ඩය 111 | පත්‍රය 248 | පිටු 24 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 03 සෙනසුරාදා



අද පත්‍රය සමඟ

# රටේ අද ඇති ප්‍රශ්න අනාගත පරපුරට දෙන්න සූදානම් නෑ

## අගමැති කියයි

මහින්ද අලුත්ගෙදර

අද වන විට අපේ මාතෘභූමිය යම් ප්‍රශ්නයකට මුහුණ දෙන්නේ නම් ඒ ප්‍රශ්න කිසිවක් අනාගත දරු පරුපුරට භාර දීමට සූදානම් නැති බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසීය. මීට වසර 15කට පමණ පෙර තමා මේ රටේ ජනාධිපතිවරයා වශයෙන් බලයට පත් වන විට ජනතාව අමතා ප්‍රකාශ කළේ අප එදා මුහුණ දුන් ප්‍රශ්න අනාගත පරපුරට භාර නොදෙන රටක් නිර්මාණය කරන බව සිහිපත් කළ ඒ මහතා අද ඒ අනාගතය උදා වී තිබෙන බවද, එදා පරපුර මුහුණ දුන් ප්‍රශ්න අද තමා ඉදිරියේ සිටින දරුවන්ට මුහුණ දෙන්න සිදු වී නොමැති බවද කීවේය. පිට 06

# ට්‍රම්ප්ට - බිරියට කොරෝනා



මහින්ද අලුත්ගෙදර

ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මහතාට සහ ජනාධිපති ආර්යා මෙලනියා ට්‍රම්ප් මහත්මියට කොරෝනා වයිරසය ආසාදනය වී තිබේ. පිට 06

# ඇමැති ජෝන්ස්ටන් සතොස නඩුවෙන් නිදහස්



කුමුදු හෙට්ටිආරච්චි

වෙළෙඳ හා සමුපකාර කටයුතු අමාත්‍යවරයාව සිටියදී වසර පහක කාලයක් ස.තො.ස. ආයතනයේ සේවකයන් 153ක් වෙනත් කටයුතුවලට යොදාගත් බවට චෝදනා කරමින් අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාට එරෙහිව අල්ලස් කොමිසම පවරා ඇති නඩුව තවදුරටත් පවත්වාගෙන යා නොහැකි බව ඊයේ (2) තීන්දු කළ කොළඹ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳිගේ මහතා ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා එම නඩුවෙන් නිදහස් කිරීමට ද නියෝග කළේය. පිට 06

## ඉකුත් මාසයේ රට පුරා කළ වැටලීම්වලින්

# හෙරොයින් කිලෝ 50ක් සමඟ ගංජා කිලෝ 1000ක් අත්අඩංගුවට

## වරෙන්තුකරුවෝ 12,883ක් කොටු වෙති

රක්ෂණ ශ්‍රියන්ත

රට පුරා පොලිස්ථානවලින් පසුගිය මාසයේ පමණක් කළ වැටලීම්වලින් හෙරොයින් කිලෝ 50කට ආසන්න සංඛ්‍යාවක්, ගංජා කිලෝ 1000කට ආසන්න ප්‍රමාණයක්, අයිස් සහ අවි-ආයුධ ඇතුළුව වරෙන්තුකරුවන් 12,883ක් සහ වෙනත් වැරදි සම්බන්ධ සැකකරුවන් 25644ක් අත්අඩංගුවට ගෙන තිබේ. පිට 06

## පාස්කු දා ප්‍රහාරය වන තෙක්

# සහරාන් ත්‍රස්තයකු බව බුද්ධි අංශ දැන සිටියේ නෑ



සුභාෂිණී සේනානායක

මෙරට සියලු බුද්ධි අංශ සහරාන් හෂීම් ත්‍රස්තවාදියකු බව පාස්කු දා ප්‍රහාරය වන තෙක් හඳුනාගෙන නොසිටි බව හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා ඊයේ (2) පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය. පිට 06

# මෛත්‍රීගේ අස්සන CIDය හොරට ගහලා ද?

## විමර්ශනයට හිටපු ජනපති ලේකම් උදය කොමිසමට කැඳවයි

රෝෂන් තුෂාර

යුද හමුදා බුද්ධි නිලධාරීන් රඳවා තබා ගැනීමේ නියෝග සඳහා හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ අත්සන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් හොරට යොදා ඇති දැයි සොයා බැලීම සඳහා හිටපු ජනපති ලේකම් උදය ආර්. සෙනෙවිරත්න මහතා සාක්ෂියට කැඳවන්නැයි දේශපාලන පළි ගැනීම් පිළිබඳ විමර්ශනය කරන ජනාධිපති කොමිසම ඊයේ (2) නියෝග කළේය. පිට 06

# කොරෝනාවට බිඳ වැටුණු රාජ්‍ය ආදායම යළි යථා තත්ත්වයට

ජයසිරි මුණසිංහ

මෙරට මාසයක රාජ්‍ය ආදායම් ලැබීම් රුපියල් බිලියන 150ක් වූවද මේ වසරේ අප්‍රේල් මාසයේ එය රුපියල් බිලියන 70 දක්වා විශාල ලෙස අඩු වූ බව මුදල් අමාත්‍යාංශ ලේකම් එස්.ආර්. ආටිගල මහතා පැවසීය.

මෙලෙස මුල් මාස කීපයේ රජයේ ආදායම් අඩු වූවද මේ වන විට නැවත වැඩිවීමට පටන්ගෙන ඇතැයි පැහැදිලි කළ මුදල් ලේකම්වරයා ඉකුත් අගෝස්තු මාසයේ රුපියල් බිලියන 144ක රාජ්‍ය ආදායමක් වාර්තා කර ඇතැයි ද කීවේය. පිට 06

# විස්සට එරෙහි හා අතරමැදි පෙත්සම්වලට කරුණු කීම අවසන් පිට 06

# ඩයගම සිට හැටන් ගිය බස් රථය අඩි 35ක ප්‍රපාතයේ

## පාසල් ළමයින් 30ක් ඇතුළු 51ක් තුවාල ලබා රෝහලේ



අසේල කුරුළුවංශ
හැටන් මධ්‍යම සමූහ

ඩයගම සිට හැටන් දක්වා ධාවනය වූ පෞද්ගලික බස් රථයක් පොඩයිස් වත්ත ප්‍රදේශයේදී මාර්ගයෙන් ඉවතට පැන අඩි 35ක් පමණ බෑවුමකට පෙරළී යෑමෙන් එහි ගමන් ගත් පාසල් ළමයින් 30 දෙනකු ඇතුළු 51ක් තුවාල ලබා දික්ඔය මූලික රෝහලට ඇතුළත් කෙරිණි. පිට 06

# ජගත් අමද්‍යප දිනය අද

උපාලි කරුණාරත්න

ලෝක අමද්‍යප දිනය අදට (3) යෙදී තිබේ.

ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා අමද්‍යප මහා සභාව ඊයේ (2) කොළඹ ආනන්ද මහා විද්‍යාලය සහ විශාකා විද්‍යාලය කේන්ද්‍රකර ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කළ බව එහි උප ලේකම් ලංකේෂ් හේරත් මහතා පැවසීය. පිට 06

# විස්සේ බොහොමයකට එකඟ වන්න බැහැ



උතුරු පළාත් විශේෂ රසුල
දිල්හාර ගමගේ

විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් ඇතැම් කරුණු ඉතා වටිනා කරුණු වූවත් ඉන් බොහොමයකට තම පක්ෂයට එකඟ විය නොහැකි බව සමස්ත ලංකා මහජන කොංග්‍රස් පක්ෂයේ නායක මන්ත්‍රී රිෂාර්ඩ් බදියුදීන් මහතා පැවසීය. පිට 06

# අර්ජුන උසාවියෙන් සමාව ගනී

සිරන්ජනි කුමාරි

බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ ඇති වූ කලහාකාරි සිද්ධියක් සම්බන්ධ නඩුවකට අධිකරණයේ පෙනී නොසිටීම හේතුවෙන් පෙරවරුවේ වරෙන්තු නිකුත් වූ හිටපු අමාත්‍ය අර්ජුන රණතුංග මහතා කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් එම්. මිහාල් මහතා හමුවේ පෙනී සිටිමින් ඊයේ (2) අධිකරණයෙන් සමාව ගත්තේය. පිට 06

# විස්ස බුදු දහමට තර්ජනයක්



ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ

යෝජිත විසි වැනි සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බුදුදහමට දී ඇති ප්‍රමුඛතාවට තර්ජනයක් බව එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා පැවසීය. ජනතා පරමාධිපත්‍ය බලයත් බුදු දහමත් ආරක්ෂා කිරීම වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂය අඛණ්ඩව සටන් කරන බවත් ඒ මහතා කීවේය. පිට 06

# කටාන ව්‍යාපාරිකයාගේ නිවෙස කොල්ල කෑ 4ක් දැලේ පිට 06

## කුඩු ජාවාරමුන් 2කගේ කෝටි 49ක ගිණුම අහෝසි නොකළ

# බැංකුවක ප්‍රධාන විධායකට රටින් පිටවීම තහනම්

## දිගින් දිගටම නියෝග කඩමින් අධිකරණයටත් අපහස කරලා

සමීර අබේසිංහ නුගේගොඩ සමූහ

දැනට විදෙස් ගතව සැඟව සිටින පාතාල කල්ලි නායකයන් දෙදෙනකු වන රත්මලානේ කුඩු අංජු සහ මොරටුමුල්ලේ ඇල්ටෝ ධර්මේ මෙහෙය වූ කුඩු ජාවාරමේ කෝටි 49ක ගිණුම, අහෝසි නොකර පවත්වාගෙන ගිය පෞද්ගලික බැංකුවක ප්‍රධාන විධායක නිලධාරියාට විදෙස් ගතවීම තහනම් කරමින් ගල්කිස්ස මහේස්ත්‍රාත් උදේශ් රණතුංග මහතා ඊයේ (2) නියෝගයක් නිකුත් කළේය. පිට 06




# විස්ස එපා සජබ 8 දා හයිඩ් පිටියේ විරෝධතාවක

මැදකොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ

විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ඉල්ලා අස් කර ගන්නැයි ආණ්ඩුවට බල කරමින් මේ 8 දින පස්වරු 2.30ට කොළඹ හයිඩ් පිටියේදී රැලියක් පැවැත්වීමට සමගි ජන බලවේගය තීරණය කර ඇත. පිට 06

# රංජන් - ශානි දේශපාලන පළි ගැනීම් කොමිසමට කැඳවයි පිට 06

# ‘ගම සමඟ පිළිසඳර’ වැඩසටහන් මාලාවේ දෙවැන්න විල්ගමුවේදී





ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහභාගි වන “ගම සමග පිළිසඳර” වැඩසටහන් මාලාවේ දෙවැන්න මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හිඹිලියාකඩ ග්‍රාම නිලධාරී වසමේ නාග–වනාරාම විහාරස්ථාන භූමියේ දී ඊයේ (02) පෙරවරුවේ පැවති අතර ඒ අවස්ථාවට සහභාගි වූ ජනාධිපතිවරයා ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කළ අයුරු.

# වනාතවිල්ලුවේ නව ශාක 10,000කට වැඩි ප්‍රමාණයක් රෝපණය ඇරඹුවා

## ඇමැති මහින්ද අමරවීර

**අමෝදා ජයමහ**

වනාතවිල්ලුවේ වන විනාශය හේතුවෙන් විනාශ වූ තුරුලතා වෙනුවට නව ශාක 10,000කට වැඩි ප්‍රමාණයක් රෝපණය කිරීම ආරම්භ කළ බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පැවැසුවේය.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ වනාතවිල්ලුව සහ ආනවිලුන්දැව පරිසර හානිය පිළිබඳ නිරීක්ෂණයට ගිය අවස්ථාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'ආනවිලුන්දාවේ අක්කර 3000කට වඩා කඩොලාන සිටුවීමට මේ වන විට තීරණය කර තිබෙනවා. පරිසර සංවිධාන රැසකගේ එකතුවෙන් මේ වන විට ශාක රෝපණ වැඩසටහන ආරම්භ කර තිබෙනවා. වනාතවිල්ලුවේ පරිසර හානිය සිදු කර තිබෙන සිමෙන්ති ආයතනයට දැඩි ලෙස අවවාද කළා.

සමාජ මාධ්‍යයේ පරිසර හානි කිරීම් පිළිබඳව දක්වන කරුණු සියල්ල සත්‍ය නෑ. ඇතැම් කුඩා සිද්ධි අතිශයෝක්තියෙන් මාධ්‍ය හරහා ප්‍රචාරය කරනවා. ඇතැම් පුද්ගලයන්ට තවමත් පරිසරය සුරැකීම පිළිබඳව අවබෝධයක් නෑ. ගහකොළ, සතා සිවුපාවන් ආරක්ෂා කර ගත යුතුය යන හැඟීමක් ඔවුන් තුළ නැතිවීම කනගාටුව කරුණක්. පරිසර විනාශ කරන්නන්ට තරාතිරම නොබලා නීතිය ක්‍රියාත්මක කරනවා.'



# ළමා පරපුර ඉලක්ක කරගෙන ආහාර සුරක්ෂිතතා වැඩසටහනක්

**සන්ධ්‍යා කරුණාරත්න**

මෙරට ළමා පරපුර ඉලක්ක කර ගනිමින් ආහාර සුරක්ෂිතතා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය තීරණය කරයි.

කොවිඩ් -19 රෝගය සාර්ථකව මර්දනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වැඩසටහන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බව එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ නියෝජිත සන් ෂුබින් (Mr. Sun, Xuebing) මහතා පැවැසුවේය.

කොරෝනා මර්දනය සාර්ථකව සිදු කිරීම නිසා රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් සියලු අන්තර් ජාතික සංවිධානවල සහාය ඉදිරියේදී ලබා දෙන බවට අන්තර් ජාතික සංවිධාන කිහිපයක් සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය වෙත දැනුම්දී තිබේ.

ශ්‍රී ලංකාවේ ඉදිරි සෞඛ්‍ය සංවර්ධන වැඩපිළිවෙළ පිළිබඳව සෞඛ්‍ය ඇමැතිවරිය සමඟ මෙරට සිටින අන්තර් ජාතික සංවිධාන නියෝජිතයන් පිරිසක් සෞඛ්‍ය අමාත්‍යාංශයේදී පැවැත්වූ විශේෂ සාකච්ඡාවකදී මේ කරුණු ඊයේ (02) ප්‍රකාශ කර තිබේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නේවාසික නියෝජිත වෛද්‍ය රාසියා පෙන්ඩ්සේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක හානා සින්ගර් (Ms. Hana Singer), එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ අන්තර් ජාතික තාක්ෂණික විශේෂඥ ජේරෝ ඇන්ඩ්‍රුස් විලාමිල් (Mr. Jairo Andres Villamil-Diaz), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපත්ති විශේෂඥ සහ කණ්ඩායම් නායක ෆදිල් බාකීර් මාකර් (Mr. Fadhil Bakeer Markar) මහත්ම මහත්මීහු මේ සාකච්ඡාවට සම්බන්ධ වූහ.

මහජන සෞඛ්‍ය සේවා පුළුල් කිරීමට අවශ්‍ය මූලාධාර ලබාදීමට ද ඔවුහු මෙහිදී එකඟතාව පළ කළහ. මෙරට රෝහල්වල යටිතල පහසුකම් සහ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට වැඩපිළිවෙළක් සකස් කර ඇති බව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ෆදිල් බාකීර් මාකර් (Mr. Fadhil Bakeer Markar) මහතා කියා සිටියේය.

සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ මහතා ද මේ අවස්ථාවට සහභාගි විය.



අන්තර්ජාතික සංවිධානවල නිලධාරීන් සමග සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කරන අයුරු.

# වකුගඩු රෝගීන්ගෙන් 70%ක් අධික රුධිර පීඩනයෙන් දියවැඩියාවෙන් පෙළෙන අයයි

## වකුගඩු බද්ධ කිරීමේ විශේෂඥ වෛද්‍ය එච්. පී. හරිස්චන්ද්‍ර

**ඉන්ද්‍රාණී තෝරදෙණිය**

වකුගඩු රෝගීන්ගෙන් 70%ක් අධික රුධිර පීඩනය සහ දියවැඩියාවෙන් පෙළෙන අය බව සංඛ්‍යා ලේඛනවලින් තහවුරු වන බව ද, පසුගිය වසර කිහිපයේ වකුගඩු රෝගීන්ගේ ප්‍රමාණය වැඩිවී ඇති බව ද වකුගඩු බද්ධ කිරීමේ විශේෂඥ වෛද්‍ය එච්. පී. හරිස්චන්ද්‍ර මහතා පවසයි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'ආහාර, ව්‍යායාම නොමැතිකම, දියවැඩියාව සහ අධික රුධිර පීඩනය නිසි ලෙස පාලනය නොකිරීම වකුගඩු අක්‍රියවීමට බොහෝ සෙයින් බලපානවා. කාලීන වකුගඩු රෝගය අවස්ථා පහක් යටතේ පරීක්ෂණවලට භාජනය කෙරෙනවා. මෙහි හතර වන හෝ පස් වන අවස්ථාවට පැමිණි පසු ජීවත්වීමට නොහැකි තත්ත්වයට පත් වෙනවා. එම අවස්ථාවලදී රුධිර කාන්දු කරණය හෝ වකුගඩු බද්ධ කිරීම හෝ සිදු කළ යුතුයි.

පවතින සංඛ්‍යා ලේඛන අනුව දැනට අපේ රටේ ජනගහනයෙන් 10%කට දියවැඩියාව පවතිනවා. තව වසර දහයකට පසු මෙය 20% වන බව පෙන්වා දී තිබෙනවා. ජනතාව දැඩි ලෙස සෞඛ්‍ය පිළිබඳ අවධානය යොමු කළ යුතුයි.'

# 20ට ඡන්දය නොදෙන බවට පළ වන වාර්තා අසත්‍යයි

## රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක



**උපාලි කරුණාරත්න**

විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තමා ඡන්දය නොදෙන බවට විවිධ මාධ්‍යයන්ගේ පළ වන වාර්තාවල කිසිදු සත්‍යතාවක් නොමැති බව ජාතික උරුම, ප්‍රසංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතා පැවැසීය.

ඇමැතිවරයා එසේ ප්‍රකාශ කළේ 'දිනමිණ' කළ විමසීමකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආරම්භක අවස්ථාවේ තිබෙනවා. මේ පිළිබඳව තවම හරි අධ්‍යයනයක් කර නෑ. විවිධ පුද්ගලයන් විසි වන සංශෝධනය සම්බන්ධයෙන් විවිධ දේ ප්‍රකාශ කරනවා.'

# පියයුරු පිළිකාව නිසා දිනකට මෙරට මරණ දෙකක් සිදු නෙවා

## ජාතික පිළිකා මර්දන ඒකකයේ අධ්‍යක්ෂිකා විශේෂඥ වෛද්‍ය ජානකී විදානපතිරණ

**සන්ධ්‍යා කරුණාරත්න**

පියයුරු පිළිකාව හේතුවෙන් දිනකට මෙරට මරණ දෙකක් සිදු වන බවත්, වාර්ෂිකව මරණ 700කට වැඩි ප්‍රමාණයක් සිදු වන බවත් ජාතික පිළිකා මර්දන ඒකකයේ අධ්‍යක්ෂිකා විශේෂඥ වෛද්‍ය ජානකී විදානපතිරණ මහත්මිය පැවැසුවාය.

ඒ මහත්මිය මේ බව පැවැසුවේ පියයුරු පිළිකා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ මාසය (ඔක්තෝබර් මාසය) නිමිත්තෙන් ඊයේ (02) සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේදී පැවති මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ මාධ්‍ය හමුවකට සහභාගී වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහත්මිය මෙසෙ ද කීවාය.

'මේ රෝගයට ගොදුරු වන කාන්තාවන් වාර්ෂිකව අලුතින් 3500ක් හඳුනා ගන්නවා. පියයුරු පිළිකාව ආරම්භයේදීම හඳුනාගැනීමෙන් ප්‍රතිකාර සිදු කර මුළුමනින්ම සුවපත් කළ හැකියි. පිරිමි පුද්ගලයන්ට සාපේක්ෂව කාන්තාවන්ට පියයුරු පිළිකා සෑදීමේ හැකියාව සිය ගුණයකින් ඉහළ අගයක් ගන්නවා. වයස අවුරුදු 20 සිට කාන්තාවක් මේ රෝගයට ගොදුරුවීමේ ප්‍රවණතාවක් පවතිනවා. ස්වයං පියයුරු පරීක්ෂාවක් සිදු කරගැනීමෙන් මූලික අවස්ථාවේදීම රෝගය හඳුනාගෙන ප්‍රතිකාර ලබා ගත හැකියි.

කාන්තාවක් වීම, පියයුරු පිළිකාව පිළිබඳ පවුලේ ඉතිහාසය, පියයුරු තිබෙන ප්‍රදේශයට1 විකිරණ ප්‍රතිකාර ලබාදීම, වයස අවුරුදු 12ට අඩු කාලයේදී වැඩිවියට පත්වීම, වයස අවුරුදු 55 පසුව ආර්තවහරණය සිදු නොවීම ආදී කාරණා පියයුරු පිළිකා හට ගැනීමට හේතු වෙනවා. දරුවකුට දිගු කලක් මව්කිරිදීමෙන් සහ ව්‍යායාම සිදු කිරීමෙන් මේ පිළිකා අවදානම අඩු වෙනවා. රට පුරා ග්‍රාමීය මට්ටමෙන් පිහිටා ඇති සුවනාරි සහ සුවදිවි සායනවලින් පිළිකා සේවාවන් නොමිලේ ලබා ගත හැකියි.'

ජාතික පිළිකා මර්දන වැඩසටහනේ ප්‍රජා විශේෂඥ වෛද්‍ය නයනා ද අල්විස්, ශ්‍රී ලංකා පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ වෛද්‍ය ජාලිය ජයසේකර, ඉන්දිරා පිළිකා භාරයේ සභාපතිනී වෛද්‍ය ලංකා ජයසූරිය, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සභාපති සමාධි රාජපක්ෂ මහත්ම මහත්මීහු මේ අවස්ථාවට සහභාගි වූහ.

# මුදල් සංශෝධන කෙටුම්පත දෙවන වර කියවීම ආනයන, අපනයන රෙගුලාසි පිළිබඳ විවාදය 6 දා

**ස්වර්ණා විජේකෝන්**

මුදල් සංශෝධන කෙටුම්පත දෙවන වර කියවීම සහ ආනයන සහ අපනයන (පාලන) පනතට ඉදිරිපත් කර ඇති රෙගුලාසි පිළිබඳව විවාදය මේ මස 06 වැනිදා පැවැත්වීමට පක්ෂ නායක රැස්වීමේදී තීරණය කර ඇත.

ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කරන සභාව කල් තැබීමේ යෝජනාවක් ද 06 වැනිදා පැවැත්වෙන අතර එම විවාදය පස්වරු 4.30 සිට පස්වරු 5.30 දක්වා පැවැත්වේ.

ජාතිය ගොඩනැඟීමේ බදු සංශෝධන පනත් කෙටුම්පත දෙවන වර කියවීම, ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනත් කෙටුම්පතේ දෙවන වර කියවීම, වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන සංශෝධන පනත් කෙටුම්පතේ දෙවන වර කියවීම, මේ මස 07 වැනිදා විවාදයට ගැනීමට නියමිත වේ. එමෙන්ම විසර්ජන පනත යටතේ වන යෝජනා 05ක් ද විවාදයට ගැනෙනු ඇත. එදින පස්වරු 4.30 සිට 5.30 දක්වා ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කරන සභාව කල් තැබීමේ විවාදය පැවැත්වීමට නියමිතවේ.

මේ මස 08 වැනිදා, සභාව කල් තැබීමේ යෝජනාවක් ලෙස විදේශ ගිවිසුම් පිළිබඳ විවාදය පැවැත්වෙනු ඇත. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතා කළ යෝජනාවකට අනුව සියලු විදේශ ගිවිසුම් පිළිබඳව සභාව කල් තැබීමේ විවාදයක් පැවැත්වීමට ආණ්ඩු පක්ෂය එකඟතා පළ කර ඇත. ඒ අනුව එම විවාදය පෙරවරු 11 සිට පස්වරු 4.30 දක්වා පැවැත්වෙනු ඇත.

මේ මස 09 වැනිදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තිදෙනකු පිළිබඳ ශෝක ප්‍රකාශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙනු ඇත. අභාවප්‍රාප්ත සුරංගනී එල්ලාවල, ආර්. ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ, කේ. පී. සිල්වා මන්ත්‍රීවරුන් පිළිබඳව ශෝකය පළ වනු ඇත.

මේ මස 06 වැනිදා සිට 09 වැනිදා දක්වා පාර්ලිමේන්තුව පැවැත්වීමට කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය කෙරිණි.

සභානායක දිනේෂ් ගුණවර්ධන, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ජොන්ස්ටන් ප්‍රනාන්දු, ඇමැතිවරුන් වන චමල් රාජපක්ෂ, ඩග්ලස් දේවානන්දා, විමල් වීරවංශ, ඩලස් අලහප්පෙරුම, මහින්ද අමරවීර, ප්‍රසන්න රණතුංග මහත්වරු ද, මන්ත්‍රීවරුන් වන මහින්ද සමරසිංහ, ලක්ෂ්මන් කිරිඇල්ල, ගයන්ත කරුණාතිලක, අනුර කුමාර දිසානායක, ඩිලාන් පෙරේරා, මනෝ ගනේෂන් සහ එම්. ඒ. සුමන්තිරන් මන්ත්‍රීවරු ද මේ රැස්වීමට එක්ව සිටියහ.

# නීති විරෝධී කටයුතු පිළිබඳ තොරතුරු 1997ට දැනුම් දෙන්න



## පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජනතාවගෙන් ඉල්ලයි

**චන්ද්‍රිකා පෙරේරා**

නීති විරෝධී ගිනි අවි, පුපුරන ද්‍රව්‍ය, මත්ද්‍රව්‍ය, මත්පැන්, වනය ඇතුළු ස්වාභාවික සම්පත් විනාශ කිරීම්, නිදන් හෑරීම ආදී නීති විරෝධී කටයුතු සහ ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු දුරකතන අංක 1997 මඟින් දැනුම්දීමට කටයුතු කරන ලෙස පොලිස් මාධ්‍ය ප්‍රකාශක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජාලිය සේනාරත්න මහජනතාවගෙන් ඉල්ලා සිටී.

ඒ මහතා මේ බව පැවැසුවේ පොලිස් මූලස්ථානයේ ඊයේ (02) පැවති මාධ්‍ය හමුවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'සෘජුව පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක 1997 අංකය සහිත මෙහෙයුම් මධ්‍යස්ථානය තොරතුරු ලබා දෙන සියලු ජනතාවගේ රහස්‍යභාවය සුරකිනවා. එසේ තොරතුරු ලබා දෙන අයට මුදල් ත්‍යාග ප්‍රදානයට කටයුතු කරනවා.

මෙසේ පොලිසියට ලැබුණු මහජන තොරතුරු අනුව ඉකුත් ජූනි මස 06 වැනිදා සිට මේ දක්වා කාලයේදී කළ වැටලීම්වලින් නීති විරෝධී මත්පැන් ලීටර් 131,733ක් සමඟ සැකකරුවන් 10,842ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. එහිදී වරෙන්තුකරුවන් 12,883ක් ද, වෙනත් විවිධ අපරාධ සම්බන්ධයෙන් සැකකරුවන් 24,646ක් ද අත්අඩංගුවට ගෙන තිබෙනවා. එම කාලයේ අත්අඩංගුවට ගත් හෙරොයින් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 132ක්. ගංජා කිලෝ ග්‍රෑම් 1838ක් ද, අයිස් මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 3ක් ද, නීති විරෝධී ගිනි අවි 712ක් සමඟ සැකකරුවන් 642ක් ද, ජීව පතොරොම් 3,777ක් ද අත්අඩංගුවට ගෙන තිබෙනවා.

උතුරු පළාතේ කලහකාරී ලෙස හැසිරුණු කල්ලිවලට අයත් කඩු නවයක් සහ පිහි දෙකක් විශේෂ කාර්ය බළකාය අත්අඩංගුවට ගෙන තිබෙනවා. යාපනයේ කල්ලි දෙකක් මෙසේ ක්‍රියාත්මක වූ බවට හෙළි වුණා. කිලිනොච්චියේ ද එක කල්ලියක් පිළිබඳ කරුණු අනාවරණය වුණා.

දැනට බස්නාහිර පළාතේ ක්‍රියාත්මක මංතීරු නීතිය ඉදිරියේදී පිට පළාත්වලත් ක්‍රියාවට නැංවීමට කටයුතු කරනවා. වැසි ජලයෙන් යටවීම, මාර්ග සංඥා අවිධිමත් වීම වැනි ගැටලු සහගත තත්ත්වයකදී මංතීරු නීතිය ක්‍රියාත්මක වන්නේ නෑ. එවැනි තත්ත්වයන් අවම කරගැනීමට මොරටුව විශ්වවිද්‍යාලය සහ මාර්ග සංවර්ධන අධිකාරය සමඟ සාකච්ඡා කර කටයුතු කිරීමට ඉදිරියේදී පියවර ගන්නවා.





# ගිංතොට තුනී ලෑලි සේවකයන්ට පෙබරවාරියේ සිට පඩි ගෙවා නෑ

## පැමිණිල්ල නිසි ලෙස විභාග කරන්නේ නැතැයි ගාල්ල මූලස්ථාන පොලීසියට විරෝධය

**කරාපිටිය සමූහ - එස්. ලොකුකරවිට සහ දකුණු පළාත් සංචාරක**

තමන් විසින් පොලීසියට ඉදිරිපත් කරන ලද පැමිණිල්ල නිසි පරිදි විභාග කරන ලෙස ඉල්ලා ගිංතොට තුනී ලෑලි සංස්ථාවේ සේවය කළ සේවක සේවිකාවෝ පිරිසක් ඊයේ (02) උදෑසන ගාල්ල මූලස්ථාන පොලිසිය ඉදිරිපිට උද්වේගකාරී ලෙස හැසිරුණහ.

දැනට මාස 07ක පමණ සිට ගිංතොට තුනීලෑලි සංස්ථාව වසා දමා ඇති අතර සේවකයන් පවසන්නේ පෙබරවාරි මාසයේ සිට තමන්ට වැටුප් නොගෙවූ බවයි. තමන්ට සාධාරණයක් ඉල්ලා පොලිසියට කරන ලද පැමිණිල්ල විභාග කිරීම සඳහා තුනීලෑලි සංස්ථාවේ හිමිකරුවන් ගෙන්විය යුතු වුවත් ඔවුන් ගෙන්වා නොමැති බවත් සේවකයෝ පවසති. තුනීලෑලි සංස්ථාව නියෝජනය කරන බව පවසමින් කාන්තාවක් පැමිණ සිටි බවත් වගකීමක් නැති එවැනි පුද්ගලයන් ගෙන්වා පැමිණිල්ල විභාග කිරීමෙන් තමන්ට අසාධාරණයක් සිදුවන බවත් ඔවුහු වැඩිදුරටත් පැවසූහ.

තුනීලෑලි සංස්ථා සේවකයන් විශාල පිරිසක් ගාල්ල පොලිසියේ ගේට්ටුව අසල රැඳී සිටි අතර ඔවුන්ගේ නියෝජිතයන් කිහිපදෙනකුට පමණක් පොලිසියට ඇතුළු වීමට ඉඩ දී ගේට්ටු වසා දමා තිබිණි.

# මහර බන්ධනාගාරයේ රැඳවූවන්ට පෝදා සදහම් දෙසුමක්



**රාගම සමූහ**

ශාසන ඉතිහාසයේ අසිරිමත් සිදුවීම් රාශියක් සිදුව ඇති වප් පුන් පෝදා ඓතිහාසික කැලණි රාජමහා විහාරය හා එගොඩ කැලණියේ පිහිටි කිත්සිරි මෙවන් විහාරය යන උභය විහාරාධිපති කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අංශයේ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමියන් විසින් පෙරවරුවේ මහර බන්ධනාගාරයේ රැඳවූවන් වෙත දම් දෙසූහ.

මහර බන්ධනාගාරයේ රැඳවූවන් වෙනුවෙන් ඉදි කර ඇති දර්ශනීය බෝ සමිඳුන් අබියසදී සුපුරුදු පරිදි රැඳවූවන් 400කට අධික පිරිසක් වප් පුන් පෝය නිමිති කර ගනිමින් පෙහෙවස් සමාදන්ව සිටි අතර නායක හිමියෝ ඔවුන් අමතා සමාජයට වැඩ දායක පුද්ගලයෙකු වීමට ඇවසි මග බුදුදහම ඇසුරෙන් පහදා දෙමින් විචිත්‍රවත් ධර්ම දේශනයක් සිදු කළේය.

මහර බන්ධනාගාර අධිකාරි ජගත් චන්දන වීරසිංහ මහතාගේ උපදෙස් මත ප්‍රධාන ජේලර් සුභාෂ් උපුල්දෙණිය මහතා සහ පුනරුත්ථාපන අංශයේ නිලධාරින් විසින් මෙම පින්කම සංවිධානය කර තිබිණි

# බූරු පොළ වටලන්න ගිය පොලිස් නිලධාරිනියකට පහර දීලා

**පරාක්‍රම ගුණසේකර සූරියවැව සමූහ**

සෙවණගල පොලිසියේ නිලධාරින් විසින් ප්‍රදේශයේ නිවෙසක නීති විරෝධි අන්දමින් පවත්වාගෙන ගිය බූරු පොළක් වැටලිමේදි එම නිවැසි කාන්තාව ගේ පහරදිමට ලක්වූ පොලිස් සැරයන්වරියක තුවාල ලබා සෙවණගල රෝහලට ඇතුළු කර ඇත.

පෙරේදා (01) සවස සමනලගම නිවෙසක බූරු පොළක් වැටලිමට ගොස් එහි කාන්තාවක් අත් අඩංගුවට ගැනිමට යෑමේදි එම කාන්තාවගේ පහරදිමට ලක් වූ සෙවණගල පොලිසියට අනුයුක්තව සේවය කරන පොලිස් සැරයන් සමන්මලි මහත්මිය මෙසේ රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටීමේ පිළිබදව එම නිවසේ හිමිකරු සහ බිරිය යන දෙදෙනාම සෙවණගල පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත. සෙවණගල පොලිස් ස්ථානාධිපති පොලිස් පරික්ෂක සුභාෂණ වන්නිආරච්චි මහතා මෙම සිද්ධිය පිළිබදව වැඩිදුර පරික්ෂණ පවත්වයි. අත් අඩංගුවට ගන්නා ලද සැකකරුවන් ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරිමට නියමිතව තිබිණි.

## තනි අලියෙක් මාන්තොට්ටම බිය වද්දයි:

# අයියාව හොඬවැලෙන් අල්ලා විසි කළ අලියා බියකරු හඬින් කෑගැසුවා



### තුවාලකරුගේ සොහොයුරිය සිද්ධිය කියයි

**දමන විශේෂ නවරත්න සමරතුංග**

අම්පාර දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාන්තොට්ටම අවට ගොවි ගම්මාන කීපයක පෙරේදා (01) රාත්‍රි සැරි සැරූ වල් අලියකුගේ පහර කෑමට ලක් වූ මහානාගපුර 18 ජනපදයේ පුද්ගලයකු රෝහල්ගත කර ඇත.

ජී.ජී. උපාලි නමැති අංක 95/1 ලිපිනයේ පදිංචි මොහු අලියා පහරදීමෙන් බරපතළ තුවාල ලබා තිබේ.

තුවාලකරුගේ නිවස අසලම පදිංචි ඔහුගේ සොහොයුරිය වන ග්‍රාම නිලධාරිනී ජී.ජී. චන්ද්‍රිකා මහත්මිය සිද්ධිය විස්තර කරමින් මෙසේ පැවැසුවාය:

අලියා ගේ ඉස්සරහ කෙසෙල් ගහක් ගලවාගෙන කන්න හැදුවා.



ඒත් එක්කම ඌ අයියාව දැකලා ගේ වටේම පැන්නුවා. දුවගෙන යනකොට අලියා හොඬ වැලෙන් අල්ලා ඈතට විසි කළා.

ඒ වෙලාවේ රාත්‍රි 11-30-ත් 12-00ත් අතර. මාන්තොට්ටම සිට අලි වැට භාරව කටයුතු කරන ග්‍රාමාරක්ෂක වරුන් මේ අලියා පස්සෙන්ම ආවා.

අලියා අයියාට පහර දීමෙන් පසුව එතනට වෙලා බියකරු හඬකින් කෑගැසුවා. අයියාත් කෑගැසුවා. එතනට ආපු පිරිසක් අලියා එළවන්න කෑගැසුවා. බය නිසා මම ඈතට වෙලා හිටියා. එවිට අලියා යන්න ගියා.

සිවිල් ආරක්ෂක කණ්ඩායම සමඟ අසල් වාසීන් අයියා ත්‍රිරෝද රියක දාගෙන තොට්ටම රෝලට අරන් ගියා.

රෝගියා පරීක්ෂා කර බලා එහි සිට වෛද්‍ය නිලධාරීනිය ගිලන් රථයෙන් එයාව අම්පාර රෝහලට ගෙනැවිත් ඇතුළත් කළා. රාත්‍රිය පවා නොතකා ඇයත් ගිලන් රථයෙන්ම රෝහලට පැමිණියා.

වනජීවියෙනුත් ආවා රාජ්‍ය නිලධාරීන් කවුරුත් කැප වීමෙන් කටයුතු කළා.

හේරත්ගම ගොවි සංවිධානයේ සභාපති අයි.ජී.රාජපක්ෂ. මහතා ;

අවුරුදු ගානක් අපි අලි ප්‍රශ්නය නිසා දුක් විඳිනවා. බලධාරීන් මේ ගැන දැනුම්වත් වෙලා ඉන්නවා. වනජීවි ඇමතිතුමාත් මේ ප්‍රදේශයේම පදිංචි කෙනෙක්.

මේ අලි ප්‍රශ්නය නිසා දැන් වෙල් යායේ වගා කරන්න බැරි තත්වයක් තියෙන්නේ. වෙල් යාය ළඟ තියෙන කැලෑ රොදක තමයි අලියා දවල්ට රිංගාගෙන ඉන්නේ.

ඊයේ කුඹුරු වැඩට ගිය මිනිස්සු පස්සේ මේ අලියා පන්නාගෙන ආවා. ඒ මිනිනස්සු වැඩ නොකර ආපසු ආවා.

මෙය දිගින් දිගටම බලපාන ප්‍රශ්නයක්. දැන් මුළු ගමම බයෙන් තමයි ඉන්නේ. නිලධාරීන්ගේත් බල ධාරීන්ගේත් ඇස් යොමු වෙලා නෑ!

ඇමතිතුමාත් අපි ළඟම ඉන්නවා. ක්‍රියා මර්ගයක් ගනීවි කියලා මම හිතනවා.

## ශ්‍රීකාන්තගේ ශ්‍රී රූපත



• දැන් ටයර් හිඟයකුත් තියෙනව කියල සජිත් කියන්නෙ බං !

• එයාගෙ තාත්තගෙ කාලෙත් හිඟ වුණා, හැබැයි ඡර් පරණ ටයර් !

# මෙරට හැදූ ගිනි අවි සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

මෙරට නිෂ්පාදිත ගිනි අවි 03ක් සමග සැකකරුවන් දෙදෙනෙකු ගිරිඋල්ල පොලිස් වසමේ බෝගහයාය ප්‍රදේශයේදී පෙරේදා (01) ගිරිඋල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් පිරිසක් විසින් සිදුකළ මෙහෙයුමකදී අත්අඩංගුවට ගෙන තිබේ.අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 50 සහ 53 වයස්වල පසුවන ගිරිඋල්ල හා නාරංගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් බව පොලිසිය පවසයි.

සැකකරුවන් ඊයේ (02) කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

ගිරිඋල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

# ගිනි අවියක් ළඟ තබා ගත් 70 හැවිරිදි විශ්‍රාමිකයා අධිකරණය හමුවට

**කොටදෙණියාව සමූහ - එම් පී කුමාර**

රිපීටර් වර්ගයේ ගිනි අවියක් පතරොම් හතක් හා හිස් කොපු තුනක් සමග 70 හැවිරිදි විශ්‍රාමිකයකු ඊයේ අත්අඩංගුවට ගත් බව මීරිගම පොලිසිය කියයි.

දංඕවිට තාරාදෙණිය ප්‍රදේශයේ සිදුකළ වැටලීමකදී මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ ජාතික ඉංජිනේරු පර්යේෂණ මධ්‍යස්ථානයේ සේවය කර විශ්‍රාම ලැබූ දෙදරු පියෙකි. මීරිගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක ප්‍රියන්ත මහතාට ලැබුණු තොරතුරක් අනුව සැකකරුගේ නිවෙස පරික්ෂා කිරීමේදී සොල්දරයේ මෙට්ටයක් යට සඟවා තිබූ රිපීටර් ගිනි අවිය සොයා ගැනීමට හැකිවී ඇත.

පැරණි නිවෙසක් වන මෙහි සැකකරු හුදෙකලා ව කල් ගෙවන බව ද ඔහුගේ බිරිය හා දරුවකු වෙනත් නිවෙසක පදිංචි බවද බව ද හෙළි වී ඇත. සැකකරුගේ දියණියක ඇමරිකාවේ පුරවැසිභාවය ලබා ඇතැයි ද පොලිසිය කියයි.

රැකියාවෙන් විශ්‍රාම ගත් ගත් සැකකරු ගේ ඥාතියෙකු බව කියන හමුදා නිලධාරියකු විසින් මෙම රිපීටර් ගිනි අවිය ඔහුට දී ඇති බව පොලිසිය කළ ප්‍රශ්න කිරීමේදී සැකකරු හෙළි කර ඇත. ගිනි අවිය ලබා දුන් බව කියන හමුදා නිලධාරියා ද කලකට පෙර මරණයට පත්වී ඇති බවටද පොලිසියට තොරතුරු ලැබී ඇත .

සැකකරුගේ පියාට බලපත්‍ර සහිත ගිනි අවි දෙකක් තිබූ බව ද එම පුරුද්ද මත තමන් ද ගිනි අවියක් ලබාගෙන නිවෙසේ තබා ගත් බවද සැකකරු පොලිසිය කළ ප්‍රශ්න කිරීමේ දී හෙළි කර තිබේ.

සැකකරු හෙළි කළ තොරතුරු වල සත්‍යතාවය සොයා බැලීමට පොලිසිය පියවර ගෙන ඇති අතර මෙම ගිනි අවිය කිසියම් අපරාධ සඳහා යොදාගෙන ඇත්දැයි අනාවරණය කර ගැනීමට ද පරීක්ෂණ පැවැත්වේ. අත්අඩංගුවට ගැනුණු ගිනි අවිය මෑතකදී ඔයිල් ගල්වා තිබූ බව හෙළි වී ඇත සැකකරු හා නඩු භාණ්ඩ අත්තනගල්ල අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය

# අල්ලස් කොමිසමේ හිටපු අධ්‍යක්ෂ මහේස්ත්‍රාත්වරයාට බලපෑම් කළා

## රක්නා ආරක්ෂක ලංකා සමාගමේ හිටපු සභාපති දේශපාලන පළි ගැනීම් විමර්ශන ජනපති කොමිසම හමුවේ සාක්කි දෙයි

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ හිටපු අධ්‍යක්ෂ දිල්රුක්ෂි ඩයස් මහත්මිය මහේස්ත්‍රාත්වරයාට බලපෑම් කරමින් තමාගේ ඇප නියෝගය වෙනස් කරන ලෙසට ඉල්ලා සිටි බව රක්නා ආරක්ෂක ලංකා සමාගමේ හිටපු සභාපති ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ හිටපු සභාපති මේජර් ජනරාල් පාලිත ප්‍රනාන්දු මහතා දේශපාලන පළි ගැනීම් විමර්ශන ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ඊයේ (02) පැවසීය.

දිල්රුක්ෂි ඩයස් මහත්මිය මහේස්ත්‍රාත් නිල නිවෙසට පැමිණෙන විට මහේස්ත්‍රාත්වරයා විසින් ඇප තීන්දුව ලබා දී තිබූ බවත්, එම ඇප තීන්දුව වෙනස් කර රක්ෂිත බන්ධනාගාරගත කරන්නැයි ඇය ඉල්ලා සිටි බවත් ප්‍රනාන්දු මහතා හෙළි කළේය.

බොරු සාක්ෂි මත නඩු පවරා දේශපාලන පලිගැනීම් සිදු කළ බවට පාලිත ප්‍රනාන්දු මහතා පවරා තිබූ පැමිණිල්ලේ සාක්ෂි දෙමින් ඔහු එසේ පැවැසීය.

ඇවන්ගාඩ් සමාගමේ සභාපති නිශ්ශංක සේනාධිපති මහතා විසින් අල්ලසක් ලබා දුන් බවට සඳහන් කරමින් තමන්ට එරෙහිව පවරා ඇති නඩුව අල්ලස් කොමිසමේ කොමසාරිස්වරුන් තිදෙනාගේ අනුමැතියකින් තොරව පවරා ඇති බවත්, අදාළ මහාධිකරණ නඩුව සිය මූලික විරෝධතාවය මත අභියාචනාධිකරණයෙන් අත්හිටුවා ඇති බවත් හෙතෙම හෙළි කළේය.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ නිලධාරීන් ද්වේශ සහගතව මෙම නඩුව ගොනු කර ඇති බව ප්‍රනාන්දු මහතා සඳහන් කළේය.

# අයිස් ග්‍රෑම් 500ක් කිඹුලාපිටියේදි අල්ලයි

**රක්ෂණ ශ්‍රියන්ත**

අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 500 මිලිග්‍රෑම් 110ක් සමග සැකකරුවෙකු මීගමුව අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් පිරිසක් විසින් කටාන පොලිස් වසමේ කිඹුලාපිටිය ප්‍රදේශයේදී පෙරේදා (01) සිදුකරන ලද වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35ක් වන මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවකු බව පොලිසිය පවසයි.

සැකකරු ඊයේ (02) මීගමුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

## ඇ නෑ ත්ත

ගරු ජනපතිඳු ඇත දහනවයෙ හිර — වෙලා
එනමුදු හිටපු අගමැති හිටියෙ තර — වෙලා
අද එතුමා සිටී සිරිකොතෙහි කොර — වෙලා
විපක්ෂයේ නම් ඇත විස්ස පර — වෙලා

විස්සට විපක්ෂය ඇත්තේ පුදුම — බයක්
නැත ජේ.ආර්. යුගයේ නම් එහෙම — දෙයක්
ලද ජන වරම පොදුවේ මේ රටෙහි — ජයක්
කළු නෑ යකින්නිය ලස්සන සොඳුරු — ලියක්

රටේමුල්ලේ මුදන්නායක

# මහවැලි ගඟට පැන්න තරුණයාගේ මළ සිරුර පොල්ගොල්ල වේල්ල අසල

**එස්.පී.විජේරත්න - කටුගස්තොට සමූහ**

කටුගස්තොට නවයාලතැන්න ප්‍රදේශයේ පිහිටි දුම්රිය පාලම (කළු පාලම) මතින් පසුගිය 29 වැනිදා මහවැලි ගඟට පැන ඇති තරුණයකුගේ මළ සිරුර දින 4 කට පසු ඊයේ (02) පෙරවරුවේ පොල්ගොල්ල නැරඹුම් වේල්ල ආසන්නයේ තිබී හමුවී ඇති බව කටුගස්තොට පොලිසිය පවසයි.

වටපුලුව දේවි පාරේ පදිංචිකරුවකු බව පැවැසෙන ගෝවින්ද වඩුගේ කසුන් සංජීව නමැති 25 හැවිරිදි මෙම තරුණයා සොයා දෙන ලෙස මොහු ගඟට පැන්න දිනයේම ඔහුගේ සහෝදරිය විසින් කටුගස්තොට පොලිසිය වෙත පැමිණිල්ලක් දමා තිබුණි. තරුණයා ගඟට පැන්න දින සිට පොලිස් නිලධාරින්, නාවික හමුදාවේ කිමිදුම් කණ්ඩායම් හා අසල් වැසියන් විසින් මළ සිරුර සෙවීම ආරම්භ කර තිබුණි.කටුගස්තොට පොලිසියේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. කුලසේන මහතාගේ උපදෙස් මත පො.සැ. අමරකෝන් වැඩිදුර පරික්ෂණ කටයුතු ආරම්භ කර ඇත.

# මහනුවර තැපැල් ශ්‍රවණාගාරයේ පිය ගැට පෙළ මරු කපොල්ලක් වෙලා

**ඉන්ද්‍රාණී තෝරදෙණිය**

මහනුවර තැපැල් ශ්‍රවණාගාරය මහනුවර නගරයේ පවතින විශාලතම ශ්‍රවණාගාරවලින් එකක් වන අතර එහි මහජන ආරක්ෂාව නඩත්තු කරන ආකාරය පිළිබඳ බලවත් ජනතා විරෝධයක් එල්ල වෙමින් පවතී.

එහි පවතින උත්සව අවස්ථාවන් නිමවන විට අඳුරු වැටීගෙන එන්නේ නම් තෙවන මහලේ සිට පිය ගැට පෙළ හරහා පහළ මහලට පැමිණිමට එළියක්ද රැගෙන ආ යුතුව ඇත්තේ එහි විදුලිය ඇතත් ආලෝකය නොමැති කමින් ජීවිත අවදානමේ තිබෙන බැවිනි.

පසුගිය සතියේ බදාදා එම ශාලාවේ පැවති ජනතා විමුක්ති පෙරමුණේ රැස්වීම අවසන් වන විට අඳුරු වැටී තිබිණි. රැස්වීම නිමවී ලහි ලහියේ නිවෙස් බලා යෑමට ඉක්මන් වූ ජනතාව අඳුරු වලාවකින් වැසිගිය පිය ගැට පෙළ අසල රොක් වනු දක්නට ලැබිණි. එකිනෙකා අත වූ ජංගම දුරකතන එළියෙන් ආලෝක වූ පියගැට පෙළේ ජනතාවට අපහසුවෙන් මහල් තුනක් බැසීමට සිදු වූ අතර එකිනෙකා නොසෑහෙන්ට දොස් පවරන අයුරු දක්නට ලැබිණි. එම පිය ගැට පෙළට විදුලි බලය ලබා දි ඇතත් එහි සවිකර ඇති විදුලි බල්බ තැනින් තැන නොමැති බවක් දක්නට ලැබිණි.

තැපැල් ශ්‍රවණාගාරය කිනම් හෝ අවශ්‍යතාවකට වෙන් කර ගැනිමේදි පැය හතරකට රුපියල් දහ දහසක්, පැය අටකට රුපියල් දහ අට දහසක්, වැඩිවන සෑම පැයකටම රුපියල් තුන්දහසක් සහ ආපසු ගෙවන රුපියල් පන්දහසක තැන්පතුවක් අය කරනු ලැබුවද එහි පැමිණෙන ජනතාවගේ ජීවිත අවදානම වෙනුවෙන් බල්බ ටිකක් සවි කිරිමට සදහා සුළු මුදලක් වැය කිරිමට නොහැකි වීම කනගාටුවට කරුණකි.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 ඔක්තෝබර් 03 සෙනසුරාදා

# බස් එකක පොත් ගුලක්!

කුමන හෝ උපායමාර්ග ඔස්සේ දරුවන්ගේ කියැවීම දියුණු කළ හැකි නම්; එය අනාගතය පිළිබඳ සුබ නිමිත්තක් වනු ඇත. පොතපත කියැවීම පරිපූර්ණ මිනිසකු බිහි කිරීමට ඇති හොඳම ක්‍රම-විධිය ලෙස බෝඩ් ගසා ඇතත් කියැවීම දියුණු වී නැත. එය දිනෙන්-දින පිරිහීමට පත් වන බව පෙනෙන්නට තිබේ. පොත් අලෙවිය අඩු වී ඇත. පත්තර අලෙවිය ද අඩු වී ඇත. සඟරා නිකුත් වීම මුළුමනින් ම පාහේ අහෝසි වී ඇත. දකුණු ආසියාවේ ඉහළම සාක්ෂරතාව වාර්තා කරන රටේ කියැවීම දුර්වල වන්නේ ඇයි? මෙය තාක්ෂණික පෙරළියක් යැයි අත පිසදා ගත හැකි ද?

1960 ගණන් වන විට අපේ තරුණ-තරුණියන් අතේ පොතක් හෝ සඟරාවක් හෝ තිබිණි. නවකතා, කෙටිකතා හා ශාස්ත්‍රීය නිබන්ධ පාදක කරගත් සම්මන්ත්‍රණ, සංවාද, විචාර සහා නිතිපතා පැවැත්විණි. පාසල්වල පමණක් නොව; ප්‍රජා මණ්ඩලවල පවා පොත් ගුලක් හෙවත් පුස්තකාලයක් තිබිණි. රාජ්‍ය අනුග්‍රහය සහිතව පැවැත්වුණු සාහිත්‍ය සම්මාන උලෙළ අඛණ්ඩව පැවැත්විණි. එදා මුළු මහත් සමාජය බුද්ධි පිපාසාවකින් පෙළුණු බව සත්‍යයෙකි. තරුණ පරපුර අතර කියැවීමේ පිස්සුවක් පැවැතිණි. (එය පිස්සුවක් නොව; සාධනීය ලක්ෂණයකි.) කියැවීමෙන් තරුණ පරපුරේ චින්තනය දියුණු විය. ජීවිතාවබෝධය පුළුල් විය. අද එය කිසිවක් නැත.

රජයක් ගනු ලබන තීන්දු-තීරණ අනුව ද ක්‍රියාත්මක කරන වැඩසටහන් අනුව ද සමාජයේ සංස්කෘතික සාධකවල හැඩතල වෙනස් වෙයි. 1956 දී සිංහලය රාජ්‍ය භාෂාව වූ නිසා සිංහල අධ්‍යාපනය දියුණු විය. එහෙත් ඉංග්‍රීසි අධ්‍යාපනය දුර්වල විය. 1977න් පසු සාහිත්‍යය හා ඉතිහාසය ඉගැන්වීම දුර්වල කරන ලද බැවින් කියැවීම දුර්වල විය. සාහිත්‍යය හා ඉතිහාසය යන විෂයයන් දෙකම අමතර කියැවීමකට මඟ හෙළි කරයි. සාහිත්‍ය හදාරන දරුවා ප්‍රබන්ධ-කතා කියවයි. කවි රස විඳියි. සම්භාව්‍යය පොතපත පරිශීලනය කරයි. ඉතිහාසය හදාරන දරුවා රජවරුන් ගැන කරුණු සොයයි. අතීත ලෝකය ගැන විමසයි. ඒවා අතහැරුණු කළ දරුවන්ගේ ඔළු ගෙඩි හිස්ය.

වත්මන් ජනාධිපතිවරයා පුළුල් සමාජ දැක්මක් ඔස්සේ රට මෙහෙයවන රාජ්‍ය නායකයෙකි. ඔහු අනාගතය සැලැසුම් කරන නායකයකු හැටියට ද කැපී පෙනෙයි. ජනාධිපතිවරයා මෙවර ලෝක ළමා දිනය සමරන්නට එක් වූයේ දරුවන්ගේ කියැවීමට අදාළ වැදගත් වැඩසටහනක් හඳුන්වා දෙමින් ය. එය බසයක් තුළ පොත් ගුලක් ලෙස හඳුන්වා දිය හැකිය. ඉවත දැමූ බස් බොඩියක් ගෙන එය ළමා පුස්තකාලයක් ලෙස සකස් කිරීම හා පාසල්වල එය පිහිටුවීම වැඩසටහන මඟින් සිදු කෙරේ. මෙය දරුවන්ගේ ආකර්ෂණය දිනා ගනු ලබන ජනප්‍රිය වැඩසටහනක් වනු ඇතැයි උපකල්පනය කළ හැකිය. ලෝක ළමා දිනයේදී පාසල් කිහිපයකට ම මේ මහඟු ත්‍යාගය ලැබිණි.

බසයක් තුළ පුස්තකාලයක් පිහිටුවීම හරි අපූරු සංකල්පයකි. ජපානයේ එක්තරා ගුරුවරයෙක් දුම්රිය පෙට්ටි උපයෝගි කරගෙන පන්ති-කාමර සකස් කළේය. ඔහු වියදම් අඩු ඉස්කෝලයක් නිර්මාණය කළ අතර සිසුන් ආකර්ෂණය කර ගත්තේය. දිළිඳු දරුවන්ගේ අධ්‍යාපනය දියුණු විය. පසුකලෙක ලෝක අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නොමැකෙන නමක් සටහන් කර ගැනීමට ජපන් ගුරුවරයා සමත් විය. ඉවත ලන දුම්රිය මැදිරි හා කන්ටේනර් අවන්හල් ලෙස ද, නවාතැන් පොළවල් ලෙස ද භාවිත කරන රටවල් තිබේ. දකුණු කොරියාවේ ද මේ ක්‍රමය දකින්නට ලැබේ. බසයක් තුළට යැමටත්, එහි සිට පොත-පත කියැවීමටත් දරුවෝ රුචි වෙති.

මේ වැඩසටහන සඳහා රාජ්‍ය ආයතන කිහිපයක සේම පෞද්ගලික ආයතන කිහිපයක ද අනුග්‍රහය ලැබේ. රාජ්‍ය අංශය සේම පෞද්ගලික අංශය ද ජාතික කාර්යයන් සඳහා අනුග්‍රහය ලබාදීම යහපත් ලක්ෂණයකි. සෑම ආයතනයක් ම රටේ දියුණුව වෙනුවෙන් කිසියම් වගකීමක් ඉටුකිරීමට ඉදිරිපත් වීම මඟින් සාමූහිකත්වය ගොඩනැඟෙයි. මේ සෑම ආයතනයකටම ජාතියේ කෘතඥතාව හිමි විය යුතුය. මන්ද යත් මෙයින් සිදු වන්නේ ජාතියක් ඔසොවා තැබීම බැවිනි. පෞද්ගලික ආයතන සිය ප්‍රචාරණය සඳහා වාර්ෂිකව වැය කරන මුදල අති විශාලය. එයින් සුළු ප්‍රතිශතයක් යොදවා මෙබඳු ජාතික කාර්යයක් ඉටුකිරීමෙන් ආයතනයකට ලැබෙන කීර්ති නාමය බලවත්ය. එය හුදු ප්‍රචාරයට වඩා ව්‍යාපාරික වශයෙන් වාසිදායක ය.

දරුවන් උදෙසා හොඳම දේවල් දෙමු යන තේමා පාඨය කරළියට ගෙන ආවේ සෝවියට් දේශය ගොඩනැඟූ වී. අයි. ලෙනින් ය. ඔහු නායකත්වය ගත් සෝවියට් දේශය දරුවන් උදෙසා වූ සාර්ථක අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වා දුන්නේය. දරුවන් උදෙසා සුභසාධන ක්‍රමවේදයක් හඳුන්වා දුන්නේය. පසු කලෙක ඒවා ලෝක ආදර්ශ බවට පත් විය. දරුවාට ශාරීරික මෙන්ම මානසික පෝෂණයක් ද අවශ්‍ය වෙයි. මානසික පෝෂණය ලබා දිය හැකි ප්‍රධාන උපායමාර්ගය වන්නේ කියැවීමය. සංගීතය ඇතුළු සෞන්දර්ය විෂයයන් වෙත නැඹුරු වීම මානසික පෝෂණය ලද හැකි තවත් උපායමාර්ගයකි. දරුවන් විභාගවලට පමණක් හිර කරන්නේ නැතිව ඔවුන්ගේ නිදහස හා ආස්වාදය ගැනත් විමසුම් ඇස යොමු කළ යුතුය.

බස් එකක පුස්තකාලය හරි අපූරු ප්‍රති නිර්මාණයකි. එය දරුවන්ට අලුත් අත්දැකීමක් වනු ඇත. අලුත් දෑ සොයන්න සේ ම අලුත් දෑ තනන්න ද දරුවෝ උනන්දු වෙති. අපේ රාජ්‍ය නායකයා එය වටහා ගෙන තිබේ.

### දිල්රුගෙ සීවිද

සත පහකට ගණන් නොගෙන සමච්චලෙන් විරෝනා
දෙකේ කොළේටම දාලා ඇහු දුටු තැන ගොරෝනා
ඔහොම අයට ළං වෙන එක වැඩක් වගෙයි මරෝනා
ට්‍රම්ප් ළඟට කිට්ටු වුණේ ලැජ්ජ නැද්ද කොරෝනා



# ජනාධිපති ට්‍රම්ප්ටත් කොරෝනා

# ට්‍රම්ප් - බයිඩන් විවාද සමය අවිනිශ්චිතයි

අමෙරිකා ජනාධිපතිවරණ සටන උණුසුම් අතට හරවමින් ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් සහ ඔහුගේ ප්‍රතිවාදී ඩිමොක්‍රටික් අපේක්ෂක ජෝ බයිඩන් අතර පළමු රූපවාහිනී විවාදය ආරම්භ විය. තවත් දෙවටයක් ඉදිරි සති කිහිපය තුළ පැවැත්වේ.

උණුසුම් විනාඩි 90 ක කාලසීමාවක් තුළ අපේක්ෂක දෙපළ ආර්ථිකයේ පටන් කොරෝනා වසංගතය දක්වා එකිනෙකාගේ අදහස් සමඟ ගැටුණහ. අමෙරිකානුවන් රූපවාහිනිය ඔස්සේ මේ විවාදය සජීවීව දැක බලා ගත්තේ තම තමන්ගේ දේශපාලන මතිමතාන්තර සමඟ මේ අදහස් ගළපමිනි.

මෙම විවාද අමෙරිකා ජනාධිපතිවරණයේ ප්‍රධාන ඉසව්වකි. අපේක්ෂක දෙපළ රට ගොඩනැඟීම සඳහා තමන් සතුව ඇති ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ ජනතාව හමුවේ තබන්නේ මෙම විවාදය ඔස්සේය.

ජනාධිපති ට්‍රම්ප් මෙම විවාදයේදී ඉදිරිපත් කළ ප්‍රධාන කාරණයක් වූයේ, ඉතිහාසයේ මහා ආර්ථිකය තම පාලන සමය තුළ ගොඩනැඟූ බවය. ඊට එරෙහිව මතු වූ ප්‍රති තර්කය එය නිවැරැදි නොවන බවය. ආර්ථිකය මීට වඩා ශක්තිමත් වූ අවස්ථා එරට ඉතිහාසයේ තිබූ බව කියැවිණි. කෙසේ වුවද, කොරෝනා වසංගතයට පෙර අමෙරිකා ආර්ථිකයේ ඓතිහාසික වර්ධනයක් පෙන්වීමට ට්‍රම්ප්ට හැකි විය. 1950 - 1980 අතර එරට ආර්ථික වර්ධනය 10% ඉක්මවූ අවස්ථා තිබිණි. 1980 න් පසු කිසිම අවස්ථාවක එය 10% ඉක්මවා නැත. 1950 - 1980 අතර සමයේද වරින්වර එය සෘණ අගයක් ගත් අවස්ථා තිබූ අතර වර්තමානයේද යළිත් වරක් පෙන්නුම් කරන්නේ සෘණ තත්ත්වයකි. ජෝ බයිඩන් මෙහිදී කියා සිටියේ, ලෝක ජනගහනයෙන් 4%ක් අමෙරිකානුවන් වුවද මරණ සංඛ්‍යාව ද 20%ක් වී ඇති බවය. ඔහු ඉන් අදහස් කළේ, කොරෝනා වසංගතය හමුවේ අමෙරිකාව පත් වී ඇති තත්ත්වයයි. මෙය අතිශයෝක්තියක් නොවන අතර, අමෙරිකාව මුහුණ දී සිටින තත්ත්වය පිළිබඳ යම් පැතිකඩකි. ජනාධිපති ට්‍රම්ප්, කොවිඩ් 19 මර්දනය කිරීමට අසමත්ව ඇති බවට බයිඩන් මෙහිදී පෙන්වා දුන්නේය. සංඛ්‍යාත්මකව ඔහු ඉදිරිපත් කළ කාරණා නිවැරදිය. අමෙරිකාවේ ජනගහනය මිලියන 328කි. එය ලෝක ජනගහනය වන බිලියන 7.7 න් 4%කි. කොරෝනා වසංගතය හමුවේ අමෙරිකාවෙන් වාර්තා වී ඇති මරණ සංඛ්‍යාව 206000 ට ආසන්නය. (ජෝන් හෝකින්ස් විශ්වවිද්‍යාල දත්ත අනුව) ලොව පුරා වාර්තා වූ කොරෝනා මරණ සංඛ්‍යාව 1,004,800 ඉක්මවා තිබේ. මෙම සංඛ්‍යා අනුව අමෙරිකාවේ එම ප්‍රතිශතය ගෝලීය කොරෝනා මරණ සංඛ්‍යාවෙන් 20%කි. කෙසේ වුවද ඒ ඒ රටවල් මෙම ගණනය කිරීම් කරන ක්‍රමවේද අනුව යම් යම් වෙනස්කම් තිබිය හැකිය. පුද්ගලයන් 100,000කට එම මරණ සංඛ්‍යාව ගණනය කළ විට බ්‍රිතාන්‍ය ද ඇතුළුව රටවල් කිහිපයක් අමෙරිකාවට ඉදිරියෙන් සිටී.

ඡන්ද පාවිච්චි වන ආකාරය පෙන්වා දෙමින් ජනාධිපති ට්‍රම්ප් කියා සිටියේ, තැපැල් ඡන්ද භාවිතය ඉහළ ගොස් තිබීමෙන් පෙනෙන්නේ යම් වංචනික ක්‍රියාවක් සිදු වෙමින් ඇති බවය. එහෙත්, එවැනි සංවිධානාත්මක අක්‍රමිකතාවක් මෙතෙක් අනාවරණය වී නොමැත. එලෙස තැපැල් ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව ඉහළ යාමට හේතුව වශයෙන් පෙන්වා දී ඇත්තේ, කොරෝනා වසංගතය හේතුවෙන් අමෙරිකානු ඡන්දදායකයන් තැපැල් ඡන්දය භාවිත කිරීමට වැඩි නැඹුරුවක් පෙන්වීමය.

යම් යම් හුදෙකලා සිද්ධීන් නම් වාර්තා වී තිබේ. ජනාධිපති ට්‍රම්ප්ගේ තර්කය වූයේ, මෙම ප්‍රවණතාව මැතිවරණ අක්‍රමිකතාවලට හේතු විය හැකි බවය. මෑතදී පෙන්සිල්වේනියා ප්‍රාන්තයෙන් වාර්තා වූ සිදුවීමකින් කියැවුණේ යුද හමුදාවේ ඡන්ද 9ක් අවලංගු වූ බවය. ඉන් 7ක් ට්‍රම්ප්ට ප්‍රකාශ වූ ඒවා බව කියැවිණි. මෙවැනි සිද්ධීන් හැරුණු විට මහා පරිමාණ අක්‍රමිකතා පිළිබඳ මෙතෙක් වාර්තා වී නැත. අමෙරිකා ඉතිහාසයේ මැතිවරණ අක්‍රමිකතා සමස්තයක් ලෙස සිදු නොවන තරම් බව 2017 දී සිදු වූ අධ්‍යයනයකින්ද (Brennam Center for Justice) පෙනී ගොස් ඇත. ප්‍රතිශතයක් ලෙස එය 0.00004% - 0.0009% පමණ අගයකි.

අමෙරිකානුවන්ගේ සෞඛ්‍ය පිළිබඳ ද මෙම විවාදයේදී අවධානයට ලක්විය. ජෝ බයිඩන් කියා සිටියේ අමෙරිකානුවන් මිලියන 100ක් පමණ පෙර සිට පවත්නා සෞඛ්‍ය තත්ත්වයන්ගෙන් යුතු බවය. මෙය ඇතැම් පෞද්ගලික වෛද්‍ය රක්ෂණයන් මඟින් ආවරණය නොවීමට හේතුවකි. ජනාධිපති ට්‍රම්ප්ගේ තර්කය වූයේ බයිඩන් ඉදිරිපත් කරන සංඛ්‍යා මුළුමනින්ම වැරැදි සහගත බවය. විවිධ ආයතනවලින් පිළියෙල කර ඇති මෙම සංඛ්‍යාවල යම් යම් විචල්‍යයන් ඇත. කොවිඩ් 19 සඳහා එන්නතක් ඉදිරි සති කිහිපය තුළ හඳුන්වා දීමට හැකිවනු ඇතැයි ජනාධිපති ට්‍රම්ප් මෙහිදී විශ්වාසය පළ කළේය. එසේ වුවද අමෙරිකා ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ ප්‍රධාන විද්‍යාත්මක උපදේශකවරයාගෙන් එවැනි ඉඟියක් පළ වී නැත. එසේ වුවද එරට සිටින වසංගත රෝග පිළිබඳ විශේෂඥයකු වන වෛද්‍ය ඇන්තනී ෆෝසි ඉදිරි මාස කිහිපය තුළ අමෙරිකාව මීට එන්නතක් සොයා ගනු ඇත යන මතය පළ කර තිබේ.

නිෂ්පාදන ආර්ථිකය කොරෝනා වසංගතයටත් පෙර සිටම බිඳ වැටී තිබූ බව මෙහිදී ජෝ බයිඩන් පැවසීය. මේ සංඛ්‍යාවල වෙනස්කම් ඇතත්, නිෂ්පාදන ක්ෂේත්‍රයේ අවම රැකියා ප්‍රමාණය පෙන්නුම් කරන්නේ ට්‍රම්ප් යුගයේදීය. ඔබාමා පාලනයට වඩා එය ඉහළට ගමන් කළද යළි අඩුවීමක් පෙන්නුම් කරන්නේ කොරෝනා වසංගතය හේතුවෙනි.

පෝට්ලන්ඩ්හි ෂෙරිෆ්වරයා තමන්ට සහාය පළ කළ බව ජනාධිපති ට්‍රම්ප් පැවසුවද ඔහු එය ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වුවද ජනාධිපති ට්‍රම්ප් කියා සිටින්නේ නීතිය ක්‍රියාත්මක කරන අංශවලින් තමාට ඉහළ සහායක් ලැබෙන බවය.

ජනාධිපති ට්‍රම්ප් මෙම විවාදයේදී චෝදනාමය ස්වරූපයෙන් පෙන්වා දුන්නේ ජෝ බයිඩන් විසින් අප්‍රිකානු සම්භවයක් ඇති අමෙරිකානුවන් විලෝපිකයන් ලෙස හඳුන්වා තිබෙන බවය. මෙය නිවැරදි නොවන බවට ද බයිඩන් එම වදන භාවිත කර ඇතත් ඒ, කළු අමෙරිකානුවන් සම්බන්ධයෙන් නොවන බවට ද තර්ක කෙරිණි. 1993 දී ඔහු ප්‍රකාශ කර ඇත්තේ විලෝපිකයන් වීදි සරන්නට පටන්ගෙන ඇති බවය. හිලරි ක්ලින්ටන්, 1996 දී සුපිරි විලෝපිකයන් ගැන ප්‍රකාශයක් කර ඇත.

ඖෂධ මිල පහත හෙළීමට ට්‍රම්ප් පාලනය අසමත්ව ඇති බවට ද මෙහිදී ජෝ බයිඩන් පෙන්වා දුන්නේය. ඉකුත් වසරේ අගෝස්තු වන විට ඖෂධ මිල පහත වැටීමක් පෙන්නුම් කළද යළිත් එම මිල ගණන් ඉහළ ගොස් තිබේ. ට්‍රම්ප් බලයට පත් වූ පසු ඖෂධ මිල ගණන් පහත වැටීමක් පෙන්වා ඇතත් යළි එය ඉහළ නඟිමින් ඇත.

ජනාධිපති ට්‍රම්ප් මෙහිදී බයිඩන්ට එරෙහිව පෞද්ගලික මට්ටමේ චෝදනාවක් මතු කරමින් කීවේ, ඔහු ගෞරවාන්විත නොවන ලෙස හමුදා සේවයෙන් ඉවත් කළ අයකු බවය. ඒ, කොකේන් භාවිත කර හසු වූ බැවිනි. මීට ප්‍රතිචාර වශයෙන් පළ වී ඇත්තේ බයිඩන්ගේ දෙවැනි පුත්‍රයා එවැනි වරදකට හසුව හමුදා සේවයෙන් ඉවත් කර ඇතත්, ඒ ගෞරවාන්විත නොවන අයුරින් නොවන බවය. නින්දා සහගත ලෙස සේවයෙන් පහ කිරීම එරට හමුදා සේවයේ ඉහළම අපකීර්තියට ලක් කිරීමකි.

ඉකුත් 29 වැනිදා පැවැති මෙම පළමු විවාදයෙන් අනතුරුව දෙවැනි විවාදය ඔක්තෝබර් 15 වැනිදාට යෙදී තිබේ. තුන්වැන්න, එනම් අවසන් විවාදය ඔක්තෝබර් 22 වැනිදාට නියම වී ඇත. උප ජනාධිපති අපේක්ෂකයන් අතර ද එක් විවාදයක් ඔක්තෝබර් 7 වැනිදා පැවැත්වේ. ජනාධිපතිවරණයේදී මෙම විවාද පැවැත්වීමට අනුග්‍රහය දක්වන්නේ ජනාධිපති විවාද කොමිසම මඟිනි. 2016 දී, මෙම විවාද අපක්ෂපාතීව නොපැවැත්වුණු බවට ජනාධිපති ට්‍රම්ප් ඉකුත් වසරේදී චෝදනා කළේය. කෙසේ වුවද, එම විවාද පෙර දිනයකට ගන්නා ලෙස හෝ 4 වැනි වටයක් ලබාදෙන ලෙසට කරන ලද ඉල්ලීම නම් කොමිසම මඟින් ප්‍රතික්ෂේප කර තිබිණි.

මෙම විවාද සඳහා ඉදිරිපත් වීමට නම් ජනාධිපතිවරණය සඳහා තරග කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය. ඒ අතර, ධුරයට තෝරා ගන්නා විට අවම වශයෙන් අවුරුදු 35කවත් වයසක සිටීම, උපතින්ම අමෙරිකානුවකු වීම හා බලයට පත් වන විට වසර 14ක් අමෙරිකාවේ පදිංචිකරුවකු වීම වැනි කාරණා තිබේ. 22 වැනි සංශෝධනය අනුව දෙවරකට වැඩි වාර ගණනක් ධුරය දැරීමට ද නොහැකිය.

> “මෙම විවාද සඳහා ඉදිරිපත් වීමට නම් ජනාධිපතිවරණය සඳහා තරග කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය. ඒ අතර, ධුරයට තෝරා ගන්නා විට අවම වශයෙන් අවුරුදු 35කවත් වයසක සිටීම, උපතින්ම අමෙරිකානුවකු වීම හා බලයට පත් වන විට වසර 14ක් අමෙරිකාවේ පදිංචිකරුවකු වීම වැනි කාරණා තිබේ. 22 වැනි සංශෝධනය අනුව දෙවරකට වැඩි වාර ගණනක් ධුරය දැරීමට ද නොහැකිය.


විවාද ඇරැඹීමට පෙර සිදු කළ CNN/ SSRS මත විමසුමකට අනුව ප්‍රේක්ෂකයන්ගෙන් 60%ක් විශ්වාස කළේ ඉන් ජෝ බයිඩන් ජයගනු ඇති බවය. ට්‍රම්ප් ජයගනු ඇතැයි කීවේ 28%කි. CBS මත විමසුම අනුව එම සංඛ්‍යා 48%ක් බයිඩන්ට හා 41%ක් ට්‍රම්ප්ට වශයෙන් විය.


මෙම විවාදය මිලියන 73ක පමණ රූපවාහිනී ප්‍රේක්ෂකයන් නරඹා ඇතැයි වාර්තා විය. එය අමෙරිකා ඉතිහාසයේ තුන්වනුව වැඩිම ප්‍රේක්ෂක පිරිසක් නැරඹූ රූපවාහිනී විවාදයයි. ඉන් පළමු තැන ඇත්තේ 2016 දී ට්‍රම්ප් සහ හිලරි ක්ලින්ටන් අතර පැවැති විවාදයටය. එය මිලියන 84ක් වන ප්‍රේක්ෂකයෝ රූපවාහිනියෙන් නැරඹූහ. දෙවැනි තැන 1980 දී ජිමී කාටර් හා රොනල්ඩ් රේගන් අතර පැවැති විවාදයට ලැබී ඇත්තේ මිලියන 80ක ප්‍රේක්ෂක සංඛ්‍යාවක් ද සමඟය.

මෙම විවාදවලදී ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් අපේක්ෂකයන් නොයෙක් අදහස් හා තර්ක විතර්ක මතු කළ ද, චෝදනා එල්ල කළ ද ප්‍රතිපත්තිමය වශයෙන් ඔවුන් අතර ඇති වෙනස්කම් පුළුල් නොවන බවද පිළිබිඹු වේ. සෙසු ලෝකය සම්බන්ධයෙන් වඩාත් බලපාන්නා වූ කාරණය එයයි.

නවතම වාර්තා අනුව ජනාධිපති ට්‍රම්ප් සහ මෙලනියා ට්‍රම්ප් ද කොවිඩ් - 19 ආසාදිතයන් බවට තහවුරු වී ඇති බැවින් ඉදිරි විවාද වට පැවැත්විය නොහැකි තත්ත්වයක් ඇති වී තිබේ. මේ තත්ත්වය ඉදිරි ජනාධිපතිවරණයට කවරාකාරයෙන් බලපානු ඇතිද යන්න තවමත් අවිනිශ්චිතය.

**ධම්මික සෙනෙවිරත්න**





# ප්‍රජාතන්ත්‍රවාදය ගාන්ධිතුමාගේ ඇසින්

## ඔක්තෝබර් දෙවැනි දිනට යෙදුණු මහාත්ම ගාන්ධිතුමාගේ ජන්ම දින සැමරුම වෙනුවෙනි



නව දිල්ලියේ ජවහර්ලාල් නේරු විශ්වවිද්‍යාලයේ හින්දි සහ නූතන භාරතීය භාෂා අධ්‍යයනාංශයේ සම්මානිත මහාචාර්ය
**මැනේජර් පාණ්ඩේ**




ලෝකයේ තිබෙන රටවල් දෙකක් තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය අතිශයින් උතුම් යැයි පවසති. ඉන් එකක් ඇමෙරිකාව වන අතර, දෙවැන්න භාරතයයි. ප්‍රශ්නයක් මතු වන්නේ මේ අයගේ ප්‍රජාතන්ත්‍රවාදයේ උතුම් බව හා සම්බන්ධ සැබෑ ස්වරූපය කුමක්ද යන්න විමසා බැලීමේදීය. ඇමෙරිකාවේ ලක්ෂ 20කට අධික පිරිසක් බන්ධනාගාරගත වී සිටිති. එයින් වැඩි පිරිසක් කළු ජාතිකයෝය. ඒ අතර සිටින ස්ත්‍රීන්ගේ හා ළමයින්ගේ සංඛ්‍යාව ඉතා අධිකය. අනෙක් අතට භාරතීය භූමියේ විශාල ප්‍රදේශයක, එනම් කාශ්මීරයේ සිට ඊසානදිග භාරතයට අයත් ප්‍රාන්ත රාජ්‍ය රැසක ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගෙන යනු ලබන්නේ යුදහමුදාවේ සහායෙනි. මණිපුර් ප්‍රාන්තයේ කාන්තාවක වන ඉරෝම් ශර්මිලා චානු පසුගිය වසර 8ක කාලයක සිට යුදහමුදා විශේෂ බලතල පනත ක්‍රියාත්මක කිරීම අවසන් කරන්නැයි උපවාස පවත්වමින් බල කරමින් සිටියි. ඒ ගැන භාරතීය රජය මෙන්ම භාරතීය සමාජයද අවධානය යොමු කරන බවක් පෙනෙන්නට නැත. ගාන්ධිතුමාගේ 'උපවාස / සත්‍යග්‍රහ' වචනවල අර්ථය වැඩකට නැති දෙයක් බවට ඔප්පු කෙරෙමින් පවතියි. වර්තමානයේ ගාන්ධිතුමා ජීවත්ව සිටියා නම් ඇමෙරිකාවේ සහ භාරතයේ රජයන් විසින් සිදු කරනු ලබන දෑ දෙස බලා එම රටවල් දෙකෙහි ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති උතුම් බව ගැන කුමක් සිතනු ඇතිද යන්න අනුමාන කළ හැකි වනු ඇත.

### ඉන්දීය ස්වරාජ්‍යය

ගාන්ධිතුමාගේ චින්තනයෙන් සහ ලේඛනයෙන් පැහැදිලි වන්නේ එම චින්තනය ස්වරාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කිරීම ගැන පමණක් නොව ස්වරාජ්‍ය සංකල්පයේ අනාගතය ස්වරූපය පිළිබඳවද කනස්සල්ල පළ කරන ආකාරයයි. එම කරුණ එතුමාගේ 'හින්ද් ස්වරාජ්' (ඉන්දීය ස්වරාජ්‍යය (1909) කෘතිය කියවන ඕනෑම කෙනෙකුට වැටහෙන කරුණකි. එහෙත්, එතුමාගේ අදහස් කෙරෙහි වගකිවයුත්තන්ගේ අවධානය කිසිසේත් යොමු නොවිණි. ඒ අය අතර සිටියේ නිදහස් භාරතයේ වර්තමානය සහ අනාගතය නිර්මාණය කරන පුද්ගලයෝය.

ගාන්ධිතුමා සිතුවේ 'භාරතය තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්නට නම් හිංසාව සහ අසත්‍යය අතර කිසිදු ආකාරයක 'ගිවිසුමක්' ඇති කළ නොහැක' යන්නයි. එහෙත්, භාරතයෙහි බිහි කරනු ලැබූ 'ප්‍රජාතන්ත්‍රවාදය' තුළ ඉහළින්ම තිබුණේ 'අසත්‍යය' සහ 'හිංසාව'යි. මෙවැනි 'ප්‍රජාතන්ත්‍රවාදයක්' කෙසේ හෝ ඉදිරියට ගමන් කළ අතර, අසත්‍යයේ සහ හිංසාවේ 'තත්ත්වය'ද 'ඉහළ' ගියේය.

දේශපාලන විද්‍යාවට අනුව ප්‍රජාතන්ත්‍රවාදය යන්නේ අනේක විධ ප්‍රකාර / කොටස් දක්වා තිබේ. ඒ අතර ප්‍රමුඛ වන්නේ ජනතාවා දී, නව ජනතාවාදී-සමාජවා දී, පාලනය කළ සහ ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදය ආදියයි. ආරම්භයේ දී ධනවාදය සමඟ ප්‍රජාතන්ත්‍රවාදයේ විකාසනය සිදු විය. එතෙක් පැවැති සමාජවාදී පාලනතන්ත්‍ර පරිහානියට පත් වීමෙන් පසුව ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදය පමණක් මුළු ලෝකය පුරාම ඉතිරි විය. කියුබාව වැනි රටක් පමණක් ව්‍යතිරේකයක් වශයෙන් ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ ආක්‍රමණයට මුහුණ දෙමින් සිටියි. ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප දෙකක් ඇත; එනම්, 'ලිබරල්වාදී ප්‍රජාතන්ත්‍රවාදය' සහ 'නව ලිබරල්වාදී ප්‍රජාතන්ත්‍රවාදය' යනුවෙනි. 'නව ලිබරල්වාදී ප්‍රජාතන්ත්‍රවාදය' යන්න ඔබ කැමති නම් මෙසේද හැඳින්විය හැකිය, එනම්, 'නිරුවත් ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදය' යනුවෙනි. එහි සංකේතය සහ සාක්ෂ්‍යය වන්නේ 'අමෙරිකාව'යි. එහි, රැවටීම සහ ධවල ම්ලේච්ඡත්වය උදව් කර ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගෙන යනු ලබයි. එවැනි ප්‍රජාතන්ත්‍රවාදයක් ගාන්ධිතුමා වෙත නොතිබිණි. එහෙත්, එහි බීජ එංගලන්තය, ජර්මනිය සහ ඉතාලිය වැනි රටවල ඇති ප්‍රජාතන්ත්‍රවාදයේ තිබිණි. ඒවා මොනවාදැයි ගාන්ධිතුමා හොඳින් දැන-හඳුනාගෙන සිටියේය. ඒ නිසාම ගාන්ධිතුමා 1940 දී මෙලෙස ලිව්වේය, 'බටහිර අද දක්නට ඇති ප්‍රජාතන්ත්‍රවාදය තරමක නාසි හා ෆැසිස්ට් තන්ත්‍රයක ළා වර්ණයක් සහිත එකකි. වැඩි වශයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය, අධිරාජ්‍යවාදී නාසි සහ ෆැසිස්ට් ක්‍රමවේද වසා තබනු වස් භාවිත කෙරෙන ආඩම්බරකාර කඩතුරාවකි. ඉඳහිට ප්‍රජාතන්ත්‍රවාදය 'අධිරාජ්‍යවාදී මෙහෙයුම්' සඳහා 'කඩතුරාවක්' ලෙසද භාවිත කෙරෙයි. පසුගිය දශක කිහිපය තුළ අමෙරිකාව 'ප්‍රජාතන්ත්‍රවාදය' ස්ථාපිත කිරීමේ මුවාවෙන් බොහෝ රටවලට එළිපිට මෙන්ම රහසේද හමුදාමය අතපෙවීම් සිදු කළේය; එසේම ම්ලේච්ඡ ඝාතනද සිදු කළෝය. ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ ආදර්ශවත් ස්වරූපය ඒබ්‍රහම් ලින්කන්ගේ වචනවලින් කියතොත්, 'ජනතාව සඳහා, ජනතාව විසින් සිදු කරනු ලබන ජනතාවගේ පාලනය' යන්නයි. එහෙත්, එහි යථාර්ථවාදී ස්වරූපය ජෝර්ජ් ඩබ්ලිව්. බුශ්ගේ යුගයේ දී ඉතා හොඳින් දක්නට ලැබිණි.


සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය නම් මෙයයි, එහි සමාජය පුරාම නිදහස, සමානාත්මතාව සහ සහෝදරාත්මක හැඟීම් සැබෑ ලෙසම තිබිය යුතුය; එය 'මන්ත්‍රයක්' පමණක් ලෙස නොව පාලන තන්ත්‍රය තුළ සැබෑ ලෙසම තිබිය යුතුය. ඉහත කී කාරණා තුනෙන් වඩාත් වැදගත් වන්නේ 'සමානාත්මතාව'යි. මක් නිසාද යත: සමානාත්මතාව නැති තැන සමාජයේ සියලු දෙනා 'ස්වතන්ත්‍ර' නොවන්නා සේම සහෝදරත්වය පිළිබඳ හැඟීමක් ඇති වීමේ හැකියාවක්ද නැත. ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදයෙහි 'සමානාත්මතාව' පිළිබඳ කිසිදු සිතිවිල්ලක් ඇත්තේ නැත; එවැනි තත්ත්වයක් ඇති වීමේ සම්භාවිතාවක්ද නැත. එහි ඇත්තේ ධනවාදීන්ගේ 'නිදහස' පමණි. එමෙන්ම කම්කරු පන්තිය කෙරෙහි ඔවුන් ඔවුන් තුළ ඇති විරෝධයද ස්ථිරව පවතියි. ගාන්ධිතුමාගේ කාල්පනික ස්වරාජ්‍යයේ සමානාත්මතාව කේන්ද්‍රීයව පවතින්නකි. එතුමා පැහැදිලිව ලියා ඇති ආකාරයට 'පූර්ණ ස්වරාජ්‍යයක් යන්නෙන් බලාපොරොත්තු වන්නේ එය රජ කෙනකුට කොතරම් සලකනවාද, එලෙසම ගොවියකුටද සැලකිය යුතුය; ධනවත් ඉඩම් හිමියකුට කොතරම් සලකනවාද, එතරම්ම ඉඩම් අහිමි අඳ ගොවියකුටද සැලකිය යුතුය; හින්දුවරුන්ට යම් පමණක් සේද, එතරම්ම මුසල්මානුවන්ටද සලැකිය යුතුය; ජෛන, යුදෙව්, සීක් ආගමිකයන්ට යම් පමණක්ද, එතරම්ම ෆාරසීවරුන්ට සහ ක්‍රිස්තියානි ආගමිකයන්ටද සැලකිය යුතුය. එහි ජාති-පන්ති-ආගම් සහ මට්ටම් ආදි භේදවලට කිසිදු ස්ථානයක් හිමි නොවේ' (යංග් ඉන්ඩියා, 05.03.1931). වර්තමානයේ අප සිටින්නේ එවැනි 'ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක්' තුළද? අප සිටින මේ 'ප්‍රජාතන්ත්‍රවාදී සමාජය' ගාන්ධිතුමාගේ දැක්මට අනුව අපූර්ණ, අඩුපාඩු සහිත සහ අසමත් තත්ත්වයක් නොවන්නේද?

අනෙක් පාලන තන්ත්‍රවලින් ප්‍රජාතන්ත්‍රවාදය වෙනස් වන මූලිකම කාරණය වන්නේ 'එකඟ නොවීම' සහ 'විරෝධය' යන්න පිළිගැනීමට ලක් කිරීමයි. ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියක අනිවාර්ය පොරොන්දුව වනුයේ මෙයයි. මේ තත්ත්වය නොමැති වීම අතීත සමාජවාදී පාලනතන්ත්‍ර බිඳ වැටීමට බලපෑ මූලිකම කාරණයක් විය. අන්‍යයන්ගේ අදහස්වලට ගරු කිරීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තක් බව ගාන්ධිතුමා ඉහළින්ම පිළිගත්තේය.

### පර මත ඉවසීම

එතුමා ලියූ ආකාරයට, 'අපේ රට වැනි විශාල රටවල අවංකව අදහස් පළ කරන සෑම ජන කොටසකටම තැනක් හිමි විය යුතුය. ඒ නිසාම තමන් කෙරෙහි මෙන්ම අන්‍යයන් කෙරෙහිද අවම වශයෙන් සිදු කළ යුතු යුතුකමක් වන්නේ අප විරුද්ධ පාර්ශ්වයන්ගේ දෘෂ්ටිකෝණ තේරුම් ගැනීමට උත්සාහ කිරීමයි. අපට ඒවා පිළිගැනීමට හැකියාවක් නැති නම් අඩුම ගණනේ බලාපොරොත්තු වන්නේ ඒ අය අපේ මතයට ගරු කරනු ඇත යන අදහසයි. ඒ අනුව අපද ඒ අයගේ මතයට ගරු කළ යුතුය. මේ තත්ත්වය, නීරෝගි ජන ජීවිතයකට ස්වරාජ්‍ය සංකල්පයට අදාළ යෝග්‍යතාවේ අනිවාර්ය උරගල්වලින් එකක් බවට පත් වෙයි' (යංග් ඉන්ඩියා, 17.04.1924). කිසියම් පාලනතන්ත්‍රයක්, විරෝධය පෑම 'අපරාධයක්' ලෙස සලකයිද, එය කෙබඳු ප්‍රජාතාන්තික තත්ත්වයක් වන්නේද? වර්තමාන භාරතයේ මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු විසින් සෑම සාමාජික, දේශපාලනික 'විරෝධයක්'ම 'අපරාධයක්' ලෙස සලකනු ලබයි; ඒවා මර්දනය කරනු ලබයි.

**ගාන්ධිතුමා හින්දි ස්වරාජ්‍යයේ 'ප්‍රජාතන්ත්‍රවාදය' හා සම්බන්ධ ආයතන රැසක් දැඩි ලෙස විවේචනය කළේය. එතුමා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව හැඳින්වූයේ 'වඳ වෛශ්‍යාවක්' ලෙසය. එය දැඩි බලපෑමක් ඇති කළ ප්‍රකාශයක් විය. එහෙත්, භාරතීය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු තම 'හැසිරීම්වලින්ම' ගාන්ධිතුමාගේ විවේචන සත්‍ය බව පසක් කළහ.**



ගාන්ධිතුමා හින්දි ස්වරාජ්‍යයේ 'ප්‍රජාතන්ත්‍රවාදය' හා සම්බන්ධ ආයතන රැසක් දැඩි ලෙස විවේචනය කළේය. එතුමා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව හැඳින්වූයේ 'වඳ වෛශ්‍යාවක්' ලෙසය. එය දැඩි බලපෑමක් ඇති කළ ප්‍රකාශයක් විය. එහෙත්, භාරතීය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු තම 'හැසිරීම්වලින්ම' ගාන්ධිතුමාගේ විවේචන සත්‍ය බව පසක් කළහ. කිසියම් පාර්ලිමේන්තුවක සාමාජිකයන් මුදලට ගත හැකි, විකිණෙන අය වෙත් නම්, දෝෂාභියෝග ඉදිරිපත් කෙරෙන, ඡන්දය විමසන අවස්ථාවල දී මේවා සිදු වෙයි නම්, කිසියම් පාර්ලිමේන්තු සාමාජිකයකු විසින් 'මුදල්' ලබා ගැනීමෙන් පසු 'ප්‍රශ්න' අසනු ලබයි නම්, ඒ 'පාර්ලිමේන්තුව' 'වෛශ්‍යාවක්' ලෙස හැඳින්වීම උචිත නොවන්නේද!

ගාන්ධිතුමා 'ප්‍රජාතන්ත්‍රවාදය' යන්න මුල සිටම විවේචනය කළ අයෙකි. 'මුල සිටම' යන්නෙහි අරුත වන්නේ විවේචනය යන ක්‍රියාදාමයෙහි මුල තෙක් ගමන් කිරීමයි. කාල්මාක්ස් පැවසූ පරිදි 'මනුෂ්‍යයාගේ මුල වන්නේ මනුෂ්‍යයා'මය. ඒ නිසා මුල සිටම කෙරෙන විවේචනය යන්න මූලික වශයෙන්ම 'මානවවාදී විවේචනයකි'. ගාන්ධිතුමා 'ප්‍රජාතන්ත්‍රවාදය' යන්න විවේචනය කිරීමේ දී මනුෂ්‍යයාගේ අතීතය, වර්තමානය සහ අනාගතය පිළිබඳ අවධානය යොමු කළේය.

### ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදය

වර්තමාන භාරතයේ දක්නට ඇති 'ප්‍රජාතන්ත්‍රවාදය' 'ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදයක්' වන අතර, එය ධනවාදී ගෝලීයකරණය තුළ ඇති 'නව ලිබරල්වාදී ප්‍රජාතන්ත්‍රවාදය'කි. එය ලිබරල්වාදී ප්‍රජාතන්ත්‍රවාදය හා සම්බන්ධ සියලු අරමුණු, මතවාද සහ ඉලක්ක අමතක කරමින්, ධනවාදයේ සියලු ආකාර ප්‍රචාරයන් සඳහා පමණක් ක්‍රියා කිරීමට කැප වී සිටියි. කිසියම් පුද්ගලයෙක්, ජන වර්ගයක් හෝ සමූහයක් සංවර්ධනයේ ධනවාදී ක්‍රියාදාමයන්ට විරෝධය පළ කරයි නම්, එසේත් නැතහොත්, ඒ ක්‍රියාදාමයෙන් විපතට සහ විනාශයට පත් වූ ආදිවාසීන්, ගොවීන් සහ කම්කරුවන්ගේ ගැටලු ගැන කතා කරයි නම්, ඔහු 'සංවර්ධන විරෝධියකු' ලෙස නම් කරන රාජ්‍ය පාලනය ඔහු මර්දනය කරයි. ස්ටාලින්ගේ කාලයේ දී සෝවියට් සංගමයේ පාලනය, එය ජනතාවගේ සතුරකු ලෙස හැඳින්වුණු අතර, ජනතාව සමඟ කටයුතු කළේ කුමන ආකාරයටදැයි සියලු දෙන හොඳින් දනිති. වර්තමාන භාරතයේ ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ පාලනය 'සංවර්ධනයේ සතුරන්' ලෙස හඳුනා ගත් අයට සලකන්නේ ස්ටාලින් සමයේ සෝවියට් සංගමයේ පාලකයන් ජනතා සතුරන්ට සැලකූ ආකාරයටය. ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදය ජනහිතවාදය / ජනතා යහපත අතහැර ධනවාදයේ යහපත ගැන සිතීම තම ඉලක්කය කරගත් පසු, එතැන් පටන් රාජ්‍ය බලය ගත්තෝ අතිශය මර්දනකාරී පිළිවෙතක් අනුගමනය කිරීම ආරම්භ කළෝය. ගාන්ධිතුමාගේ බලාපොරොත්තු සහිත ප්‍රජාතන්ත්‍රවාදයෙහි මර්දනකාරී රාජ්‍ය බලයකට කිසිදු ඉඩක් ඇත්තේ නැත. ගාන්ධිතුමා 1936 ජනවාරි 11වැනි දින 'හරිජන්' (හරිජනයා/කුලහීන ජනයා) සඟරාවට මෙසේ ලිව්වේය, 'යම් විටෙක රාජ්‍ය බලය ජනතාව අතට පත් වෙයිද, එවිට එය, ප්‍රජාවගේ නිදහසට අතපොවන ප්‍රමාණය අතිශයින් අඩු වී යයි. වෙනත්

වචනවලින් කියන්නේ නම්, කිසියම් රටක් තම කටයුතු රාජ්‍ය බලයේ මැදිහත් වීමකින් තොරවම සාමකාමීව හා වඩාත් ඵලදායක ලෙස ඉටු කර පෙන්වයි. එය සැබෑ අර්ථයෙන්ම 'ප්‍රජාතන්ත්‍රවාදී' යැයි කිව හැකිය. කිසියම් තැනෙක එවන් තත්ත්වයක් නොමැති නම්, එතැන බාහිරින් රජයේ ප්‍රජාතන්ත්‍රවාදී බව පෙනුණද, එය 'නාමමාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදයක්ම' පමණි.'

ගාන්ධිතුමාගේ මේ උරගල මත ඔබ භාරතීය ප්‍රජාතන්ත්‍රවාදය උරගා බලන කල ඔබට පෙනී යනු ඇත්තේ එය 'නාමමාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදයක්' පමණක්ම වන බවය.

ගාන්ධිතුමාගේ දෘෂ්ටිකෝණයට අනුව ප්‍රජාතන්ත්‍රවාදය හුදෙක් දේශපාලන ක්‍රියාදාමයක් පමණක් නොවේ, එය සාමාජික හා සදාචාරමය ක්‍රියාදාමයක්ද වේ. එහෙත්, ධනවාදය හුදෙක් ලාභයම අරමුණු කරගෙන සිටින්නකි. එය ලාභ මාර්ගයේ විරෝධතා දක්වන කිසිදු ආකාරයක සාමාජික, සදාචාරත්මක සහ මානුෂීය තත්ත්වයන් කෙරෙහි අවධානයක් නොදක්වයි. එහෙයින්, භාරතයේ වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදය සමාජ සාධාරණත්වය, සදාචාරාත්මක පිබිදීම, මනුෂ්‍ය හිංසනය ආදිය පිළිබඳ කිසි විටෙක සැලකිල්ල යොමු නොකරයි. වර්තමාන භාරතීය ප්‍රජාතන්ත්‍රවාදයට ඇත්තේ හුදෙක් ධනවාදය ප්‍රචාරය කිරීමේ වුවමනාව පමණි. සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ව්‍යාප්ත කිරීම, ජනතාවට නිදහසේ ජීවත් වීමට, සිතීමට සහ යමක් ප්‍රකාශ කිරීමට අයිතියක් ලබා දීම පිළිබඳ වුවමනාවක් නැත. භාරතය තුළ ධනවාදය පැතිර වීම වේගවත් කිරීම සඳහා විශේෂ ආර්ථික කලාප 500ක් ඇති කිරීමේ යෝජනාවක් තිබේ. ඒවා සියලු ආකාරයේ රෙගුලාසි සහ නීතියේ දායකත්වයෙන් නිදහස්, පීඩාවට පත් කිරීම සඳහා වූ විශේෂ කලාප වනු ඇත. ඒ තුළ කිසිදු ආකාරයක සාමාජික සහ සදාචාරමය ප්‍රජාතන්ත්‍රවාදයක් පිළිබඳ සිතිවිල්ලක්වත් ඇති කර ගැනීමට නොහැකි වනු ඇත.

භාරතීය ප්‍රජාතන්ත්‍රවාදය ගැන කිව හැක්කේ එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පදනම් වී ඇති දෙයකිය යන්නයි. එහෙත්, සමහරුන් ආණ්ඩු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත දිවුරමින් බලයට පත් වන අතර, වැඩ කටයුතු කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කරුණුවලට ඉඳුරාම පටහැණි ආකාරයෙනි. භාරතීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හැඳින්වීමෙහි පෙර දී සඳහන් කර තිබුණු ආකාරයට භාරතය යනු 'අනාගමික ප්‍රජාතාන්ත්‍රික සමූහාණ්ඩුවකි'. පසුව අගමැතිනි ඉන්දිරා ගාන්ධී මැතිනිය එම හැඳින්වීමට තවත් වචනයක් එකතු කොට භාරතය අනාගමික ප්‍රජාතාන්ත්‍රික සහ 'සමාජවාදී' සමූහාණ්ඩුවක් බවට පත් කළාය. භාරතයේ ආණ්ඩු කොපමණ අනාගමික සහ කොපමණ ප්‍රජාතාන්ත්‍රිකද යන්න විවාදයට තුඩු දෙන කාරණයකි. එහෙත්, ආණ්ඩු කොපමණ 'සමාජවාදී'ද?

ගාන්ධිතුමාගේ දැක්මට අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන්නේ 'ජනමතය'යි. ජනතා හැඟීම සහ තේරුම් ගැනීම කෙරෙහි උනන්දුවක් දක්වන පාලනතන්ත්‍රයක දී 'ජනමතය' කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙන අතර, හුදෙක් විශේෂඥයන්ගේ අදහස්වලට පමණක් සීමා නොවෙයි.

ඉංග්‍රීසි නවකතා කරුවකු සහ නාට්‍යකරුවකු වන හෙන්රි ෆීල්ඩිංග් තමන්ගේ නාට්‍යයක ජනමතයේ වැදගත්කම පිළිගත්තේය; එය නසන්නා වූ පාලකයන්ගේ චර්යාව විවේචනයටද ලක් කළේය. ඔහු මෙසේ ලියයි: 'ජනමතය ඝාතනයට ලක් කරන අය, එය තමන්ගේ සාර්ථකත්වයක් යැයි ප්‍රකාශ කරති. ඔවුන්ට අමතක වන කාරණයක් වන්නේ, ජනමතයේ භූතයා ඔවුන් පසුපස හඹා එනු ඇතිය යන්නයි.' ජනමතය හෙළා දකින, එයට ගරු නොකරන ප්‍රජාතන්ත්‍රවාදය ගාන්ධිතුමාට අනුව 'නාම මාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදයක්' පමණකි; එහි 'සැබෑ ප්‍රජාතාන්ත්‍රික දේශපාලක සංස්කෘතියක්' නොතිබෙනු ඇත.

වර්තමාන ධනවාදී ගෝලීයකරණ ක්‍රියාදාමයේ දී එක්තරා 'උන්මාද / උමතු පුද්ගලවාදයක්' පැන නැඟී ඇත. එයද ප්‍රජාතන්ත්‍රවාදයට අහිතකරය. මේ අතර පශ්චාත් නූතනවාදීන් විසින් 'සමාජයේ මරණය' ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එක් අතකින් 'උමතු පුද්ගලවාදය' සහ අනෙක් අතින් 'සමාජයේ මරණය' යන්නෙහි ප්‍රතිඵලයක් ලෙස කිසියම් සමාජයක් නිර්මාණය වෙමින් පවතියි. එය වැඩි වශයෙන්ම 'පුද්ගලයන්ගේ සමාජයක්' ලෙස හැඳින්විය හැකිය. වර්තමානයේ සාමූහිකත්වයට වැදගත්කමක් දෙන රට, රාජ්‍යය, කණ්ඩායම සහ අදහස් වැනි සංකල්පවල සැබෑ අර්ථය අතුරුදන් වෙමින් පවතියි. සාමූහිකත්වය නැත හොත් සාමූහිකත්ව සිතිවිල්ල / හැඟීම නොමැති ප්‍රජාතන්ත්‍රවාදී සිතිවිල්ල සංවර්ධනය නොවන වග අතිශයින් පැහැදිලිය.

### පුද්ගල නිදහස

ගාන්ධිතුමාගේ චින්තනයේ සහ ක්‍රියාපටිපාටියේ මධ්‍ය ලක්ෂ්‍යයෙහි 'සාමාජිකත්වය' යන්න තිබිණි. එයින් 'සාමූහිකත්වය' යන හැඟීම ඉපදිණි. ගාන්ධිතුමා 'පුද්ගලයාගේ නිදහස' වැදගත් කාරණයක් ලෙස සැලකුවේය. එහෙත්, ඔහු 'පුද්ගලවාදය' අනුමත නොකළේය. 1939 දී එතුමා මෙසේ ලිව්වේය: 'පුද්ගල නිදහස යන්න අතිශය ප්‍රශංසනීය බව මම කියමි. එහෙත්, කිසි විටෙකත් අමතක නොකළ යුතු කරුණ වන්නේ 'මනුෂ්‍යයා' යනු මූලික වශයෙන්ම 'සමාජ ප්‍රාණියෙකුය' යන්නයි. ඔහු සමාජ ප්‍රගතිය සඳහා වන අවශ්‍යතා අනුව තම පුද්ගලත්වයනිර්මාණය කර ගැනීම ඉගෙනගෙන වර්තමාන තත්ත්වය දක්වා ළඟා වී ඇත. 'නිදහස් පුද්ගලවාදය' කැලේ සතුන්ගේ නීතියකි. පුද්ගල නිදහස සහ සාමාජික සංයමය අතර ඒකමිතියක් ඇති කරන ආකාරය අප ඉගෙනගත යුතුය.' එවැනි සංහිඳියාවක් ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාව සහ එය මෙහෙයවා ගැනීම සඳහා අත්‍යවශ්‍යය.

පැවැති සමාජවාදී පාලනතන්ත්‍ර විසින් මනුෂ්‍යයා සාමාජික බවට පත් කරනු ලැබූවත්, ඔවුන්ට සමාජක්‍රමය මානුෂිකත්වයට පත් කළ නොහැකි විය. ගාන්ධිතුමා බලාපොරොත්තු වූ 'ප්‍රජාතන්ත්‍රවාදය', තවදුරටත් මුළුමහත් ලෝකයේම 'මානව සමාජයේ බලාපොරොත්තුවම' බවට පත් වී ඇත.



සිංහල පරිවර්තනය:
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
**උපුල් රංජිත් හේවාවිතානගමගේ**
හින්දී අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය

## එක් පළාතකට එක් ළමා රෝහලක් පවත්වා ගෙන යෑමට

# ආණ්ඩුවේ අවධානය යොමුව තිබෙනවා

## අගමැති මහින්ද රාජපක්ෂ

**නදී මාණික්කගේ**

කොළඹ සහ මහනුවරට පමණක් දැනට සීමා වන ළමා රෝහල් මින් ඉදිරියට එක් පළාතකට එක් ළමා රෝහලක් ලෙස සංවර්ධනය කොට පවත්වාගෙන යෑම පිළිබඳ ආණ්ඩුවේ අවධානය යොමු වී ඇතැයි පසුගියදා (1) ලෝක ළමා දිනය හා රිජ්වේ ආර්යා ළමා රෝහලට වසර 125ක් සපිරීමට සමගාමීව මහල් නවයකින් යුතු දැඩි සත්කාර හා ශල්‍ය වාට්ටු සංකීර්ණයට මුල්ගල තැබීම සහ ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකය හා නව ශල්‍යාගාර සංකීර්ණය විවෘත කිරීමේ උත්සවයට එක්වෙමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසුවේය.

රිජ්වේ ආර්යා ළමා රෝහලේ නිල වෙබ් අඩවිය අන්තර්ජාලයට මුදා හැරීම සහ ඩිජිටල් සායන ක්‍රම ස්ථාපනය කිරීම අගමැතිවරයාගේ සුරතින් සිදු වූ අතර අගමැතිවරයා හා ශිරන්ති රාජපක්ෂ මහත්මිය ලෝක ළමා දිනයට සමගාමීව දරුවන්ට ත්‍යාග ප්‍රදානය සිදු කළහ.

හෙද නිලධාරී ජී.එච්.ජේ. හේවගේ මහත්මිය විසින් රචිත කළුවර අහසට සඳ පායලා කෘතිය අගමැතිවරයා වෙත පිළිගැන්වීම හා ලිට්ල් හාට් අරමුදලට සජිකල් නිෂ්පාදන පෞද්ගලික ආයතනයේ සභාපති කලන හේවා මල්ලිකා මහතා රුපියල් ලක්ෂ හතක මුදලක් පරිත්‍යාග කිරීම මෙම උත්සවයට සමගාමීව සිදුවිය.

අගමැතිවරයා මෙහිදී වැඩිදුරටත් මෙසේද පැවසුවේය.

රාජ්‍ය ළමා දින සැමරුම් උත්සවය එක්ක ළමා රෝහලට එන්න පුළුවන් වීම ගැන මම සතුටු වෙනවා. අද විශේෂඥ වෛද්‍යවරු එකතු වෙලා රෝහල් අධ්‍යක්ෂකවරයාගේ උනන්දුව ඇතුව, කාර්ය මණ්ඩලයේ උනන්දුව ඇතිව, ශෛල්‍යාගාර දෙකක් විවෘත කරන්න ලැබුණා. මම හිතන්නේ ඒ තුළින් විශාල සේවයක් සිදු වෙනවා. දැනට ළමා රෝහල් තියෙන්නේ දෙකයි. ඒ කොළඹ සහ නුවර පමණයි. ළමා රෝහල් අඩුගානේ එක පළාතකට එකක් වශයෙන්වත් සකස් විය යුතු යැයි අපේ ආණ්ඩුව තරයේ විශ්වාස කරනවා. කෙසේ වෙතත් අද දරුවන්ගේ නිරෝගීකම වැදගත්. දරුවෝ තමයි අනාගතයේ අපේ රට භාරගන්න ඉන්න නායකයන්. දරුවන් ආරක්ෂා කිරීම අපේ කාර්යයභාරයක් වෙනවා. පාසල්වලට අපේ විශේෂඥ වෛද්‍ය පාදෙණිය මහත්මයා කැඳ දෙන්න සූදානම් වෙලා තියෙනවා. අපිත් අධ්‍යාපන ඇමැතිතුමාට යෝජනා කරනවා සෑම දරුවකුටම කැඳ වීදුරුවක් වගේ ශක්තිමත් පානයක් ලබා දීමට පියවර ගන්න කියලා. අපේ කාලය තුළ දී දරුවන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් අපි කටයුතු කරන්න සූදානම් බව මතක් කළ යුතුව තියෙනවා. රිජ්වේ ආර්යා ළමා රෝහලේ අධ්‍යක්ෂවරයා, විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලු දෙනාට මේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් අපි ස්තූතිවන්ත වෙනවා. මේ මොහොතේ දී ඔවුන්ගේ විශිෂ්ට සේවය මම අගය කරනවා. ඔබ අතින් ඉටුවන්නේ අපේ අනාගත පරපුර රැක ගැනීමේ කාර්යභාරයයි.

සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි, රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි, සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම් මේජර් ජනරාල් සංජීව මුණසිංහ, රිජ්වේ ආර්යා ළමා රොහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ජී. විජේසූරිය, විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු වෛද්‍ය කාර්යය මණ්ඩල මහත්ම මහත්මීන් හා මව්පිය දූදරුවන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාව සඳහා එක්ව සිටියහ.

## මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමිව අගමැති බැහැ දැකී



නාරාහේන්පිට ශ්‍රී අභයාරාම පුරාණ විහාරස්ථානයේ විහාරාධිපති බස්නාහිර පළාත් ප්‍රධාන සංඝනායක, මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි බැහැ දැකීමට පෙරේදා (1) එම විහාරස්ථානයට ගිය අගමැති මහින්ද රාජපක්ෂ මහතා උන්වහන්සේගේ සුවදුක් විමසා බැලුවේය.

රටේ ආර්ථික, සමාජීය හා දේශපාලන ක්‍රියාදාමයන්ට අදාළ ධර්මානුකූල පිළිවෙත් ගැන මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මෙහිදී අගමැතිවරයාට අනුශාසනා කළ අතර විහාරස්ථානයට පැමිණි සැදැහැවතුන් හා දරුවන් සමඟ ද සුහද කතා බහක නිරත වෙමින් ඡායාරූප ගැනීමට ද දරුවන්ට ඉඩ සලසා දුන්නේය.

මෙම අවස්ථාවේ දී කුඩා දරුවකු අගමැති මහින්ද රාජපක්ෂ මහතා හමු වී තමන්ට නිවෙසක් නොමැති බව පවසා ලිපියක් ඉදිරිපත් කළ අතර පසුව දරුවාගේ මව කැඳවා නිවාස ගැටලුව විමසූ අගමැතිවරයා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා මහතා හමුවන්නැයි උපදෙස් දී දරුවාට නිවෙසක් ලබා දීමට පොරොන්දු විය.

මෙම අවස්ථාවට ඇමැති නිමල් සිරිපාල ද සිල්වා, රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර මහත්වරු හා සැදැහැවත්හු රැසක් එක්ව සිටියහ.





# දරුවන්ට නිදහසේ සතුටින් ඉගෙන ගත හැකි අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් රටට අවශ්‍යයි

## ලෝක ළමා දින ජාතික උත්සවයේදී අගමැති කියයි



**මහින්ද අලුත්ගෙදර**

දරුවන්ට නිදහසේ සතුටින් ඉගෙන ගත හැකි අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් වහාම මේ රටට අවශ්‍ය බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා අවධාරණය කරයි.

අගමැතිවරයා මේ බව සඳහන් කෙළේ බත්තරමුල්ල, අපේ ගම පරිශ්‍රයේ ඊයේ (2) පෙරවරුවේ පැවැති ලෝක ළමා දින ජාතික උත්සවය අමතමිනි.

'අපේ රට - අපේ දැතින්' යන්න තේමාව කරගත් මෙම උත්සවය කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත ද සිල්වා මහතාගේ උපදෙස් හා මඟපෙන්වීම අනුව එම අමාත්‍යාංශය විසින් සංවිධානය කෙරිණි.

එහිදී වැඩිදුරටත් අදහස් පළකළ අගමැති මහින්ද රාජපක්ෂ මහතා මෙසේද පැවසීය.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට වඩා මේ රටේ අනාගතයට බලපානවා. අධ්‍යාපනයට ජාතික ආදායමෙන් කොයිතරම් කොටසක් වෙන් කළ ද දරුවන් ඉගෙන ගන්නේ නිදහසේ නොවෙයි නම් එයින් ඵලක් වන්නේ නෑ. දරුවන්ට නිදහසේ ඉගෙන ගන්න පුළුවන් මෙන්ම නැවත තමන්ගෙ ඉලක්ක ජය ගන්න පුළුවන් රටක් බාරදිය යුතුයි.

ලෝක ළමා දිනයට සමගාමීව දරුවන් වෙනුවෙන් මේ වගේ උත්සවයක් පැවැත්වීම ගැන මම ඉතාමත් සතුටු වෙනවා. විශේෂයෙන් දරුවන් වෙනුවෙන් බිත්තිවලින් වටවුණු ශාලාවක දේශනයක් පවත්වනවාට වඩා අපේක්ෂාමතක් වෙන විදිහට අපේ ගමේ මේ උත්සවය පවත්වන එක ගැන මම ඉතාමත් සතුටුයි. ඒ වගේම මේ දිනය අපේ දරුවන්ගේ සෞන්දර්ය හැකියාවන් එළිදක්වමින් පවත්වන්න ඇමැතිතුමන් උත්සහ ගැනීම ඉතාම කාලෝචිතයි කියලා මම හිතනවා. මේ දරුවන් අතරින් සියලුම ජාතීන්ට, සියලුම ආගම්වලට අයත් දරුවන් ඉන්න බව මට පේනවා. ඒක තමයි මම මේ රටේ වැඩියෙන්ම දකින්න කැමති දර්ශනය. ඒ වගේම සියලු ජාතීන් ආගම්වලට අයිති දරුවන් ඒකරාශී කර ගැනීම ගැනත් මම ස්තූතිවන්ත වෙනවා. 2005 දී ,මීට අවුරුදු 15 කට කලින් මම ජනතාව අමතලා කිව්වා අපි එදා මුහුණ දෙන ප්‍රශ්න අනාගත පරපුරට භාර දෙන්නේ නැති රටක් හදනවා කියලා. 2005 දී ඉපදිලත් නැති දරුවෝ අද මේ සභාවේ ඉන්න පුළුවන්. ඒ දරුවන්ට එදා තිබූ ඉතිහාසය ගැන මේ මොහොතේ මම මතක් කරන්න ඕනෑ.

එදා මේ රටේ යුද්ධයක් තිබුණා. අද වගේ නිදහසේ ගමන් බිමන් යන්න බෑ. කොයි මොහොතේ බෝම්බයක් පුපුරලා මැරිලා වැටෙයි ද කියන්න බැරි රටක් තිබුණා. කිලෝ මීටර් හතරෙන් පහට හැම තැනම චෙක් පොයින්ට් තිබුණා. බස් එකෙන් බැහැලා කිහිප පොලක පරීක්ෂාවට ලක්වෙලා තමයි ගමනක් යන්න වුණේ. හැම ගමකම යුද්ධයේ මළ ගෙයක් තිබුණා. උතුරු නැගෙනහිර පළාත්වල ලක්ෂ ගණන් බිම් බෝම්බ වළලලා තිබුණා. ඒ වේලාවේ බොහෝ දෙනෙකුට කකුල් අතපය අහිමි වුණා. ගාලු පාරේ නිතරම තුවාල ලබපු අය රෝහල්වලට ගෙන යන ගිලන් රථ එහා මෙහා ගියා. ඒ විතරක් නොවෙයි එදා දහස් ගණන් දරුවෝ උපන්නේ අනාථ නිවාසවල. ඉස්කෝලේ ගියේ යුද්ධයෙන් අනාථ වුණ අය ඉන්න කූඩාරම්වල ඉඳලා. 2005 දී අපි ජාතිය අමතලා මුලින්ම කිව්වා අපි මුහුණ දෙන ප්‍රශ්න අනාගතයට භාර දෙන්නේ නෑ කියලා. අද ඒ අනාගතය උදා වෙලා තියෙනවා. එදා පරපුර මුහුණ දුන් ප්‍රශ්න අද මා ඉදිරියේ ඉන්න දරුවන්ට මුහුණ දෙන්න වෙලා නෑ. එදා විදුලිය තිබුණේ රටෙන් කොටසකට. කාපට් කරපු පාරවල් මේ රටේ තිබ්බෙ අතළොස්සයි.

පරිගණක සාක්ෂරතාව තිබුණේ ජනගහනයෙන් සීයට පහකට විතරයි. ඒවා නිසා ඇති වූ ප්‍රශ්න අද මේ පරපුරට මුහුණ දෙන්නේ නැති රටක් අපි හැදුවා. කොවිඩ් -19 වසංගතය ආපු වේලාවේ මේ රටේ ලක්ෂ ගණන් දරුවන්ට පරිගණක සාක්ෂරතාව භාවිතා කරලා ඉස්කෝල වැඩ කරන්න පුළුවන් වුණේ අපි එදා නවීන තාක්ෂණය රටේ දියුණු කළ නිසයි. නැණසල මධ්‍යස්ථාන පිහිටුවා රටේ ම දරුවන්ට පරිගණක තාක්ෂණය පුරුදු කරන්න අපි එදා වැඩ කළා. ඈත පළාත්වල දූ දරුවෝ විශ්වවිද්‍යාලයට අයැදුම් කරන්නේ මේ නැණසල හරහා බව අපි දන්නවා. ඒ නිසා දුවේ, පුතේ, මම කියනවා අද අපි යම් ප්‍රශ්නයකට මුහුණ දෙනවා නම්, ඒ ප්‍රශ්නවලටත් අනාගතයේ මුහුණ දෙන්න වෙන්නේ නැති රටක් අපි හදනවා කියලා. අපි කුඩා කාලයේ ඉඳලම දරුවන්ව බෙදනවා. දරුවන්ට බෙදෙන්න, බෙදිලා ජීවත් වෙන්න මඟ පාදා දෙනවා. අද සිංහල දරුවෝ සිංහල ඉස්කෝලවල, මුස්ලිම් දරුවෝ මුස්ලිම් ඉස්කෝලවල, හින්දු දරුවන්ට වෙනම ඉස්කෝල. කුඩා කාලයේ ඉඳන්ම දරුවන්ව වෙන් වෙන්ව තියලා උගන්වලා අපි ඒ ගොල්ලො ලොකු මහත් වුණාම කියනවා එකතු වෙයල්ලා කියලා.

අධ්‍යාපනයේ දී බෙදිලා වෙන් වෙලා ඉගෙන ගත් අය වැඩිහිටියෝ වුණාට පස්සේ එකතු වෙන්නේ කොහොම ද කියන ප්‍රශ්නය අද අපේ ජාතිය හමුවේ කියනවා. ජාතිය, ආගම හැටියට විතරක් නොවෙයි මේ දරුවන් ඉස්කෝල හැටියටත් පොඩි කාලෙම බෙදනවා. ජාතික පාසල්වල දරුවෝ, සුපිරි පාසල්වල දරුවෝ, පළාත් සභා පාසල්වල දරුවෝ, ජාත්‍යන්තර පාසල්වල දරුවෝ කියලා දරුවෝ බෙදනවා. පොඩි කාලෙම බෙදිලා වෙන් වෙලා පන්ති හැටියට ජීවත් වෙන්නයි අපේ දරුවන්ට උගන්වන්නේ. එක නීතියක් එක රටක් ඕනෑනම් බාල කාලයේ සිට මේ බෙදීම අවසාන කරන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. අද මේ දරුවන්ගෙන් ඇහුවොත් දරුවන්ට තියෙන ලොකුම ප්‍රශ්නය මොකක් ද කියලා දරුවෝ කියයි ඉගෙන ගැනීම කියලා. දරුවන්ගෙන් ඇහුවොත් ඔබට තියෙන ලොකුම බර මොකක් ද කියලා දරුවෝ කියයි විභාගවල බර කියලා. අපි අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ අරමුණින් ගොඩනැගිලි දහස් ගණන් හැදුවත්, ඒවා වායු සමීකරණය කළත්, පොත්පත්, ඇඳුම්, සපත්තු, ටැබ් දුන්නත් වැඩක් නෑ දරුවන් ඉගෙන ගන්නේ සතුටින් නොවෙයි නම්.

අපි අධ්‍යාපනයට ජාතික ආදායමෙන් කොයිතරම් කොටසක් වෙන් කරත් වැඩක් නෑ දරුවන් ඉගෙන ගන්නේ නිදහසේ නොවේ නම්. ඒ නිසා අධ්‍යාපනයට මුදල් වෙන් කරනවාට වඩා දරුවන්ට නිදහසේ සතුටින් බරක් නැතුව ඉගෙන ගන්න පුළුවන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් වහාම මේ රටට ඕනෑ. ඒ ප්‍රතිසංස්කරණය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ-



යට වඩා මේ රටේ අනාගතයට බලපාන බව මම කියන්න ඕනෑ. අපි දරුවන්ට නිදහසේ ඉගෙන ගන්න පුළුවන් රටක් නැවත තමන්ගෙ ඉලක්ක ජය ගන්න පුළුවන් රටක් හදලා භාර දෙන්න ඕනෑ. අපිට අපි උපන් රට ගැන ලොකු වගකීමක් තියෙනවා. මේ දුවලා පුතාලා මතක තියා ගන්න ඕනෑ අපි මේ පය ගහලා ඉන්න රට ආරක්ෂා කර ගන්න වසර දහස් ගණනක් තිස්සේ ලක්ෂ කෝටි ගණන් ජනතාව, ජීවිත පූජා කරලා තියෙන බව. යටත් නැති රටක් හදන්න අපේ මුතුන් මිත්තෝ අපිරිමිත කැප කිරීම් කළ බව අපි මතක තියා ගන්න ඕනෑ. දහස් ගණන් වැව් බැඳලා ඒවායේ දියවර අරන් මුතුන් මිත්තෝ අපි වෙනුවෙන් ඒ මහා නිර්මාණ ඉතුරු කළ බව මතක තියා ගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, අපේ භික්ෂූන් වහන්සේලා ලෝකයේ ශ්‍රේෂ්ඨ ධර්මය ථෙරවාදී බුදු දහම වණපොත් කරලා ආරක්ෂා කර ගෙන ගෙනල්ලා ලෝකයට දෙන්න, රැක ගත්ත බව අපි මතක තියා ගන්න ඕනෑ.

මගේ ඉදිරියේ ඉන්න දුවලා පුතාලා වගකීමක් තියෙනවා මේ දේවල්වලට යමක් එකතු කරන්න. අද අපි කවුරුත් හිතනවා රුවන්මැලිසෑය බැඳපු යුගයේ අපි ජීවත් වුණා නම් අපිටත් ඒවාට දායක වෙන්න පුළුවන් කියලා. කැප්පෙටිපොළ නිලමේතුමා අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව සටන් කළ යුගයේ අපිත් හිටියා නම් අපිත් ඒ සටනට යනවා නේද කියලා අපි අද හිතනවා. අපි එහෙම යුගයක් මේ රටේ ගොඩනගන්න ඕනෑ. අනාගත පරපුර ආපස්සට හැරිලා හිතන කොට අද කාලේ ජීවත් වුණා නම් කොයිතරම් හොඳ ද කියලා හිතෙන රටක් හදන්න අපි කැප වෙන්න ඕනෑ. අද අපේ සියලු දේවල් යළි ගොඩනගන යුගයක්, ඔබගේ ගේ පිටිපස්සේ වැවෙන කහ පැළයේ ඉඳන් ඔබ පාසල් යන කොට අඳින නිල ඇඳුම් රෙද්ද දක්වා අපේ අතින්ම නිෂ්පාදනය කරන රටක් හදන්න පුළුවන් යුගයක් එළඹිලා තියෙනවා. ඒ මහා යෝධ කාර්යයට දායක වෙන්න හිතට ගත්තොත් තව අවුරුදු සිය ගාණකට පස්සේ උපදින පරපුර කියයි මේ යුගයේ උපන්නා නම් හොඳයි කියලා. ඒ නිසා අපේ මහා ජාතික කවියකු වූ එස්. මහින්ද හාමුදුරුවෝ කිව්ව කවියකින් මා මගේ කතාව අවසන් කරනවා.

**තමන් ලැබූ දිවි පෙවෙතේ**
**කොටසක් රට සමය වෙතේ**
**පුද නොකළොත් එයින් පුතේ**
**මෙලොවට කිසි පලක් නැතේ**

**අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල් පීරිස් මහතා-**

අපි අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් සම්බන්ධයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා පෙන්වා දුන්නා. අද අපේ රටේ කාලීන අවශ්‍යතාවය වන්නේ අපේ අධ්‍යාපනය නවීන සමාජයට ගැලපෙන පරිදි ප්‍රතිසංස්කරණය කිරීමයි. අපේ රටේ ශක්තිය තමයි අපේ මානව සම්පත. ඒ දූ දරුවන්ට දීප්තිමත් අනාගතයක් ඇති කර දීම වෙනුවෙන් අධ්‍යාපන ව්‍යුහය නවීකරණය කිරීම කාලීන අවශ්‍යතාවයක් වෙනවා. ඉතා වැදගත් තේමාවක් අද මේ උත්සවය සඳහා යොදා ගෙන තිබෙනවා. අපිට වෙනත් කොතනින් හෝ ආදර්ශ ලබා ගැනීම අවශ්‍ය වන්නේ නැහැ. අපි චාරිත්‍ර, බුදු දහමේ ආභාසය තුළ අපිටම අවේණික වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම අසීරු දෙයක් නොවෙයි. අපේ දරුවන් හා මව්පියන් වැදගත්. ගුරුවරයා දෙවැනි වන්නේ මව්පියන්ට පමණයි. ශිෂ්‍යා හා ගුරුවරයා අතර සබඳතා අපි දන්නවා. අධ්‍යාපනයේ වැදගත්ම අරමුණ දැනුම ලබාදීම පමණක් නොවෙයි. අගයන්, ආකල්පයන් දරුවාට සකස් කර දීම අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය අරමුණක් වෙනවා.

මේ රටේ අද තිබෙන සියලුම නරක පැති ඉවත් කරන්න නීතිය තුළින් පමණක් කරන්න බැහැ. පාතාලය, මත්ද්‍රව්‍ය මේ සියල්ල ගැන අපි දෛනිකව දකිනවා. ඇතැමුන් යෝජනා කරන්නේ මේ සඳහා එල්ලුම් ගස නැතිනම් නීතිය දැඩි කරන්න කියලයි. එයින් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. එය ඉතාම සරල ක්‍රමයක් පමණයි. මේ සඳහා ළමා මනස තුළ ඒ වෙනුවෙන් ප්‍රතිකර්මය රැඳී තිබෙනවා. ළමා මනස වර්ධනය වන අවස්ථාවේ සදාචාරාත්මක පසුබිම ගොඩනැඟීම අධ්‍යාපනයේ ප්‍රමුඛ අරමුණක් වෙනවා. අධ්‍යාපනයෙන් අපි අපේක්ෂා කරන්නේ ළමයාගේ විශ්ලේෂණාත්මක හැකියාවයි. ස්වාධීනව සිතීමේ හැකියාවයි. තමන් ලබන දැනුම ලෝකයේ අභියෝග ජයගැනීමට ප්‍රායෝගික වශයෙන් පාවිච්චි කිරීමයි. මේවා වැදගත්. අද තිබෙන අධ්‍යාපන ක්‍රමයෙන් ඒ අරමුණ ඉටු කර ගැනීමට සුදුසු වන්නේ නැහැ. අධ්‍යාපනය කියන්නේ ගවේෂණයක්. ඒ තුළින් ළමයා සතුටක් ලබනවා. නමුත් අද සිදුවන්නේ ළමයාට විශාල කරුණු සමුදායක් මනසට ඇතුළත් කරනවා. මතකයේ පමණයි. ස්වාධීනව සිතන්නේ නැහැ. මෙය වෙනස් කළයුතු වෙනවා.

නාරාහේන්පිට අභයාරාමාධිපති බස්නාහිර පළාත් ප්‍රධාන සංඝනායක මුරුත්තෙට්ටුවේ ආනන්ද, පැපිලියාන සුනේත්‍රා මහා දේවී පිරිවෙනේ විහාරාධිපති මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නායක හිමිවරුන් සහ ඇමැතිවරුන් වන ආචාර්ය බන්දුල ගුණවර්ධන, ගාමිණී ලොකුගේ, රාජ්‍ය ඇමැතිවරුන් වන පියල් නිශාන්ත, සුසිල් ප්‍රේමජයන්ත, විජිත බේරුගොඩ, වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ, වෛද්‍ය සීතා අරඹේපොළ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ප්‍රේම්නාත් සී. දොළවත්ත, ඒ.ඩී ජගත් කුමාර, රාජිකා වික්‍රමසිංහ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් කුමාරි ජයසේකර මහත්ම මහත්මීන් ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

**ඡායාරූප - නිශංක ද සිල්වා**

# 19 අඩංගු සියලු කාරණා ඉවත් කර 20 ගෙනා යුතුයි

## සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි

**චන්ද්‍රිමා කරුණාරත්න**

19න් ගෙනා සියලු කාරණා ඉවත් කර, 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙනා යුතු බවත් එය ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණේ හා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයේද මතය බවත් සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය පැවැසුවාය.

19 වන ව්‍යවස්ථා සංශෝධනයේ කොටසක් හොඳයි , කොටසක් හොඳ නැහැයි කියා ඇතැමුන් ප්‍රකාශ කළද ඒ හොඳ කොටස් එලෙසම තිබියදී 20 වන ව්‍යස්ථා සංශෝධනය ගෙන ආ යුතුයි කියන මතය සිදුනොවිය යුතු බවත් ඒ මහත්මිය ප්‍රකාශ කළාය.

බත්තරමුල්ල නෙළුම් මාවත , ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මාධ්‍ය මධ්‍යස්ථානයේදී ඊයේ (02) පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් මේ බව පැවැසු ඇමැතිනිය වැඩිදුරටත් මෙසේද අදහස් පළ කළේය.

19 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ රනිල් වික්‍රමසිංහ මහතාට ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන්න බැරි බව දැනගෙන සිටි නිසයි. ඒ නිසා ජනාධිපතිවරයාට තිබූ බලතල භාවිතා කරන්න 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා.

19 වන ව්‍යවස්ථා සංශෝධනයේ කොටසක් හොඳයි කොටසක් නරකයි කියා සමහරු ප්‍රකාශ කරනවා. නමුත් කිරි කළයකට ගොම බිංදුවක් වැටුණොත් මොකද වෙන්නේ. ඒ නිසා 20 ගෙන ඒමේදී 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ගෙනා සියලු කාරණා ඉවත් කරන්න අවශ්‍යයි.

පාර්ලිමේන්තු මන්ත්‍රී කෝකිලා හර්ෂණී ගුණවර්ධන මහත්මිය-

19 වන ව්‍යවස්ථා සංශෝධනය රටේ අවශ්‍යතාවට ගෙනා ව්‍යවස්ථා සංශෝධනයක් නොවේ. එක්සත් ජාතික පක්ෂයට කිසිදාක ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන්න බැරි නිසා ජනාධිපති බලතල බුක්ති විඳින්න හදපු ව්‍යවස්ථා සංශෝධනයක්. 2015 මැතිවරණයේදී ජනතාව නොමඟ යැව්වා. ඒ බව පසුකාලීනව ජනතාව තේරුම් ගත් නිසා මහින්ද රාජපක්ෂ මහත්තයා සමඟ ජනතාව එකතු වුණා. 19 වන ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ පිරිස රටට ආදරේ පිරිසක් නොවේ. ඒ නිසා 20 වන ව්‍යවස්ථා සංශෝධනය රටට අවශ්‍යයි. ඒ සමඟ නව ව්‍යවස්ථාවක් ගෙන ඒමත් අවශ්‍යයි.

එහිදී මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය මෙසේ අදහස් පළ කළේ ය.

20න් විගණන කොමිසම ඉවත් වෙනවා කියා සමහරු ප්‍රකාශ කළත් විගණන කොමිසම තිබියදී මහ බැංකු මංකොල්ලය සිදුවුණේ කොහොමද? විගණන කටයුතු සිදුවන විටත් අමාත්‍යවරු කොපමණ හොරකම් කළාද? මේ රටේ සියලුම රාජ්‍ය ආයතන 19 වන ව්‍යවස්ථා සංශෝධනයට පෙරත් විගණනයකට ලක් වුණා.

ඒ නිසා පැහැදිලිවම 19 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ රාජපක්ෂ පවුල ඉලක්ක කරලයි.

අපේ පක්ෂයෙන් ද්විත්ව පුරවැසියෙක් මැතිවරණයට ඉදිරිපත් කරන්නේ නැති බව මම සහතිකවම ප්‍රකාශ කරනවා. ඡන්දය ඉල්ලනවා නම් ඒ ද්විත්ව පුරවැසිභාවය ඉවත් කරගෙනයි.

විපක්ෂය ජනතාව ඉදිරියේ තැබූ මතයට ජනතාව කැමැති වූවානම් අද විපක්ෂයට අත්වී තිබෙන තත්ත්වය උදා වෙන්නේ නැහැ.


සෑම බෝගයකින්ම රට ස්වයංපෝෂිත තත්ත්වයට පත් කිරීම අපේ රජයේ අරමුණයි. රටට අවශ්‍ය කරන පොල් , සහල් , එළවළු රටේ නිෂ්පාදනය කරන අතරතුර පිටරටටද යවන්න අවශ්‍ය වැඩපිළිවෙළ අප සකස් කරනවා. ආණ්ඩුව කටයුතු කරන්නේ අපනයන ආර්ථිකයට යාමටයි. ඒවගේම උද්ධමනය අඩු කරන්න ආණ්ඩුව දීර්ඝ කාලීනව වැඩපිළිවෙළක් සකස් කර තිබෙනවා.

ඖෂධ ප්‍රතිපත්තිය සම්බන්ධව ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ සාකච්ඡා කරන්න අවශ්‍යයි. ඉන්පසුව එය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

මේ හරහා රටේ ඖෂධවලට යම් වෙළෙඳපොළක් ඇති කරන්නත් නිෂ්පාදනය දිරිගන්වන්නත් බලාපොරොත්තු වෙනවා.

අපේ රටේ ඖෂධ නිෂ්පාදනය තරගකාරී මිලකට ටෙන්ඩර් කැඳවා ඒ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සමඟ බෙහෙත්වලට වැයවන මුදල් අඩුවෙයි කියා සිතනවායිද කීය.





**19 රටේ අවශ්‍යතාවට සැදූ එකක් නොවේ**

පාර්ලිමේන්තු මන්ත්‍රිනී කෝකිලා හර්ෂණී



# විස්ස දැන් පොඩ් එකාගේ ලියුම වගේ

## හිටපු ආණ්ඩුකාර රජිත් කීර්ති තෙන්නකෝන්

විස්ස ගැන නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට සංශෝධන 83ක් ඉදිරිපත් කර ඇති බවත් පිටු 67ක සංශෝධනයට තවත් සංශෝධන 83ක් ඇතුළත් කිරීම මේ ලියවිල්ලේ දුර්වලතාව පෙන්වන්නක් බවත් හිටපු ආණ්ඩුකාර රජිත් කීර්ති තෙන්නකෝන් මහතා නිවේදනයක් නිකුත් කරමින් පවසයි.

20 වැනි සංශෝධනය මේ වන විට පොඩි එකාගේ ලියුම වගේ වී ඇතැයි කී ඒ මහතා වැඩිදුරටත් සිය නිවේදනයේ මෙසේ කියා සිටියේය.

ගැසට් මගින් ප්‍රකාශයට පත් කරපු ව්‍යවස්ථා සංශෝධනයට නීතිපවරයා විසින් යෝජනා කරන සංශෝධන කිසිම නෛතික බලපෑමක් නැහැ. එය සිදුවන්නටත් පුළුවන්, නොවෙන්නටත් පුළුවන්. කමිටු අවස්ථාවේ සංශෝධන කියන්නේ ඇස්බැන්දුමක් බවත්, එය තවත් අවුල් ජාලාවකට හේතු වන බවත් අපගේ අතීත අත්දැකීම වෙනවා. 20 උත්කෘෂ්ඨයට නංවමින් කථා කළ ආණ්ඩුවම දැන් එහි වරද 83ක් ලැයිස්තු ගත කර තියෙනවා. එය අතිශයින් දුර්වල ලියවිල්ලක් බව එයින්ම තහවුරු වෙනවා.

රටේ මූලික නීතියේ පදනමට බලපෑම් කරන, ජනාධිපතිවරයාගේ බලය වැඩි කිරීම, තුලන හා සංවරණ ක්‍රියාවලිය, කොමිෂන් සභා කප්පාදු කිරීම වැනි ක්ෂේත්‍රවලට අදාළව 20ට විරුද්ධව ප්‍රධාන යෝජනා 28ක් තියෙනවා. එයින් කිසිම යෝජනාවක් ආණ්ඩුව නීතිපතිවරයා මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ සංශෝධන මගින් ඉටු වෙන්නේ නෑ. එහි කුමන හෝ යහපතක් සිදුවන්නේ පාර්ලිමේන්තුව අවුරුද්දකින් විසිරුවා හැරීම වෙනුවට වසර 2 ½කින් විසිරුවා හැරීමට යෝජනා කිරීම සහ ජනාධිපති, අගමැති කාර්යාල විගණනය කිරීමේ අවස්ථාව සැලසීම පමණයි.

20 රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යෝජනාවක්. එහි ඇතැම් වගන්ති ජනමත විචාරණයකින්වත් සම්මත කර ගත නොහැකි බව ආණ්ඩුවේම කණ්ඩායම් අවබෝධ කරගෙන තියෙනවා. එබැවින් මේ ආණ්ඩුවේ පාර්ශ්වකරුවෝ 20ට විරුද්ධව සිටිති.

20 අත්තනෝමතික යෝජනාවක් බවත් එය සම්පූර්ණයෙන්ම අකුළා ගත යුතු බවත් එම නිවේදනයේ වැඩිදුරටත් සඳහන් වේ.

# 21 අපනයනකරුවන්ගේ සංසදය 7 දා

**මානෙල් පුෂ්ප කුමාරි**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සංවිධාන කරන 21 අපනයනකරුවන්ගේ සංසදය, වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 07 වැනිදින කොළඹ පිහිටි වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වේ. මෙහිදී අපනයන ප්‍රජාව මුහුණදෙන ගැටලු පිළිබඳ සාකච්ඡා කෙරෙන අතර අපනයනකරුවන්ට විසඳාගත නොහැකි ගැටලුවලට රාජ්‍ය ආයතනවල ඉහළ මට්ටමට ගෙන ගොස් එම ගැටලු විසඳීමට අපනයනකරුවන්ගේ සංසද සකසා ඇත.

# පාස්කු ප්‍රහාරයට අදාළව සැකකරුවෝ 100කට වැඩි ප්‍රමාණයක් අත්අඩංගුවේ

**චන්ද්‍රිකා පෙරේරා**

පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් 100කට අධික සැකකරුවන් ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන පරීක්ෂණ සිදු කරන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජාලිය සේනාරත්න පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'මේ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් හිටපු ඇමැතිවරයකු වන රිෂාඩ් බදියුදීන්ගේ සහෝදරයා අත්අඩංගුවට ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කළ පරීක්ෂණවලදී ඔහුට චෝදනා එල්ල කිරීමට තරම් සාක්ෂි නොමැති බව හැඟී ගොස් තිබෙන නිසා මුදා හැර තිබෙනවා.

දැනට අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් කොටසක් රක්ෂිත බන්ධනාගාරගතව සිටිනවා. තවත් පිරිසක් රැඳවුම් නියෝග මත රඳවාගෙන ප්‍රශ්න කරනවා. මේ සිද්ධිය පිළිබඳ තවදුරටත් ලබාගැනීමට ඇති රස පරීක්ෂක වාර්තා සහ වෙනත් වාර්තා ලැබීමෙන් පසු සැකකරුවන්ට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ නීතිපතිගෙන් විමසා කටයුතු කිරීමට පියවර ගන්නවා.'

## කොවිඩ් මර්දනයට නිසි ක්‍රියාමාර්ග ගෙන

# ආර්ථිකය - මහජන ආරක්ෂාව තහවුරු කිරීම ගැන අමෙරිකාවේ ප්‍රසාදය

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ්-19 හෙවත් නව කොරෝනා වයිරසයේ ව්‍යාප්තිය හේතුවෙන් සමස්ත ලෝකයේම ආර්ථිකය කඩාවැටී තිබෙන පසුබිමක නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් අමෙරිකා එක්සත් ජනපදය සිය ප්‍රසාදය පළ කරයි.

ශ්‍රී ලංකාව සහ අමෙරිකාව අතර වෙළෙඳ කටයුතු සම්බන්ධයෙන් වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා සහ ශ්‍රී ලංකාවේ අමෙරිකානු තානාපති ඇලෙයිනා බී. ටෙප්ලිට්ස් මහත්මිය අතර වෙළෙඳ අමාත්‍යාංශයේ දී ඊයේ (02) පැවති හමුවේදී මේ බව අනාවරණය විය.

රොබොටික්ස් තාක්ෂණය දක්වා ඉදිරියට පැමිණ ඇති ශ්‍රී ලාංකේය තාක්ෂණික අංශයේ නව නිපැයුම් සම්බන්ධව ඇමැතිවරයා මෙහිදී කරුණු පැහැදිලි කළ අතර ඊට සමගාමීව අමෙරිකාවේ ඇති තාක්ෂණික හා නව නිපැයුම් අංශ සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කිරීමට ශ්‍රී ලාංකේය සිසුන්ට ඇති හැකියාව පිළිබඳව ද මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.



එමෙන්ම මහපොළ අරමුදල භාර ඇමැතිවරයා වශයෙන් තවත් සිසු දරුවන් රැසකට ශිෂ්‍යත්ව ලබාදීමට අමෙරිකාවේ සහයෝගය බලාපොරොත්තු වන බව ද මෙහිදී ඇමැතිවරයා සඳහන් කළේය. දෙස් විදෙස් රැකියා වෙළෙඳපොළට සරිලන මෘදුකාංග ඉංජිනේරු වැනි අංශ තුළ ශ්‍රී ලංකාව මේ වන විට ලබා ඇති දියුණුව පිළිබඳ කරුණු දක්වමින් දෙරට අතර උසස් අධ්‍යාපනය හා ව්‍යාපාරික සහයෝගීතාවක් ඇති කරගැනීමේ යෝජනාවක් ද මෙහිදී ඉදිරිපත් කෙරිණි.

බලශක්ති උත්පාදනය සම්බන්ධ ව්‍යාපෘති රැසක් පිළිබඳව සාකච්ඡා කරන ලද අතර මෙරටේ නිෂ්පාදනය කිරීමට පහසුකම් නොමැති ආකාරයේ උපකරණ අවම බදු ප්‍රතිශතයන් යටතේ අමෙරිකාවෙන් ගෙන්වීමේ ක්‍රමවේදයක් පිළිබඳව අමෙරිකානු තානාපතිවරිය මෙහිදී යෝජනා ඉදිරිපත් කළාය.

මේ අවස්ථාවට අමෙරිකානු තානාපති කාර්යාලයේ ආර්ථික සහ වාණිජ කටයුතු පිළිබඳ නිලධාරී ජමල් ජෝන්ස් මහතා ද සහභාගී විය.

# සිරිසේන - වික්‍රමසිංහ ආණ්ඩුව මේ රටේ පැවති දුර්වලම කාලපරිච්ඡේදයක්

## එක්සත් වාමාංශික පෙරමුණේ ප්‍රධාන ලේකම් අධිනීතිඥ ලාල් විජේනායක

**ඉන්ද්‍රාණී තෝරදෙණිය**



සිරිසේන - වික්‍රමසිංහ ආණ්ඩුව මේ රටේ පැවති ඉතාම දුර්වල කාලපරිච්ඡේදක් යැයි එක්සත් වාමාංශික පෙරමුණේ ප්‍රධාන ලේකම් අධිනීතිඥ ලාල් විජේනායක මහතා පැවසීය. ඒ මහතා එසේ පැවසුයේ පසුගියදා (30) මහනුවර තැපැල් ශ්‍රවණාගාරයේ පැවති ජනතා විමුක්ති පෙරමුණේ මහනුවර දිස්ත්‍රික් සම්මන්ත්‍රණය අමතමිනි.

එහිදි ඒ මහතා මෙසේද කීය. විස්ස පිළිබඳ රටපුරා වැදගත් සංවාදයක් ඇති වෙලා තියෙනවා. මේ පිළිබඳ ජනතාවගේ දැනුවත්වීම වැදගත්. දහ නවය සංශෝධනයක් ඇති වුණා. මෙය ගෙන ඒමට වට පිටාව සකස් වුණේ 2010 දහ අට සම්මත වීමත් සමඟ. 18න් සියලු බලතල ජනාධිපතිවරයා පවරා ගනු ලැබුවා. සම්පූර්ණ බලය එක පුද්ගලයකු මත කේන්ද්‍රගත කිරීමට උත්සාහ කළා. ඒ කාලයේ රජය බාරයේ සිටි එකසිය ගණනක් මරා දැම්මා. නඩු විභාගයක් නෑ. පොලිසියේ කොළකැල්ල විතරයි. මාධ්‍ය ආයතනවලට පහර දුන්නා. කිසිම නඩුවක් නෑ. අධිකරණ තීන්දු ස්වාධීනව තිබුණු අවස්ථා නැති වුණා. ශිරානි බණ්ඩාරනායක ඇදලා දැම්මා. රටේ නීතිය විනාශ වුණා. අධිකරණ ස්වාධිනත්වය විනාශ වුණා. එක පුද්ගලයකු සතුව බලතල පිහිටීම රට විනාශ වීමට හේතුවක්.

2015 නැවත ආණ්ඩුවක් ආවා. ඒ ආණ්ඩුව පොරොන්දු වුණා පළමුවෙනි දින සියයේ නැවත ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම. මානව හිතවාදී සමාජයක මූලික පදනම. ජනමත විචාරණයකට කාලයක් තිබ්බේ නෑ. දහනවය ඉදිරිපත් කළා. දෙසිය විසිපහෙන් දෙසිය විසිහතරක් පක්ෂව ඡන්දය දුන්නා. ඒ තරම් ඒක වැදගත්. එදා විරුද්ධ පක්ෂයත් ඡන්දය දුන්නා. එහි දුර්වල ස්ථාන කීපයක් තියෙනවා.

සිරිසේන -වික්‍රමසිංහ මේ රටේ දුර්වල කාලපරිච්ඡේදයක්. එහෙම තිබ්ලත් මාධ්‍ය ආයතනවලට පහර දුන්නේ නෑ. අමු අමුවේ මරා දැම්මේ නෑ. 19න් ජනතාව නිදහසේ අදහස් ප්‍රකාශ කළා. අල්ලස් හෝ දූෂණ කොමිසන් ශක්තිමත් වුණා. ජනාධිපති කාර්යාලයේ පුද්ගලයොත් අල්ලා ගත්තා.

වෙනසක් ඇති කළා. 19න් මානව හිමිකම් කොමිෂන් සභාව පත් කිරීම ව්‍යවස්ථා සභාවේ කොටසක් කළා. විධායකයේ බලතල අඩුකළා. ඇමැතිවරු සීමා කළා. පාර්ලිමේන්තුව ශක්තිමත් වුණා.

විස්සෙන් මොකද කරන්නේ. ව්‍යවස්ථාදායක සභාව සම්පූර්ණයෙන් අහෝසි කරනවා. විස්සෙන් අධිකරණයට දැඩි ලෙස බලපෑම් එල්ල වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, අභියාචනාධිකරණ විනිසුරු පත් කරන්නේ ජනාධිපති.

ජනාධිපති පාර්ලිමේන්තුවට වග කියන්නේ නෑ.ජනාධිපති ඔහුගේ වචන චක්‍රලේඛ ලෙස පිළිගන්න කියනවා. මගේ පනත සම්මත නොකළොත් විසුරුවනවා කීවොත් විසුරුවන්න ඕනෑ. පාර්ලිමේන්තුව බාල්දු වෙනවා. ඇමැතිවරු පත් කරන්නේ ජනාධිපති. දහනවයෙන් ඇමැතිකම් සීමා කළා. විස්සෙන් ඇමැතිකම් ඕනෑ තරම් පුළුවන්. විස්සෙන් මානව හිමිකම් කොමිසන් සභාව බාල්දු වෙනවා. පාර්ලිමේන්තුවට තියෙන ලොකුම බලය මුදල් බලය. අධික්ෂණය රජයේ විගනණාධිපති. 19 විගණනාධිපති ස්වාධීන කළා. විස්සෙන් අගමැති ගිණුම ජනාධිපති ගිණුම විගණනය කරන්න බෑ. 51% කොටස් තියෙන රාජ්‍ය සමාගම් ඒවා විගණනය කරන්න බෑ. ඒ නිසා විස්ස කොහොම හරි අහෝසි කළ යුතුයැයි අධි නීතිඥ ලාල් විජේනායක මහතා පැවසීය.

## විධායක ජනාධිපති ධුරයේ කැටිව තිබූ

# අසීමිත බලතල නියාමනය කරන්න 19න් අපට හැකි වුණා

## සමගි ජන බලවේගයේ හබරාදුව ප්‍රධාන සංවිධායක නීතිඥ තාරක නානායක්කාර

**නදී මාණික්කගේ**



ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ නිහඬ අරගලයක් ගෙනයන බව පෙනෙන්න ඇති බවත් 20 හරහා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය නැති කිරීමට කටයුතු කර ඇති බවත් සමගි ජන බලවේගයේ හබරාදුව ප්‍රධාන සංවිධායක නීතිඥ තාරක නානායක්කාර මහතා ඊයේ (02) සමගි ජනබලවේගය ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදී පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීය.

අද ලංකාවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය බරපතළ අර්බුදයකට ලක්ව ඇති කාලෙක තමයි අප මේ සාකච්ඡාව කරන්නේ. මේ ආණ්ඩුව 20 ගෙනත් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය නැත්තටම නැති කරන්න හදන්නේ. විධායක ජනාධිපති ධුරයේ කැටිවෙලා තිබුණු අසීමිත බලතල යම්කිසි නියාමනයකට ලක් කරන්න අපට 19න් පුළුවන්කම ලැබුණා. නීතියට ඉහළින් තිබුණු විධායක ජනාධිපතිවරයාගේ ක්‍රියාපටිපාටිය ගැන මූලික අයිතිවාසිකම් නඩු පවරන්න ජනතාවට හැකියාව ලබා දුන්නා. රටේ ප්‍රධාන තනතුරු පත් කිරීමේ බලතල ජනාධිපතිවරයාගෙන් විතැන් කර කමිටුවකට ඒ බලතල ලබා දුන්නා. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයක් අප හඳුන්වා දුන්නා.

ඒත් 20 හරහා ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා බලාපොරොත්තු වෙන්නේ පාර්ලිමේන්තුවට දුන් ඒ බලතල නැවතත් ගන්න. ඒ අඩුකර තිබුණු බලය නැවත ප්‍රතිස්ථාපනය කරන්න. අධිබලැති විධායක ජනාධිපතිවරයකු බිහිකර ගැනීමට තමයි මෙයාලා සැරසෙන්නේ. ඉස්සරහට ස්වාධීන කොමිෂන් සභාවල සභාපතිවරු පත්කරන්නේ ජනාධිපතිවරයා විසින්. නීති ක්ෂේත්‍රයේ ඉහළම තනතුර වන අග්‍ර විනිශ්චයකාරවරයා පත්කරන්නේ ජනාධිපතිවරයා විසින්. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික කුලුනු තුන වන ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යන තුනෙහි තුලනය පිළිබඳ විශාල ගැටලුවක් ඇති වෙනවා. ජනාධිපතිවරයා පත් කළ නිලධාරියකුගෙන් වරදක් වූ විට ඒ වෙනුවෙන් ජනතාවට මූලික අයිතිවාසිකම් පෙත්සමක් දැමීමේ බලය පවා අද අහිමි වෙලා තියෙනවා. එක පුද්ගලයෙක් ඉලක්ක කර ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවට ඉදිරිපත් වීමේ අවස්ථාව ඇති කර තියෙනවා. ද්විත්ව පුරවැසියෙක් ලෙස දෙමළ ඩයස්පෝරාවේ සාමාජිකයකුට පවා මේ හේතුවෙන් පාර්ලිමේන්තුවට එන්න පුළුවන්. ඒක ලංකාවේ ස්වෛරීත්වයට හානි වෙන දේවල් වෙන්න පුළුවන්.

රිෂාඩ් බදියුදීන් මහතා කෙරෙහි අපේ විරෝධයක් නැහැ. ඒත් පහුගිය කාලේ බැනර් ගහලා තිබුණා රිෂාඩ් බදියුර්දින්ට පක්ෂව කටයුතු කර ගමට එන්න එපා කියලා. එහෙම කටයුතු කළ අය කන්න ඕනෑ වුණාම කබරගොයා තලගොයා බවට පත් කරගෙන තියෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව ඇතුළේ නිහඬ අරගලයක් අරන් යන බව පේන්න තියෙනවා. චන්ද්‍රිම වීරක්කොඩි වගේ මහත්වරු මේ ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව කටයුතු කරනවා. ඒ අය කියන්නේ ව්‍යවස්ථා සංශෝධනයකින් ඒකාධිපතිත්වයකට යන්න දෙන්නේ නෑ කියලා. දයාසිරි ජයසේකර මහත්තයා කියනවා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයා බරපතළ කලකිරීමක ඉන්නේ කියලා. ආණ්ඩුවට බරපතළ සැකයක් තියෙනවා. ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ගේ ඡන්දය ලැබෙයිද නැද්ද කියලා. ඒකයි පිළිකුලෙන් හෙළා දැකපු රිෂාඩ් බදියුදීන් වැනි අයව අතට අත දීලා පිළිගන්න වෙලා තියෙන්නේ.





# සුවඳට තැළෙන 'කබල්' ජීවිත



"ටං... ටං...ටං... මලකඩ ගෑවුණ ඇඳුමක් ඇඳගෙන, නිහාල් බිම බලාගෙන යකඩ තාර බැරල් පියනක් මිටියකින් තළනවා. ටිකක් එහායින් චමින්දත් යකඩ රවුමක ලස්සනට හැඩ තල තිය තිය මිටියකින් තළනවා. චමින්ද ළඟින්ම ඉඳගෙන ඩිලානුත් හැඩ කරපු රවුමට රිවට් ඇණයක් ගහලා හැඬලයක් සවි කරනවා. මේ තුන් දෙනාම බිම බලාගෙන වැඩ. හරියට මැෂින් වගේ. කොළ පාට තීන්ත ගාපු දුම් කබල් ගොඩක්ම පැත්තකින් ගොඩ ගහලා. කබල් කිව්වට අලුතෙන් තීන්ත ගාලා දිලිසෙනවා. බුදුන්ට දෙවියන්ට දුම් අල්ලන්න හදන මේ පොඩි බඳුනට දුම් කබල නොකියා කියන්න වෙන වචනෙකුත් නැහැ.

බුදුන් වහන්සේගේ පා පහස ලද ශුද්ධ වූ පුරවරයක් තමයි කැලණිය. "උපන් දා සිට කරපු පවු නැත වරක් වැන්දොත් කැලණියේ" කියල තමයි කියන්නේ. කැලණියේ හදන මේ දුම් කබල් ලංකාව පුරාම බෙදා හරිනවා. ජීවිතයේ හබල් ගාගෙන කබල් හදන මේ මිනිස්සුන්ගෙ ජීවිත ඒ තරමටම සුන්දර නැහැ. මේ කතාව ඒ ගැන.

"මේකට අපි මුලින්ම තාර බැරල් තමයි ගන්නේ. ප්‍රාදේශීය සභාවෙනුයි නගර සභාවෙනුයි අයින් කරන තාර බැරල් වෙන වැඩ පොළවල් වලින් අපි ගන්නවා." එහෙම කියන ගමන් නිහාල් ඔළුව උස්සලා බැලුවා.

තාර බැරල්...... මම ප්‍රශ්නාර්ථයක් එක්ක වට පිට බැලුවා. හැම තැනම තියෙන්නේ යකඩ පියන්. යකඩ තැටි.

"තාර බැරල් එකේ පියන් දෙක තමයි මම ගේන්නේ. බැරල් එකේ ශීට් එකෙන් ඒ වැඩ පොළවල්වල අය පාන් තැටි ගහනවා, විල් බැරෝ තට්ටු ගහනවා. බාල්දි හදනවා. යාපනේ යවන්න ට්‍රන්ක පෙට්ටි ගහනවා. අපට දෙනවා මේ පියන් දෙක. ඒ වගේ වැඩ පොළවල් කීපයක්ම සේදවත්ත, වනවාසල තියෙනවා.

ප්‍රාදේශීය සභාවයි නගර සභාවයි ටෙන්ඩර් දාලා මේ හිස් තාර බැරල් විකුණනවා. එහෙම එකපාර ගන්න තියනව නම් හොඳයි. අපට එච්චර සල්ලි නැහැ. දැන් අපි මේවා ගන්නේ එක පියනක් රුපියල් 40කට. ටෙන්ඩර් දානකොට ගන්න තිබුණ නම් එක පියනක් රුපියල් 10කට වගේ ගන්න පුළුවන්. ලොකු සල්ලිකාරයො ඒවා අරගෙන අපට වැඩි ගණනට විකුණනවා. මම එක පාර බැරල් පියන් දාහක් වගේ ගේනවා. ඒගොල්ලො මේ පියන් පුච්චලා තාර ඇරලා තමයි අපට දෙන්නේ."

කළු පාට වූ බිත්ති, සිමෙන්ති දැමූ රළු බිම. හැමතැනම යකඩ කුඩු. එකම එක පුටු කබලක් තිබුණා. මම ඒක ඇදල අරගෙන ඒකෙ වාඩි වුණා. ඇත්තටම ඒක කම්මලක් වගේ කටුක වැඩබිමක්.

"මේක අපේ ගේ. අපි ඉන්නෙත් මේකෙමයි. වැඩපොළ කරන්නෙත් මේකෙමයි" නිහාල් කරන වැඩේ මඳකට නවත්වලා දොඩමලු වුණා. "මට දැන් අවරුදු 52යි. නෝනයි දරුවො දෙන්නයි ඉන්නෙත් මේකෙමයි. ලොකු ළමයා රස්සාවක් කරනවා. අනිත් එක්කෙනා ඉස්කෝලෙ යනවා. මම දැන් අවුරුදු විස්සක් තිස්සෙ මේ දුම් කබල් රස්සාව තමයි කරන්නේ. මගේ තාත්තත් මේක කළා. දරුවො මේකට කැමැති නෑ. මගෙන් පස්සේ කවුරුත් මේ රස්සාව කරන්නෙ නැහැ. මේක හරි අමාරු වැඩක්. ඇඟ පත පුරාම මජං නාගෙන ඉන්නෙ. මේ යකඩවල ඩස්ට් එකත් තියනවා. මම දැන් ඒකට හොඳට හුරුයි. මගෙ ළඟ තුන් දෙනෙක් වැඩ කරනවා."

චමින්දට අවුරුදු 48යි. ඔහු තනිකඩයි. හැබැයි මැෂින් එකක් වගේ වැඩ.

ඔහු තාර බැරල් පියනක් අරගෙන විශාල කතුරකින් රවුම් රවුම් කපනවා.

"එක පියනකින් රවුම් හයක් කපන්න පුළුවන්. සමහර ඇද වෙච්ච පියන් තිබුණොත් රවුම් හතරක් පහක් වගේ තමයි කැපෙන්නේ."

රවුම් ගොඩක් කපා ගෙන ඉවර වුණු චමින්ද ඊළඟට බිම ඇන තියාගෙන වාහනයකින් ගලවපු රෝදයක හබ් එකක් උඩ තියාගෙන මිටියකින් ගහ ගහ ඒ රවුම්වල දාර වගේ හැඩ තියනවා. හරියට ඉලෙක්ට්‍රික් මැෂිමක් වගේ වේගවත්.

මේගොල්ලො ළඟ තියන ආයුධ තමයි මේ හබ් එක (ඒකට නිහාල් කිව්වෙ වීල් එක කියලා) රේල් පීලි කෑල්ලක්, යකඩ පට්ටමක්, යකඩ කපන කියත සහ මිටිය.

"මේ රවුම් හතරක් පහක් එකට අරගෙන වීල් එක උඩ තියලා මිටියෙන් ගහලා මේ විදියට රැල්ල තියනවා. ඊට පස්සේ ඇද අරිනවා."

එහෙම කියන ගමන් නිහාල් රේලි පීලි කෑල්ලක් උඩ තියාගෙන අර රැලි තියපු රවුමෙ ඇද ඇරියා.

"මේකෙන් තළලා තමයි අපි ලස්සන කරන්නේ."

මේ රැලි කරලා හදපු රවුමට යටින් තවත් පුංචි රවුමක් රැලි කරලා බිම තියන්න පුළුවන් රඳවනයක් ඒකට සවි කරනවා. ඊට පස්සෙ හැඬල් එක සවි කරනවා. මේ රඳවනයත් හැඬලයත් සවි කරන්නේ රිවට් ඇනවලින්. මේවා කපන්නේ පාන් තැටි කපලා ඉතිරි වෙන තහඩු කෑලි වලින්. දුම් කබල් පාට කරන්නේ අන්තිමට.

"මම තීන්ත ගේන්නේ ප්‍රෙස් එකකින්. සුළු ගාණකට ගේනවා. එයාලා දෙන පාටක් තමයි මේවට ගාන්නේ. මේ දුම් කබලක් මම දෙන්නේ රුපියල් 40ට. මුදලාලිලා ඒවා රුපියල් 100ට 150ට විකුණනවා. අපි මහන්සි වෙනවා විතරයි."

එහෙම කියන කොට නිහාල්ගේ මූණ ටිකක් අඳුරු වෙලා මැලවුණා.

බිම ඇන තියාගත්ත ඩිලාන් හැඩ කරපු රවුම්වලට හැඬලය සවි කරනවා. ඔහුත් හරිම වේගවත්. අර රේලි පීලි කෑල්ල උඩ තියාගෙන හුස්ම ගන්නවටත් වඩා වේගයෙන් රිවට් ඇණයක් ගහලා හැඬලය සවි කරනවා. ඩිලාන්ට අවුරුදු 41යි. ඔහුත් විවාහකයි. දරුවො තුන් දෙනෙක්ගෙ තාත්තා කෙනෙක්.

"අපි දැන් මේ රස්සාවට හුරු වෙලා ඉන්නේ දවසට දුම් කබල් 240ක් හදනවා. කෑලි ගණනට තමයි ගෙවන්නේ. අපිට ජීවත් වෙන්න ඒ ගාන ඇති."

අඩු ආර්ථික මට්ටමක ජීවත් වෙන මොවුන්ගේ එකම ජීවනෝපාය මාර්ගය දුම් කබල් හැදීම. නමුත් පාට ගාලා දිලිසෙන දුම් කබල වගේ ඔවුන්ගේ ජීවිත දිලිසෙන්නේ නැහැ. ඒවා හරිම කටුකයි. හරියට දුම් කබලට දාන පොල් කටු අඟුරු වගේ.

පන්සලේ බෝ මළුවේත්, දේවාල ගෙය තුළත්, බොහෝ නිවෙස් තුළ මෙන්ම ආයතන, කඩ සාප්පු ආදී බොහෝ ස්ථානවලට නැතිවම බැරි දෙයක් තමයි දුම් කබල. උදේට කහ දියර ඉහලා දුම් අල්ලලා තමයි බොහෝ ව්‍යාපාරිකයන් තමන්ගේ ව්‍යාපාර කටයුතු අරඹන්නේ.

ශ්‍රී ලංකාව දැන් නව තාක්ෂණය අතින් ඉතා ඉහළ මට්ටමක සිටිනවා. නමුත් මේ මිනිසුන් පරිසරයෙන් සොයා ගත් ආම්පන්න කිහිපයකින් ඉතා දුක සේ මෙම දුම් කබල් රස්සාව කරගෙන යනවා.

"අපටත් මේ දුම් කබල් හදන්න කරන්ට් එකෙන් වැඩ කරන මැෂින් එකක් තිබුණ නම් හොඳයි." නිහාල් ඔවුන්ගේ ගැටලු කිහිපයක් ඉදිරිපත් කළා. "යකඩ කපන මැෂිමක්, මේ රැල්ල තියන්න මැෂින් එකක් වගේ තිබුණ නම් හොඳයි. සමහර අය මේවා කරන්නේ මැෂින්වලින්. අපෙන් පස්සෙ මේවා කරන්න කවුරුත් නැහැ. මේ කර්මාන්තය දිගටම කරගෙන යන්න නම් අපට මැෂින් තියෙන්න ඕනෑ."

දුම් කබල් සියල්ල වැල් වශයෙන් අමුණා තිබුණා. එක වැලක දුම් කබල් 12ක්. එක වැලක් රුපියල් 480ක් වැනි මුදලකට කඩවලට දෙන බවයි නිහාල් පැවසුවේ.

"අපට දෙන්නේ එක වැලකට රුපියල් 480යි. ඒගොල්ලො ඒවා රුපියල් 700ට 800ට විකුණනවා. මම වැඩිපුර දාන්නේ කොළඹ කඩවල්වලට. සයිකලේ පටවගෙනත් යනවා. දැන් ටිකක් සනීප නැති නිසා ත්‍රීවීල් එකක පටවගෙන කොළඹට යනවා. මේ ව්‍යාපාරෙන් සෑහෙන්න කොටසක් ජීවත් වෙනවා. මම දැන් කරන්නේ සුළුවට නේ. මේ කර්මාන්තය තව දියුණු කර ගත්තොත් තව පවුල් ගානකට ජීවත් වෙන්න ආදායම් මාර්ග හැදෙනවා."

"තහඩු ගේන්නත්, හදන බඩු අරගෙන යන්නත් සෑහෙන මුදලක් මට වියදම් වෙනවා. ඉස්සර මං ළඟ දහ දෙනෙක් විතර වැඩ කළා. දැන් ඉන්නේ තුන් දෙනයි. එයාලා හදන කෑලි ගාණට මම ගෙවනවා. මේ දුම් කබල් වලට ඉල්ලුම හොඳට තියෙනවා. මට ඉඩකඩ ප්‍රශ්නය සහ මැෂින් ප්‍රශ්නය තමයි තියෙන්නේ. ලොකු වැඩපොළවල්වල කරන දේවල් අපටත් කරන්න පුළුවනි. ඒත් ඒවට යටකරන්න මුදල් මං ළඟ නැහැ"

නිශා, එයාගෙ හරි නම කුමාර, ඔහු තමයි සයිකලේ බැඳගෙන දුම් කබල් අරගෙන යන්නේ. කෙසඟ සිරුරක් තිබුණට ඔහුත් හරිම කාර්ය සූර ලෙස වැඩ කරනවා.

තහඩු වගේම තැලෙන ජීවිත අතරින් මට සමුගන්න කාලය ඇවිත් තිබුණා. දුම් කබල් අදත් හෙටත් අනිද්දාටත් හැම දාටමත් ඕන වෙනවා. මොකද අප රටේ ඉන්නේ කුමක් හෝ ආගමක් අදහන මිනිසුන්. ඔවුන් තමන්ගේ ආගම දහමට මුල් තැන දී කටයුතු කරනවා. දුම් අල්ලා යළිත් හෙට දිනයේත් දුම් ඇල්ලීමට දුම් කබල ආරක්ෂා සහිතව තබනවා සේම දුම් කබල් හදන මේ දුක් විඳින නිහාල් ලා ද ආරක්ෂා කර ගත යුතු යැයි මට සිතේ.

ටං....ටං.... ශබ්දය නොනවත්වාම ඇහෙනවා. ඒ අතරින් සද්දය පිටට එන්නෙ නැති ඔවුන්ගෙ හදවත්වල හඬ මට ආයෙමත් ඇහෙනවා. ඒත් එක්කම දුම්මල සුවඳ ද ගිනිගත් කබල ද මට මැවෙනවා, දැනෙනවා. ඔව් ඒ ජීවන සුවඳයි.

**චතුමී පිටිපන**
**ඡායාරූප - රොෂාන් පිටිපන**



# සරසවිය නිර්මාණශීලී අදහස්-කුසලතාවලින් පිරි තෝතැන්නක් බවට පත් කළ යුතුයි

## උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ

චන්දිමා කරුණාරත්න

විශ්වවිද්‍යාල පද්ධතිය විභාග අරමුණු කර ගත් ක්‍රියාවලියෙන් බැහැරව නිර්මාණශීලී අදහස් සහ කුසලතාවලින් පිරි තෝතැන්නක් බවට පත් කළ යුතු බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී පසුගියදා (30) පැවති මානව ශාස්ත්‍රීය හා සමාජ විද්‍යා පීඨයේ පීඨ ප්‍රකාශන දිනයට සහභාගි වෙමිනි.

එහිදී 'රන් රසු නිර්මාණ සංග්‍රහය' සහ මානව ශාස්ත්‍රීය හා සමාජ විද්‍යා පීඨයේ ළමයින් විසින් කොරෝනා වසංගත කාලයේදී රචනා කරන ලද පද්‍ය කාව්‍ය එකතුවක් වන 'දිසි විදෙසි' නමින් ද, මානව ශාස්ත්‍රීය හා සමාජ විද්‍යා පීඨයේ මහාචාර්යවරුන් විසින් රචිත පොත් සහ විශ්වවිද්‍යාල සිසුන් විසින් රචිත පොත් ද එළි දැක්වීම සිදු කෙරිණි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද ප්‍රකාශ කළේය.

'විශ්වවිද්‍යාල දරුවන් හෙට ලෝකයට ගැළපෙන ආකාරයට නව සිතුවිලි සහ නිර්මාණාත්මක අදහස්වලින් පිරිපුන් පිරිසක් විය යුතුයි.

අනාගත ලෝකයේ වැඩිදියුණුවට මූලික අඩිතාලම වන්නේ එයයි. අභියෝග ජය ගනිමින්, ප්‍රශ්නවලට මුහුණදීමේ හැකියාව ඇති කළ යුතුයි. නිර්මාණාත්මක බව වැදගත් වන්නේ අභියෝග ජයගැනීමටයි. එහිදී විභාග මූලික කර ගත් අධ්‍යාපන ක්‍රමයෙන් බැහැරව දරුවන්ට නිර්මාණාත්මකව හිතන්න වෙලාවක් ඇති කරන්න අවශ්‍යයි.

රටේ අනාගතය භාරගැනීමේ වගකීම මේ විශ්වවිද්‍යාල සිසුන්ට පැවරෙනවා. එහිදී මේ ළමයින් ලෝකය වෙනස් කරන ක්‍රියාවලියේ මූලිකත්වය ගන්නවා. ළමයින් ලෝකය වෙනස් කළ යුතුයි. ලෝකය ගමන් කරන ආකාරයට අප හැඩගැහෙන්න ගියොත් ගැටලුවක් ඇති වෙනවා.'

ප්‍රවීණ සාහිත්‍යවේදී චූලානන්ද සමරනායක මහතා

'දේශපාලනඥයන් අතින් සාහිත්‍යකරුවන් සම්මාන ලබා ගත යුතු නෑ. විශ්වවිද්‍යාල දරුවන් රැකියා අභිමුඛ වෙළෙඳපොළට ඉලක්ක ගතව බිහි කරනවාට වඩා නිර්මාණාත්මක හැකියාවලින් යුත් පුද්ගලයන් පිරිසක් බවට පත් කරන්න අවශ්‍යයි. විරැකියාව රටේ ප්‍රශ්නයක් නොවෙයි. එය පුද්ගලයන්ගේ පෞරුෂය සම්බන්ධ ප්‍රශ්නයක්.

විශ්වවිද්‍යාල පද්ධතියෙන් නිර්මාණකරුවන් බිහි කළ යුතුයි. නිර්මාණශීලී මිනිසුන්ට අභියෝග ජයගැනීමේ හැකියාව තිබෙනවා. ඒ අනුව විශ්වවිද්‍යාල පද්ධතිය 21 වන සියවසේ අභියෝගවලට මුහුණ දිය හැකි ළමයින් පිරිසක් සමාජයට බිහි කළ යුතුයි.

කොරෝනා වසංගත තත්ත්වයෙන් පසුව ලෝකය වෙනස් වී තිබෙනවා. එහිදී විශේෂයෙන්ම නිර්මාණාත්මක අදහස් සහ හැකියාවන් තිබෙන අයට ලෝකයේ ඉඩකඩ විවරවී තිබෙනවා.

ඒ වගේම මෙහිදී අප සමග සිටින අනිත් අයව හඳුනාගැනීමේ කලාව වැදගත් වෙනවා. අනික් අයව තේරුම්ගැනීමේ හැකියාව පුද්ගලයන්ට අනිවාර්යයෙන්ම තිබිය යුතුයි. අපට හැමදාම හමු වූ දේවල් පවා කලාත්මක ඇසකින් බලන්න පුරුදු වෙන්න. නව්‍යකරණය මෙහිදී වැදගත් අංගයක්.

විශ්වවිද්‍යාල පද්ධතියේ සාහිත්‍ය පෝෂණය කළ යුතුයි. දරුවන් සිතුවිලිවලින් සන්නද්ධ බළකායක් බවට පත් කරන්න අවශ්‍යයි. ඒ වගේම රටේ සංවර්ධනයට විශ්වවිද්‍යාල සිසුන් විසින් ඇති කරන කතිකාවතක් ද ඇති කළ යුතුයි.'

මානව ශාස්ත්‍රීය හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති සිරන්ත හීන්කෙන්ද මහතා

'සමාජයේ සාහිත්‍යයට කතිකාවතක් ඇති කළ යුතුයි. ඒ සඳහා විශ්වවිද්‍යාල සිසුන් පෙරමුණ ගත යුතුයි. ලංකාවේ සාහිත්‍ය පෙරළියක් ඇති කිරීමට විශ්වවිශ්වවිද්‍යාල මට්ටමින් මූලික අඩිතාලම දැමිය යුතුයි.'



මානව ශාස්ත්‍රීය හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති සිරන්ත හීන්කෙන්ද මහතා විසින් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතාට 'රන් රසු' ග්‍රන්ථය පිළිගන්වන අයුරු .

ඡායාරූපය - රොෂාන් පිටිපන

---

දුප්පත්-කුලී-මධ්‍යම පාන්තික පිරිසට

# කඩිනමින් නිවාස හිමි කරදීමේ වැඩසටහනක්

## රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ

උපාලි කරුණාරත්න

ලෝක ජනාවාස දිනයට සමගාමීව දුගී දුප්පත් ජනතාවට, කුලී නිවැසියන්ට සහ මධ්‍යම පාන්තිකයන්ට නිවාස පිරිනැමීමේ වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කර සොඳුරු පරිසරයකදී සොඳුරු රටක් නිර්මාණය කරන බව ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා පැවැසීය. රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේ පෙරේදා (01) 'ඔබට ගෙයක් - රටට හෙටක්' ජාතික නිවාස වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කිහිපයක නව නිවාස ඉදිකිරීමට මුල්ගල් තැබීමේ අවස්ථාවට සහභාගී වෙමිනි. ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ආසනයේ බඩල්ගම, ගුරුල්ලගම, නරියමුල්ල සහ ඕතරවාඩිය ප්‍රදේශවල ඉදි කිරීමට නියමිත නව නිවාස සඳහා රාජ්‍ය ඇමැතිවරයා විසින් මෙහිදී මුල්ගල් තබන ලදි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'මේ වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් නව නිවාස 150කට මුල්ගල් තැබීම් සිදු කිරීමට නියමිතයි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත අගමැති සහ නිවාස ඇමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය පෙබරවාරි මාසයේදී මේ ජාතික නිවාස වැඩසටහන ආරම්භ කළා. මේ යටතේ ග්‍රාම සේවා මට්ටමින් දිවයින පුරා නිවාස 14,022ක් ඉදි කරනවා.'

එදා ප්‍රජාතන්ත්‍රවාදය මෙන්ම පරිසරය ද විනාශ කර දැමූ අය අද මෙරට ආර්ථිකය සම්බන්ධයෙන් කුමන ප්‍රකාශ සිදු කළත් රටේ ආර්ථිකය ශක්තිමත් සහ සුරක්ෂිතවී තිබෙනවා. ත්‍රස්තවාදී යුද්ධය ජය ගත්තා සේම, කොවිඩ් සාර්ථකව පාලනය කළා සේම, ආර්ථික යුද්ධය ද සාර්ථකව ජය ගන්නා ආකාරය හොඳින් බලාගෙන සිටින්න.

---

# අනාගත පරපුර මත් රකුසාගෙන් බේරාගැනීමේ පුළුල් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සූදානම්

## පුරවැසි ලංකා පදනමේ සභාපති භාරත ජේ. උඩගෙදර

අනුර ප්‍රේමලාල්

මෙරට අනාගත දරු පරපුර මත් රකුසාගෙන් බේරාගැනීමට පුළුල් වැඩපිළිවෙළක් සෑම පාසලකම ක්‍රියාත්මක කිරීමට සූදානමින් සිටින බව පුරවැසි ලංකා පදනමේ සභාපති භාරත ජේ. උඩගෙදර මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ පසුගියදා (30) කොළඹ පැවති මාධ්‍ය හමුවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'දැනටමත් දරුවන් මත්ද්‍රව්‍ය වගේම තවත් නොමඟ යවන ක්ෂේත්‍ර ගැන හඳුනා ගනිමින් ඒ පිළිබඳ දරුවන් හා දෙගුරුන් දැනුවත් කිරීමට පොලිසියේ සහයෝගය ඇතිව මූලික කටයුතු සිදු කරමින් සිටිනවා. දුෂ්කර පළාත්වල යටිතල පහසුකම් නොමැති පාසල්වලට එම පහසුකම් ලබාදීමට දැනටමත් අයදුම්පත් කැඳවා තිබෙනවා. ඒවා නිරීක්ෂණය කර එම ආධාර ලබාදීමේ 'සිසු ශක්ති' නමින් ක්‍රමවේදයක් ද පුරවැසි ලංකා පදනම ක්‍රියාත්මක කරනවා. එමෙන්ම භික්ෂූන් වහන්සේ ඇතුළු අනෙකුත් ආගමික නායකයන් වයෝවෘධ අවස්ථාවේ උපස්ථාන කර ඖෂධ ලබාදීමේ ආධාර ක්‍රමයක් ද ආරම්භ කරනවා.

අධ්‍යාපනයට දක්ෂතා ඇති නමුත් දිළිඳුකම ඊට බාධාවක්ව තිබෙන දරුවන්ට අතහිත ලබාදීමේ වැඩසටහනක් ද දැනටමත් ක්‍රියාත්මක කරනවා. අපේ අනාගත පරපුර රැකගැනීම මෙයින් බලාපොරොත්තු වෙනවා. මේ සත්කාර්යයන්ට එක්වීමට කැමති අය සිටී නම් විනිවිද අයුරින් තම පදනම සමඟ එක්ව කටයුතු කළ හැකියි.'

---



රුපියල් මිලියන 55ක වියදමකින් ඉදි කළ වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව ශ්‍රවණාගාරය විවෘත කිරීම වාරිමාර්ග ඇමැති, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙරේදා (01) සිදු වූ අයුරු. වවුනියාව දිසාපති එස්. එම්. සමන් බන්ධුලසේන, උතුරු පළාත් ආණ්ඩුකාරවරිය වන පී. එම්. එස්. චාර්ල්ස්, ආරක්ෂක ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහත්ම මහත්මීහු සහ වන්නි දිස්ත්‍රික්කයේ සියලු මන්ත්‍රීවරු ද, රාජ්‍ය ප්‍රධානීහු ද මේ අවස්ථාවට සහභාගී වූහ.

ඡායාරූපය - උතුරු පළාත් විශේෂ

---

# මෙරට සංචාරක-ආයෝජන ප්‍රවර්ධනයට කැනේඩියානු රජයේ පූර්ණ සහාය



මහින්ද අලුත්ගෙදර

කොවිඩ්-19 වසංගතය පහව යෑමෙන් පසු මෙරට සංචාරක හා ආයෝජන ක්ෂේත්‍ර නංවාලීමට සිය පූර්ණ සහාය ශ්‍රී ලංකාවට ලබා දෙන බවට කැනේඩියානු රජය සහතික වෙයි.

ඒ සඳහා අවශ්‍ය සියලු සහයෝගය ලබාදීමට කැනඩා රජය කැමැත්තෙන් සිටින බව ශ්‍රී ලංකාවේ කැනේඩියානු මහ කොමසාරිස් ඩේවිඩ් මැකිනොන් මහතා පවසයි.

සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා සමඟ සංචාරක ඇමැති කාර්යාලයේදී පසුගියදා (30) පැවති විශේෂ හමුවේදී මහ කොමසාරිස්වරයා මේ බව සඳහන් කළේය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'පවතින තත්ත්වය යටතේ නව සංචාරක සැකසුම් සහ ක්‍රමෝපායන් පිළි රජයේ අවධානය යොමු වී තිබෙනවා. ගුවන්තොටුපොළ විවෘත කිරීමෙන් පසු සංචාරකයන් කණ්ඩායම් වශයෙන් ශ්‍රී ලංකාවට ගෙන්වීමේ සැලසුමක් දැනටමත් සකස් කර තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය එළැඹෙන ශීත කාලයේදී කොවිඩ්-19 පැතිරීමේ වර්ධනයක් ඇති විය හැකි බවට අනතුරු අඟවා ඇති නිසා ගුවන්තොටුපොළ විවෘත කිරීම කල් යා හැකියි.'

කැනඩා මහ කොමසාරිස් ඩේවිඩ් මැකිනොන් මහතා 'කොවිඩ් වසංගතය හේතුවෙන් ලෝකයේම සංචාරක කර්මාන්තය අර්බුද රැසකට මුහුණ පා සිටිනවා. ශ්‍රී ලංකාව කොවිඩ් පාලනය කිරීමට ගත් ක්‍රියාමාර්ග ඉතා ප්‍රශංසනීයයි. ශ්‍රී ලංකාව ඉතා සුන්දර රටක්. ඒ නිසාම බටහිර රටවල සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණීමට වැඩි උනන්දුවක් දක්වනවා.

කොවිඩ්-19 ලෝකයේ පාලනය වීමත් සමඟ ශ්‍රී ලංකාව සංචාරක ක්ෂේත්‍රයේ වැඩි ආකර්ෂණයක් දිනා ගන්නා රටක් බවට පත් වෙනවා. එලෙස මෙරටට පැමිණෙන සංචාරකයන් පිළිගැනීමට ශ්‍රී ලංකාව සූදානම්. කොවිඩ්-19 පැතිර යෑම වැළැක්වීමට ගත යුතු සහ ගත හැකි උපරිම ආරක්ෂක පියවර ද අනුගමනය කරමින් ඔවුන් රැක බලාගැනීමට සූදානම්.

සංචාරක අමාත්‍යාංශ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා ද මේ සාකච්ඡාවට එක් විය.

---

# විදේශ රැකියා සඳහා අවශ්‍ය පවුල් පසුබිම් වාර්තා නිර්ණායකයන් නැවත අධ්‍යයනයට පියවර

## රාජ්‍ය ඇමැති පියංකර ජයරත්න

අනුර ප්‍රේමලාල්

කාන්තාවන් විදේශ රැකියා සඳහා යොමුවීමේදී අවශ්‍ය කරන පවුල් පසුබිම් වාර්තාව අනුමත කිරීමට නිර්දේශ කරන නිර්ණායකයන් නැවත අධ්‍යයනය කර වර්තමානයට ගැළපෙන ලෙස සැකසීමට පියවර ගන්නා බව විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපොළ විවිධාංගිකරණ රාජ්‍ය ඇමැති පියංකර ජයරත්න මහතා ප්‍රකාශ කරයි.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව පැවැසුවේ ඉකුත්දා (30) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති සිය අමාත්‍යාංශයට අයත් සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවකට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය. පවුල් පසුබිම් වාර්තාවේ නීතිමය තත්ත්වය ඉවත් කිරීමට කටයුතු කරන්නේ නෑ. එහි නිර්ණායක පමණක් වර්තමානයට ගැළපෙන ලෙස සකස් කිරීමට බලාපොරොත්තු වෙනවා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම යටතේ නිපුණ රැකියා බළකායක් පිහිටුවීමට පියවර ගන්නවා. පාසල් අධ්‍යාපනයට විධිමත්ව යොමු නොවූ පිරිසත්, පාසල් හැර ගිය අයගේ අනාගතයටත් අප කුමක් ද කරන්නේ. අද දරුවන් විවිධ විෂමාචාරවලට, මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වෙලා. ඇතැම් අය මත්ද්‍රව්‍ය විකුණා මුදල් ඉපැයීමේ නීති විරෝධී ජාවාරම්වල නිරත වෙලා. එලෙස සිටින රැකියා නොමැති අය තෝරාගෙන විදේශ රැකියා සඳහා පුහුණුවක් ලබා දිය යුතුයි. එක් දිස්ත්‍රික්කයකින් එවැනි අය 2000ක් සම්බන්ධ කරගැනීමට හැකි නම්, ඔවුන් අපට විදේශ රැකියා සඳහා යොමු කරන්න පුළුවන්. ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධවී වැඩපිළිවෙළක් සකස් කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ ඉදිරි පස් අවුරුදු සැලැස්මෙන් මේ සඳහා වැඩපිළිවෙළක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

ජපානයේ ශ්‍රී ලංකා තානාපති සමඟ 2021 සිට වසරකට ජපානයේ රැකියා සඳහා 5000කට අවස්ථාව ලබාගැනීමට ඇති හැකියාව ගැන සාකච්ඡා කළා. මේ සඳහා ජපන් භාෂාව ඉගැන්වීමේ පාඨමාලා ආරම්භ කර පාසල් හැර යන තරුණ පිරිස් මේ සඳහා යොමු කිරීමටත්, ඉදිරියේදී ඒ සඳහා අවබෝධතා ගිවිසුමකට එළැඹීමටත් බලාපොරොත්තු වෙනවා.

අමාත්‍යාංශයේ ලේකම් එස්. අරුමෛනායගම්, අතිරේක ලේකම් යමුනා පෙරේරා, කාර්යාංශයේ සභාපති කමල් රත්වත්තේ, අධ්‍යක්ෂ (පාලන) නිමල් තිබ්බොටුමුනුව සහ පුත්තලම දිසාපති චන්ද්‍රසිරි බණ්ඩාර මහත්ම මහත්මීහු ද මේ අවස්ථාවට එක් වූහ.



---

# පුද්ගලයකු බන්ධනාගාරගත වූ විට වැඩියෙන්ම දුක් විඳින්නේ ඒ පවුලේ දූ-දරුවන්

## රාජ්‍ය ඇමැතිනී, විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ



මංජුල හිරිපිටිය - හෝමාගම සංචාරක

සමාජයේ කෙතැනක හෝ සිදු වූ වැරැද්දක් නිසා පුද්ගලයකු බන්ධනාගාරගත වූ පසු වැඩියෙන්ම දුක් විඳින්නේ, සමාජයෙන් පීඩා ලබන්නේ එම පවුලේ දූ දරුවන් බව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පැවැසුවාය.

රාජ්‍ය ඇමැතිනිය මේ බව පැවැසුවේ වටරැක බන්ධනාගාරයේ පැවති ලෝක ළමා දින සැමරුම සහ සිරකරු පවුල් හමුවට ප්‍රධාන ආරාධිතයා ලෙස එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිනිය මෙසේ සඳහන් කළාය.

'බන්ධනාගාරයෙන් නිදහස ලබා සමාජගත වන පුද්ගලයා ආවේග පාලනය කර ගත්, මනස නිරවුල් කරගැනීමේ ක්‍රමවේද පිළිබඳව අවබෝධයක් ලබා ගත් අයෙක්. බන්ධනාගාර පිරී තිබෙන්නේ කොහේ හෝ සිදුවූ වරදක් හේතුවෙන්. එය මව්පියන් නිසා හෝ සමාජය නිසා හෝ අධ්‍යාපන ක්‍රමයේ පවතින ගැටලු නිසා හෝ විය හැකියි.

රජයත්, පෞද්ගලික අංශයත් එකතුවී කරගෙන යන ඇවන්ට්ගාඩ් ව්‍යාපෘතිය ඉතා වැදගත්. මෙවැනි ව්‍යාපෘතියක් හඳුන්වාදී රැඳවූන් සාර්ථක පුද්ගලයන් ලෙස සමාජගත කිරීම පිළිබඳ මගේ විශේෂ ස්තූතියක් නිශ්ශංක සේනාධිපති මහතාටත්, ඒ මහතාගේ කාර්ය මණ්ඩලයටත් පුද කර සිටිනවා.'

වරදක් සිදු කිරීම නිසා අධිකරණයෙන් බන්ධනාගාරගත කිරීමට නියම කරන පුද්ගලයකු එයින් නිදහස ලබා යළි සමාජගත වන විට ඔහුට හෝ ඇයට ජීවත් වන්නට ක්‍රමයක් තිබිය යුතුයි. තම පවුලේ සාමාජිකයන්ට බරක් නොවී ඔවුන්ගේ ජීවිත ගමනට අත්වැල් සපයන්නට ඔහුට දැතේ කර්මාන්තයක් ඉගැන්විය යුත්තේ බන්ධනාගාරයෙන්. මේ සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව සැලසුම් තිබුණත් ඒ සඳහා අතහිත දෙන්නට සිටින පිරිස අවමයි. මේ ගැන අවධානය යොමු කළ වත්මන් රජය පුනරුත්ථාපන වැඩපිළිවෙළ රැසක් ආරම්භ කර තිබෙනවා. පුනරුත්ථාපනය වන සිරකරුවන් ද මෙයින් නිසි ඵල ප්‍රයෝජනය ලබා ගත යුතුයි.

ඇවන්ට්ගාඩ් සමූහ ව්‍යාපාරය සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව එක්ව සිදු කරගෙන යන රැඳවූවන් රැකියා නියුක්තිකයන් කර සමාජගත කිරීමේ ව්‍යාපෘතියට එක්ව සිටින රැඳවූවන්ට බැංකු ගිණුම් විවෘත කර ඔවුන් වෙත ලබාදීම ද රාජ්‍ය ඇමැතිනිය අතින් මෙහිදී සිදු විය.

ඇවන්ට්ගාඩ් සමූහ ව්‍යාපාරයේ පූර්ණ දායකත්වයෙන් සංවිධාන වූ මේ ළමා දින සැමරුම් උලෙළ සහ සිරකරු පවුල් හමුවට සහභාගී වූ දරුවන්ට ත්‍යාග ලබාදීමත්, වටරැක බන්ධනාගාරයේ පවත්වාගෙන යනු ලබන සුනීත ජාතික පාසලේ දරුවන්ට ත්‍යාග ලබාදීමත් මෙහිදී සිදු විය.

නේවාසික රැඳවූවන්ගේ දරුවන්ට ජීවිතයේ කිසිදු දිනෙක නොදුටු සිය පියා හමුවීමත්, ඔහු සමඟින් කතා කිරීමට හැකියාව ලැබීමත් මෙදින සිදු වූ ඉතා සංවේදී වූ සුවිශේෂී අවස්ථාවකි. මේ වැඩසටහනට සහභාගී වූ සිරකරු පවුල් සමඟ රාජ්‍ය ඇමැතිනිය සුහද කතාබහක ද නිරතවීමට අමතක නොකළාය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය, හිටපු ක්‍රිකට් නායක හෂාන් තිලකරත්න, බන්ධනාගාර කොමසාරිස් පාලන හා පුනරුත්ථාපන චන්දන ඒකනායක, කොමසාරිස් බුද්ධි මෙහෙයුම් තුසිත උඩුවර, වටරැක බන්ධනාගාරයේ අධිකාරී මෝහන්දාස් නිමල් ශාන්ත, ඇවන්ට්ගාඩ් මැන්පවර් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී මේජර් ජනරාල් පී. චන්ද්‍රවංශ, එහි මෙහෙයුම් නිලධාරී මේජර් ජෙනරල් නිමල් ජයසූරිය, හිටපු බන්ධනාගාර කොමසාරිස් ගාමිණී ජයසිංහ මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

AROUND THE WORLD
ලොව වටා



## ටික්ටොක් අඩවියට සජීව ඉදිරිපත් කිරීමකට සූදානම් වූ චීනයේ ලාමුට ඇයගේ හිටපු සැමියා පෙට්‍රල් වත් කර ගිනි තබයි

අනුගාමිකයන් ලක්ෂ ගණනක් සිටින චීන ජාතික ධනාත්මක බලපෑම්කාරිනියක වූ ලාමු නම් කාන්තාවක් එරට ටික්ටොක් අඩවිය වන ඩොවුයින්හි සජීවීව ඉදිරිපත් කිරීමකට සූදානමින් සිටිය දී ඇයගේ හිටපු සැමියා විසින් පෙට්‍රල් වත්කර ගිනි තැබීම නිසා රෝහල්ගතව සිට ජීවිතක්ෂයට පත් වී තිබේ. මේ ප්‍රහාරය නිසා ඇයගේ සිරුරෙන් සියයට 90ක් පමණ පිලිස්සී ඇති අතර ප්‍රහාරයෙන් සති දෙකකට පසු රෝහලේ දී මියගොස් තිබේ. චීනයේ කාන්තාවට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා මේ සිද්ධිය හොඳම අදාහරණයක් යැයි බටහිර සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෝ කියති. 30 හැවිරිදි ලාමු ගැමි ජීවිතය ගැන ප්‍රශංසා මුඛයෙන් කතා කරන ඇයගේ පෝස්ටුවන් වෙත මිලියන ගණන් ලයික් වැටෙන බව වාර්තා සඳහන් කරයි. වීඩියෝ සඳහා අංගරචනා නොයෙදීම ගැන ඇයට බොහෝ දෙනාගේ ප්‍රශංසාව හිමි වී ඇත.

එරට රජයේ මාධ්‍ය ආයතනයක් වන බෙයිජිං යූත් ඩේලි පවසන පරිදි සැප්තැම්බර් 14 වැනිදා අන්තර්ජාලයේ සිටින අතරේ එකවරම ඇයගේ තිරය කළු වී ගොස් ඇත. ටැන්ග් යන වාසගමෙන් හඳුන්වා ඇති ඇයගේ හිටපු සැමියා පිහියක් සහ පෙට්‍රල් බෝතලයක් අතැතිව ඇය සිටින කාමරයට ඇතුළු වී ඒ පෙට්‍රල් ඇයගේ හිසේ සිට වත්කර මේ අපරාධය සිදු කර ඇත.

## බෙල්ජියමේ දෙවන ඇල්බර්ට් රජුගේ අනියම් බිරියගේ දියණිය රාජකීය උරුමය ඇති බවට ගොනු කළ පෙත්සමට අනුමැතිය

බෙල්ජියමේ දෙවන ඇල්බර්ට් රජුගේ අනියම් බිරියගේ දියණිය තමන්ට ද රාජකීය උරුමයක් ඇති බවට අධිකරණය හමුවේ ගොනු කළ පෙත්සමට අනුමැතිය හිමි වී තිබේ. චිත්‍ර ශිල්පිනියක වන 52 හැවිරිදි ඩෙල්ෆින් බොයෙල්ව මේ නිසා මින් අනතුරුව බෙල්ජියමේ කුමරියක ලෙස හැඳින්විය යුතුය. පිය උරුමය වෙනුවෙන් දශකයකට වැඩි කාලයක් නීතිය හමුවේ සටනක නිරත වූ ඇය තමන්ගේ දියණියක බව මේ වසරේ ජනවාරි මස ඇල්බර්ට් රජු විසින් පිළිගත්තේය. ඇයගේ මව වන බරෝනිස් සිබිලි ඩි සෙලිස් ලෝන්ග්චැම්ප් පවසන්නේ ඇල්බර්ට් රජ තනතුරට පත්වීමට පෙර වසර 18ක කාලයක් ඔවුන් පෙම්වතුන් ලෙස සබඳතා පවත්වා ගෙන ගිය බවයි.

## කොවිඩ් රෝග ලක්ෂණ තිබියදී පාර්ලිමේන්තුවට ආ මන්ත්‍රීවරිය තනතුරෙන් ඉවතට





ස්කොට්ලන්ත ජාතික පක්ෂයේ මන්ත්‍රීනියක වන මාගරට් ෆෙරියර් කොවිඩ් රෝග ලක්ෂණ තිබිය දී වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තුව වෙත පැමිණීම කිසිසේත්ම සමාව දිය හැකි වරදක් නොවේයැයි එරට අගමැතිවරයා පවසා තිබේ. තමන්ට සනීප බවක් දැනුණු නිසා මේ ගමනේ නිරත වූ බවත් එහෙත් රෝග ලක්ෂණ ඉස්මතු වූ පසු වහාම තමන් ආපසු පැමිණි බව ඇය කීවාය. ඇයට තනතුරෙන් ඉවත් වන ලෙස විරුද්ධවාදීන් සහ ස්කොට්ලන්ත ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ද එක හඬින් දැනුම් දී ඇත. මේ සිද්ධියෙන් අනතුරුව ඇය පක්ෂයෙන් නෙරපා හැර ඇත. රටේ මිනිසුන් කොවිඩ් වසංගතය මුලිනුපුටා දැමීමට කරන මහත් වෙහෙස නොසලකා මේ ආකාරයෙන් මන්ත්‍රීවරුන් කටයුතු කිරීම නොහොබිනා වැඩක් යැයි චෝදනා එල්ල වී තිබේ.

## ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් මානව හිමිකම් සංවිධානය ඉන්දියාවේ මෙහෙයවීම් නතර කරයි







ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් මානව හිමිකම් සංවිධානය ඉන්දියාවේ මෙහෙයවීම් නතර කිරීමට සූදානමින් සිටියි. ඒ සංවිධානය ප්‍රකාශ කරන්නේ ඉන්දීය රජය මානව හිමිකම් සංවිධානවලට එරෙහිව මර්දනය ක්‍රියාත්මක කිරීමට හේතු සොයමින් සිටින බැවින් මේ තීරණය ගත් බවයි. තමන්ගේ බැංකු ගිණුම් අත්හිටුවා ඇති බවත්, ඒ නිසා කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීමට නොහැකි බැවින් එරට කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි බවත් සංවිධානය වැඩිදුරටත් කියයි. එහෙත් මේ බව ප්‍රතික්ෂේප කරන ඉන්දීය රජයේ ආරංචි මාර්ග පවසන්නේ මානව හිමිකම් ආයතනය සත්‍යය ඉක්මවා කරුණු වැඩියෙන් ඉස්මතු කර පෙන්වන බවයි.

# වනාතමුල්ල 'ඕවල් වීව් රෙසිඩන්සිය' අගමැති ප්‍රධානත්වයෙන් 5 වැනිදා විවෘත වෙයි

**බුද්ධිකා ඉඹුලාන**

රාජ්‍ය සේවකයන් වෙනුවෙන් ඉදි කරන ලද නිවාස 608 කින් යුත් බොරැල්ල, වනාතමුල්ල ඕවල් වීව් රෙසිඩන්සි (Oval view Residence) නිවාස ව්‍යාපෘතිය නාගරික සංවර්ධන හා නිවාස ඇමැති, අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම 5 වැනිදා පෙ.ව. 11.00 ට විවෘත කිරීමට නියමිතය.

සමස්ත ව්‍යාපෘතිය සඳහා මූලික ඇස්තමේන්තු ගත වියදම රුපියල් මිලියන 5500 කි.

රාජ්‍ය සේවකයින් වෙනුවෙන් වූ මෙම නිවාස ව්‍යාපෘතිය 2014 වසරේ නොවැම්බර් මාසයේ දී වර්තමාන ජනාධිපති, එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව ආරම්භ කෙරිණි. 2015 වසරේ දී මෙම මහල් නිවාස සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු නවතා දැමුණු අතර නැවත මෙහි ඉදිකිරීම් කටයුතු 2016 වසරේ මැද භාගයේ දී ආරම්භ කෙරිණි.

පසුගිය යහපාලන ආණ්ඩුව කාලයේ දී වසර 1 1/2 ක පමණ ප්‍රමාදයක් සිදු වූ මෙම නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් අගමැතිවරයාගේ උපදෙස් අනුව පසුගිය දිනවල ඉදිකිරීම් කඩිනම් කළ මෙම නිවාස ව්‍යාපෘතියේ වැඩකටයුතු අවසන් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කැර ඇත.

පෙර විකුණුම් පදනම මත ඉදිකිරීම් ආරම්භ කෙරුණු මෙම නිවාස සංකීර්ණයේ නිවාස 608 ම මේ වන විට විකිණී අවසන් වී ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (දේපොළ හා ඉඩම් කළමණාකරන) ඊ.ඒ.සී. ප්‍රියශාන්ත මහතා ප්‍රකාශ කරයි. නිදන කාමර 3 කින් සමන්විත නිවාස 304 කින් සහ නිදන කාමර 2 කින් සමන්විත නිවාස 304 කින්, මෙම මහල් නිවාස සංකීර්ණය සමන්විතය.මෙහි එක් නිවාස වර්ගයක් වර්ග අඩි 680 ක් වන අතර අනෙක් නිවාස වර්ගය වර්ග අඩි 880 ක් වේ.අංග සම්පූර්ණ මෙම මහල් නිවාස සංකීර්ණය තට්ටු 25 කින් සමන්විතයි. රථ ගාලක්, ළමා උද්‍යානයක්, ව්‍යායාම මධ්‍යස්ථාන 2 ක්, වෙළෙඳ සංකීර්ණයක්, පිහිනුම් තටාකයක් ඇතුළු පහසුකම් රැසකින් මෙය සමන්විත වේ.වසර 15 ක් වසර 20 ක් රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ සේවකයින් මෙම නිවාස මිලදී ගෙන ඇති අතර ඔවුන් සහන ගෙවීමේ ක්‍රමයට ණය පහසුකම් ද සමඟින් මෙම නිවාස ලබා ගෙන ඇත.මෙහි ප්‍රධාන කොන්ත්‍රාත් සමාගම ලෙස ඇක්සස් ඉංජිනේරු සමාගම කටයුතු කැර තිබේ.

නාගරික සංවර්ධන හා නිවාස ඇමැති අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා, අමාත්‍යාංශ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති හර්ෂාන් ද සිල්වා සහ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාද් රණවීර යන මහත්වරුන්ගේ අධීක්ෂණයෙන් නාගරික සංවර්ධන අධිකාරිය මෙම මහල් නිවාස සංකීර්ණයේ වැඩ කටයුතු අවසන් කැර ඇත.

මෙම නිවාස වැඩ පිළිවෙළ තවදුරටත් ශක්තිමත්ව ව්‍යාප්ත කිරීම සඳහා නාගරික සංවරධණ අධිකාරිය අවශ්‍ය පරිසරය සකස් කැර ඇත. එම රාජ්‍ය මග පෙන්වීම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කොළඹ හා තදාසන්න නගරයන්හි හා රටේ හඳුනාගත් නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කැර ගනිමින් ඉදිරි වසර 5 ක කාල සීමාව තුළ තවත් නිවාස ඒකක 5000 ක් ඉදි කිරීමේ වැඩසටහනට මේ වන විට පියවර තබා ඇත.

# වන හානි-රක්ෂිත සහ කඩොලාන විනාශ කිරීම් පැමිණිලි 20ක් පොලීසියට

## සැකකරුවෝ 25ක් අත්අඩංගුවට

පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජාලිය සේනාරත්න



**චන්ද්‍රිකා පෙරේරා**

ශ්‍රී ලංකාවේ වනාන්තරවලට හානි කිරීම සහ රක්ෂිත සහ කඩොලාන විනාශ කිරීම සම්බන්ධයෙන් මේ වන විට පැමිණිලි 20ක් පොලිසියට ලැබී තිබෙන අතර ඒ සම්බන්ධයෙන් සැකකරුවන් 25ක් අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජාලිය සේනාරත්න මහතා පැවසීය.

රක්ෂිත කපා ගිනි තැබීම, කඩොලාන විනාශ කිරීම, රක්ෂිත ඩොසර් කිරීම, වනය කපා වෙනත් වගා සිදු කිරීම, වැලි ගොඩ දැමීම, නිදන් හෑරීම, තෙත් බිම් විනාශ කිරීම සහ ගොඩ කිරීම සහ වෙරළ ආසන්න ප්‍රදේශයට හානි කිරීම ආදී ස්වාභාවික පරිසරය විනාශ කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදීද නීතිය තදින්ම ක්‍රියාත්මක කිරීමට පොලිසිය කටයුතු කරන බව ද කීය.

පසුගිය කාලයේ මාධ්‍යවලින් මෙවැනි වන හානි හෙළි කිරීම ගැන හෙතෙම මාධ්‍යට ස්තුති කළේය.

මහනුවර හන්තාන, කල්පිටිය කඩොලාන, මාරවිල වෙරළාසන්න කඩොලාන විනාශය, මාරවිල, මොරවැව ප්‍රදේශවල වන විනාශය, ආනවිලුන්දාව තෙත්බිම් විනාශ කිරීම, මංගලපුර, කාවන්තිස්සපුර, මින්නේරිය, නකල්ස් සහ වැලිකන්ද වන විනාශය, කැකිරාව, සෝමාවතිය, මහනුවර හැදෙණිය, කිරිදි ඔය රක්ෂිතය ආදී ස්වභාවික සම්පත් විනාශ කිරීම සම්බන්ධයෙන් මේ වන විට විවිධ පාර්ශ්ව පැමිණිලි ඉදිරිපත් කර තිබේ. ඒ අනුව පොලිසිය සිදු කළ විමර්ශනවලින් හෙළි වූ තොරතුරු මත අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කර ඇති අතර තවදුරටත් මෙවැනි වන විනාශ සිදු කරන අය සම්බන්ධයෙන් පොලිසිය විමසිලිමත්ව කටයුතු කරයි.

මෙරට වනය සහ ස්වභාවික තෙත් බිම් ආරක්ෂා කර ගැනීමට පොලිසිය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන ජීවී දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ ආයතන සමඟ එක්ව විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත.

පොලිස් මූලස්ථානයේ ඊයේ (02) පැවැති විශේෂ හමුවේදී මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජාලිය සේනාරත්න මහතා එම අදහස් පළ කළේය.

# ද ෆිනෑන්ස් සමාගමේ තැන්පත්කරුවන් ආරක්ෂා කොට, යුක්තිය ඉටු කර දෙන්න

## 'ද ෆිනෑන්ස්' සේවක සංගමයේ සභාපති ජනපතිගෙන් ඉල්ලයි

**අමෝදා ජයමහ**

රටේ මූල්‍ය ස්ථායීතාව පවත්වාගෙන යාමට මහ බැංකුව ස්ථාපිත කර තිබේ නම් මූල්‍ය ස්ථායීතාව පවත්වා ගනිමින් "ද ෆිනෑන්ස් සමාගමේ තැන්පත්කරුවන් ආරක්ෂා කරන ලෙස හා ඔවුන්ට යුක්තිය ඉටු කර දෙන ලෙස අප ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින බව "ද ෆිනෑන්ස්" සේවක සංගමයේ සභාපති දුමින්ද තිලකරත්න මහතා පැවසීය.

"ද ෆිනෑන්ස් සමාගමේ" තැන්පත්කරුවන් මූලික කරගත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සිදු වී ඇති ආර්ථිකමය බේදවාචකය පිළිබඳ ඊයේ (02) විරෝධතා පා ගමනක් පැවති අතර එහිදී ඔවුන් ජනාධිපතිවරයා වෙත සංදේශයක් භාර දුනි.

ඒ අනුව එම සංදේශය හරහා ද ෆිනෑස් සමාගමේ තැන්පත්කරුවන්ගේ මුදල් සහ හිඟ පොලිය 100% ආපසු ගෙවීම් කැබිනට් මණ්ඩල තීරණයක් මගින් රාජ්‍ය වගකීමට යටත් කළ යුතු බව, "ද ෆිනෑන්ස් සමාගමේ" සම්පත් හා හැකියාවන් යොදා ගනිමින් රාජ්‍ය බැංකුවට අනුයුක්ත කිරීම හෝ ආයතන ප්‍රතිව්‍යුහගතකරණය යටතේ හෝ මූල්‍ය ක්ෂේත්‍රයේ ද විශ්වාසය යළි ගොඩ නැංවෙන පරිදි ක්‍රියාමාර්ගයකට යා යුතු බව ද,



"ද ෆිනෑන්ස් සමාගම" ඈවර කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව වගකීමෙන් ගැලවීමට ගන්නා ප්‍රයත්නයක් බවත් තැන්පත්කරුවන්ගේ තැන්පත් 100% සුරක්ෂිතභාවයට එය හේතු නොවන බැවින් ද සමාගම කිසිසේත් ඈවර නොකළ යුතුය යන මූලික කරුණු ජනාධිපතිවරයාට දැන්වීමට ඔවුන් බලාපොරොත්තු වේ.

ලංකා වෙළෙඳ කාර්මික හා පොදු කම්කරු සංගම් ශාලාවේ ඊයේ (02) පැවැති මාධ්‍ය දැනුවත් කිරීමේ සාකච්ඡාවකට සහභාගී වෙමින් ඒ මහතා මේ බව කීවේය.

එහිදී වැඩිදුරටත් දුමින්ද තිලකරත්න මහතා මෙසේ ද කීය.

ද ෆිනෑන්ස් සමාගම අවුරුදු දහයකට ප්‍රථම මහ බැංකුව පාලනයට ගනු ලැබුවා.ලංකාවේ අවුරුදු අසූවක් පැරණි ද ෆිනෑන්ස් සමාගම වසර අවුරුදු හැත්තෑවක් පැරණි මහ බැංකුව පාලනයට ගෙන තැන්පත්කරුවන්ගේ මුදල් අගතියට පත් වනතුරු කුමක් ද සිදු කළේ කියා අප මහ බැංකුවෙන් ප්‍රශ්න කරනවා. මෙය වංචාවක්,ද ෆිනෑන්ස් සමාගම ශ්‍රී ලංකාවේ ප්‍රථම මූල්‍ය සමාගම ලෙස අප රටේ නිදහසට පෙර 1940 දශකයේ ආරම්භ කළා. ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින් මූල්‍ය ක්ෂේත්‍රයේ විශාල සේවයක් සිදු කරමින් කොටස් වෙළෙඳපළේ ඉහළ වටිනාකමක් ඇති ආයතනයක් ලෙස වර්ධනය වුණා. 2009 වසරේ සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ ඇතිකළ අර්බුදය මුල්කර ගනිමින්,රජයේ කැබිනට් මණ්ඩලයේ තීරණයක් අනුව ද ෆිනෑන්ස් සමාගම ශ්‍රී ලංකා මහ බැංකුව යටතට පවරා ගත්තා. ඉන් පසුව මූල්‍ය කළමනාකරණ ආයතන සභාපති,අධ්‍යක්ෂ මණ්ඩල, ප්‍රධාන විධායක නිලධාරීන් පත් කරනු ලැබුවේ ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය මණ්ඩලයයි.ද ෆිනෑන්ස් සමාගම මහ බැංකුවට පවරා ගැනීමට ප්‍රථම වත්කම් විශාල ප්‍රමාණයක් හිමිව තිබූ සාර්ථක සමාගමක්.නමුත් මහ බැංකුව පවරාගත් පසු අවසනාවන්ත ලෙස ද ෆිනෑන්ස් සමාගම පරිහානියට ලක්වුණා. නමුත් මහ බැංකුව විසින් 2019 මාර්තු මාසයේ ද ෆිනෑන්ස් සමාගමේ ව්‍යාපාර කටයුතු අත්හිටුවා තැන්පත්කරුවන්ගේ තැන්පතු ආපසු ගැනීම් වළක්වා,පොළී මුදල් ද එකගතාවකින් තොරව අඩු කළා.ඒ අඩු කිරීම සිදු කළේ ද පෙර මාසයේ රුපියල් බිලියන තැන්පතු එකතු කර ගැනීමෙන් අනතුරුවයි.එය මුල්‍ය වංචාවක් බව පසුව හෙළි වුණා.මේ වන විට මහ බැංකු අධිපතිවරයා විසින් මෙහි වගකීම එවකට ද ෆිනෑන්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය භාරගත යුතු බව පවසනවා.අද වනතුරු මේ මුදල් තැන්පතු භාරගත් කිසිම අධ්‍යක්ෂවරයෙක් පිළිබඳ විමර්ශනයක් සිදු කර නෑ.මේ සිද්ධියේ වගඋත්තරකරු වන්නේ මහ බැංකුවම පමණයි.මේ විරෝධතාව, මේ විලාපය මීට සාධාරණයක් ලබා ගැනීමයි. ජනාධිපතිවරයා සමඟ අප සාකච්ඡා කළා. නමුත් ජනාධිපතිවරයා සාකච්ඡාවට පැමිණෙන විට පැමිණ සිටි මහ බැංකු නිලධාරීන් සත්‍ය තොරතුරු වසන් කරමින් අසත්‍ය තොරතුරු පමණක් ජනාධිපතිවරයාට කිව්වා.ජනාධිපතිවරයා මේ සම්බන්ධව විෂය භාර ඇමැතිවරයෙක් පත් කළා.මේ සම්බන්ධව වාර්තාවක් විෂය භාර ඇමැතිවරයාට ලබාදෙන ලෙස ජනාධිපතිවරයා උපදෙස් දුන්නා.තවමත් වාර්තාවක් ලබා දී නෑ.මෙවැනි කරුණුවලින් මෙය වංචාවක් බවට තහවුරු වෙනවා.මේ මුදල් අයථා ආකාරයෙන් නීත්‍යනුකූල නොවන මාර්ගයෙන් සොයා ගත් මුදල් නොවේ. සෑම තැන්පත්කරුවකුම සිය අයැදුම්පතේ මේ මුදල් සපයා ගත් ආකාරය සඳහන් කර තිබෙනවා.

ඡායාරූපය – රුක්මාල් ගමගේ

කල්පිටිය සමූහ





## කල්පිටියේ නිර්මල මාතා විදුහලට ජල පෙරනයක්

කල්පිටිය නිර්මල මාතා සිංහල මහා විදුහලේ සිසු දරුවන්ගේ මූලික අවශ්‍යතාවක් වූ පානීය ජල ගැටලුවට විසඳුමක් සපයමින්,ශ්‍රී ලංකා නාවුක හමුදාව විසින් ජල පෙරනයක් ලබා දීම එම විදුහල් පරිශ්‍රයේදී පසුගියදා සිදුවිය. දහසකට ආසන්න සිසු දරුවන්ට කලක සිට තිබූ පානීය ජල ගැටලුව මෙමඟින් විසැදුණි. මේ ජල පෙරනය මඟින් දිනකට දිවා කාලයේ පානීය ජලය ලීටර 10,000ක් නිකුත් කිරීමේ හැකියාව ඇත. මෙහි වටිනාකම රුපියල් ලක්ෂ 15කට අධිකය. මේ අවස්ථාවට ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය ඇමැති සනත් නිශාන්ත පෙරේරා, පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චින්තක මායාදුන්නේ, කල්පිටිය විජය නාවුක හමුදා කඳවුරේ නියෝජ්‍ය අණදෙන නිලධාරී තුෂාර ජයවර්ධන, පුත්තලම අධ්‍යාපන කලාප අධ්‍යක්ෂ සරත් විජේසිංහ ඇතුළු නිලධාරීහු රැසක්ම මේ අවස්ථාවට සහභාගි වූහ.

උබයරත්න වනසිංහ - පස්සර සමූහ

# බදුල්ලේ දියඇලි ආශ්‍රිත උග්‍ර පාරිසරික විනාශයක්



බදුල්ල දිස්ත්‍රික්කයේ සංචාරක ආකර්ෂණය දිනා ගැනීමේ ලක්ෂණ සහිත කඳුවැටි හා ඒ ආශ්‍රිත ප්‍රදේශ රැසක මේ වන විට පාරිසරික ව්‍යසනයක් ඇතිවීමේ නැඹුරුතාවක් දක්නට ලැබෙන බව බදුල්ල දිස්ත්‍රික් පරිසරවේදී සංවිධාන රැසක් පෙන්වා දෙති. විශේෂයෙන් නමුණුකුල, බඹරගල, රාවණා ඇල්ල, නාරංගල, මඩොල්සිම, පුංචි ලෝකාන්තය වැනි කඳු පන්ති හා ඒ ආශ්‍රිත ප්‍රදේශත්, දුන්හිඳ, බඹරකන්ද, දියලුම, පීස්ස ඇල්ල හා පස්සර අර්දුණු ඇල්ල වැනි සුන්දර දිය ඇලි සහිත ප්‍රදේශයත් එවැනි තත්ත්වයකට ගොදුරු වන බව පෙන්වා දෙන එම සංවිධාන මේ සඳහා ස්වාභාවික හේතූන්ට වඩා සෘජුවම මිනිස් ක්‍රියාකාරකම් බලපා ඇති බව නිරීක්ෂණවලින් පැහැදිලි වී ඇති බව ද කියා සිටී. පළාත් සභා සංචාරක අමාත්‍යාංශය, අදාළ ප්‍රදේශයන්හි ප්‍රාදේශීය සභා, නගර සභා, පරිසර සංවිධාන, ගොවි සංවිධාන හා වෙනත් ග්‍රාමීය සංවිධාන ආදිය මේ තත්ත්වය අවම කිරීම සඳහා කලක සිට උත්සාහයක නිරත වී සිටින බවත්, එසේ තිබියදීත් ඇතැම් පිරිස් හා තනි-තනිව අදාළ ස්ථානයන්හි වනපෙත් හා ජල මුලාශ්‍රවලට විවිධාකාරයේ හිතුවක්කාර බලපෑම් ඇති කරන බවත් වැඩි දුරටත් පෙන්වා දෙන එම පරිසර සංවිධාන මේ සඳහා පළාතේ රාජ්‍ය ආයතන ආරක්ෂක අංශ, සිවිල් සංවිධාන හා මාධ්‍යවේදී සංවිධාන ඒකාබද්ධව පළාතේ පරිසරය සුරැකීමේ තිරසාර සංවිධානයක් ගොඩනගා ගැනීම වඩාත් කාලෝචිත බව ප්‍රකාශ කර සිටී.

එන්.පී.රාජදොරේ - රත්නපුර විශේෂ

## බීමතින් රිය පදවා 3ක් දඩ කති

බීමත්ව රිය පැදවීමේ චෝදනාවට වරදකරුවන් වූ රත්නපුර,නිවිතිගල සහ ඇහැළියගොඩ පදිංචිකරුවන් තිදෙනකුට රත්නපුර ප්‍රධාන මහේස්ත්‍රාත් ජනිතා පෙරේරා මහත්මිය එක් අයකුට රුපියල්( 50,000) පනස්දහස බැගින් තිදෙනාට රුපියල් එක්ලක්ෂපනස්දහසක දඩයක් නියම කළාය. දඩයට අමතරව මාස හයක සිර දඬුවමක් නියම කළ ප්‍රධාන මහේස්ත්‍රාත්වරිය, සිරදඬුවම වසර පහකට අත්හිටවන ලෙසද නියම කළාය. මෙසේ දඩ සහ අත්හිටවූ සිරදඬුවම් නියම වුයේ ඇහැළියගොඩ රණවිරු සමන් මාවතේ මොරහැල පදිංචි කරදන ආචාරිගේ සුමිත් කුමාර,නිවිතිගල උඩ වතුපිටය පදිංචි කහංගම ආරච්චිලාගේ ආරියරත්න,රත්නපුර අමතගොඩ හිදැල්ලන පදිංචි මුණි ගමගේ කවීන්ද්‍ර යන තිදෙනාටය.

ඩී.එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## කැබ් රථයක සඟවා තිබූ ගංජා සොයාගනී

බිබිල නගරයේදී පොලීසිය මඟින් සිදු කළ වාහන පරීක්ෂාවකදී කැබ් රථයක් තුළ සඟවා තිබූ ගංජා ග්‍රෑම්ස් 950ක් අත්අඩංගුවට ගෙන ඇත. මේ කැබ් රථයේ රියැදුරු පානම උතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. අත්අඩංගුවට ගත් ගංජා තොගය, කැබ් රථය සහ රියැදුරු බිබිල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. බිබිල පොලිස් ස්ථානාධිපති ඒ.එස්.පී.සී.කේ සෙනරත් මහතා සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වයි.

ඩී.එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## මුවමස් රැගෙන යද්දී දඩයක්කරුවා දැලේ

කුඩාඔය-ඩෝල්ලංකා මාර්ගයේදී මුව මස් කිලෝ හතහමාරක් රැගෙන යමින් සිටි දඩයක්කරුවෙක් කුඩාඔය පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරු මස් පිණිස වන සතුන් දඩයම් කිරීමේ නිරතව සිටින පුද්ගලයකු වන අතර මුව මස් අලෙවි කිරීමට කුඩාඔය නගරයට රැගෙන යමින් සිටියදී මෙලෙස අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරු සහ නඩු භාණ්ඩ වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.කුඩාඔය පොලිස් ස්ථානාධිපති එස්.ඒ.සී ප්‍රසාද් මහතා සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

දිනමිණ දසත
දස අත ම එක තැන

ඇම්.පී චන්ද්‍රපාල - තංගල්ල විශේෂ

# පාර්ලිමේන්තුවට තේරී පත් වූ පළාත් සභා මන්ත්‍රීවරු පිළිගැනීමේ උත්සවයක්



මෙවර පාර්ලිමේන්තු මහ මැතිවරණයට ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණෙන් පළාත් සභාවල හිටපු මන්ත්‍රීවරුන් 58 දෙනකු නාම යෝජනා භාර දුන් අතර ඉන් 28 දෙනෙකු මෙවර පාර්ලිමේන්තුවට නවක මන්ත්‍රීවරුන් ලෙස තේරී පත් වූහ. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණෙන් හම්බන්තොට, මාතර, ගාල්ල ,යන දිස්ත්‍රික්කවලට තරග වැදුණු දකුණු පළාත් සභාවේ හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් තිදෙනාම මෙවර පාර්ලිමේන්තුවට තේරී පත් වීම විශේෂත්වයකි.

හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් අජිත් රාජපක්ෂ, මාතර දිස්ත්‍රික්කයෙන් විරසුමණ විරසිංහ, ගාල්ල දිස්ත්‍රික්කයෙන් සම්පත් අතුකෝරල යන මහත්වරු තේරී පත් විය. පාර්ලිමේන්තුවට තේරී පත් වූ හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් 28 දෙනා පිළිගැනීමේ උත්සවයක් බැසිල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා කොළඹ දී පැවැත් විණි. එහිදී හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ අජිත් රාජපක්ෂ මහතාට බැසිල් රාජපක්ෂ මහතා විසින් සමරු තිළිණයක් ද පිරිනමන ලදී.

අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

# අනුරාධපුර වකුගඩු රෝගීන් වෙනුවෙන් ඉදිවෙන උතුරු ජල යෝජනා ක්‍රමය කඩිනමින්



අනුරාධපුර දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගයට ගොදුරු වී සිටින ජනතාව වෙනුවෙන් පිරිසුදු පානීය ජලය ලබා දීමේ අරමුණු ඇතිව ඉදි කෙරෙන අනුරාධපුර උතුරු ජල යෝජනා ක්‍රමය කඩිනම් කිරීමට පියවර ගැනේ. ඒ සඳහා ඇස්තමේන්තු ගත කර ඇති මුදල රුපියල් බිලියන 11.5කි.

පසුගිය රජය සමයේ අක්‍රිය තත්ත්වයේ පැවති මේ ජල යෝජනා ක්‍රමය නැවත ආරම්භ කරමින් එහි පළමුවැනි අදියර යටතේ විශේෂිත වූ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම් කටයුතු මේ වන විට ආරම්භ කර තිබේ. මේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ සොයා බැලීම සඳහා මුදල් සහා සමෘද්ධි පිළිබද රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා පසුගියදා එහි නිරීක්ෂණ චාරිකාවක නිරත විය.

මේ ජල යෝජනා ක්‍රමය මඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය,රඹෑව,ඇතැකඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් සෘජු ප්‍රතිලාභි පවුල් විසිපන්දහසකට(25000) පමණ සෙත සැලසේ.

අනුරාධපුර කනදරාව ජලාශය කේන්ද්‍ර කර ගනිමින් මේ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර මේ ව්‍යාපෘතිය මඟින් එම කනදරාව ජලාශයට අහිමි වන ජලය මොරගහකන්ද ජල යෝජනා ක්‍රමය මඟින් ලබා ගැනීම මේ ව්‍යපෘතියේ අරමුණ වේ.

මෙම නිරීක්ෂණ චාරිකාවට එක් වූ රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා කියා සිටියේ මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිරිසුදු පානීය ජලය නොමැති පවුල් සඳහා ද මේ අනුරාධපුර උතුරු ජල යෝජනා ක්‍රමය හරහා ජලය පහසුකම් ලබා දීමට නියමිතය.

ඩබ්ලිව්. විදානපතිරණ - ඇඹිලිපිටිය සංචාරක

## ඇඹිලිපිටිය මෙත් සෙවණේ ආබාධිත දරුවන්ට වියළි ආහාර ද්‍රව්‍ය පරිත්‍යාගයක්



පෑන් ඒෂියා බැංකුවේ ඇඹිලිපිටිය ශාඛාව ආරම්භ කර වසර 10ක් පිරීම නිමිති කරගෙන එම බැංකු පරිශ්‍රයේදී ඉකුත් දා මහා සංඝරත්නය විසින් සෙත් පිරිත් සජ්ඣායනාවක් පවත්වා ඉන් අනතුරුව එම බැංකුවේ කළමනාකාර ධම්මික බණ්ඩාර මහතා ඇතුළු කාර්ය මණ්ඩලය විසින් ඇඹිලිපිටිය පනාමුර පාර බෝධිරාජ මෙත් සෙවණේ සෙවණ ලබන ආබාධිත දරුවන් සඳහා වියළි ආහාර ද්‍රව්‍ය සහ අත්‍යවශ්‍ය උපකරණ පරිත්‍යාග කිරීමක්ද සිදු විය. මේ අවස්ථාවට පෑන් ඒෂියා බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ කලාපීය කළමනාකාර අනුරාධ රණවීර මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ජෙරමි ද සිල්වා මහතා, ඇඹිලිපිටිය බැංකුවේ කළමනාකාර ධම්මික බණ්ඩාර මහතා සහ පාලිත මහතා ඇතුළු කාර්ය මණ්ඩලය ද සහභාගී වී සිටියහ.

සී. එම්. ආරියපාල - තඹුත්තේගම

## පොතියාගම ආබාධිත පුද්ගලයන් 10කට මුදල් ප්‍රදානයක්



තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 433 පොතියාගම තුලානේ පදිංචි ආබාධිතව ඔත්පලව නිවෙස්වල සිටින කැලේගම වසමට අයත් සමගි වැඩිහිටි සමිතියේ සාමාජිකයන් දස දෙනකුට සංගමයේ තීරණයක් අනුව රුපියල් 5000 බැගින් ප්‍රදානය කිරීමේ සද්කාර්යක් ඉකුත්දා සිදු කෙරිණි. මේ අවස්ථාවට සමගි වැඩිහිටි සමිතියේ නිලධාරි මණ්ඩලයද , වසමේ ග්‍රාම නිලධාරිනිය වන බී. එම්. නිල්මිණි පුෂ්ප කාන්ති මහත්මියද සහභාගී වූ අතර මේ ආබාධිත ඔත්පල පුද්ගලයන්ගේ නිවෙස්වලට පෞද්ගලිකවම ගොස් මුදල් ප්‍රදානය කළාය.

ටී.එල්.ඒ.පී.හේමපාල - නාගොඩ සමූහ

## දකුණේ ජලභීතිකාව වළක්වන්න වැඩසටහන්

දකුණු පළාතේ ජලභීතිකා රෝගය පැතිරීම වැළැක්වීමටත් මේ රෝගී තත්ත්වය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමටත් විශේෂ වැඩසටහන් මේ වනවිටත් ක්‍රියාත්මකව ඇති බව දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ටී.එල්. චන්දිම සිරිතුංග මහතා පැවැසීය.

ඒ මහතා මේ බව කීවේ උඩුගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බලප්‍රදේශයට අයත් යටලමත්ත සහ මාපලගම ප්‍රදේශවලදී ජලභීතිකා රෝගය වැළඳී ඉතාමත්ම අවාසනාවන්ත ලෙස දෙදෙනකු මියයෑමේ සිද්ධිය සම්බන්ධව අදහස් දක්වමිනි.

මේ මරණ දෙකම වළක්වා ගත හැකිව තිබූ මරණ දෙකකි.සිද්ධීන් දෙකේදීම සුනඛයෙකු සපාකෑමෙන් පසු ලබා ගතයුතු එන්නත් ලබා නොගැනීම මේ මරණවලට හේතු වී ඇති බව අනාවරණය වෙනවා.විශේෂයෙන්ම ළමයි පිළිබඳ මවුපියන්, වැඩිහිටියන්, මීට වඩා උනන්දු විය යුතුයි.ජලභීතිකා රෝගය වැළඳුණු අයකු සුවකරන්න බැහැ.

ඒ නිසා බල්ලෙක්, බළලකු ,නරියෙක් වැනි සතකු සපා කෑමෙන් පසුව හෝ නියවලින් සීරූ පසුව නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට ළඟම රෝහල වෙත යා යුතුයි.

පවතින තත්ත්වය අනුව ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට සෞඛ්‍ය අංශ සමඟ විශේෂ සාකච්ඡාවක් දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලී ගමගේ මහතා විසින් කැඳවා තිබේ.

පී.පී.ගුණතිලක - ගලේවෙල මධ්‍යම සමූහ

## කතකට තුවාල කර රන් මාලය කොල්ලකාලා

කාන්තාවකට තුවාල සිදු කර පෙන්ඩනයක් සහිත රුපියල් 61,000ක් වටිනා රන් මාලයක් කොල්ලකෑම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයකුට දඹුල්ල මහේස්ත්‍රාත් කෝසල බණ්ඩාර ඉලංගසිංහ මහතා විසින් රුපියල් දහසක දඩයක් හා මාස තුනක බරපතළ වැඩ සහිත අනිවාර්ය සිරදඬුවමක් නියම කරන ලදි. ඊට අමතරව මාස 08ක සිර දඬුවමක් අවුරුදු 10කට අත්හිටවනු ලැබීය. අගතියට පත්වූ අයට රුපියල් 40,000ක මුදලක් ගෙවීමටත් නියම විය. අධිකරණයේදී පැමිණිල්ල මෙහෙයවන ලද්දේ ගලේවෙල පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ උප පොලිස් පරීක්ෂක රාජරත්න මහතා විසිනි.

■ සම්පත් ප්‍රියනන්දන - බලන්ගොඩ විශේෂ

# බලන්ගොඩ පැෂන් ෆෘට් වගාවට නරක දසාවක්



බලන්ගොඩ ප්‍රදේශයේ මේ දිනවල පවතින වර්ෂාවත් සමග අයහපත් කාලගුණය හේතුවෙන් ප්‍රදේශයේ පැෂන් ෆෘට් වගාවේ ගෙඩිවල දුඹුරු පැහැති පැල්ලම් හට ගැනීමේ රෝගයක් පැතිර ඇතැයි වගාකරුවෝ පවසති.

පැෂන් ෆෘට් වගාවේ රෝගය හට ගැනීමත් සමග පැෂන් ගෙඩි සහ මල් වර්ෂාවත් සමග නටුවෙන් ගැලවී බිමට වැටීමට පටන් ගෙන ඇතැයි වගාකරුවෝ කියති.

ඉකුත් දිනවල පැෂන් ෆෘට් කිලෝවක් රුපියල් 180ක් වැනි මිලකට වෙළෙන්දන් මිල දී ගත් බවත් එහෙත් මේ දිනවල පැෂන් ෆෘට් කිලෝවක මිල රුපියල් අසූවත් සියයත් අතර මිලකට පහත වැටී ඇති බව ද ප්‍රදේශයේ පලතුරු වගාකරුවෝ සඳහන් කරති.

■ හැටන් මධ්‍යම විශේෂ

# හැටන් නගරයේ කානු පුදුම ගඳක්

## නගර වැසියන් සුළු දිය පහකරන්නෙත් මේ කානුවල - නගරාධිපති

හැටන් නගර මධ්‍යයේ කානු පද්ධති නිසි ලෙස සුද්ද පවිත්‍ර නොකිරීමත් සමග එම ප්‍රදේශවල පවතින දැඩි දුගඳ හේතුවෙන් නගරවැසියන් මෙන්ම නගරයේ වෙළෙඳසල්වල පිරිස් ද විවිධ දුෂ්කරතාවයන්ට පත්ව සිටිති.

මේ පිළිබඳ අදහස් දක්වන නගර වැසියන් මෙන්ම සමහර වෙළෙන්ඳන් පවසන්නේ නගරයේ සමහර කානු පද්ධති නිසි ලෙස ශුද්ධ පවිත්‍ර නොකිරීමත් සමග දැඩි දුගඳක් හමන බවත් මේ තත්ත්වයන් මත තමන් විවිධ දුෂ්කරතාවට පත්ව ඇති බවත් ය.

විශේෂයෙන් හැටන් නගරයේ ඩංබාර් මාවතේ වෙළෙඳසල් පිටුපස කානු පද්ධතිය මෙන්ම නගරයේ තවත් කානු පද්ධති මෙසේ නිසි ලෙස පවිත්‍ර කිරීමක් නොකර බවත් මේ තත්ත්වයන් මත එම කානු පද්ධති තුළින් හමන දුගඳ හේතුවෙන් තමන් දැඩි දුෂ්කරතාවට පත්ව ඇති බවද ඔවුහු පවසති.

මේ පිළිබඳ කරන ලද විමසීමකදී අදහස් දැක්වූ හැටන් දික්ඔය නගර සභාවේ සභාපති එස්. බාලචන්ද්‍රන් මහතා පැවසුවේ සමහර පුද්ගලයන් රාත්‍රී කාලයේ මේ කානුවලට සුළුදිය පහකරන බවත් තවත් සමහර කානු පද්ධති පවිත්‍ර කිරීම සඳහා යෑමට ඉඩ කඩ නොමැතිවීමත් මත මේ තත්ත්වයන් උදාවී ඇති බවත් ය.

කෙසේ වුව ද මේ කානු නිසි ලෙස සුද්ධ පවිත්‍ර කිරීම සඳහා නගර සභා කම්කරුවන් යෙදවීමට පියවර ගන්නා ලෙස අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දෙන බව ද හෙතෙම පැවසීය.

■ ධර්මදාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක

# අම්බලන්ගොඩ ශුද්‍ර මූල්‍ය ආයතනයකින් භාණ්ඩ සොරාගත් සේවකයෙක් රිමාන්ඩ්

අම්බලන්ගොඩ ප්‍රදේශයේ ශුද්‍ර මූල්‍ය ආයතනයකට අයත් භාණ්ඩ සොරාගත් එම ආයතනයේම සේවකයකු අම්බලන්ගොඩ පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන බළපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සැකකරු මේ මස 5 වැනි දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කෙරිණි.

පසුගිය කොරෝනා සමයේදී මේ ශුද්‍ර මූල්‍ය ආයතනය වසා තැබූ අතර ආයතනයේ යතුර බාරදී තිබුණේ ඉඩංතොට ප්‍රදේශයේ පදිංචි එම ආයතනයේ සේවකයකුටය. කොරෝනා නිවාඩුව අවසානයේ නැවත වැඩ ඇරඹීම සඳහා හිමිකරු ආයතනය විවෘත කර බලන විට එහි තිබූ වටිනා භාණ්ඩ කිසිවක් නොතිබූ බැවින් ආයතනයේ හිමිකරු අම්බලන්ගොඩ පොලීසියට පැමිණිල්ලක් කර තිබිණි.

වහාම ක්‍රියාත්මක වූ ප්‍රධාන පොලිස් පරීක්ෂක ජනක ගුණසේකර මහතා සිද්ධිය වූ ස්ථානයට ගොස් විමර්ශන ඇරඹීය. ඒ අනුව යතුර බාර දී තිබූ සේවකයා ගැන සැක සිතී ඔහු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී සියලු තොරතුරු වමාරන්නට වූ අතර ඔහු විසින් එහි තිබූ භාණ්ඩ රැගෙන ගොස් විකුණූ බවත් ඒවා ලබා දුන් ස්ථාන පෙන්විය හැකි බවත් පැවැසීය.

ඒ අනුව පොලිස් නිලධාරීන් කණ්ඩායමක් අදාළ ස්ථානවලට ගොස් එම භාණ්ඩ සිය බාරයට ගෙන ඇති අතර සොරකම් කළ භාණ්ඩ අතර වායු සමීකරණ යන්ත්‍ර, ලැප්ටොප්, පරිගණක, සී.සී. ටී.වී. කැමරා, පරිගණක පුටු ඇතුළු ලොරි දෙකක පමණ භාණ්ඩ තිබී ඇත.

■ අජිත් කුමාර - මාකඳුර සමූහ



# උපතින් ආබාධිත වුණත් යතුරුපැදි හදන රංසෑගොඩ අමරසේන

මාතර මාකඳුර රංසෑගොඩ පදිංචි වයස අවුරුදු 54ක් වන නාරංගොඩ ගමගේ අමරසේන උපතින්ම දෙපා ආබාධිත තත්ත්වයෙන් පෙළෙන්නෙකි. කිසි දිනෙක පාසල් අධ්‍යාපනය හෝ කාර්මික අධ්‍යාපනයක් නොලද ඔහු දක්ෂ වාහන කාර්මිකයෙකි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් රංසෑගොඩ කුඩුම්රියහේන වතුයායේ රක්ෂිත භූමියේ මාකඳුර නැම්මහේන ප්‍රධාන මාර්ගය අසලම කුඩා නිවෙසක් තනාගෙන ජීවත්වන ඔහුට තමා පදිංචි ඉඩම් කොටස සඳහා මේ දක්වා කිසිදු බලපත්‍රයක් ලබා දී නොමැත.

කාමර දෙකකින් යුත් කුඩා නිවෙස ඔහුගේ වාසස්ථානය මෙන්ම වාහන සාදන ගරාජය ද වේ. එම නිවසේ කොටසක් දැනට කඩා වැටී ඇති අතර ඉතිරි කොටස ද අද හෙටම කඩාවැටිය හැකි බව පවසන අමරසේන නිවෙස අලුත්වැඩියා කර ගැනීමට තරම් තමාට ශක්තියක් නොමැති බව පවසයි.

අමරසේන මහතා මෙසේ පැවසීය.

මට පාපැදි, යතුරුපැදි, ත්‍රී රෝද රථ, හා ට්‍රැක්ටර් ආදි වාහන අලුත්වැඩියා කරන්න පුළුවන්. ඒ දැනුම මට ස්වභාව ධර්මයෙන් ලැබුණු ආශීර්වාදයක්. කොසු, ඉදල් බැඳීම, පොල්කටු හැඳි සෑදීම, පිහියා මිට ගැසීම වගේ වැඩත් මට කරන්න පුළුවන්. මේ යතුරුපැදිය මා හැදුවේ මට ගමන් බිමන් යන්න. සැලැසුම හැදුවේත් මම. මම මේ යතුරුපැදියෙන් ඉතා දුරබැහැර ගමන් පවා යනවා. දැන් මේ යතුරුපැදිවලට ලොකු ඉල්ලුමක් තිබෙනවා. දැනටමත් හතර පස් දෙනෙක්ම ඉල්ලා තිබෙනවා. මටත් ලාභ තියාගෙන රුපියල් ලක්ෂ එක හමාරකට විකුණන්න පුළුවන්. මේ යතුරුපැදි හදන්නේ මමමයි. මීට ඉස්සර මෙවැනි යතුරුපැදි දෙකක් හදලා විකුණුවා. පාවිච්චියෙන් ඉවත් කළ චැලි වර්ගයේ බයිසිකල් කොටස් මේ සඳහා උපයෝගී කර ගන්නවා. මට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි ජීවත් වෙන්න තැනක් නොමැති වීම. තවම මේ ඉඩමට බලපත්‍රයක්වත් නෑ. මම මුලටියන දිසාපති කාර්යාලයට ලිපි කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට කිව්වා. මේ ප්‍රදේශයේ අනෙක් අයට ඉඩම් බලපත්‍ර ලැබී තිබෙනවා. මට නෑ.

මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මට මේ රැකියාව කරගෙන යන්න එයාර්කම්පෙෂර් එකක් සහ වෑල්ඩින් ප්ලානට් එක්ක ලබාදුන්නා. මට ආබාධිත දීමනාව වශයෙන් මාසයකට රුපියල් පන්දහසක් ලැබෙනවා. මට මේ ඉඩමට බලපත්‍රයක් ලබාදෙන්න. මේ පුංචි නිවෙස කඩා වැටෙන්න ළඟයි. මා ආබාධිත වුණත් අනුන්ගේ අනුකම්පාව බලාපොරොත්තු වන්නේ නෑ. මට මේ කටයුතු සාර්ථක කරගන්න ආධාර හෝ උපකරණ ලැබෙනවා නම් මටත් අනෙක් අය වගේම සමාජයට බරක් නොවී ජීවත් වෙන්න පුළුවන්.

■ මහානාම විතානගේ - මල්වාන සමූහ

# යතුරු පැදියකින් කසිප්පු ඇද්ද අයෙක් දැලේ

ස්කූටි වර්ගයේ යතුරු පැදියකින් කසිප්පු බෝතල් 50ක් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයෙකු බියගම පොලීසිය මගින් පසුගියදා (30) උදේ මල්වාන ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත. මේ පුද්ගලයා දොම්පේ සිට බියගම දක්වා කසිප්පු ප්‍රවාහනය කරමින් සිටියේදී මෙසේ අත්අඩංගුවට පත්විය. සැකකරු මහර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. බියගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඊ. ඒ. සී. එල්. අමරසේකර මහතාගේ උපදෙස් අනුව උප පොලිස් පරීක්ෂක ඩී.එම්.එස්.සී. කුමාර , සැරයන් සිසිර, පො.කො. ගුණවර්ධන සහ සේනානායක නිලධාරීහු වැටලීම සිදු කළහ.

■ එස්.ජී. විජේරත්න - කටුගස්තොට සමූහ

# මහවැලි ගඟට පැන්න තරුණයා සොයා මෙහෙයුම්

කටුගස්තොට නවයාලතැන්න ප්‍රදේශයේ පිහිටි දුම්රිය පාලම (කළු පාලම) මතින් මහවැලි ගඟට පැන ඇති තරුණයකුගේ සිරුර සොයා කටුගස්තොට පොලීසිය හා නාවික හමුදාවේ කිමිදුම් කණ්ඩායමක් මෙහෙයුමක් ආරම්භ කර ඇත.

වටපුලුව, දේව් පාරේ පදිංචිව සිටි බව පැවැසෙන ගෝවින්ද වඩුගේ කසුන් සංජීව නමැති 25 හැවිරිදි තරුණයකු පසුගිය 29 වැනිදා දහවල් මහවැලි ගඟට පැන ඇති බව පොලීසිය පවසයි. මේ පිළිබඳ එම තරුණයාගේ සහෝදරියක විසින් කටුගස්තොට පොලීසිය වෙත පැමිණිලි කර ඇති අතර තම සහෝදරයා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව සිටි බවත් එයින් මිදීම සඳහා වෛද්‍යවරයකුගෙන් බෙහෙත් ලබා ගන්නා බව ද පවසා තිබේ.

■ කේ.එස්. කරුණාරත්න - මරදන්කඩවල සමූහ

# මලයාපරත්තිකුලම් ගමට බෞද්ධ විහාරස්ථානයක්



ඇක්සස් ඉංජිනියරින් සමාගමේ වාර්ෂික සමාජ සත්කාර වැඩසටහන යටතේ වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩුකන්ද, මලයාපරත්තිකුලම් ගම්මානයට අංගසම්පූර්ණ නව බෞද්ධ විහාරස්ථානයක් ඉදි කොට ශාසනයට පූජා කිරීමේ උත්සවය පසුගියදා (30) පැවැත්විණි.

උතුරු නැගෙනහිර දෙපළේ අධිකරණ සංඝනායක අතිපූජ්‍ය මුවඇටගම ආනන්ද ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි ඇක්සස් ඉංජිනියරින් සමාගමේ වැඩබිම් කළමනාකරු වරුණ මල්ලවආරච්චි හා සම්බන්ධීකරණ නිලධාරී එම්. ටී.බී.ඒ. වන්නිනායක යන මහත්වරුන්ගේ මූලිකත්වයෙන් මේ විහාරස්ථානය ඉදිකෙරිණි. ආවාස ගෙයක්, බුද්ධ මන්දිරයක්, ධර්ම ශාලාවක් මේ අනුව ඉදිකෙරිණි. මේ සඳහා රුපියල් ලක්ෂ හතළිහකට ආසන්න මුදලක් වැය කර ඇත.

මේ අවස්ථාවට වවුනියාව දිස්ත්‍රික් ලේකම් එස්. එම්. සමන් බන්දුල, ඇක්සස් ඉංජිනියරින් සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ජගත් ගම්ලත්ගේ මහත්වරුන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය හා සේවක මණ්ඩලය ඇතුළු ගම්වාසීහු සහභාගිවී සිටියහ.

■ සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ / මහානාම විතානගේ - මල්වාන සමූහ

# බියගම මැදි විදුහලේ සිසු නායක දිනය දා...



බියගම මධ්‍ය මහා විද්‍යාලයේ 2020 වර්ෂයේ ශිෂ්‍ය නායක නිල ලාංඡන පැලඳවීමේ උත්සවය බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රී ලාල් නෝනිස් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (29) විද්‍යාලයීය පරිශ්‍රයේදී පැවැත්විණි. විදුහල්පති යූ. වී. ගුණරත්න මහතා සහ ආචාර්ය මණ්ඩලයේ මඟපෙන්වීම මත සංවිධාන කර තිබූ මේ උත්සවයේ දී සිසු සිසුවියන් 102 දෙනෙක් ශිෂ්‍ය නායක නායිකාවන් ලෙස දිවුරුම් දුන්හ.



■ සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

# අනවසර ඉදිකිරීම් කළැයි දෙදෙනකුට 50,000ක දඩ

කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රහුමානියා පෙදෙසේ මුහුදුතීරය කේන්ද්‍ර කරගනිමින් කිසිදු නීත්‍යානුකූල අවසරපතක් හෝ ලියවිල්ලක් නොමැතිව අනවසර ඉදිකිරීම් කරමින් සිටි පුද්ගලයන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමෙන් පසු ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් රන්දික ලක්මාල් ජයලත් මහතා රුපියල් 25,000 බැගින් දෙදෙනාට රුපියල් 50,000ක දඩයක් ගෙවීමට පසුගියදා (29) නියෝග කළේය.

මේ දිනවල කින්නියාව හා මූතූර් ප්‍රදේශවල පදිංචිකරුවන් අනවසරයෙන් කඩොලාන විනාශ කරමින් වගුරුබිම් ගොඩ කරමින් හා වෙරළ තීරය ද ආක්‍රමණය කරමින් සිටින අතර පොලීසිය හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව එක්ව මේ වනවිට වැටලීම් කිහිපයක් කර සැකකරුවන් අධිකරණය හමුවට පමුණුවා දඬුවම්ද නියම කොට ඇතත් ඉදිකිරීම් කටයුතු නතර කර ඇති බවක් දැනට නිරීක්ෂණය නොවන බව ද වාර්තාවේ.

■ දයාරත්න බණ්ඩාර - කෑගල්ල දිස්ත්‍රික් සමූහ

# සුව සරණ සුබසාධක සංගමයේ වාර්ෂික සංවත්සරයෙන්



දැදිගම මැතිවරණ කොට්ඨාසයට අයත් මහපල්ලේගම ප්‍රාදේශීය රෝහලේ සුව සරණ සුබසාධක සංගමයේ වාර්ෂික සංවත්සරය කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී උදය කාන්ත ගුණතිලක මහතාගේ ප්‍රධානත්වයෙන් රෝහල් පරිශ්‍රයේ දී පැවැත්විණි. එහිදී මන්ත්‍රීවරයා ජාතික කොඩිය එසවූ අවස්ථාව මෙහි දැක්වේ.

■ සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

# කන්තලේ ජල පවිත්‍රාගාරය නිරීක්ෂණයට මන්ත්‍රී කපිල නුවන් එක්වෙයි



ජනාධිපතිවරයාගේ සැමට පානීය ජලය ලබාදීම සංකල්පය අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සියලුම ජනතාවට පිරිසුදු පානීය ජලය ලබාදීම සඳහා කඩිනමින් පියවර ගැනීමට මේ වනවිටත් අවශ්‍ය සැලැසුම් සකස් කර ඇතැයි ත්‍රිකුණාමලය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කපිල නුවන් අතුකෝරළ මහතා පසුගියදා (29) කන්තලේ දී පැවැසී ය.

මුළු දිස්ත්‍රික්කයේම ජනතාවට පානීය ජලය ලබාදීම සඳහා දැනට ජලය බෙදාහරින කන්තලේ ජල පවිත්‍රාගාරය නිරීක්ෂණය කිරීම සඳහා පැමිණි අවස්ථාවේ ඒ මහතා මාධ්‍ය වෙත මෙසේ අදහස් දක්වමින් කියා සිටියේ ය.

අපි මේ පිළිබඳ සැලැසුමක් සකස් කොට තියෙනවා. සීමාවකින් තොරව ජල පවිත්‍රාගාරය අලුත්වැඩියා කොට මුළු දිස්ත්‍රික්කයටම ජලය ලබාදීම, පානීය ජලය නොලැබෙන ප්‍රදේශ වලට ජලය ලබාදීමට නව ජල පවිත්‍රාගාර 2ක් ඉදිකිරීම හා අපතේ යන ජල ප්‍රමාණය අවම කර ගැනීම, ඉදිරි වර්ෂ 5 සඳහා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවක් පිහිටුවා නවතා ඇති ව්‍යාපෘති හැකි ඉක්මනින් ආරම්භ කිරීම.



## රාජ්‍ය ඇමැති ජීවන් තොණ්ඩමන් මහ සඟරුවනේ ආශිර්වාදය ලබාගනී...

**බුද්ධි කරුණාරත්න**

තමා ආරම්භ කළ නව දේශපාලන ගමනට මහා සංඝරත්නයේ ආශිර්වාදය ලබා ගැනීමට වතු නිවාස සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය ඇමැති ජීවන් තොණ්ඩමන් මහතා ඊයේ (02) අස්ගිරි පාර්ශ්වයේ මහානායක වරකාගොඩ ශ්‍රී ඥානරතන හිමියන් බැහැදුටුවේය. ලංකා කම්කරු කොංග්‍රසයේ උප ලේකම්, වෘත්තීය සමිති කටයුතු සහ ජාත්‍යන්තර කටයුතු භාර අධ්‍යක්ෂ භරත් අරුල්සාමි සහ හිටපු පළාත් සභා මන්ත්‍රී ඊ. මදියුගරාජා මහත්වරුද මේ අවස්ථාවට සහභාගි වූහ.

# නව ව්‍යවසායක් ඇරඹීමේදී තමන්ට ඉලක්කයක් තිබිය යුතුයි

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති මහින්ද සාලිය

**ජයසිරි මුණසිංහ**

කොවිඩ්-19 ගෝලීය වසංගතය ඇතුළු තවත් හේතු ගණනාවක් නිසා බිඳවැටුණු ව්‍යාපාර යළි ඉක්මනින් නඟාසිටුවීමට RDB පුනර්ජීවන වැඩසටහන සහ ව්‍යවසායකයන් දැනුවත් කිරීමේ හමු රට පුරා සංවිධාන කරන බව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති මහින්ද සාලිය මහතා ප්‍රකාශ කළේය.

මහනුවර දිස්ත්‍රික් ව්‍යවසායකයන් සඳහා ණය මුදල් ප්‍රදානය කිරීම සහ මධ්‍යම පළාතේ දිරිමත් ව්‍යවසායකයන් දැනුවත් කිරීමේ ව්‍යවසායක හමුව ඉකුත් 29වැනිදා මහනුවර පැවැති අවස්ථාවට එක්වෙමින් සභාපතිවරයා මේ බව කියා සිටියේය. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් ගාමිණී රාජරත්න මහතා ප්‍රධාන ආරාධිතයා වශයෙන් මේ අවස්ථාවට එක්විය. මධ්‍යම පළාතේ කුඩා ව්‍යාපාර සංවර්ධන දෙපාර්තමේන්තු, කාර්මික සංවර්ධන මණ්ඩලය, කඳුරට ගුවන්විදුලිය ආදී ආයතන නියෝජනය කරමින් එහි උසස් නිලධාරීහු මේ අවස්ථාවට සහභාගි වූහ.

එහිදී වැඩිදුරටත් මහින්ද සාලිය මහතා මෙසේද කීය. නව ව්‍යවසායකයන් දිරිමත් කිරීම සඳහා RDB පුනර්ජීවන ණය වැඩසටහන මේ වන විට රට පුරා ක්‍රියාත්මක වෙනවා. මෙහිදී ණය මුදලක් ලබාදීමට අමතරව ව්‍යවසායකත්වයක් ගොඩනගා ගැනීමේදී අනුගමනය කළයුතු යහපත් ගුණාංග පිළිබඳ ගනුදෙනුකාර ව්‍යවසාය ප්‍රජාවට කරුණු කියාදෙනවා.

නව ව්‍යවසායක් ඇරඹීමේදී තමන්ට ඉලක්කයක් තිබිය යුතුය. කොතරම් බාධක, අභියෝග පැමිණියත් ඉලක්කය ජයගන්නා තුරු දිරිමත්ව කටයුතු කළ යුතුය. එක දවසින් මහා පරිමාණ ව්‍යවසායකයකු බිහිවන්නේ නැහැ.ඒ නිසා ක්‍රමක් ක්‍රමයෙන් නැඟී සිටීමට නවක ව්‍යවසායකයන් ඉවසීමෙන් කටයුතු කළ යුතුය. ණය මුදල් තම ව්‍යාපෘතියේ ආයෝජනය කරනවා හැර අඩුම තරමේ මේ ණය මුදලින් ටොපියක්වත් දරුවන්ට සෙල්ලම් බඩුවක්වත් අරගෙන දීමට නොයෙදිය යුතුය. එසේ නොකොට අරමුණු ගතව ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කොට ඉන් ලබන ලාභය ණය ආපසු ගෙවීමටත් අනෙකුත් පරිභෝජන සඳහාත් යෙදවිය හැකියි.

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් ගාමිණී රාජරත්න මහතා -

අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට මෙන්ම දුප්පත්කම දුරුකිරීම සඳහා විශාල කාර්යභාරයක් බැංකු පද්ධතියට කළ හැකිය. එහිදී විශේෂයෙන් ගම්බද දුප්පත් ජනතාවගේ නවෝදය සඳහා අතදීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වැනි ආයතන ඉතා කැපවීමෙන් කටයුතු කරන බව අමුතුවෙන් කිව යුතු නොවේ. ජනතාවට වඩාත් සමීප සුහදශීලී ගනුදෙනුකාර සේවයක් ඔවුන්ට ලබාදෙන බැංකුවක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව නම් කිරීමට මට පුළුවන්. එහි ගනුදෙනුකාර සේවා පිළිබඳ ජනතාව සතුටින් කතා කරනවා.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් හා බැංකු සේවා) ලලිත් පිහිල්ලන්ද මහතා-

අප බැංකුවේ මුළු ගනුදෙනුකරුවන් සංඛ්‍යාව ලක්ෂ 60ක් වෙනවා. මේ ප්‍රමාණයෙන් ලක්ෂ 40ක් සක්‍රියව ගනුදෙනු කරනවා. අපේ බැංකුවෙන් ණය මුදල් ලබාගෙන කෘෂිකර්මාන්ත, ධීවර, සත්ත්ව නිෂ්පාදන, කර්මාන්ත, වෙළෙඳාම, සංචාරක, ඉදිකිරීම් හා වෙනත් ව්‍යවසායක කටයුතු සිදුකරන ගනුදෙනුකරුවන් පිරිස ලක්ෂ 8ක් වෙනවා.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මධ්‍යම පළාත් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී ඩී.එම්. සේනාරත්න බණ්ඩාර-

මහනුවර දිස්ත්‍රික්කයේ ශාඛා 19ක් ක්‍රියාත්මක වෙනවා. මේ ශාඛා 19 අතරින් මේ ව්‍යවසායක හමුවට හා ණය ප්‍රදාන අවස්ථාවට සම්බන්ධ කරගනු ලබන්නේ ශාඛා 13ක ව්‍යවසායකයන් 281ක පිරිසක්. අනෙක් ශාඛා 6 ණය ප්‍රදාන මීට පෙර අවස්ථාවකදී සිදුකළා. එසේ සිදුකළත් ඉදිරියටත් ශාඛා සියල්ලගේම අලුත් ණය ලබාදීම්ද සිදුකරනවා.

2019 RDB හොඳම ව්‍යවසායක කාන්තාව තේරීමේ තරගයෙන් ජයගත් මධ්‍යම පළාතේ ආයුර්වේද වෛද්‍යාචාරිනී නදීකා ගජනායක මහත්මිය ද මෙහිදී අදහස් දැක්වූවාය.

2019 RDB හොඳම ව්‍යවසායක කාන්තාව තේරීමේ තරගයෙන් ජයගත් මධ්‍යම පළාතේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ ව්‍යවසායක කාන්තාවන්ට තෑගි හා තිළිණ ප්‍රදානය, RDB සූර්ය බලශක්ති ණය පිරිනැමීම ද සිදු කෙරිණි.

මහනුවර දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා එස්.එල්.ඩී මනෝජා, කාර්මික සංවර්ධන මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලලිත් හීන්කෙන්ද, කඳුරට එෆ්.එම්.සේවයේ ප්‍රධානී සමන් ජයරත්න, RDB බැංකුවේ මධ්‍යම පළාත් සහකාර සාමාන්‍යාධිකාරී ඩී.එස්. ටී.රණතුංග, ප්‍රධාන කළමනාකරු එස්. එස්. දිසානායක, දිස්ත්‍රික් කළමනාකරු ආනන්ද තොටදෙණිය, සහකාර දිස්ත්‍රික් කළමනාකරු කේ.ජී.චන්ද්‍රරත්න, චමින්ද වනිගසේකර, අලෙවි කළමනාකරු ක්‍රිෂාන්ත පයාගල මහත්ම මහත්මීන් ඇතුළු බැංකුවේ ශාඛා කළමනාකරුවෝ ගනුදෙනුකරුවෝ විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.




2019 RDB මධ්‍යම පළාත් හොඳම ව්‍යවසායිකාව තේරීමේ තරගයේ ජයග්‍රාහකයන්ට තෑගි සහ සහතික පිරිනැමීම ආරාධිත අමුත්තන් අතින් සිදු වූ අවස්ථාව.

# NGO නඩයේ දිව දෙකේ කතා

ජනතා පරමාධිපත්‍ය පිළිබිඹු කරන ප්‍රධාන මැතිවරණ දෙකකට අනතුරුව අතිබහුතරය විසින් තෝරාගන්නා ලද ජනාධිපතිවරයකු ද 2/3ක බලයක් සහිත පාර්ලිමේන්තුවක් ද බිහි වූ පසු මැතිවරණ පොරොන්දු ඉටු කිරීමට මූලික අඩිතාලම වශයෙන් නව ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනඒමට පියවර ගැනීමත් සමඟ ඩොලර් ගැති NGO නඩය එයට බාධා කිරීමට අලුත් ප්‍රජාතන්ත්‍රවාදයක අර්ථකථන ඉදිරිපත් කරති.

තමන් විසින්ම දේශපාලන විද්‍යාඥයකු ලෙස හඳුන්වාගෙන ඇති දයාන් ජයතිලක පවසන්නේ 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුවහොත් 'අවිගත් අනගාරික ධර්මපාල' කෙනෙකු බිහි වන බවය. මේ ලියුම්කරුට එක්වරම සිහි වන්නේ දැඩි මහින්ද රාජපක්ෂ විරෝධී ප්‍රචාරයක යෙදී සිටි දයාන් ජයතිලක ප්‍රකට වාමාංශික න්‍යායාචාර්යවරුන් වූ ග්‍රැම්සි, අල්තුසාර්, කාල්මාක්ස් සහ ලෙනින්ගේ මත ප්‍රචාරය තාවකාලිකව නවතා නූතන ධර්මපාල කෙනකු ලෙස මහින්ද හඳුන්වාදීමට තීරණය කළේ තානාපති පදවියක් දෙන බවට දුන් පොරොන්දුවත් සමඟ බවය.

බටහිර න්‍යායන් ඉදිරිපත් කරමින් මහින්ද විරෝධය සිය එකම ප්‍රතිපත්තිය කරගත් ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසියෙන් සිංහල කතා කරන පාක්‍යසෝති සරවනමුත්තු සිය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හරහා 20 විරෝධී දැඩි ප්‍රචාරයක් ගෙන යන්නේ තම අරමුණ ප්‍රජාතන්ත්‍රවාදය බේරා ගැනීම බව කියමිනි.

අනෙක් විවේචකයා වන ආචාර්ය ජයදේව උයන්ගොඩ පවසන්නේ 20න් අධිකාරී ජනාධිපතිවරයකු බිහි වන බවය. ඒ අතරම තමන් ගෝඨාභය ඒකාධිපතිවාදියකු ලෙස හැඳින්වීමට සූදානම් නැති බව ද ඔහු පවසයි. ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා සිවිල් සමාජය බිල්ලකු ලෙස හඳුන්වා දීමට උත්සාහ කරන්නේයැයි කියමින් ඔහු බිය පළ කරන්නේ සිවිල් සමාජය ලෙස තමන් විසින්ම හඳුනාගත් NGO නඩයට විදෙස් මුදල් ලැබීම ආදී අක්‍රමිකතා සම්බන්ධයෙන් සොයා බැලීමට රජය මේ බලතල උපයෝගී කරගනු ඇත කියාය.

මේ ප්‍රජාතන්ත්‍රවාදය රකින පතාක යෝධයන් 2002 දී රනිල් වික්‍රමසිංහ රජය විසින් විධායක ජනාධිපතිනියට හෝ කැබිනට් මණ්ඩලයට නොදන්වා කෲර ත්‍රස්තවාදී කොටි නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් සමඟ ගිවිසුමකට එළඹීමට කටයුතු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී බවයි. එහෙත් ඔවුන්ගේ මතයට අනුව 69 ලක්ෂයක බහුතර ඡන්දය ලබා විධායක ජනාධිපති පදවියට පත් ගෝඨාභය රාජපක්ෂ 2/3ක පාර්ලිමේන්තු බලයක් සහිතව මැතිවරණයේදී ජනතාවට දුන් පොරොන්දු ඉටු කිරීමට ව්‍යවස්ථාව සංශෝධනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී නොවන බවය.

මේ අරුම පුදුම ප්‍රජාතන්ත්‍රවාදී අර්ථකථනයන් සොයා ගැනීමට දයාන්, පාක්‍යසෝති හා ජයදේව යුහුසුලු වූයේ කාගේ න්‍යායක් මතදැයි ඔවුහු හෙළි නොකරති. එහෙත් සාමාන්‍ය දේශපාලන දැනුමක් සහිත ජනතාවට පවා ඔවුන්ගේ බටහිර ගැති ඩොලර් ගැති න්‍යාය පත්‍රය සක්සුදක් සේ පැහැදිලිය. ප්‍රජාතන්ත්‍රවාදය රකින මේ 'ප්‍රජාතන්ත්‍රවාදී පතාක යෝධයන්' හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ සහ ඔහුගේ විදේශ ඇමැති මංගල සමරවීර ඔවුන්ගේම ජනාධිපතිවරයාටත් රහසින් කැබිනට් මණ්ඩලයට හෝ පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළ මානව හිමිකම් සුරැකීමේ හවුල් යෝජනාවක් එක්සත් ජනපදය හා යුරෝපීය ජාතීන් සමඟ එක්ව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයට ඉදිරිපත් කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සලකති. එහෙත් ජනාධිපති ගෝඨාභය මැතිවරණ පොරොන්දුවකට ජනතා වරම ලබා ජිනීවා යෝජනාවෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම ඔවුන්ගේ මතයට අනුව ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනිය.

මහාචාර්ය උයන්ගොඩ පවසන්නේ ජනාධිපති රාජපක්ෂ හමුදා මානසිකත්වයකින් අධිකාරිවාදී පාලනයකට ක්‍රමයෙන් පිවිසෙන බවය. එහෙත් ප්‍රභාකරන් උතුර බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින විට බිෂොප් කෙනත් ප්‍රනාන්දු සහ චාල්ස් අබේසේකර සමඟ වන්නියට ගොස් ඔහු හමු වූ අවස්ථාවේදී ළමයින් හා කාන්තාවන් ද ඇතුළුව සිංහල සිවිල් වැසියන්ව අමු අමුවේ මරා දමන්නේ මන්දැයි ප්‍රභාකරන්ගෙන් අසා සිටියේ නැත. ඒ වෙනුවට ඔවුන් කළේ ප්‍රභාකරන්ගේ ගුණ වර්ණනා කිරීමය. ප්‍රභාකරන්ට තදින් සාමය අවශ්‍ය යැයි ඔවුහු පැවසූහ. එහෙත් අද උතුරේ ජන සමාජයට සෙසු පළාත්වල ජනයා හා සම ලෙස වාසය කළ හැකි පරිසරයක් ඇති කිරීමට කටයුතු කරන ගෝඨාභය රාජපක්ෂගෙන් ඔවුන් ඉල්ලා සිටින්නේ පළමුව අතුරුදන්වූවන් ගැන සොයා බලන ලෙසටය. ඔවුන් කවදාවත් ප්‍රභාකරන්ගෙන් හෝ ත්‍රස්තවාදී අතකොළු බවට පත් වූ දෙමළ දේශපාලනඥයන්ගෙන් ප්‍රභාකරන් බලහත්කාරයෙන් රඳවාගෙන සිටි ළමා සොල්දාදුවන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටියේ නැත.

උයන්ගොඩ පසුගියදා සඳහන් කළේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුව හොත් ශ්‍රී ලංකාව 1931දී සර්වජන ඡන්ද බලය හිමි වීමට පෙර පැවති දැඩි ආඥාදායක අධිරාජ්‍යවාදී පාලන යුගයට ආපසු යන බවයි. විසිවන ව්‍යවස්ථා සංශෝධනය සම්මත වන්නේ ජනතාවගේ තුනෙන් දෙකක අනුග්‍රහයෙන් පත් වූ ප්‍රජාතන්ත්‍රවාදයේ මුදුන් මල්කඩ වන පාර්ලිමේන්තුවකින් බව උගත් මහාචාර්යවරයාට අමතක වී ඇත. පසුගිය මැතිවරණ දෙකම ඉතා සාධාරණ ලෙස පැවති බව ද ඔවුන්ට අමතකය.

ජාතික ආරක්ෂාව සඳහා විධායක ජනාධිපති බලතල අවශ්‍ය නැතැයි මේ NGO නඩය පවසයි. එහෙත් ජාතික ආරක්ෂාව අඩාළ කරමින් බල සමතුලනය බිඳීයෑමට හේතු වූ කරුණ විග්‍රහ කිරීමට ඔවුහු අකැමැතිය. ජාතික ආරක්ෂාව බිඳ වැටුණේ 19න් බල ක්ෂේත්‍ර දෙකක් බිහි වූ නිසාය. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විශාල මිනිස් ඝාතනයක් හා විනාශයක් සිදු වූයේත් එවකට පැවති අනාරක්ෂිත තත්ත්වය යටතේය. එය නිවැරැදි කිරීම, ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමට අත්‍යවශ්‍යය. මහාචාර්යවරුන්ට නොතේරුණ ද මේ සත්‍යය ජනතාව හොඳින් වටහාගෙන ඇත. සෞඛ්‍ය බලධාරීන්, හමුදාවේ ද සහාය ඇතිව කොවිඩ් වසංගතය පාලනය කර, එසේ කළ ලොව දෙවන සාර්ථකම රට බවට ශ්‍රී ලංකාව පත් කරවීමෙන් ජනතාවට එය වඩාත් තහවුරු විය. එය මෙහෙයවීමට මූලිකත්වය ගත් සෞඛ්‍ය ලේකම්, වෛද්‍ය සංජීව මුණසිංහ හමුදා වෛද්‍යවරයකුව සිටීම නිසා ඔහුව පත් නොකළ යුතුව තිබුණේයැයි මේ NGO නඩය විසින් තර්ක ඉදිරිපත් කරති. ඔවුන්ගේ එකම අරමුණ බටහිර න්‍යාය පත්‍රය ඉටු කිරීම මිස ජනතා යහපත නොවේ.

**උපනන්ද නන්දිමිත්‍ර**

# සියලු කාන්තාවන් සහ ගැහැනු ළමයින් සවිබල ගැන්වීමට කැප වී සිටිනවා

## කාන්තාවන් පිළිබඳ 4 වැනි ලෝක සමුළුවේදී ඇමැති **දිනේෂ් කියයි**

**මහින්ද අලුත්ගෙදර**

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සහ සියලු කාන්තාවන් හා ගැහැනු ළමයින් සවිබල ගැන්වීම සඳහා කැප වී සිටින බව කාන්තාවන් පිළිබඳ 4 වැනි ලෝක සමුළුවේදී ශ්‍රී ලංකාව අවධාරණය කරයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුත් වත්මන් රජය තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා ඇපකැප වී සිටින අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් හා ගැහැනු ළමයින් සවිබල ගැන්වීම අරමුණ වී තිබෙන බවද එලදායී පුරවැසියෙක්, තෘප්තිමත් පවුලක්, විනයගරුක හා සාධාරණ සමාජයක් සහ සමෘද්ධිමත් ජාතියක්' යන සිව් වැදෑරුම් ප්‍රතිඵල ළඟා කර ගැනීමට ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 10ක් හඳුනාගෙන තිබෙන බවද විදේශ සබඳතා ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා පෙන්වා දෙයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ කාන්තාවන් පිළිබඳ 4 වැනි ලෝක සමුළුවේ 25 වන සංවත්සරයේ ඉහළ පෙළේ රැස්වීම අමතමිනි. "ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ සියලුම කාන්තාවන් හා ගැහැනු ළමයින් සවිබල ගැන්වීම සාක්ෂාත් කර ගැනීම වේගවත් කිරීම" යන්න තේමාව කරගනිමින් මෙය පැවැත්විණි.

එහිදී වැඩිදුරටත් විදේශ සබඳතා ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා මෙසේද කීය.

නිසැකවම, 1995 දී පැවති කාන්තාවන් පිළිබඳ 4 වැනි ලෝක සමුළුවේ දී සම්මත කරගන්නා ලද බීජිං ප්‍රකාශනය සහ ක්‍රියාකාරී වේදිකාව කාන්තාවන් සවිබල ගැන්වීමට වූ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන ගෝලීය න්‍යාය පත්‍රයක්. මේ සවිස්තරාත්මක ප්‍රතිපත්ති ලේඛනය, ගෝලීය වශයෙන් කාන්තාවන්ගේ වැඩිදියුණුව හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සඳහා මඟ පෙන්වීමක් හා ප්‍රබෝධයක් ලබාදෙන පදනමක් ලෙස මීට වසර 25කට පෙර දී මෙන්ම අදටත් අදාළ ලෙස පවතිනවා.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ගෝලීය ප්‍රජාව විසින් වැදගත් පියවර රැසක් ගෙන ඇති බව පිළිගන්නා අතරම, කාන්තාවන්ගේ සමාජ-ආර්ථික හා දේශපාලනික සංවර්ධනයට බාධා පමුණුවන අභියෝග සහ බාධක ද අඛණ්ඩව පවතින බව අප පිළිගන්නවා. සෞඛ්‍යයේ සිට ආර්ථිකය දක්වා සෑම ක්ෂේත්‍රයකම කොවිඩ්-19 සෘණාත්මක බලපෑම් ලොව පුරා කාන්තාවන් හා ගැහැනු ළමයින් කෙරෙහි බලපා තිබෙන නමුත් මේ වසංගත තත්ත්වයෙන් ප්‍රකෘතිමත් වීම සඳහා වන ගෝලීය ප්‍රයත්න මධ්‍යයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තාවන් ඉදිරියෙන් සිටීම අත්‍යවශ්‍යයි.

ඓතිහාසික වශයෙන්, රටේ සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා කාන්තාවන් විසින් ලබාදෙන ලද අගනා දායකත්වය පිළිබඳ දැනුවත්ව සිටිමින්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වූ කැපවීම සහ දේශපාලනික කැමැත්ත ශ්‍රී ලංකාව විසින් ප්‍රදර්ශනය කර තිබෙනවා. අපගේ ජනගහනයෙන් අඩකටත් වඩා වැඩි සංඛ්‍යාවක් සිටින ශ්‍රී ලංකාවේ කාන්තාවන්, සාක්ෂරතා අනුපාත, සමාජයට අන්තර්ගත වීම සහ ආයු අපේක්ෂාව වැනි සමාජ සංවර්ධන දර්ශක සාක්ෂාත් කරගෙන සිටින අතර, ඒවා සංවර්ධිත රටවලට සමාන මට්ටමක පවතින බව සඳහන් කිරීම ඉතා දිරිගන්වන සුළුයි.

සෑම ක්ෂේත්‍රයකදීම වැදගත් කාර්යභාරයක් ඉටුකරන මගේ රටේ කාන්තාවන්ගේ ජයග්‍රහණ පිළිගැනීමට ලැබීම පිළිබඳ මම ආඩම්බර වෙනවා. 1931 දී ශ්‍රී ලාංකික කාන්තාවන්ට ඡන්ද අයිතිය (සර්වජන ඡන්ද බලය) ලබාදෙන ලද අතර ශ්‍රී ලංකාව 1960 දී ලොව ප්‍රථම කාන්තා අගමැතිනිය බිහි කර තිබෙනවා. පාර්ලිමේන්තු සහ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරියන්, අමාත්‍යාංශ ලේකම්වරියන්, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල ප්‍රධානීන් සහ අධිකරණය යන අංශවල ශ්‍රී ලාංකික කාන්තාවන් දිගින් දිගටම රටේ ඉහළ තනතුරු ගණනාවක් දරා තිබෙනවා. කාන්තාවන් රටේ වැඩ කරන ජනගහනයෙන් අඩක් නියෝජනය කරන අතර, ඔවුන් උසස් අධ්‍යාපනයේ දීද දස්කම් දක්වනවා. ජාතික ආර්ථිකය සඳහා ඔවුන්ගේ දායකත්වය ඉතා වැදගත්. කාන්තාවන් ශ්‍රම බළකායෙන් සියයට 34.5 ක් නියෝජනය කරන අතර, විදේශීය ශ්‍රම බළකායෙන් සියයට 39ක් කාන්තාවන්ගෙන් සමන්විතයි.

ශ්‍රී ලංකාවේ ජනතාව විසින් අතිමහත් ජනවරමක් ලබා දී ඇති ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුත් රජය තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා ඇපකැපවී සිටින අතර, ඒ අතර පස්වැනි ඉලක්කය වන්නේ "ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් හා ගැහැනු ළමයින් සවිබල ගැන්වීමයි".

ශ්‍රී ලංකාව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සහ සියලු කාන්තාවන් හා ගැහැනු ළමයින් සවිබල ගැන්වීමට වූ සිය ඇප කැපවීම යළි තහවුරු කරයි. මේ වසරේ ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික කාන්තා දින තේමාව වන "ඇය දිරිමත් - රට සවිමත්" යන පාඨය උපුටා දක්වන්න කැමැතියි.



# ලෝක ජනාවාස දින සැමරුම් උත්සවය අගමැති ප්‍රධානත්වයෙන් අනිද්දා

**උපාලි කරුණාරත්න**

ලෝක ජනාවාස දින සැමරුම් උත්සවය-2020 අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අනිද්දා (05) පස්වරු 2.00ට අරලියගහ මන්දිරයේදී පැවැත්වේ. 'සැමට සුවපහසු නිවසක් සතුට සපිරි නගරයක් මෙවර එහි තේමාවයි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත මෙය පැවැත්වෙන අතර 2020 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වන අතර මේ ජාතික උත්සවයට සමගාමීව ජනාවාස සතියක් ප්‍රකාශයට පත් කර ඇත. ග්‍රාමීය, නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැඟිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් මේ මාසයේ හා ඉදිරියේදී වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන බව රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා පැවසීය.

තරුණ පරපුර හා අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් ඉදිකරන යක්කල වැරැල්ලවත්ත මධ්‍යම පාන්තික මහල් නිවාස ක්‍රමය ආරම්භ කිරීම, ඔබට ගෙයක්- රටට හෙටක් වැඩසටහන යටතේ වැඩ අවසන් නිවාස ඇතුළු අනෙකුත් ඉදිකරන ලද නිවාස ජනතා අයිතියට පත් කිරීම, එම වැඩසටහන යටතේ හඳුනාගත් නව නිවාස වල ඉදිකිරීම් ආරම්භ කිරීම, හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම, දිවයිනම ආවරණය වන පරිදි චිත්‍ර තරග සහ ළමා වැඩසටහන් පැවැත්වීම හා ත්‍යාග සම්මාන ප්‍රදානය කිරීම, අවතැන් වූ ප්‍රජාව වෙනුවෙන් ඉදිකළ නිවාස අයිතියට පත් කිරීම, ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන්, දේශන හා වැඩමුළු, උපදේශන වැඩසටහන්, ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් පැවැත්වීම, ඉදිකිරීම් ශිල්පී පුහුණු වැඩසටහන් පැවැත්වීම මෙහිදී සිදු කෙරේ.

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම් හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති නාලක ගොඩහේවා, වතු නිවාස හා යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති ජීවන් තොණ්ඩමන්, එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ ශ්‍රී ලංකා වැඩසටහන් කළමනාකාරු ආචාර්ය චානක තල්පහේවා මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් මෙය පැවැත්වේ.

# රටම දියර කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත කිරීම අරමුණයි

## අරමුණ ජය ගැනීමට ඉදිරි සිව් වසරේ වැඩසටහන් රැසකුත්

### රාජ්‍ය ඇමැති ඩී.බී. හේරත්

**නදී මාණික්කගේ**

සමස්ත රටම දියර කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත කිරීම තම අමාත්‍යාංශයේ අරමුණ බව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය ඇමැති ඩී.බී.හේරත් මහතා පැවසීය. කිරි නිෂ්පාදනයෙන් වයඹ පළාත ප්‍රථමයා කිරීමේ ඒකායන අරමුණ ජය ගැනීමට ඉදිරි වසර හතරේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන බවත් ඇමැතිවරයා මෙහිදී පැවසීය. ඇමැතිවරයා මේ බව පැවසුවේ වයඹ පළාත් වන්නිගම, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී වයඹ පළාත් කිරි ගොවීන්ගේ ගැටලු හඳුනා ගැනීමේ සහ විසඳුම් සෙවීමේ හමුවකට එක්වෙමිනි.

කිරි ගව පාලනය ආදි කාලයේ සිට අපේ ජනතාවගේ ආගම, සංස්කෘතිය හා බැඳුණු දෙයක් බවත් අනුරාධපුර යුගයේ සිට අප රටේ කිරි ගව පාලනය ඉතාමත් ඉහළ මට්ටමක තිබුණු අතර ඒ කාලයේදී කිරි ගවයා පූජනීය තත්ත්වයෙන් සලකා ඇති බවත් පැවසූ ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීය.

1505 සුද්දා මෙරටට ආවයින් පසුව අපේ සංස්කෘතියත් ආගමත් සමගම කිරි ගව පාලනයත් විනාශ කළා. නමුත් ඉන්පසු පැවති සෑම දේශපාලන පක්ෂයක්ම සෑම රජයක්ම මේ ක්ෂේත්‍රය නැවත යථා තත්ත්වයට පත් කිරීමට සක්‍රියව දායක වුණේ නැහැ.

එහෙත් වර්තමාන ජනාධිපතිගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "සෞභාග්‍යයේ දැක්ම-කිරෙන් සපිරි රටක්" මගින් කිරි ගව සම්පත නගා සිටුවීමට වැඩපිළිවෙළක් සකසා තිබුණා. එහි අර්ථය අපගේ දේශය කිරෙන් ඉතිරේවා යන්නයි. ඒ අනුව අපේ ගව සම්පත වැඩි දියුණු කර, වැව් අමුණු ඇළ දොළවල් සංවර්ධනය කර, තණ බිම් ටික සශ්‍රීකව වැඩි දියුණු කළොත් අපට අපගේ අරමුණ කරා යන්න පුළුවන්. අපගේ ක්ෂේත්‍රයේ පළමුවැනියා වෙන්නේ ගොවි මහත්වරුන්.

ගොවීන්ට හොඳට සලකලා බලා ගත්තොත් අපට මේක දියුණු කරන්න පුළුවන්. ඒ වගේම අපගේ එළදෙනට හොඳට සලකන්න ඕනෑ. වෙලාවට වතුර ටික, ආහාර ටික ලබා දීලා උන්ට ආදරය, සෙනෙහස දක්වන්න ඕනෑ. බුද්ධ වචනය අනුව අන්‍යයන්ට අප සලකලා ගෞරව දැක්වුවහොත් නිතැතින්ම ඒ අය අපට ගෞරව කරාවි යන සංකල්පය මත කිරි දෙනුන්ද අපට වැඩි කිරි ප්‍රමාණයක් ලබාදේවි.

අපගේ ගොවීන්, පශු වෛද්‍යවරු, සත්ව සංවර්ධන නිලධාරීන් වගේම අමාත්‍යාංශ නිලධාරීන් ඇතුළු මම එක පවුලක් විදිහට හිතන්න. ඒ පවුලේ දුවා දරුවන්ට කරදරයක් වුණාම අම්මා තාත්තා ඒ ගැන සොයා බලන්න ඕනෑ. එවා විසඳන්න ඕනෑ. ඒ ප්‍රශ්න විසඳුවාම තමයි පවුලේ සමගිය ඇති වී දියුණු වෙන්නේ.

වයඹ පළාතේ දෛනිකව කිරි ලීටර 1,75,000ක් නිපදවනවා. එය ලංකාවේ දෛනික නිෂ්පාදනයෙන් 20%ක් පමණ වෙනවා. ඉදිරි වසර කීපයේ එය ලීටර 3,50,000 කිරීමයි වයඹ පළාතේ ඉලක්කය.

මෙහිදී පැමිණ සිටි ගොවීහු ක්ෂේත්‍රයේ දියුණුවට විවිධ අදහස් යෝජනා ඉදිරිපත් කළහ.

අමාත්‍යාංශ ලේකම් එස්. සේනානායක, අතිරේක ලේකම් (පශු සම්පත්) වෛද්‍ය නිරෝෂන් ගමගේ, පළාත් අමාත්‍යාංශ ලේකම් ගීතා ධර්මසිරි ඇතුළු නිලධාරීහු පිරිසක් සහ වයඹ පළාතේ කිරි ගොවීහු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

# ක්‍රීඩාංගණවල සංගීත සංදර්ශන පැවැත්වීම : ප්‍රතිපත්තිමය තීන්දුවකට ඇමැති අවධානය



ලෝක ළමා දිනය නිමිත්තෙන් ටොරින්ටන් ක්‍රීඩාංගණයේ පැවැති චලන කුසලතා සංවර්ධන වැඩසටහනේදී තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා දරුවන් සමඟ.

## ක්‍රීඩා පාසල් 10කට මීටර් 130 සින්තටික් ධාවන පථ

**ප්‍රින්ස් ගුණසේකර**

ක්‍රීඩාංගණ තුළ වාහන ගාල් කිරීම හා සංගීත සංදර්ශන පැවැත්වීම සම්බන්ධව ඉදිරියේදී දැඩි ප්‍රතිපත්තිමය තීන්දුවලට එළැඹීමට ක්‍රීඩා අමාත්‍යාංශය සූදානම් වෙයි. ඒ අනුව ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් ඇති පොදු සම්පත් රැකදීමේ වැඩපිළිවෙළක් ඉදිරියේදී සැකසීමට බලාපොරොත්තුවන බව තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා පවසයි.

"ක්‍රීඩාංගණවල වේදිකා ගහන්න දෙන්න එපා. ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් සංවර්ධනය කරන ක්‍රීඩා පිටි වේදිකා ගහලා සංදර්ශන පැවැත්වුවාම යළිත් පරණ තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා දේශපාලන අධිකාරියෙන්, විදුහල්පතිවරුන්ගෙන් හා මව්පියන්ගෙන් ඉල්ලා සිටින්නේ දරුවන්ගේ සම්පත් රැක ගැනීමට අවධානය යොමු කරන ලෙසයි" ක්‍රීඩා ඇමැතිවරයා එලෙස ඉල්ලීමක් කළේය.

පසුගියදා අවස්ථා කිහිපයකදීම ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩාංගණ පහසුකම් හා අනෙකුත් යටිතල පහසුකම් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් අදහස් දැක්වීම විශේෂත්වයකි. ක්‍රීඩක ක්‍රීඩිකාවන් එදිනෙදා පුහුණුවීම් සිදු කරන ටොරින්ටන් ක්‍රීඩාංගණයේ වාහන නවතා තැබීම හේතුවෙන් ක්‍රීඩාංගණය හානි වීම දැක එසැණින් ක්‍රීඩාංගණය යථා තත්ත්වයට පත් කිරීමට ක්‍රීඩා ඇමැතිවරයා නිලධාරීන්ට නියෝග කරනු දක්නට ලැබිණි. මේ අතර, රට පුරා ඇති ක්‍රීඩා පාසල් 25කින් මූලික අදියරේ තෝරා ගත් ක්‍රීඩා පාසල් 10කට මීටර් 130 සින්තටික් ධාවන පථ ඉදි කිරීමට ද ක්‍රීඩා ඇමැතිවරයාගේ අවධානය යොමුව තිබේ. එම වැඩපිළිවෙළ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීමට දැනටමත් ආරම්භ කොට ඇත. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී වන අන්තර්ජාතික තරග සියල්ල සින්තටික් ධාවන පථවල පමණක් පැවැත්වෙන හෙයින් මෙරට පුහුණු කටයුතුවලදී එවැනි පහසුකම් දීම අත්‍යවශ්‍ය කරුණක් බව බොහෝ කලක සිට කතාබහට ලක් වන මාතෘකාවකි. දැනට ශ්‍රී ලංකාව තුළ සින්තටික් ධාවන පථ ඇත්තේ දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේ හා කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේ පමණි.

ක්‍රීඩා පාසල් සියල්ලට කායවර්ධන පහසුකම්, නේවාසික පහසුකම් දීමට ද නියමිත බව ක්‍රීඩා ඇමැතිවරයා සඳහන් කර සිටියේය. ක්‍රීඩා පාසල්වලට මෙතෙක් දරුවන් ඇතුළත් කරගන්නා ක්‍රමවේදය ඉදිරි කාලයේදී වෙනස් කොට පළාත් පාලන ආයතන මට්ටමෙන් හා දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රීඩා සංගම් සම්බන්ධ කොට නව වැඩපිළිවෙළක් සැකසීමට අවධානය යොමු වී ඇත. එහිදී ක්‍රීඩා දක්ෂතා ඇති දරුවන්ගේ කුසලතාවන් වැඩමුළුවක් මඟින් හඳුනාගෙන ක්‍රීඩා පාසල්වලට ඇතුළත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට නියමිතය.

## කබඩි ප්‍රීමියර් ලීග් තරගාවලියට ක්‍රීඩකයන් සොයයි

2016 වර්ෂයේ සිට 2020 දක්වා ශ්‍රී ලංකා ජාතික කබඩි කණ්ඩායම නියෝජනය කළ ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ ක්‍රීඩකයන් සහ සංචිතගතව පුහුණුවීම් කළ ක්‍රීඩකයන් හා ජාතික මහා ක්‍රීඩා උලෙළ නියෝජනය කළ ක්‍රීඩකයන්, අන්තර් ක්‍රීඩා සමාජ (national club), අන්තර් දිස්ත්‍රික් තරගාවලි නියෝජනය කළ ක්‍රීඩකයන්ගේ කබඩි ප්‍රීමියර් ලීග් තරගාවලියට සම්බන්ධ කර ගැනීමට කබඩි සංගමය තීරණය කරයි.

මේ මස 5 දිනට පෙර 0717954729 දුරකතන අංකය වෙත whatsapp මඟින් නම, උපන් දිනය, ක්‍රීඩා සමාජය, ක්‍රීඩා කරන ස්ථානය, ලබා ඇති ඉහළම දක්ෂතාව සහ වර්ෂය, වර්තමාන පුහුණුකරු හා පැහැදිලි ඡායාරූපයක් එවන මෙන් සියලු ක්‍රීඩකයන්ගෙන් ඉල්ලා සිටී.

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel

### 42 වන ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මඟින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මඟින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ....................

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: ....................

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

පාසල : ....................

ඔබේ නම : ....................

ලිපිනය : ....................

ජංගම දුරකථන අංකය : ....................

SUNDAY OBSERVER

**vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.**

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-10-03 **අංකය** 30



# බෙයාර්ස්ටෝව් ටෙස්ට් පිටියට නෑ

එංගලන්ත පිලේ කඩුලු රකින පිතිකරු ජොනී බෙයාර්ස්ටෝව් වසර 2020-21 තරග වාරයේ ටෙස්ට් ක්‍රිකට් ගිවිසුමට ඇතුළත් නොකිරීමට එරට ක්‍රිකට් පාලක මණ්ඩලය තීරණය කර ඇත. ඔහු තව දුරටත් එක්දින කණ්ඩායමේ පමණක් රඳවා ගැනීමට තීරණය වී ඇත.

යෝක්ෂයර් ප්‍රාන්ත පිල නියෝජනය කරන 31 හැවිරිදි බෙයාර්ස්ටෝව් පසුගියදා එංගලන්තයේ පැවැති බටහිර ඉන්දීය කොදෙව් සහ පාකිස්තාන ටෙස්ට් තරගමාලාවෙන් ද ඉවත් කර තිබිණි.

# මුම්බායි එකට එයි



කිරන් පොලාඩ්

නායක රෝහිත් ශර්මාගේ සහ කිරන් පොලාඩ්ගේ වේගවත් පිති හරඹයන් හේතුවෙන් අයිපීඑල් ක්‍රිකට් තරගාවලියේ 13 වැනි තරගයෙන් කිංග්ස් ලෙවන් පන්ජාබ් පිල පරදවා ලකුණු 48ක ජයක් අත් කර ගැනීමට මුම්බායි ඉන්දියන්ස් පිල සමත් විය.

මේ සමඟ තරගාවලියේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට ද මුම්බායි පිලට හැකි විය.

අබුඩාබිහිදී පැවැති තරගයේ පළමුව පන්දුපහර දෙමින් මුම්බායි පිල දුන් ලකුණු 192ක ඉලක්කය හමුවේ පන්ජාබ් පිලට ඕවර 20 අවසානයේ රැස් කළ හැකි වූයේ ලකුණු 143ක් පමණි.

නිකලස් පූරාන් ලකුණු 44ක් රැස් කරමින් පන්ජාබ් ඉනිමේ වැඩිම ලකුණුලාභියා වෙද්දී, මයාන්ක් අග්‍රවාල් ලකුණු 25ක් සහ ක්‍රිෂ්නප්පා ගෞතම් ලකුණු 22ක් ඉනිමට එක් කළ ද කණ්ඩායම ජයග්‍රහණය කරා ගෙන යෑමට නොහැකි විණි.

පන්දු යැවීමේදී ජස්ප්‍රිට් බුම්රා, රාහුල් චහාර් සහ ජේම්ස් පැටින්සන් කඩුලු 2 බැගින් බිඳ දැමූහ.

රෝහිත් ශර්මා පන්දු 45කින් ලකුණු 70ක් මුම්බායි ඉනිමට එක් කළේ හතරේ පහර 8ක් සහ හයේ පහර 3ක් සමඟිනි. මේ සමඟ අයිපීඑල් තරග බිමේ ලකුණු 5000 සීමාව පසු කළ තෙවැනි ක්‍රීඩකයා ලෙස වාර්තා අතරට එක්වීමට ද ශර්මාට හැකි විය. ඔහුට පෙර විරාට් කෝලි සහ සුරේෂ් රයිනා එම සීමාව පසු කර තිබිණි.

ඉනිම නිමා වීමට පන්දු 23ක් ඉතිරිව තිබියදී පිටියේ එක් වූ කිරන් පොලාඩ් සහ හර්දික් පාන්ඩ්‍යා වේගවත් ලකුණු 67ක සබඳතාවක් ගොඩනැඟීමට සමත් වූහ.

තරගයේ වීරයා සම්මානය හිමි කර ගත් පොලාඩ් හතරේ පහර 3ක් සහ හයේ පහර 4ක් සමඟින් ලකුණු 47ක් රැස් කළේ පන්දු 20ක් පමණක් වැය කරමිනි. පන්දු 11කදී ලකුණු 30ක් රැස් කළ පාන්ඩ්‍යා හතරේ පහර 3ක් සහ හයේ පහර 2ක් ඉනිමට එක් කර ගත්තේය.

# බදුරලිය ප්‍රහාරය හමුවේ යුද හමුදා ගමන පමා වෙයි

## තීරණාත්මක තරග රැසක් හෙට

**නිරෝෂාන් ප්‍රියංකර**

අන්තර් සමාජ අවුරුදු 23න් පහළ ක්‍රිකට් තරගාවලියේ අවසන් පූර්ව වටයට පසුවෙන්ම පිවිසීමට යුද හමුදා ක්‍රීඩා සමාජයට තිබූ අවස්ථාව අහිමි කළ බදුරලිය ක්‍රීඩා සමාජය තරගාවලියේ 6 වැනි දිනය යටතේ පැවැති තරගයෙන් කඩුලු 5ක ජයක් අත් කර ගත්තේය.

මේ තරගාවලියේ 'ඒ' කාණ්ඩයේ තරග වදින යුද හමුදාව මේ වන විට ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණේ පසු වුවද අත් කර ගෙන ඇත්තේ ජයග්‍රහණ 4ක් පමණි. මේ ජය සමඟ බදුරලිය පිල ද ජයග්‍රහණ 4ක් සමඟින් දෙවැනි ස්ථානයේ පසු වෙයි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධාන කරන මේ තරගාවලියේ මූලික වටයේ තරග කාණ්ඩ 4ක් යටතේ පැවැත්වෙන අතර, ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගන්නා කණ්ඩායම් 4 අවසන් පූර්ව වටයට සුදුසුකම් ලබයි. එබැවින් හෙට පනාගොඩදී පැවැත්වෙන බී.ආර්.සී පිල සමඟ තරගය යුද හමුදාවට තීරණාත්මක වී ඇති අතර, බදුරලිය පිල පොලීසිය සමඟ සරේ පිටියේදී තරග වැදීමට නියමිතය. මේ තරග ද්විත්වයේ ප්‍රතිඵල අනුව 'ඒ' කාණ්ඩයෙන් අවසන් පූර්ව වටයට පිවිසෙන කණ්ඩායම තෝරා ගැනේ. තරගාවලියේ මූලික වටය හෙට (4) නිමාවට පත්වීමට නියමිත අතර, එහිදී පැවැත්වෙන තරග රැසක් තීරණාත්මක ඒවා බවට පත්ව තිබේ.

මේ හේතුවෙන් 'බී' කාණ්ඩයෙන් අවසන් පූර්ව වටයට පිවිසීමට ලන්කන් සහ ගුවන් හමුදාව අතරත් තරගයක් නිර්මාණය වී ඇත.

ලන්කන් ක්‍රීඩා සමාජය අවසන් වරට සහභාගි වූ මීගමුව සමඟ තරගය අයහපත් කාලගුණය හේතුවෙන් අත්හැර දැමූ අතර, ඔවුන් ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගෙන සිටී. ඔවුන් හෙට පාණදුරයේදී පාණදුර ක්‍රීඩා සමාජයට එරෙහිව මූලික වටයේ අවසන් තරගයට එක් වන අතර, පාණදුර ක්‍රීඩා සමාජයට එරෙහිව පැවැති තරගය කඩුල්ලකින් ජය ගනිමින් ගුවන් හමුදාව 'බී' කාණ්ඩයේ දෙවැනි ස්ථානයේ පසු වෙයි. ඔවුන්ට කටුනායකදී හලාවත මේරියන්ස් පිල සමඟ තරග වැදීමට සිදුව තිබේ.

6 වැනි දිනයට පැවැති තරගයකින් සැරසන්ස් කණ්ඩායමට සිව්වැනි පරාජය අත් කර දෙමින් කෝල්ට්ස් පිල අපරාජිතව 'සී' කාණ්ඩයේ පෙරමුණ ගැනීමට සමත් විය. ඔවුන්ගේ මූලික වටයේ අවසන් තරගය හෙට එන්.සී.සී පිල සමඟ කෝල්ට්ස් පිටියේදී පැවැත්වෙන අතර, එන්.සී.සී පිල කඩුලු 3කින් පරාජය කරමින් එම කාණ්ඩයේ දෙවැනි තැන පසු වන මුවර්ස් පිල කළුතර නාගරික කණ්ඩායමට එරෙහිව මත්තේගොඩදී තරගයට පිවිසෙයි.

සී.සී.සී පිල ලකුණු 51කින් පරාජය කළ එස්.එස්.සී පිල අපරාජිතව ඉදිරියට ගිය අතර, 'ඩී' කාණ්ඩයෙන් තරග වදින ඔවුන් ප්‍රසාද ලකුණු සටහනේ පසු වන්නේ දෙවැනි තැනය. එහි පළමු ස්ථානය මෙවර තරගාවලියේ දැවැන්තම ජයග්‍රහණය වාර්තා කරමින් කැන්ඩි කස්ටම් පිල ලකුණු 216කින් පරාජය කළ ටැමිල් යුනියන් කණ්ඩායමට හිමිව ඇති අතර, ඔවුන් මේ වන විට මූලික වටයේ තරග නිමා කර තිබේ.

එබැවින් එස්.එස්.සී. කණ්ඩායමට ද තව තරගයක් ඉතිරිව ඇති බැවින් අවසන් පූර්ව වටයට පිවිසීමේ අවස්ථාව ඇත. එය බ්ලූම්ෆීල්ඩ් පිල සමඟ එස්.එස්.සී පිටියේදී පැවැත්වේ.මේ අතර, සැරසනස් - වරාය අධිකාරිය (බ්ලූම්ෆීල්ඩ්) තරගය අදත්, හෙට (4) සෙබස්තියනයිට්ස් - නුගේගොඩ (ද සොයිසා), රාගම - මීගමුව (බ්ලූම්ෆීල්ඩ්) සහ සී.සී.සී. - ගාල්ල (සී.සී.සී.) තරගත් පැවැත්වෙන අතර, එම තරග අවසන් පූර්ව වටයට බලපෑමක් සිදු නොකරයි.

# අකුරැස්ස යෞවන ක්‍රීඩා ශූරතාව පෝරඹ කනිටු විදුහලට



චතුමි හිමායා සමරවීර



**වැලිගම සමූහ - ටී.කේ.මහින්ද**

තිස්දෙවැනි ජාතික යෞවන ක්‍රීඩා උලෙළට සමගාමීව සංවිධාන කළ අකුරැස්ස අන්තර් යෞවන සමාජ ක්‍රීඩා උලෙළ පසුගියදා අකුරැස්ස පෝරඹ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

එම ක්‍රීඩා උලෙළේ සමස්ත ශූරතවා දිනා ගැනීමට පොරඹ කනිටු විදුහල් යෞවන සමාජය සමත් වූ අතර, අනුශූරතාව බෝපිටිය ප්‍රභාස්වර යෞවන සමාජයට හිමි විය. මේ තරගාවලියේ කැපී පෙණෙන ක්‍රීඩිකාව බවට පත් වූයේ පෝරඹ ක්‍රීඩා සමාජයේ චතුමි හිමායා සමරවීරය. අවුරුදු 20න් පහළ කාන්තා අංශයෙන් තරග වැදුණු චතුමි මීටර් 1500, 800 සහ 400 ඉසව්වන්ගෙන් ප්‍රථම ස්ථාන දිනා ගත් ඇය මීටර් 100 සහ 400 ප්‍රථම ස්ථාන දිනාගත් කණ්ඩායමේ සාමාජිකාවක් ද වූවාය.

තරගාවලියේ ජය සංකේත ප්‍රදානය අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් චන්දන තිලකරත්න හා මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුන රණවක මහතාගේ පෞද්ගලික ලේකම් රමේෂ් ජයතුංග යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. එම අවස්ථාවට අකුරැස්ස තරුණ සේවා නිලධාරි රමණී ශ්‍රියාලතා, මාතර දිස්ත්‍රික් බල මණ්ඩලයේ හිටපු සභාපති මිතුල මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

**ඡායාරූප - වැලිගම සමූහ**




2020 ඔක්තෝබර් 03 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# පාස්කු ප්‍රහාරයට මාස හයකට පෙර සහරාන් ඇල්ලීමට අවස්ථාව තිබුණා

## හිටපු ආරක්ෂක ලේකම්, හේමසිරි ප්‍රනාන්දු

**සුභාෂිණී සේනානායක**

පාස්කු ප්‍රහාරයට මාස හයකට පෙර සහරාන් ඇල්ලීමට හැකියාව තිබූ බව, හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා පෙරේදා (01) පාස්කු කොමිසමේදී කියා සිටියේය.

එසේ සිදු නොකර ප්‍රහාරයක් වූ බව දැනගත් දිනයේ සහරාන් ඇල්ලීමට තිබූ ඉඩකඩ සීමිත බව කියා සිටි ඒ මහතා, පාස්කු ප්‍රහාරය වන බව දැන ගත් පළමු බුද්ධි තොරතුර සම්බන්ධයෙන් 09 වැනිදා පැවැති බුද්ධි කමිටු රැස්වීමේදී හිටපු රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතා කතා කළා නම් එම ප්‍රහාරයේ විනාශය අවම කර ගැනීමට තිබූ බවද පැවසීය.

මේ ප්‍රහාරය සිදු වුණේ සමස්ත ආරක්ෂක ක්‍රියාවලියේම බිඳවැටීමකින්. මම ආපු මාස පහහමාරට සහරාන් සන්නද්ධ වුණේ නැහැ. ප්‍රහාරයක් වන බවට නිශ්චිත බුද්ධි තොරතුරක්, මට නම් ලැබී තිබුණේ නැහැ. සහරාන් ත්‍රස්තවාදියෙක් කියලා බුද්ධි අංශ පවා දැනගත්තේ ප්‍රහාරයෙන් පස්සේ. සියලුම බුද්ධි අංශ සහරාන් දැනගෙන සිටියේ අන්තවාදී දේශකයෙක් හැටියටයි. ප්‍රහාරය වන බවට ලද විදේශ තොරතුර සම්බන්ධයෙන් විදේශගතව සිටි, හිටපු ජනාධිපතිවරයාව මම දැනුවත් කළත් එම සීමිත කාලයේ කරන්නට හැකි දෙයක් නැහැ. ත්‍රස්තවාදීන් කොහොමත් බෝම්බ ඇඳුම් ඇඳගත්තාම අතරමග හරි පුපුරවා ගන්නවා. ඒක ලෝකේ කොයි රටෙත් වෙලා තිබෙනවා. තොරතුරු ලද සැණින් හිටපු පොලිස්පතිවරයා නිසි ආරක්ෂිත පියවර ගත්තා. කන්ටන්ජන්සි ප්ලෑන් අනුව පියවර ගත්තා යැයිද ඒ මහතා ප්‍රකාශ කළේය.

**අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය:**

ඔබ SLAS නිලධාරියකුට තියෙන පසුබිමක් ඇති කෙනෙක් නෙවෙයි. SLAS නිලධාරියෙක් හමුදාවේ වැඩ කරලා නැහැ. ඔබ හමුදාවේ සේවය කරලා අවි ආයුධ අතගාලා නැහැ. ඔහු හමුදා කඳවුරක සිට නැහැ. ඔහු සිටි හමුදා කඳවුරකට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වෙලා නැහැ. ඔබට තොරතුරු ලැබෙන විට ඔබ සිවිල් නිලධාරියෙක් කියන්න බැහැ නේද? ඒ අත්දැකීම් ඔබ තුළ ගොනු වී තිබෙනවා නේද?

**සාක්ෂිකරු:**

නිවැරදියි ස්වාමිනි.

**අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය:**

ඔය ලිපිය ලැබෙන විට ජානාධිපති දිවයිනේ නැහැ. අනතුරක් සිදුවන්න යන බව දැනගෙන පියවරක් ගත්තද?

**සාක්ෂිකරු.**

මට තනතුර ලැබිලා දින දෙක තුනයි. මම අත්සන් කරන්න තිබෙන ලිපි ගොනු අරගෙන හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා හමුවෙන්න ගියා. එහිදී හිටපු බුද්ධි අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතා මා වෙත යොමු කර තිබූ බුද්ධි තොරතුරු වාර්තාවක් අරගෙන ගියා. මම කිව්වා මෙහෙම තොරතුරක් ලැබිලා තිනෙවා කියලා. එවිට ජනාධිපතිතුමා කිව්වා ඔව් හේමා, මට නිලන්ත ඒක කිව්වා කියලා. ආයිමත් දවසක් මම එවැනි පුවතක් කිව්වාමත් කිව්වා නිලන්ත මට කියලා තියෙන්නේ කියලා. මම මේ බව නිලන්ත ජයවර්ධන මහතාටත් කිව්වා. ඔහු සෘජුවම ජනාධිපතිතුමාට තොරතුරු ලබා දුන්නා ස්වාමිනි.

ප්‍රහාරයෙන් පසුව මම ජනාධිපතිතුමා හමු වෙලා අස්වීමේ ලිපිය දෙන විට ඇහුවා බුද්ධි තොරතුරු දුන්නේ නිලන්ත ජයවර්ධන නේද කියලා? එතුමා ඔව් කිව්වා. මං හිටපු මාස පහේම නිලන්ත ජයවර්ධන තොරතුරු දුන්න නේද, මේ වැදගත් තොරතුර දුන්නේ නැද්ද කියලා මම ඇහුවා. එතුමා නිහඬව බිම බලාගෙන පත්තරය බලබල හිටියා. නිලන්ත මේක කිව්වේ නැත්නම් එයා මේකට වගකියන්න ඕනෑ. නිලන්ත මේ තොරතුර කිව්වේ නැත්නම් එය බරපතළ ප්‍රශ්නයක්.

> **එක්තරා කණ්ඩායමක් නිසා ජනපති මා සමඟ විරසක වුණා**
>
> **මම වගේ තුන් ගුණයකින් නිලන්ත වග කියන්න ඕනෑ**
>
> **හිටපු ජනපති වෛරීය ප්‍රකාශයක් කළා**
>
> **පොලිස්පතිට කතා කළත් මට විස්තර ලැබුණේ නෑ**



**කොමිසම:**

මේවා ගැන අපි විමසනවා. වට්ස්ඇප් පණිවිඩය ගැන කියද්දී හඬ පටය ගැන කතා කරමින් හේමසිරි ප්‍රනාන්දු මහතා කිව්වේ ඒ හඬ පටයේ කියනවා ජනාධිපතිතුමාට කිව්වේ නැහැනේ. කියන්න ගියොත් අපිට යන්න වෙනවනේ කියලා නේද?

**සාක්ෂිකරු**

රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානියා මේ තොරතුරු එවලා නිකම් ඉඳලා හරියන්නේ නැහැ. මුණගැසී සාකච්ඡා කළ යුතුයි. වට්ස්ඇප් එවලා අහක බලන් ඉඳලා හරියන්නේ නැහැ. ඒ පණිවිඩය එව්වම මොකක්ද කරන්න ඕනෑ කියලා මම ඇහැව්වා. පොලිස්පතිතුමාට එයා කිව්වා කියලා නිලන්ත ජයවර්ධන කිව්වා. මටත් කියන්න කියපු වෙලාවේ මට කියනවා ජනාධිපතිතුමාට කියන්න කියලා කිව්වා. 08 උදේ පොලිස්පති හා ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමග ජනාධිපතිවරයා පැවැත්වූ රැස්වීමේදී නිලන්ත ජයවර්ධනට එම තොරතුර ගැන දැනුවත් කරන්න තිබුණා. එහෙම කළේ නැහැ. මම දැනගත්තේ එදා හවසයි. 09 බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී කතා කළෙත් නැහැ. ඒක තමයි හොඳ අවස්ථාව අපට ලැබුණු. එහෙම කතා කළා නම් හමුදාපතිවරුන්ට, පොලිස්පතිවරයාට, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා සමග කතා කරන්න තිබුණා. එදා කතා කළේ නැති නිසා තිබුණු ඉඩ නැති වුණා.

**අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය:**

ඔබ වැඩ භාර ගත්තට පස්සේ ඔබව සසල කරන බුද්ධි වාර්තා ඉදිරිපත් වී තිබුණද?

**සාක්ෂිකරු:**

නැහැ. මෙය ලැබෙන තුරු එවැනි ඒවා ලැබී නැහැ. එක්තරා කණ්ඩායමක් ජනාධිපතිවරයා සමග මාව විරසක කරලා තිබුණේ. අවසන් මාසය වන විට අපි අතරේ විරසකය වැඩි වුණා. මෙවැනි තොරතුරක් ලැබුණම කරන්න තිබුණේ සීමිත වැඩ කොටසක්. සහරාන් අල්ලන්න තිබුණේ මාස හයකට කලින්.

ත්‍රස්තවාදියාට තමන්ගේ ඉලක්කය ගන්න බැරි නම් අතර මග හරි මැරෙනවා. ඒ වන විට පොලිස්පතිවරයා හදිසි තත්ත්වයට කන්ටන්ජන්සි ප්ලෑන් එක අනුව ක්‍රියා කරන බව හිටපු පොලිස්පතිවරයා කීවා. ඒ අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කටයුතු කරාවී කියලා මම බලාපොරොත්තු වුණා. එක පැත්තක දෙකක ඇරෙන්න සෑම නිලධාරියෙක්ම වගකීම ඉටු කළා.

**අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය:**

පොලිසියේ කන්ටෙන්ජන්සි ප්ලෑන් එක ගැන දනගෙන හිටියාද? ඒ කවදාද?

**සාක්ෂිකරු:**

ප්‍රකෝපකාරීව ඇති වූ වර්ජනය සම්බන්ධයෙන් පොලිසප්තිතුමත් මට මේ ගැන කියල තිබුණා.

**කොමිසම:**

### පාස්කු ඉරු දින ප්‍රහාරය ගැන සොයන ජනපති කොමිසම

ඔබ හා ජනාධිපතිතුමා අතර විරසකයක් ගැන කිව්වා. ඒ නිසා මේ තොරතුරු දෙන්න බැරි වුණා කියලා කිව්වා. ඔබ අප්‍රේල් 14 අලුත් අවුරුද්දට ජනාධිපතිතුමා හමුවෙන්න ගියා නේද? හැම කෙනෙක්ම අලුත් අවුරුද්දට බුලත් දීලා අමනාපකම් නැති කර ගන්නවා. එහෙම වුණාද?

**සාක්ෂිකරු:**

මගේ අමනාපයක් තිබුණේ නැහැ ස්වාමිනි.

**කොමිසම:**

පන්නලා දැම්මද?

එහෙම වුණේ නැහැ ස්වාමිනී. සෙනග පිරිලා හිටියා. මම බුලත් අතක් දුන්නා. නිලන්ත ජයවර්ධන ඔක ලෙඩක් කියලා හැම වෙලාවෙම මට කිව්වා. ඒ අවස්ථාවේ ජනාධිපතිතුමාට 8දා ලැබුණු තොරතුර ගැන කිව්වා නම් ඒ ගැන එතුමාට වදිනවා. නිලන්ත ජයවර්ධන ජනාධිපතිතුමාට බුද්ධි තොරතුරු දන්වන බව මම දන්නවා. ඒක එයාගේ රාජකාරියේ කොටසක්. එක කොටසකට මම වගකිව යුතු නම්, නිලන්ත ඒ වගේ තුන් ගුණයක් වග කියන්න ඕනෑ.

**කොමිසම:**

නිලන්ත ජයවර්ධන මෛත්‍රිපාල සිරිසේන මහතා දැනුවත් කර තිබුණේ නැත්නම් එය වැරැද්දක් කියලා ඔබ කියන්නේ ඇයි?

**සාක්ෂිකරු:**

ජනාධිපතිතුමාට සෑම බුද්ධි තොරතුරක් ගැනම දැනුවත් කළේ නිලන්ත ජයවර්ධන. ඇයි මේක විතරක් කිව්වේ නැත්තේ.

**අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය:**

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ඔබ. ඔබට වගකීමෙන් සහ වගවීමෙන් මිදෙන්න බැහැ නේද?

20 වැනිදා ලද තොරතුරු ගැන ජනාධිපතිවරයා ආරක්ෂක ඇමැතිවරයාට දැනුම් නොදීම ගැන?

**සාක්ෂිකරු:**

සම්පූර්ණ වගකීමෙන් මිදෙන්න බැහැ.

ඔබ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා. ක්ෂණිකව මතකයට එන්න ඕනෑ CDSට කියන්න ඕනෑ කියලා. DMIට කියන්න ඕනෑ කියලා. කොමිසම:

**කොමිසම:**

ඇඳිරි නීතිය දැම්මා නම් කවුරුවත් මැරෙන්නේ නැහැ නේද?

**සාක්ෂිකරු:**

එහෙමයි සවාමිනි, පොලිස් ඇඳිරි නිතිය අවශ්‍ය නම් දාන්න තිබුණා. දාන්න එපා කියලා කාටවත් උපදෙස් දීලා නැහැ. පොලිස් මාධ්‍ය ප්‍රකාශක දැනුවත් කිරීම, විශ්ලේෂණ, නිර්දේශ මට ලැබෙන්න ඕනෑ. මේ වගේ තත්ත්වයක් යටතේ මට තනියම ක්‍රියා කරන්න බැහැ. රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ, පොලිස්පති, ජාතික බුද්ධි ප්‍රධානි තිදෙනාම එන්න ඕනෑ. කතා කරන්න ඕනෑ.

**සොලිසිටර් ජෙනරාල්:**

ඔවුන් නොපැමිණීම මදිපුංචිකමක් වුණාද? දරුවන් වැරදි කළාම මවුපියන් ඔවුන් අයින් කරන්නේ නැහැ නේද? දරුවන්ට මවුපියන්ට වගේ දුර පේන්නේ නැහැ නේද?

**සාක්ෂිකරු:**

එහෙමයි ස්වාමීනි, දරුවන් හදාගන්න අපි දැනගත්න ඕනෑ. නිලන්ත ජයවර්ධන හා මෛත්‍රිපාල සිරිසේන අතර තිබූ සම්බන්ධය නිසා නිලන්තව අධීක්ෂණය කරන්න මට හැකියාවක් මේ අවස්ථාවේ තිබුණේ නැහැ. මා පොලිස්පතිට කතා කළා. මම කිව්වා මට විස්තර දෙන්න කියලා. ඒත් මට විස්තර ආවේ නැහැ.

**අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය:**

ආරක්ෂක අමාත්‍ය ධුරයට වෙනත් කෙනෙක් පත් කළෙත් නැහැ. අගමැති ලංකාවේ හිටියා. ඔබ එතුමාව තොරතුරු ගැන දැනුවත් කළාද?

**සාක්ෂිකරු:**

නැහැ ස්වාමිනි.

**අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය:**

කළ යුතුව තිබුණේ දැනුම් දීම නේද?

**සාක්ෂිකරු:**

සාමාන්‍ය තත්ත්වයක් යටතේ වෙන රටක නම් සිදු විය යුත්තේ එයයි. මම වැඩ භාරගෙන කෙටි කාලයකින් ව්‍යවස්ථාදායකය හා විධායකය අතර අර්බුදයක් ඇති වුණා. අගමැති සමග සම්බන්ධ වෙන්න අපට හැකියාවක් තිබුණේ නැහැ.

**අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය:**

ගෙදරක වුවත් තාත්තා නැත් නම් අම්මාට වගකීමෙන් මිදෙන්න බැහැ නේද?

**සාක්ෂිකරු:**

ඒක මෙතන කරන්න බැහැ ස්වාමිනි.

**සොලිසිටර් ජෙනරාල්වරිය:**

දේශපාලනය කරන්නත් රටක් තියෙන්න ඕනේ. පුරවැසියන් ඉන්න ඕනේ.

**සාක්ෂිකරු:**

මට එය වැටහෙනවා. දේශපාලනය කරන අයටයි එය වැටහිය යුතු වන්නේ. 21 අගමැති කතා කළා, අරලිය ගහ මන්දිරයේ සාකච්ඡාවට. ප්‍රහාරයෙන් පස්සේ 11ට එන්න කියලා ජනාධිපතිතුමා රට ඉඳන් කතා කරලා කිව්වා යන්න එපා කියලා. අපි මොකද කරන්නේ? මෙවැනි තත්ත්වයක තමයි මම වැඩ කළේ.

**අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය:**

නිලන්ත ඔබට කිව්වා පොලිස්පතිට කතා කළා කියලා. ඔබටත් කතා කරන්න කියලා. එහෙම හැමෝම කියන එක කරනවද?

**සාක්ෂිකරු:**

එහෙම නම් ස්වාමිනි විදේශයෙන් ලද තොරතුරකට ඇයි මේ තරම් උඩ පනින්නේ? මෙය සමස්ත ක්‍රියාවලියේම බිඳවැටීමක්. මාස හයක් ඇතුළත වුණ දෙයක් නෙවෙයි. බිඳවැටීමේ ක්‍රියාවලිය දිගින් දිගටම සිදු වුණා. අන්තිමට චූදිතයන් වුණේ මමයි, පොලිස්පතියි. ප්‍රහාරයෙන් පස්සේ ජනාධිපතිතුමා අප ඊට වගකියන්න ඕනෑ කියලා වෛරී ප්‍රකාශයක් කළා. එහෙම කිව්වේ චෝදනාවක් ගොනු කරලාවත් නෙවෙයි.

**සොලිසිටර් ජෙනරාල්වරිය:**

වගකියන්න ඕනෑ සිස්ටම් එකද? නැත් නම් ඒක වට්ටන්න දායක වූ අයද?

**සාක්ෂිකරු:**

සමා වෙන්න; එයට මට පිළිතුරු දෙන්න බැහැ. කොමිසම තමයි ඒ ගැන කියන්න ඕනෑ.

**සොලිසිටර් ජෙනරාල්වරිය:**

ඔබේ ආයතනයට නේද හමුදා අයිති වෙන්නේ? ඔවුන් කැඳවන්න තිබුණා නේද?

**සාක්ෂිකරු:**

හදිසි නීතිය ක්‍රියාත්මක නොවන නිසා මට හමුදාව කැඳවන්න බැහැ. අප්‍රේල් 09 තිබුණු රැස්වීමේ පොලිස්පති, හමුදාපතිවරු තිදෙනා හිටපු අවස්ථාවේ මේක සාකච්ඡා කරන්න තිබුණා. එහෙම කළේ නැහැ. මේ ගැන සොයනවා කියලා හරි කතා කරන්න තිබුණා. එහෙම කළා නම් මේ කාලකන්නි ප්‍රහාරය නවත්වන්න තිබුණා. එක තමයි අපට තිබුණ එකම අවස්ථාව. අපි ඒක කළේ නැහැ. ඇයි අනික් සාක්ෂිකරුවන්ගෙන් මේක අහන්නේ නැත්තේ? ඇයි මගෙන් විතරක් අහන්නේ?

**කොමිසම:**

සාක්ෂි විමසීම ගැන අවබෝධයක් නැත්නම් එවැනි ප්‍රකාශ කිරීමෙන් වළකින්න. අහන්න තියෙන සාක්ෂිය සෑම සාක්ෂිකරුවකුගෙන්ම අහනවා. එය තමයි කොමිසමේ ක්‍රියා පිළිවෙළ.

**සාක්ෂිකරු:**

ඒක මගෙන් වුණ වැරැද්දක්.

**කොමිසම:**

ඔබ වාරාවට නේද වැඩකර තියෙන්නේ?

**සාක්ෂිකරු:**

සාමූහික වගකීම මම බාර ගන්නවා ස්වාමිනි.

# තුර්කි-ශ්‍රී ලංකා ප්‍රමිති අවබෝධය වැඩි කර ගැනීමේ ගිවිසුමක්

**මහින්ද අලුත්ගෙදර**

දෙරට අතර ද්විපාර්ශ්වික සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කර ගනිමින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ තුර්කි ප්‍රමිති ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අස්සන් කිරීම කෙරෙහි රජයේ අවධානය යොමුව තිබේ.

තුර්කියේ ශ්‍රී ලංකා තානාපති එම්. රිස්වි හසන් සහ තුර්කියේ කර්මාන්ත හා තාක්ෂණ නියෝජ්‍ය ඇමැති හසන් බුයුක්ඩෙඩේ මහත්වරු අතර පැවැති විශේෂ සාකච්ඡාවක දී මේ සම්බන්ධයෙන් අවධානය යොමුව තිබෙන බව විදේශ සබඳතා අමාත්‍යාංශය පවසයි.

වත්මන් ශ්‍රී ලංකාවේ වෙළෙඳ සහ ආයෝජන ක්ෂේත්‍රයේ පවතින අවස්ථා සහ එහි අවශ්‍යතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් මෙහිදී තුර්කි නියෝජ්‍ය ඇමැතිවරයා දැනුවත් කර තිබෙන අතර, රට ආර්ථික වශයෙන් ඉදිරියට ගමන් කරන අවස්ථාවක දෙරටටම වාසිදායක අයුරින් වෙළෙඳ හා ආයෝජන කටයුතු සිදුකර ගැනීම සඳහා සැලසුම් කළ යුතු බවද පෙන්වා දී ඇත. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හුවමාරුකර ගැනීම, නිදහස් වෙළෙඳ කලාප හා කාර්මික කලාප ස්ථාපිත කිරීම මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සම්බන්ධයෙන් තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන්ද ශ්‍රී ලංකා තානාපතිවරයා සහ තුර්කි නියෝජ්‍ය ඇමැතිවරයා අතර සාකච්ඡාවේ දී අවධානය යොමුව තිබේ.

මේ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ තුර්කි ප්‍රමිති ආයතනය අතර කඩිනමින් අවබෝධතා ගිවිසුමක් අස්සන් කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබෙන තුර්කි නියෝජ්‍ය ඇමැතිවරයා එය දෙරටටම වැදගත් වන බව පෙන්වා දී ඇත. තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ උපදේශක (වාණිජ) යොෂිතා ජයසූරිය සහ තුර්කි කර්මාන්ත හා තාක්ෂණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (යුරෝපා සහ විදේශ කටයුතු) මුස්තාෆා එඩොගන් මේ අවස්ථාවට එක්ව තිබේ.



# පොල්තෙල් සහ පාම්තෙල් කලවම් කර විකිණීම අවසන්





**රක්ෂණ ශ්‍රියන්ත**

පොල්තෙල් සහ පාම්තෙල් කලවම් කර විකිණීමට අවසරය ලබා දෙමින් 2016 වසරේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය ඉවත් කරන ලෙස පාරිභෝගික සේවා අධිකාරියේ සභාපතිවරයාට කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා උපදෙස් දුන්නේය.

දේශීය පොල්තෙල් නිෂ්පාදකයන් සමඟ පසුගියදා (29) 73/1, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටි කර්මාන්ත අමාත්‍යාංශයේදී දේශීය පොල්තෙල් නිෂ්පාදකයන් සමඟ පැවැති සාකච්ඡාව අතරතුර, පාරිභෝගික සේවා අධිකාරියේ සභාපතිවරයා සමඟ සිදු කළ දුරකතන සංවාදයකදී අමාත්‍යවරයා මෙසේ උපදෙස් දෙනු ලැබීය.

මෙම ගැසට් නිවේදනය 2016 දී එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ලෙස කටයුතු කළ රිෂාඩ් බදියුදීන් මහතාගේ උපදෙස් මත පාරිභෝගික සේවා අධිකාරිය විසින් නිකුත් කොට ඇති බවද මෙම දුරකථන සංවාදයේ දී අනාවරණය විය.

දේශීය පොල්තෙල් නිෂ්පාදකයන් පෙන්වා දුන්නේ ආනයනික පොල්තෙල් කිලෝග්‍රෑමයක් සඳහා පැවැති රුපියල් 295ක සෙස් බද්ද රුපියල් 125 දක්වා අඩු කිරීම හේතුවෙන් දේශීය පොල්තෙල් කර්මාන්තය බරපතළ ලෙස කඩා වැටුණු බවය. මෙවැනි බදු සහනයක් යටතේ පොල්තෙල් ආනයනය සිදු කරන බැවින් දේශීය පොල්තෙල් නිෂ්පාදකයන්ට ඒ සමඟ තරඟ කළ නොහැකි බව ද ඔවුහු අමාත්‍යවරයාට පෙන්වා දුන්හ.

කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා මෙහි දී පවසා සිටියේ සිදුව ඇති මිල විකෘතියේ ප්‍රශ්නය කැබිනට් පත්‍රිකාවක් මගින් නිවැරදි කරන බවය. තම අමාත්‍යාංශය යටතේ පවතින 'බීසීසී ලංකා' රාජ්‍ය සමාගම මගින් දේශීය නිෂ්පාදකයන්ගෙන් පාලන මිලකට පොල්තෙල් මිලදී ගැනීම, පොල්තෙල් වෙනුවට කොප්පරා ආනයනය කර දේශීය පොල්තෙල් නිෂ්පාදකයන් හරහා පොල්තෙල් නිපදවීම, පොල්, ගෙඩි වශයෙන් අපනයනය නතර කිරීම වැනි දේශීය පොල්තෙල් කර්මාන්තය නඟා සිටුවීමට ගත හැකි සෑම පියවරක්ම ගන්නා බවද මෙහි දී අමාත්‍ය විමල් වීරවංශ මහතා අවධාරණය කළේය.

# ලංසු සඳහා ආරාධනයයි

## රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතිය (ව්‍යාපෘති හඳුනාගැනීමේ අංකය - 163305)

## අම්පාර දිස්ත්‍රික්කය, නැගෙනහිර පළාත

| පළාත් පාලන ආයතනයේ නාමය | කාර්ය විස්තරය හා ලංසු අංකය | ටෙන්ඩර් කළ හැකි මුදල (වැට් රහිතව) රුපියල් මිලියන | කොන්ත්‍රාත් කාලය | ලංසු අවසන් දිනය හා වේලාව | අවශ්‍ය ශ්‍රේණිය හා විශේෂඥතාවය | ප්‍රසම්පාදන කමිටු නාමය | ලංසු ලේඛන මිලදී ගත හැකි ස්ථානය හා දුරකතන අංකය | ලංසු ලේඛන ගාස්තු - රුපියල් - | අවශ්‍ය ලංසු ඇපකරය | | ලංසු බහාලිය යුතු හා විවෘත කරනු ලබන ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | ඇපකර මුදල - රුපියල් - | වලංගු කාලය | |
| අඩ්ඩලයිචේනයි ප්‍රාදේශීය සභාව | ඔළුවිල්හි පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම – අදියර 1 LDSP/EP/AM/ADPS/2020/01 | 9.0 | දින 90 | 19.10.2020 14.00 පැය | C 6 / C 7 ගොඩනැගිලි ඉදිකිරීම | LAPC අඩ්ඩලයිචේනයි ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව අඩ්ඩලයිචේනයි 067-2277375 | 3500.00 | 90,000.00 | 15.02.2021 | ප්‍රාදේශීය සභාව අඩ්ඩලයිචේනයි |
| අක්කරයිපත්තු මහා නගර සභාව | අක්කරයිපත්තුහි කාදර් ඔඩාවියර් පාර කොන්ක්‍රීට් මතුපිට ඉදිකිරීම. LDSP/EP/AM/AKPMC/2020/01 | 8.0 | දින 90 | 19.10.2020 14.00 පැය | C 6 / C 7 මහාමාර්ග ඉදිකිරීම | LAPC අක්කරයිපත්තු මහා නගර සභාව | මහ නගර සභාව අක්කරයිපත්තු 067-2277275 | 3500.00 | 80,000.00 | 15.02.2021 | මහ නගර සභාව අක්කරයිපත්තු |
| අක්කරයිපත්තු ප්‍රාදේශීය සභාව | අක්කරයිපත්තු හි ඉස්සත් ගනිච්චමයි (මෝදිනර් පාර) අභ්‍යන්තර මාර්ගය කොන්ක්‍රීට් මතුපිට ඉදිකිරීම LDSP/EP/AM/AKPPS/2020/01 | 2.67 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහාමාර්ග ඉදිකිරීම | LAPC අක්කරයිපත්තු ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව අක්කරයිපත්තු 067-2053635 | 2500.00 | 27,000.00 | 18.01.2021 | ප්‍රාදේශීය සභාව අක්කරයිපත්තු |
| අලයාඩිවෙම්බු ප්‍රාදේශීය සභාව | අලයාඩිවෙම්බු, වඩිකුඩා හි විශ්වකුල පාර කොන්ක්‍රීට් මතුපිට හා ජලාපවහනය ඉදිකිරීම LDSP/EP/AM/AVPS/2020/01 | 5.01 | දින 90 | 19.10.2020 14.00 පැය | C 6 / C 7 මහාමාර්ග ඉදිකිරීම | LAPC අලයාඩිවෙම්බු ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව අලයාඩිවෙම්බු 067-2277330 | 2500.00 | 51,000.00 | 15.02.2021 | ප්‍රාදේශීය සභාව අලයාඩිවෙම්බු |
| අම්පාර නගර සභාව | තිස්සපුර අංක 174 එච් ජී පතිරණ නිවස සිට 175 බී සෝමදාස නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් මතුපිට ඉදිකිරීම. LDSP/EP/AM/AMPUC/2020/01 | 2.53 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහාමාර්ග ඉදිකිරීම | LAPC අම්පාර නගර සභාව | නගර සභාව, අම්පාර 063-2222403 | 2500.00 | 26,000.00 | 18.01.2021 | නගර සභාව අම්පාර |
| නාමල්ඔය ප්‍රාදේශීය සභාව | නාමල්ඔය පරගහකැලේ පවත්නා සංස්කෘතික ශාලාව සඳහා කෑම ශාලාවක් හා ටොයිලට් පහසුකම් ඉදිකිරීම. LDSP/EP/AM/NPS/2020/01 | 10.80 | දින 90 | 19.10.2020 14.00 පැය | C 5 / C 6 ගොඩනැගිලි ඉදිකිරීම | LAPC නාමල්ඔය ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව නාමල්ඔය 063-2242014 | 4000.00 | 108,000.00 | 15.02.2021 | ප්‍රාදේශීය සභාව නාමල්ඔය |
| දමන ප්‍රාදේශීය සභාව | හිඟුරාන, සතිපොළ සාප්පු සංකීර්ණය ඉදිකිරීම. LDSP/EP/AM/DAPS/2020/01 | 9.99 | දින 90 | 19.10.2020 14.00 පැය | C 6 / C 7 ගොඩනැගිලි ඉදිකිරීම | LAPC දමන ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව දමන 063-2240042 | 3500.00 | 100,000.00 | 15.02.2021 | දමන ප්‍රාදේශීයසභාව |
| දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව | දෙහිඅත්තකණ්ඩිය රත්මල් කඳුර නිවස අංක 89 සිට 251 දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම LDSP/EP/AM/DKPS/2020/01 | 4.20 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහාමාර්ග ඉදිකිරීම | LAPC දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව දෙහිඅත්තකණ්ඩිය 067-4549830 | 2500.00 | 42,000.00 | 18.01.2021 | දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව |
| දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව | දෙහිඅත්තකණ්ඩිය රත්හෙලගම අංක 206 නිවස සිට 387 මාර්ගය කොන්ක්‍රීට් කිරීම LDSP/EP/AM/DKPS/2020/02 | 2.67 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහා මාර්ග ඉදිකිරීම | | ප්‍රාදේශීය සභාව දෙහිඅත්තකණ්ඩිය 067-4549830 | 2500.00 | 27,000.00 | 18.01.2021 | ප්‍රාදේශීය සභාව දෙහිඅත්තකණ්ඩිය |
| ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව | ඉරක්කාමම් – 02 අක්බාර් මුස්ලිම් පල්ලිය පාර 02 වන හරස් පාර කොන්ක්‍රීට් මතුපිට හා ජලාපවහන ඉදිකිරීම. LDSP/EP/AM/IRKPS/2020/02 | 3.65 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහා මාර්ග ඉදිකිරීම | LAPC ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව ඉරක්කාමම් 063-2250181 | 2500.00 | 36,500.00 | 18.01.2021 | ප්‍රාදේශීය සභාව ඉරක්කාමම් |
| කල්මුණේ මහා නගර සභාව | මරුදමුනේ සංස්කෘතික ශාලාව ඉදිකිරීම LDSP/EP/AM/KMC/2020/01 | 13.59 | දින 90 | 19.10.2020 14.00 පැය | C 5 / C 6 ගොඩනැගිලි ඉදිකිරීම | LAPC කල්මුණේ ප්‍රාදේශීය සභාව | මහා නගර සභාව කල්මුණේ. 067-2229275 | 4000.00 | 136,000.00 | 15.02.2021 | ප්‍රාදේශීය සභාව කල්මුණේ |
| කරයිතිවු ප්‍රාදේශීය සභාව | කරයිතිව් මාවඩිපල්ලි හි මාවඩිපල්ලි සීමා මාර්ගය කොන්ක්‍රීට් කිරීම LDSP/EP/AM/KTVPS/2020/01 | 2.65 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහා මාර්ග ඉදිකිරීම | LAPC කරයිතිවු ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව කරයිතිවු 067-4929114 | 2500.00 | 27,000.00 | 18.01.2021 | ප්‍රාදේශීය සභාව කරයිතිව් |
| ලාහුගල ප්‍රාදේශීය සභාව | ලාහුගල, පානම, විර බෝධිය පාර තාර යොදා නවීකරණය කිරීම. LDSP/EP/AM/LAPS/2020/01 | 4.5 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහා මාර්ග ඉදිකිරීම | LAPC ලාහුගල ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව ලාහුගල 063-2051899 | 2500.00 | 45,000.00 | 18.01.2021 | ප්‍රාදේශීය සභාව ලාහුගල |
| මහඔය ප්‍රාදේශීය සභාව | මහඔය, පුලාවල බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම LDSP/EP/AM/MAPS/2020/01 | 6.78 | දින 90 | 19.10.2020 14.00 පැය | C 6 / C 7 ගොඩනැගිලි ඉදිකිරීම | LAPC මහඔය ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව මහඔය 063-2244091 | 3500.00 | 68,000.00 | 15.02.2021 | මහඔය ප්‍රාදේශීය සභාව |
| නින්දවූර් ප්‍රාදේශීය සභාව | නින්දවූර්හි පෙර – පාසල් සංකීර්ණය ඉදිකිරීම LDSP/EP/AM/NTRPS/2020/01 | 7.99 | දින 90 | 19.10.2020 14.00 පැය | C 6 / C 7 ගොඩනැගිලි ඉදිකිරීම | LAPC නින්දවූර් ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව නින්දවූර් 067-2250035 | 3500.00 | 80,000.00 | 15.02.2021 | නින්දවූර් ප්‍රාදේශීය සභාව |
| පදියතලාව ප්‍රාදේශීය සභාව | පදියතලාව බස් නැවතුම්පලෙහි සාප්පු සංකීර්ණය ඉදිකිරීම. LDSP/EP/AM/PDPS/2020/01 | 8.67 | දින 90 | 19.10.2020 14.00 පැය | C 6 / C 7 ගොඩනැගිලි ඉදිකිරීම | LAPC පදියතලාව ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව පදියතලාව 063-2246048 | 3500.00 | 87,000.00 | 15.02.2021 | පදියතලාව ප්‍රාදේශීය සභාව |
| පොතුවිල් ප්‍රාදේශීය සභාව | පොතුවිල් හි කතත්ත පාර ඉදිකිරීම. LDSP/EP/AM/PVLPS/2020/01 | 4.70 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහා මාර්ග ඉදිකිරීම | LAPC පොතුවිල් ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව පොතුවිල් 063-2248029 | 2500.00 | 47,000.00 | 18.01.2021 | පොතුවිල් ප්‍රාදේශීය සභාව |
| සම්මන්තුරේ ප්‍රාදේශීය සභාව | සම්මන්තුරේ ප්‍රාදේශීය සභාවේ කාර්යාල ගොඩනැගිල්ලේ ආබාධිත හා වැඩිහිටි මගී සෝපානයක් සපයා සවි කිරීම. LDSP/EP/AM/STRPS/2020/01 | 4.48 | දින 90 | 19.10.2020 14.00 පැය | EM 3 / EM 4 විදුලිමය හා යාන්ත්‍රික සේවා | LAPC සම්මන්තුරේ ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව සම්මන්තුරේ 067-2260043 | 2500.00 | 45,000.00 | 18.01.2021 | සම්මන්තුරේ ප්‍රාදේශීය සභාව |
| තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව | තිරුක්කෝවිල් හි තිරුනාවුකරසු පාරේ කොන්ක්‍රීට් මතුපිට ඉදිකිරීම. LDSP/EP/AM/TKPS/2020/01 | 4.03 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහා මාර්ග ඉදිකිරීම | LAPC තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව තිරුක්කෝවිල් 067-2265018 | 2500.00 | 41,000.00 | 18.01.2021 | ප්‍රාදේශීය සභාව තිරුක්කෝවිල් |
| උහන ප්‍රාදේශීය සභාව | කට්ටවාඩියෙහි පාලම හරහා නවගිරියාව ගෝතම විහාරයේ සිට 33/20/02 නිවස දක්වා කොන්ක්‍රීට් මාර්ගය ඉදිකිරීම LDSP/EP/AM/UHAPS/2020/01 | 3.10 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහා මාර්ග ඉදිකිරීම | LAPC උහන ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව උහන 063-2250355 | 2500.00 | 31,000.00 | 18.01.2021 | ප්‍රාදේශීය සභාව උහන |
| | නුගේලන්ද දකුණ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. LDSP/EP/AM/UHAPS/2020/02 | 3.48 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 ගොඩනැගිලි ඉදිකිරීම | | | 2500.00 | 35,000.00 | 18.01.2021 | |
| | රජගලතැන්න 1/2 ප්‍රජා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සිට 34/9 නිවස දක්වා බෝක්කුව සහිත කොන්ක්‍රීට් පාර ඉදිකිරීම. LDSP/EP/AM/UHAPS/2020/03 | 3.45 | දින 90 | 19.10.2020 14.00 පැය | C 7 / C 8 මහා මාර්ග ඉදිකිරීම | | | 2500.00 | 35,000.00 | 18.01.2021 | |

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුව වෙතින්, පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතියෙහි පිරිවැය සඳහා ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කොටසක්, ඉහත සටහනේ සඳහන් කාර්ය යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය.
02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුලින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.
03. ඒ අනුව, ඒ ඒ පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් පළාත් පාලන ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ඉහත වගුවේ විස්තර කොට ඇති කාර්ය ඉටුකිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
04. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අපලේඛන ගතවූ අයකු නොවිය යුතු අතර, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (CIDA) ඉහත සඳහන් ශ්‍රේණියේ හා ක්ෂේත්‍රයේ ලියාපදිංචිය සතු විය යුතුය.
05. අවශ්‍ය සුදුසුකම් ලංසු ලේඛනයන්හි 4 කොටසේත්, අමතර විස්තර උපලේඛනයෙහිත් (5 කොටස) සඳහන්ව ඇත.
06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර වගුවේ සඳහන් පළාත් පාලන ආයතන වෙතින් ලබාගත හැකි අතර, එම ස්ථානයේදීම රාජකාරී දිනවල 9.00 පැය හා 16.00 පැය අතර කාලය තුළ ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.
07. ලංසුකරු විසින් සෑම ලංසුවක් සමගම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ බැංකුවකින් ලබාගත් ලංසු ඇපකරයක් බැගින් සේවා යෝජක වෙත ලබාදිය යුතුය.

**සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතිය (LDSP),**
**ACLG කාර්යාලය, අම්පාර.**


21 වැනි සියවසට එළඹෙන යෞවනයට නිරවුල් ගමන් මග
බුදුසරණ

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

04. ආසියානු සංවර්ධන බැංකුවේ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා වන තනි අදියර - තනි කවර පරිපාටිය අනුව විවෘත තරගකාරී ලංසුකරණය මෙහෙයවනු ලබන අතර, ලංසු ලිපිලේඛනවල විස්තර කොට ඇති පරිදි යෝග්‍යතාපූර්ණ රටවල්වල සියලුම ලංසුකරුවන් සඳහා විවෘතව පවතී.

05. වැඩිදුර තොරතුරු ලබාගැනීමට හා ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට ලංසුකරුවන් පහත සඳහන් අයවලුන් හා සම්බන්ධ විය යුතුය.

**ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී,**
**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය,**
**විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය,**
**තාක්ෂණ පීඨය,**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ,**
**ශ්‍රී ලංකාව.**

**ZIP කේතය : 50300**
**දුරකථනය : 0714477898**
**ෆැක්ස් : 025-2266228**
**ඊමේල් : sporj-sthrd@mohe.gov.lk**

06. ආපසු ගෙවනු නොලබන ශ්‍රී.ලං.රු. 5,000/= (ශ්‍රී ලංකා රුපියල් පන්දහසක් පමණයි) ක ගාස්තුවක් මුදලින් හෝ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ STHRD ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ නමින් බැංකු අණකරයක් හෝ මිහින්තලේ ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 83804379 වෙත තැන්පත් කිරීමෙන් (එක් ලංසු ලිපිලේඛන කට්ටලයක් සඳහා) අනතුරුව "STHRD/RJ-E 6 : **ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ජෛව ක්‍රියාවලි දෙපාර්තමේන්තුවේ ජෛව තාක්ෂණය සඳහා උපකරණ ප්‍රසම්පාදනය**" සඳහා ලංසු ලිපිලේඛන ඉල්ලමින් ඉහත සඳහන් ලිපිනය වෙත යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් ලිඛිත අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන මිලදී ගත හැකිය. 2020.10.29 වෙනි දින 15.00 පැය දක්වා සතියේ දිනවල ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලැබේ. තැපැලේදී නැතිවීම හෝ ප්‍රමාදවීම පිළිබඳව වගකියනු නොලැබේ.

07. ලංසු ලිපිලේඛනයේ විස්තර කොට ඇති පරිදි වූ ලංසු ඇපකරයක් සමග ඔබේ ලංසුව 2020.11.02 වෙනි දින 14.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතුය.


**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය,**
**STHRD ව්‍යාපෘතිය, පීඨාධිපති කාර්යාලය,**
**තාක්ෂණ පීඨය,**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,**
**මිහින්තලේ, ශ්‍රී ලංකාව.**

- සම්පූර්ණ කරන ලද ලංසු, මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද කවරවල බහා "**මුල් පිටපත**" හා "**අනු පිටපත**" ලෙස අදාළ පරිදි සඳහන් කළ යුතුය. ඉන් පසුව කවර දෙක නැවත තනි කවරයක බහා මුදා තබා අදාළ කොන්ත්‍රාත් හැඳුනුම් අංකය කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.
- පූර්ණ ලංසු රැස්වීම, **2020.10.16 දින පෙ.ව. 10.00** ට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ සභා කාමරයේදී පැවැත්වේ.

08. ලංසු භාර ගැනීමේ අවසාන වේලාව ඉක්මවූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.**
**දිනය : 2020.10.03**

BE BETTER INFORMED!



News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT
apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

# දැන්වීමයි

### ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රජ්‍ය අමාත්‍යාංශය

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

## නිවාස / ව්‍යාපාරික ස්ථාන බදු දීම සඳහා අයදුම්පත් කැඳවීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු පහත සඳහන් කර ඇති නිවාස ක්‍රමවල නිවාස හා කඩසාප්පු බදු දීම සඳහා විවෘත අයදුම්පත් කැඳවීමට තීරණය කර ඇත.

| **නිවාස යෝජනා ක්‍රමය** | **නිවාස ගණන** |
|---|---|
| සොයිසාපුර පුනස්ථාපන නිවාස | 06 |
| අවිස්සාවේල්ල, මාණික්කවත්ත | 02 |
| යක්කල සියනෑ උයන I අදියර | 02 |
| කැලණිය පොල්හේන | 01 |

| **නිවාස යෝජනා ක්‍රමය** | **කඩසාප්පු ගණන** |
|---|---|
| ආරාමය පෙදෙස | 01 |
| කොළඹ නගර සීමාව තුළ | 61 |
| මොරටුව මහනගර සීමාව තුළ | 10 |

ඒ අනුව ඉහත සඳහන් දේපළ බදුදීම සඳහා 2020.10.30 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් රු. 100.00 ක මුදලක් ගෙවා අයදුම්පතක් ලබාගෙන ඊට අදාළ තොරතුරු සම්පූර්ණ කර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමට හෝ ප්‍රධාන කාර්යාලයේ දේපළ කළමනාකරණ කොට්ඨාසයේ අලෙවි අංශයට ගෙනවිත් භාරදීමට හැක. අදාළ අයදුම්පත්වල සුදුසුකම් පරීක්ෂා කර බදු ගැනීම සඳහා අවස්ථාව සලසා දෙන බව සඳහන් කරමි.

**ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී,**
**දේපළ කළමනාකරණ කොට්ඨාසය,**
**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,**
**චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, තැ.පෙ. 1826, කොළඹ 02.**

**විමසීම් : ආර්. ඉන්දික ප්‍රසාද්,**
**කළමනාකරු (අලෙවි),**
**දුරකථන අංක : 011-2445061**

**සභාපති,**
**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

### සංචාරක අමාත්‍යාංශය

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

# ලංසු කැඳවීමේ දැන්වීමයි

01. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මහ පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් පහත දැක්වෙන කාර්යය වෙනුවෙන් යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| **අනු අංකය** | **ඉදිකිරීම් කාර්යයේ නම** | **ලංසු සුරක්ෂණය** | **ආපසු නොගෙවන ලංසු අයදුම්පත්‍ර ගාස්තුව** |
|---|---|---|---|
| 01 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වියළි කලාපීය උද්භිද උද්‍යානයේ පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා ගෘහභාණ්ඩ සැලසුම් කර, සකස්කර සවිකිරීම වෙනුවෙන් මිල ගණන් ලබාගැනීම (පළමු පන්තියේ දැවයෙන්, මනා නිමාවකින්, උසස් තත්වයෙන් සකස් කළ යුතුය).<br>**අදාළ පිරිවිතර සංක්ෂිප්තව පහත පරිදිය.**<br>● මාණ්ඩලික මේස - 01<br>● මාණ්ඩලික පුටු - 01<br>● පරිගණක මේස - 02<br>● කබඩ් - 07<br>● අමුත්තන්ට පුටු - 17<br>● එල් හැඩයේ මේස - 01<br>● විද්‍යාගාර මේස - 01<br>● ලියන මේස - 03<br>● පුටු (ෆැබ්රික්) - 06<br>● විද්‍යාගාර ස්ටූල් - 06<br>● සිසු පුටු - 08<br>● සිසු මේස - 01<br>● රාක්ක - 01<br>● කෑම මේස - 01<br>● කෑම මේස පුටු - 08<br>● පැන්ට්‍රි කබඩ් - 03<br>● විමසීම් කවුළු - 01<br>● ලොබි පුටු - 09<br>● දේශන ශාලා පුටු - 20 | රු. 30,000.00 | රු. 3,000.00 |

02. ලංසු කැඳවීම දීප ව්‍යාප්ත ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටියට අනුව සිදු කරනු ලැබේ.

03. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2020-10-05 දින සිට 2020-10-26 දින** දක්වා කාර්යාල දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා රු. 3000.00 ක** ආපසු නොගෙවන ලංසු අයදුම්පත් ගාස්තුවක් ගෙවා ලංසු ආකෘති පත්‍ර පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයෙන් ලබා ගත හැකිය. ලංසු ආකෘති ලබා ගැනීම සඳහා ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

04. ඉහත සඳහන් ලංසු ආරක්ෂණය රජයේ පිළිගත් වාණිජ බැංකුවකින් ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැති නම් එම ලංසු ආරක්ෂණය මුදලින් පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ හැකිය. ලංසු ලියවිලි සමග ලංසු ආරක්ෂණය ඉදිරිපත් කර නොමැති ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද ලංසු ආරක්ෂණය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් ලබාගත යුතු අතර, එම ලංසු ආරක්ෂණය ලංසු විවෘත කරන දින සිට දින 90 කට වලංගු විය යුතුය.

05. සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව විධිමත් පරිදි මුද්‍රා තබා (මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර) 2020-10-27 දින පෙ.ව. 10.30 ට පෙර **සභාපති, දෙපාර්තමේන්තු මහ පරිමාණ ප්‍රසම්පාදන කමිටුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ. පෙ. 14, පේරාදෙණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම කාර්ය සඳහා ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති මහ පරිමාණ ප්‍රසම්පාදන බහාලුම් පෙට්ටියට දැමිය යුතු වන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුපත් භාර ගැනීම අවසන් වූ වහාම ලංසුපත් විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

06. ලංසුපත් බහා එවන ලියුම් කවරවල වම්පස ඉහළ කෙළවරේ අදාළ ප්‍රසම්පාදනයේ නම සඳහන් කළ යුතු අතර, ඒ ඒ ලිපි කවරවල අදාළ කොන්ත්‍රාත් ආයතනයේ නමද සඳහන් කළ යුතුය.

07. ලංසුපත් පිළිබඳ තීරණ ගැනීමේ සම්පූර්ණ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, මෙම නිවේදනයේ හෝ ලංසු ආකෘතීන්හි සඳහන් හෝ සඳහන් නොවන මෙම ප්‍රසම්පාදන කාර්යයට අදාළ කිසියම් කාරණයක් පිළිබඳ තීරණයක් ලබාදීමේ බලය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුවේ. (මේ පිළිබඳ වැඩිමනත් විස්තර 081-2388293 දුරකථනය මගින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී අමතා හෝ 047-7429976 දුරකථනය මගින් වියළි කලාපීය උද්භිද උද්‍යානයේ සහකාර අධ්‍යක්ෂ අමතා ලබා ගත හැක.)

**සභාපති,**
**දෙපාර්තමේන්තු මහ පරිමාණ ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.**
**2020-09-30**




2020 ඔක්තෝබර් 03 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
සදාතනික පත්තර තාරුණ්‍යය


# යොවුන් ජනතා

2020 ඔක්තෝබර් 03 සෙනසුරාදා



දෙබරවැව ජාතික පාසලේ 13 ශ්‍රේණියේ ඉගැනුම ලබන මහීෂා සන්දීපනී සිසුවිය විසින් සාම්ප්‍රදායික බිනර මල් යොදාගනිමින් නිර්මාණය කරන ලද සිතුවමකි.

**‘යොවුන් ජනතා’ අප සියලු දෙනාගේ ආදරණීයම පුවත්පතයි. පතාක යෝධයන් රැසකට විසල් සෙවණක් සැදූ ‘යොවුන් ජනතා’ නැවත ඇරඹෙන්නේ තවත් පරපුරක් වෙනුවෙන් යහ මග පෙන්වීම සඳහාය. ලියන අඳින අලුතින් සිතන සෑමදෙනකුටම ‘යොවුන් ජනතා’ ඉඩ හැකි පමණ වෙන් වෙයි. ඕනෑම මාතෘකාවක් පිළිබඳ කරනු ලබන නිර්මාණ සඳහා මෙම පිටුවට ඉඩ වෙන් කර දීමට අපි නිරතුරුවම බලා සිටින්නෙමු.**

**ඒ නිසා එන්න, මේ පිටු අතර සැරිසරමු. අපි ළෙන්ගතු අකුරු සමග අලුත් හුස්මක් ගනිමු.**

**සංස්කරණය - රජිත බස්නායක**

younjanatha@lakehouse.lk

**‘යොවුන් ජනතා’ දිනමිණ**
**ලේක් හවුස්**
**අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත**
**කොළඹ 10.**

# ගැහැනු පිරිමි නොව වැදගත් වන්නේ මාතෘත්වයයි


ළගදී දවසක පිරිමියෙක්ටත් දරුවෙක් උපන්නලු කියලා සමාජේ මිනිස්සු ලෝකෝත්තර කතා කියන්න ගත්තේ නැතැයි. මානසිකරෝගියෙක්ලු, දෙකටම නැති එකෙක්ලු. එහෙමනම් කොහොමද දරුවෙක් වදන්නේ සමාජය මිනිසුන්ට ඉන්න දෙන්නේ නෑ? වැරුද්දක් නැහැ ඒ මනුස්සයා ගේ ජීවිතේ ගැන මහ ලොකු බලාපොරොත්තුවක් ඔහුට තියෙන්න නැතිව ඇති. අම්මාට සලකගෙන පාඩුවේ ජීවිතේට මුහුණ දුන්නේ සොබාදහම ඔහුට ලබා දුන් පෙනුම නිසා බව කව්රුත්ම කියන්නේ නෑ. හැමෝම නම් දරන්නේ ඒ පුද්ගලයා වෙස්ගත්තු පිරිමියෙක් කියලා.

ඔහු අතින් වරදක් උනා නම් ඔබ ඔබටම දොස් පවරා ගන්නවා කියන කතාව 99% බොරු. දැන් ඉතින් දොස්තර නෝනලා මහත්තයාලා පොලිස් නෝනාවරු එකතුවෙලා මක්කරයිද කියලා වටේපිටේ ඉන්න ඔක්කොමලා බලාගෙන හිඳීවි. යම් දෙයක් හිමිවෙනවා නම් හිමිවෙනවා. නොලැබෙනවා නම් නොලැබෙනවා. ඒක තමාලෝක සත්‍ය. ජීවිතේ ගැට ගහන්න කොච්චර රස්සා කරන්න ඇතිද . හැබැයි හොරකම් කරලා, කුඩු කසිප්පු විකුණලා ජීවත් වෙලා, ඡන්දෙ ඉල්ලලා පාර්ලිමේන්තු ගියානම් ඒ ඔක්කොම යටයි සහෝදරයා.

අම්මා කෙනෙක් වෙනුවෙන් කරපු කැපකිරීම් කියන්න කවුරුත්ම නෑ. තමන්ට දුකක් කරදරයක් ආපුවාම ළමා අපයෝජකයින් ගුරු උපදේශකලා වෙන යුගයක, අධ්‍යාපන අද්‍යක්ෂවරු ගුරුවරුන්ට තඩිබාලා ඔවුන්ව පළාත් අමාත්‍යංශ වලට මුදාහැරලා pool එකේ ඉන්න කොට මොන කතාද. ‘වැටත් නියරත්ගොයම් කා නම් කාට කියන්නද ඒ අමාරුව” තමාකියන්න තියෙන්නේ.

අභියෝගවලට face කරනඑක තමා වැදගත් සහෝදරයා පරිපථයෙන් පිට ගියේ නැහැ. මොන හැල හැප්පීම් අතරේ දරුවෙක් ලොවට බිහිකරා... දරුවන් වදලා කුණු බක්කියේල,පාලමයට අත හැරලා යන අම්මලාට වඩා ඒකයි මේ story එකේ වැදගත්කම. කවුරු කෙසේ කීවත් ලිංගිකත්වය කියන්නේ අතිශය ස්වභාවික කාරණාවක්. මේ සිද්ධියත් එක්ක මේක කුණක් විදිහට market වෙලා ඉවරයි. පිරිමියෙක්ටත් දරුවෙක් උපන්නලු කියන කාරණාවේදී වැදගත් වෙන්නේ ගැහැණියක්ද ,පිරිමියෙක්ද යන වග නොව මාතෘත්වයයි.

**පැතුම් නිශාන්ත ඩයස්**
**හිඟුරක්ගොඩ**



# ඔයා ඇයි එළියට ඔච්චර බය

සැඳෑ අඳුර රජ වෙමින් පවතී. විඩාබර දෑස් විවේකය ලබන මොහොත ළඟය. අඳුර ඉරා සඳ කුමාරි ලොව දෙස බලන්නට උත්සාහ කරයි. සඳ රැසින් නැහැවුණ ගොයම් කරල් තාලයකට මෙන් රඟ දෙයි. තුරු මුදුන්වලට සඳ රැස් වැටිලා හරියට සුදු පාවඩ එළලා වගෙයි. පරිසරය හරිම නිසංසලයි. විටෙක හමන සිහිල් මඳනල හැරෙන්නට පරිසරය දරන්නේ පුදුම නිහඬතාවක්. කියාගන්න බැරි මොකක්දෝ පරිසරයේ ගුළි වෙලා වගේ. පරිසරයත් මාත් එකම ගැටලුවක මැදි වෙලා වගේ. මටත් කියාගන්න බැහැ. ඉඳහිට තුරු මුදුන් ලතාවකට වගේ සෙලවෙනවා. එතකොට මගේ මූණට සඳ රැල්ලක් වැටෙනවා. නොදැනුවත්වම වගේ මම මූණ සඟවා ගන්නවා.

“ඔයා ඇයි එළියට ඔච්චර බය”

මට මතකයි නිම්මි මගෙන් දවසක් ඇහුවා.

“ගිනි පෙණෙල්ලෙන් බැට කාපු අය කණාමැදිරි එළියට බයයිනෙ නිම්මි”

මම මේ ජීවිතය පුරාම වේදනා විඳින අයෙක් කියලා නිම්මි දන්නවා.

ඔයා වේදනා විඳින්න එපා මං දන්නවා ඔයාට තියෙන ප්‍රශ්න ඔයා ළඟ මං ඉන්නවා”

නිම්මි මට කිහිප විටක්ම කියලා තියෙනවා මට මතකයි. මගේ ආත්මය නිම්මි වෙනුවෙන් කැප කළේ එයාගෙ තිබූ පුදුමාකාර ගතිගුණ නිසා. නිම්මි තුළ තිබුණ වේදනාවන්, එයා මට කිව්වේ නැහැ. එයා ඒවා සඟවා ගත්තා. නිම්මි මට කිව්වේ “මට ප්‍රශ්නයක් නැහැ” කියලා. ඇතැම් කාලවලදී නෑදෑයෝ මව්පියෝ අපට එරෙහි වුණා. සමාජයේ මිනිස්සු අපව හෙලා දුටුවා. අසම්මත බොරු හැදුවා.

“සත්‍යය කවදා හරි ජය ගනියි”. නිම්මි කීවා මට මතකයි.

“සත්‍ය ජය ගන්න කොට අපි කී සැරයක් මැරි මැරී ඉපදිලා ද නිම්මි.”

“එහෙම කියන්න එපා ප්‍රශ්න නැත්තෙ කාටද?”

මගේ වැටීමේදී මාව උනන්දු කළේ නිම්මි. ඒත් වෙලාවකට මං එයා ගැන හිතුවෙ මොන තරම් වැරදි විදියට ද මට වෙලාවකට හිතෙනවා එයා මට ආදරේ නැහැ කියලා. එහෙම හිතෙන්නෙ නිම්මි ගැන මගෙ හිතේ තියෙන ආදරේ වැඩි හින්ද ද මන්දා

“අපිට කවදාවත් එක්වෙන්න ලැබෙන්නෙ නැහැ නේද” නිම්මි දවසක් මගෙන් ඇහුවා මට මතකයි.

“අනේ මන්දා නිම්මි” මට හිතා ගන්නවත් බැරි ප්‍රශ්නයක් නිම්මි ඇහුවෙ.

“මගෙ අනාගතය මං සතුව නෙමෙයි තියෙන්නෙ නිම්මි... ඔයා අහපු ප්‍රශ්නෙට කවදාවත් මට උත්තර දෙන්න බැරි වෙයි. අපි ඒවා අනාගතයට බාර දෙමු.”

මට මතකයි ඒ විදියට මම කියපු වදන්. අපි අවිනිශ්චිත ආදරයක් ඔස්සෙ පියවර නැගුවා. අනාගතය කොච්චර අවිනිශ්චිත වුණත් අපි ඉදිරියට ගියා කටු පඳුරු මැද්දෙන්. සතුට දයාව කරුණාව සේරම තියෙන්නෙ ආදරය තියෙනකල්. ආදරය ගිලිහෙන කොට උතුම් ගුණාංගත් මිනිස්සු තුළින් ඈත් වෙන්නෙ ඇයි දෙයියනේ.

ආදරයයි වෛරයයි අතරෙ වෙනස කෙස් ගසකට සමයිලු. ජීවිතයෙ හුගාක් දේවල් දැන ගන්න ආදරයෙන් පරාද වෙන්න ඕනලු. ඒත් මම හුගාක් දේවල් දැන ගත්තෙ නිම්මි මගෙන් සමුගන්න ඉස්සර. “නිම්මි ඔයාට මොකද වුණේ”

මට හිතාගන්නවත් බැහැ නිම්මිගෙ වෙනස්වීම. අහිමි ප්‍රාර්ථනා නිම්මිමයි මගෙ හිතේ ඇති කළේ. “කමක් නැහැ නිම්මි. අසම්මත ආදරයක් ඔය විදියට ඉවර වුණ එක හොඳයි.”

“ළමයො, මොකද ඔය එළිපත්තට වෙලා. මොකෝ ඔය අඬන්නෙ?” අම්මගෙ වදනින් මා සිහින ලොවින් මිදුනෙමි. සුදු සඳරැස් දහර කළු වලාකුළකින් වසා සිටිනු මම යාන්තමට දුටුවෙමි.

**හිරාන් කුලසිංහ**
**දොඩංගොඩ**

## සිහගිරි පෙම

වාසලේ සීමැඳුරු අතරින්
නවමු හිරු වඩිතත් සැණින්
අඳුරු වී හද කුටිය තුළ
ප්‍රභාවන් නැත එක ලෙසින්...

උයන් සිරි විඳ යෙනෙන ගමනේ
මගේ රුව දැක බැඳී පෙමින්
කැටුව ආ දා ස්නේහ සමුදුර
වෙරළ වෙත ඇදුණා සෙමින්...

ඇතුළු වූවත් සිංහ ගිරියෙන්
පතා පෙම් පුදසුන් සිතින්
සැණින් වැටහිණි ගොදුරු වූ වග
රුදුරු සිහ රජෙකුට ඉදින්...

සිඳුණු ආලය ලබනු රිසියෙන්
පෙරුම් පුරතත් මා නිතින්
මව්පියන් නැති නුඹත් ඇති නැති
රජගෙය ම ගිනිගෙයකි දැන්...

සිත්තරුන් විත් ලෙනේ සිව්දෙස
හැඩ කරන දා සිතුවමින්
හඬනු නොහැකිව තනිව සිටි මා
සිතුවමක් විය ගිරි මතින්...

පවුර මත ගී රටා බැන්දත්
අදත් මා හා ප්‍රේමයෙන්
කවුරු දන්නෙ ද කවුරු අසනු ද
වියෝ දුක මා විඳි හිතින්...

**තරණි උපේක්ෂා**

## විප්ලව වාදියාගේ පුත්‍රයා

ඉල්මහේ මැදියමක
අනෝරා වැහි අතර
සිනිඳු කළලය මදක්
ගැස්සුනා පා හඬට

වඩා යහපත් හෙටක්
සොයාගෙන පරපුරට
මහ හිමේ සැඟව සිටි
සිය හිමිට දිරි දුන්න
මව් සිතේ තිගැස්මට
කැලතුනා කළල් ගැබ

නිවස සුණු විසුණු කර
කිසිවෙකුත් නොදුටු කල
යකඩ පා පහරෙ සැර
ඇසුනි මර ලතෝනිය

වසර විසි හය පුරා
මහ රැයේ සයනයේ
සිහිනයෙන් මෙන් ඇසෙන
පා හඬට යළි බියව
අදත් ගුලි ගැසෙමි මම

**ශානිකා පවනි හේවගේ**

**මිනිසාගේ ඉවසීම නිර්වින්දනය කිරීමේ වාසිය ලබන්නේ හුදෙක් වෙළෙඳපළ ක්‍රියාකරුවන් ය. අධිපරිභෝජන හෙවත් අධික ලෙස පරිභෝජන කාර්යය කෙරෙහි මිනිසා යොමු වීම වඩාත් තීව්‍ර කරගන්නට මිනිසාගේ ඉවසීම මුලිනුපුටා දැමීම මඟින් ඔවුන්ට වඩාත් පහසු වන්නේ ය.**



# සැනසීම ලැබෙන තුරු ඉවසමු

ඉවසීම පුද්ගල ජීවිතයට ඉතා වැදගත් සාධකයකි. බුදු දහමේ වුවත්, ක්‍රිස්තියානි ආගමේ වුවත්, හින්දු හා මුස්ලිම් ආගම්වල වුවත් ඉවසීමේ වැදගත්කම වඩාත් පුළුල් ව පහදා දී තිබෙන්නේ ය. බුදු රජාණන් වහන්සේ 'ඛන්ති පාරමිතාව ' ලෙසින් ඉවසීමේ ගුණාංගය පාරමිතාවක් සේ ප්‍රගුණ කරන සේක. අල් කුරානයේ වුවත් ඉවසිලිවන්තව හරි දේ කිරීම හා දෙවියන්ගෙන් සහනයක් අපේක්ෂා කිරීම අතර සමීප සබඳතාවක් තිබෙන්නේ ය. ක්‍රිස්තියානි දහමට අනුව බයිබලයේ Romans 12:12 කොටසෙහි 'Rejoice in hope , be patient in tribulation, be constant in prayer' (බලාපොරොත්තුවලින් ප්‍රබෝධමත් වන්න, විපතකදී ඉවසිලිවන්ත වන්න, යාච්ඤාව සමඟ සදාකාලික ව ම බැඳෙන්න.) ලෙස සඳහන් ව තිබේ. මෙලෙසින් ලොව බොහෝ ආගම්වල, සමාජවල ඉවසීමේ වටිනාකම මොනවට පසක් කර දී ඇති විටෙක අද ලෝකයා ඉවසීම තම ජීවිතය තුළ රඳවා ගන්නවා ද, යන්න කෙරෙහි සැකයක් ඇති කරවන්නේ ය. ගෝලීයකරණය නිසා ලොව පුරා වෙළාගෙන ඇති පරිභෝජනවාදී සමාජය මිනිසාට ඉවසීම තුළ රැඳෙන්නට ඉඩ දෙනවා , යන්නත් විශාල ගැටලුවකි. මිනිසුන් ව අධිපරිභෝජන ක්‍රියාවලියකට හුරු කරවන්නට බහුජාතික සමාගම් ඇතුළු වෙළෙඳපළ ක්‍රියාකාරීන් නිරන්තරයෙන් ම ජනමාධ්‍ය හා නව මාධ්‍ය හරහා පෙරඹීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජය ක්ෂණික දෙයට වැඩිමනක් හුරු ව තිබෙන්නේ ය. ක්ෂණික ව පිළියෙල කරගත හැකි ආහාර පාන, ක්ෂණික ගනුදෙනු හුවමාරු, ක්ෂණික මිල දී ගැනීම්, ක්ෂණික ලාභ ඉපැයීම් යනාදී වශයෙන් කඩිනමින් ඉටු කර ගන්නට හැකි වෙළඳපල ආශ්‍රිත බොහෝ ක්‍රියාවලීන් නිසා සමාජයේ ඉවසීම ඉතාමත් අවම මට්ටමක පවතියි. අවශ්‍යතාවක් මතු වූ සැණින් එය සපුරා ගන්නට වත්මන් සමාජය බොහෝ විට යොමු වීමේ ගතිය නිසාවෙන් නොයෙකුත් අවැඩදායක තත්ත්වය සමාජය ළඟා කරගෙන තිබෙන්නේ නිරායාසයෙන් ම ය.

මිනිස් සමාජය තුළ පරාජය වීම්, බිඳ වැටීම් ඉවසීම තුළින් දරා ගැනීමෙන් තොර ව හා ජයග්‍රහණය සඳහා කැපවීමකින් තොර ව අපේක්ෂිත අරමුණු ලබා ගැනීමට හැකියාවක් නොමැති ය. එහෙත් ඉවසීම මිනිසාගෙන් ඉවත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ක්ෂණික ජයග්‍රහණ පසුපස හඹා යමින් නිරර්ථක කරුණු සඳහා තමන්ට, අරමුණට යෑමට ඇති ශක්තිය ව්‍යක්ත කර ගැනීම සිදු කරන්නේ ය. මිනිසාගේ ඉවසීම කොතරම් නම් පටු වී ඇද් ද, යත් මෙගා ටෙලිනාට්‍යවල විරාමයට පසු ව විකාශනය වන නාට්‍යයේ ඊළඟ කොටස ද, විරාමයට පෙර සාරාංශයක් කොට පළ කරනු දැක ගන්නට ලැබෙන්නේ ය. වෙළඳ දැන්වීම් සඳහා වෙන් කරන මිනිත්තු කිහිපය හෝ මිනිස්සුන්ට අද ඉවසන්න නොහැකි වී තිබේ. එහෙත් දශක දෙක තුනකට පෙර මාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ව සොයා බැලුවහොත් ටෙලි නාට්‍යක් රූපවාහිනියක විකාශය වන්නේ සතියකට එක් වරක් හෝ දෙවරකි. එනිසා ප්‍රේක්ෂකයාට නාට්‍යයේ ඉතිරි කොටස නරඹන්නට සතියක් පුරා ඉවසා සිටින්නට සිදු වේ. එවැන්නක් වර්තමානයේදී දැක ගැනීමට නොහැකි ය. මිනිසාගේ ඉවසීම නිර්වින්දනය කිරීමේ වාසිය ලබන්නේ හුදෙක් වෙළෙඳපළ ක්‍රියාකරුවන් ය. අධිපරිභෝජන හෙවත් අධික ලෙස පරිභෝජන කාර්යය කෙරෙහි මිනිසා යොමු වීම වඩාත් තීව්‍ර කරගන්නට මිනිසාගේ ඉවසීම මුලිනුපුටා දැමීම මඟින් ඔවුන්ට වඩාත් පහසු වන්නේ ය.

එමෙන් ම මෙම ක්ෂණික බව නිසා දැකිය හැකි තවත් එවැනි ප්‍රවණතාවයක් වශයෙන් කෙටි කලෙකින් සමාජයේ ජනප්‍රිය වන්නට, ක්ෂේත්‍රවල මුලසුන් කරා ගමන් කිරීමට පුද්ගලයා තුළ පෙලඹවීම් ඇති කර තිබෙන්නේ ය. ඕනෑ ම ක්ෂේත්‍රයක ප්‍රවීණයෙකු වීම සඳහා එම ක්ෂේත්‍රය ආශ්‍රිත දැනුම උකහා ගැනීම, අත්දැකීම් එකතු කර ගැනීම, පොතපත අධ්‍යයනය කිරීම්, භාවිත ආකෘති හැදෑරීම් අත්‍යවශ්‍ය වන්නේ ය. ක්ෂේත්‍රය තුළ දිගු කාලයක් තිස්සේ රැඳී සිටිමින් එහි ඇති රටාවන් අවශෝෂණය කර ගැනීමට ආධුනිකයා තුළ ඉවසීම තිබිය යුතු ය. එහෙත් ඒ කිසිවක් මායිම් නොකර ක්ෂණික ව උත්පාදනය කරවන ජනප්‍රියත්වය හා හැකියා පිම්බවීම නිසා බොහෝ පිරිස් ක්ෂේත්‍රවලට පැමිණ අතරමං වන්නේ ය. නිවැරදි හා දූරදර්ශී ව ක්ෂේත්‍රය තුළ ගමන්මඟ නිර්මාණය කරගත යුතු හා සාක්ෂාත් කර ගැනීමට සුදුසු මංපෙතක් නොමැති ක්ෂණික ව ඉස්මතු වීමකදී එම තැනැත්තන්ට ක්ෂේත්‍රය තුළ ඉන් අනතුරු ව රැඳෙන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ගැටලුවට මුහුණ පාන්නට සිදු වන්නේ ය. නිර්මාණකරුවා තමන්ට ක්ෂණික ජනප්‍රියත්වයක් අත්පත් කර ගැනීම තකා නිර්මාණයක් ඉදිරිපත් කරන විටෙක ඔහුගේ අවධානය මුළුමනින් ම නිර්මාණය වෙතට කේන්ද්‍ර කර ගන්නට නොහැකි වන්නේ ය. නිර්මාණය සාර්ථක කර ගැනීමට වෙහෙසෙනවා වෙනුවට කෙටි කාලයකින් නිර්මාණය අවසන් කර දැමීමට ක්ෂණික බව පොලඹවයි. මිනිසා සියුම් අධ්‍යයනයන්ට පෙලඹිය යුතු වන අතර ඒවා එක සැණින් උකහා ගැන්මට හෝ ඒවාට පරිචයන් ගොඩනගා ගන්නට නොහැකි ය. එයට නිර්මාණකරුවා තුළ ඉවසීම තිබීම අවශ්‍ය වන්නේ ය. ඇතැම් ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවන් තමන්ගේ සුපුරුදු ජීවන රටාවෙන් ද, ඉවත් වී තමන්ගේ නිර්මාණයට ම අවධානය යොමු කරවමින් වසර ගණනාවක් වුව නිර්මාණය හා සමඟ කාලය ගත කරන්නට පෙළඹී සිටි හා සිටින අතර, ලියනාඩෝ ඩාවින්චිගේ 'මොනාලිසා' චිත්‍රය එවැනි වසර ගණනාවක් තිස්සේ සංස්කරණය වෙමින් බිහි වූ නිර්මාණයක් වශයෙන් පෙන්වා දෙන්නට පුළුවන.

තාක්ෂණයේ දියුණුවත් සමඟ ක්ෂණික බව වඩාත් තීව්‍ර වෙත් ම සමාජයේ වෙසෙන මිනිසාට මෙම ක්ෂණික බව සමඟ දැරිය නොහැකි වේගවත් දිවි පෙවෙතකට අවතීර්ණ වන්නට සිදු ව තිබෙන්නේ ය. අතීතයේදී පණිවිඩයක්, ආරංචියක් විශාල ප්‍රදේශයක් පුරා ව්‍යාප්ත වන්නට මාස, සති ගණනාවක කාලයක් ගත වූ නමුත් වර්තමානයේදී ඉතාමත් කෙටි කාලයකින් විශාල තොරතුරු සමුදායක් එකවර සමාජය වෙළා ගනිමින් පවතින්නේ ය. එම නිසා වත්මන් සමාජයට විවේකයක ඉඩ හසර අහිමි වී තිබෙන්නේ ය. ක්ෂණික බව නිසා ඇති කරන්නා වූ අධිපරිභෝජනය මිනිසාට වඩාත් කාර්යබහුල, වැඩි මුදලක් ලැබීමට නම් වැඩියෙන් වැඩ කළ යුතු බවට වූ වෘත්තීය ජීවිතයකට යොමු වීමට පොලඹවා තිබෙන්නේ ය. පවුල සමඟ රැඳෙන්නට කාලය නොමැති, පරිසර සුන්දරත්වය වින්දනය කළ නොහැකි, විනෝදාංශ හෝ එවැනි තෘප්තිමත් කාර්යයක නියැළීමට අවස්ථාව අහිමි වඩා වෙහෙසකර ජීවන රටාවකට මෙනිසා මානව සමාජයේ ගමන් මග වෙනස් වී තිබීම කනගාටුදායක කාරණාවකි. පැල් කවි, කරත්ත කවි, විවිධ නාටක රඟ දැක්වීම්, ශාන්තිකර්ම යනාදි කාව්‍යාත්මක සාහිත්‍යකින් පිරී තිබූ ශ්‍රී ලාංකික සමාජය, අද නව පරපුරට දකින්නට නොහැකි ය. ලාංකේය සමාජය තුළ කවිය යන්න අනිවාර්ය අංගයක් ව පැවතියේ ය. සාමාන්‍ය ගැමියා පවා පද ගළපා අපූර්ව සදැස් ගොඩ නඟන්නට තරම් බස හැසිරවීමෙහි හා සවිඥානික බවේ සුරුකම් ඇත්තෙක් වූවේ ය. නව නිර්මාණ සඳහා කාලය මිඩංගු කරන්නට අවසර ලද්දෝ වූහ. එහෙත් ක්ෂණික බවට සමාජය ගොදුරු වීමත් සමඟ මිනිසාට සිතන්නට කාලය අහිමි කළේ ය. සියුම් දෙයටත් සංවේදී වූ මිනිසා යාන්ත්‍රිකයෙකු බවට පත් වූවේ ය. ඇතැම් සාහිත්‍ය තරගවලදී නියමිත පැය කිහිපයක් තුළ තරඟකරුවන්ට නිර්මාණයක් ඉදිරිපත් කරන ආකාරයේ කොන්දේසි පැනවීම අපි නොයෙකුත් අවස්ථාවල දැක ඇත්තෙමු. එහෙත් මිනිස් මනස පිළිබඳ ව සුළු හෝ අවබෝධයක් පවතින අයෙකු එවන් කොන්දේසි පැනවීම් මත ප්‍රශ්නාර්ථයක් මතු කරනවා නිසැක ය.

ක්ෂණික බව නිසා කොතෙකුත් පහසුකම් මිනිසාගේ අතේ දුරට සමීප ව කර තිබෙන්නා නමුදු ඉන් සියල්ල ම සම්පූර්ණ බැව් සිතීම මුග්ධකමකි. ක්ෂණික බව පසුපස හඹා යන අපට, සිතා ගන්නටවත් නො හැකි බොහෝ දේ අහිමි කර තිබෙන්නේ ය. ලියුමක් ලියා එයට පිළිතුරක් ලැබෙන තෙක් බලා සිටි ඒ අතීත කාලය වත්මන් පරපුරට අත්විඳින්නට නො හැකි ය. ඒ ආශ්‍රිත ව නිර්මාණය වූ සාහිත්‍ය, කලාව, රසය; sms පණිවිඩයකට හෝ whatsapp පණිවිඩයකට හෝ හඬ පටයකට සීමා වන්නේ ය. කතාව අවසන් කිරීමට මත්තෙන් වර්තමාන සමාජය කල් තියා ම උපකල්පනය කරමින් පුංචි තිරයට ගෙනා වඩාත් කාලෝචිත මතක සටහනක් වන 'පළිඟු මැණිකේ ' නාට්‍යයේ සූරසේනගේ 'පට් පට් සම්තින් ' වදන හුවා දැක්වීමට හැකි ය. ඔහු තම සෑම අදහස් ප්‍රකාශනයකට ම මෙම වදන යොදා ගත් ලෙසින් අද අපට ද පට් පට් සම්තින්වලින් මිදී සිටීමට නොහැකි වී ඇත්තේ ය.

**බිනූ දිලාරා ගමගේ**
**පළමු වසර - ශ්‍රීපාලි මණ්ඩපය**
**කොළඹ විශ්වවිද්‍යාලය**

# මහතලාවේ පහන්ටැඹ පාමුලදීය

සාහිත්‍ය මාසයට සමගාමීව පසුගිය සැප්තැම්බරයේ මාතලේ මහත්මා ගාන්ධි අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේ දී සාහිත්‍ය උලෙළක් පැවැත්විණි. එහිදී සැප්තැම්බර් 26 වන දා දිනය මුළුමනින්ම වෙන් කර තිබුණේ පහන්ටැඹ සාමූහිකයේ නිර්මාණාත්මක වැඩමුළුව වෙනුවෙනි. එහිදී කවිය, ගීතය හා නාට්‍ය මෙන්ම තවත් කලා අංශ ගණනාවක් පිළිබඳව ද ක්ෂෙත්‍රයේ ප්‍රවීණයන් විසින් දේශන පවත්වන ලද අතර ඡායාරූප ශිල්පය හා චිත්‍ර කලාව පිළිබඳ වැඩමුළු පවත්වන ලදී. මෙම වැඩමුළුව හා සම්බන්ධ වීමට මාතලේ දිස්ත්‍රික්කයේ තරුණ තරුණියෝ විශාල සංඛ්‍යාවක් එක්රොක් වූහ.

එදින සෙනසුරාදාවක් වූ නිසා පාසල් දරු දැරියන්ගේ සහභාගිත්වයද ඉතා ඉහළ අගයක පැවතිණි. උත්සවය ඇරඹුණේ කවි රසාස්වාදයත් සමගිනි. එතැන් සිට කවිය, රසාස්වාදය හා නාට්‍ය සම්බන්ධව ආධුනික නිර්මාණ ශිල්පීන්ට ඉතා වටිනා හෝරා කිහිපයක් ගෙවා දැමීමට හැකි වූ අතර ඉන්පසුව ඡායාරූපකරණය සම්බන්ධයෙන් ද වැඩමුළුවක් පැවැත්විණි. දක්ෂතාවයන්ගෙන් හෙබි කුඩා දරු දැරියන් පිරිසක් සොයාගැනීමට හැකි වූ තවත් අංගයක් වූයේ චිත්‍ර වැඩමුළුවයි. මෙම වැඩමුළු කිහිපය අවසානයේ දී සහතිකපත් ප්‍රදාන උත්සවයක්ද පැවැත්වීමට කටයුතු කර තිබූ අතර එහිදී ඒ ඒ අංශ වලින් දක්ෂතා පෙන්නුම් කළ තරුණ තරුණියන්ට මෙන්ම සහභාගී වූවන්ට සහතික පත් ප්‍රදානය කිරීමෙන් පසුව උත්සවය නිම විණි. මේ සඳහා මුද්‍රිත මාධ්‍ය අනුග්‍රහය ලබා දෙනු ලැබුවේ ලේක් හවුස් ආයතනයේ 'යොවුන් ජනතා' පුවත්පත මඟිනි.



සෑවොම පිළිගනිමින්


උත්සවයේ සමාරම්භය


පහන්ටැඹ සාමූහිකය වෙනුවෙන් ලියාපදිංචිය


කවි රසාස්වාදය


පිළිගැනීම - ආචාර්ය ජගත් වැල්ලවත්ත






කේ. බී. මානැව, ආරුමුගම් මලරන්බන්, පියදාස වැලිකන්නගේ සාහිත්‍යවේදීන් සම්මානයට පාත්‍ර වෙමින්


රත්න ශ්‍රී උපහාර


ඡායාරූප වැඩමුළුවේ පිරිස


රත්න ශ්‍රී විජේසිංහ


කමල්ප්‍රිය අලහකෝන්


ධම්මික බණ්ඩාර


ඉන්ද්‍රනාත තේනුවර


ආරාධිතයින්, සංවිධායකයින් සහ ගෞරව සම්මානලාභීන්


ඡායාරූප වැඩමුළුවේ සහතිකපත් ප්‍රදානය


ජයග්‍රාහකයන්ට පොත් සහ පොත් රාක්ක


චිත්‍ර වැඩමුළුව




උත්සව සභාව


කවි වැඩමුළුව

# අපේ ජීවිත සරුංගල් වගේ



ජීවිතේට ප්‍රශ්න එන්න ගත්තම එන්නේ දෙයියනේ කියලා එක පිට එක වැල නොකැඩි...... හැඟීම් දැනීම්වලට වහල් වෙලා හැමදේම නැති කරගන්න වර්තමාන යෞවනය යෞවනියන් ගොඩට අපිත් වැටිලා.....

සාම්ප්‍රදායික තරුණ පරම්පරාවට අපි අයිති නැහැ කියල කොච්චර කෑගහලා උදන් ඇනුවත් ජීවිතේ එක්තරා වෙලාවකදී අපිත් ඒ සාම්ප්‍රධායික ගොඩට වැටෙනවා. හැබැයි අපි දන්නෙත් නැහැ අපි ඒ ගොඩට වැටිලා කියලා..........

ආදරය ගැන ප්‍රශ්න ආවම කොච්චර රැඩිකල් ප්‍රේමවන්තයෝ ප්‍රේමවන්තියෝ උනත් සාම්ප්‍රදායික මානසිකත්වයකින් හිතන්න ගන්නවා...... බොලඳ වැඩ කරන්න ගන්නේ හරියට තුන හතර වසරේ පන්තිවල ඉන්න පොඩි එවුන් වගේ....

ගෙදර ඉන්න අම්මගේ තාත්තගේ අදහස් හණමිටි අදහස් කියලා ගණන් නොගන්න, අපිට අපේ වැඩ තනියෙන් කරගන්න පුළුවන් කාගේවත් උදව් ඕනේ නැහැ කියලා කෑගහන ගොඩක් කෙල්ලොන්ට කොල්ලොන්ට පොට වැරදුණාම තමා ගෙදර ඉන්න අම්මාව තාත්තව මතක් වෙන්නේ. හොට බිම ඇනුණම තමා තේරෙන්නේ මව්පියන්ගේ හණමිටි අදහස් වල සත්‍යතාව 100% කියලා.

ගෙවල්වල ඉන්න අහිංසක අම්මා තාත්තගෙන් opinions ගන්න එක youth generation එකේ අපිට මදිකමක් කියලා හිතෙනවා ඇති. චුට්ටක් හිතලා බලන්න ලී බඩුවක වුණත් වටිනාකම වැඩි වෙන්නේ modern designsවලට වඩා classic designs වල නේද කියලා..... පණ්ඩිතකමට තනි තීරණ අරගෙන අපි කොච්චර නම් දුක් විඳින අවස්ථා තියෙනවද. නැවතිලා හිතලා බැලුවම වෙලාවකට modern youth generation ඒක කියන්නේ modern විදියට දුක් විඳින ජාතියක්.

හිතට බරක් දැනෙන ප්‍රශ්නයක් ආවහම ගිහිල්ලා නතර වෙන්නේ ගමේ පන්සලේ බෝ ගහ යට. ඇත්ත බෝ ගහ යට ඉද්දි හිතට මහා සැනසිල්ලක් දැනෙනවා තමයි. පන්සල් යන්න ඕනේ කියලා අම්මලාට කිව්වම එයාලා හිතන්නේ අපි එකත් කරන්නේ style එකට කියල. එහෙම නෙමේ modern stylish අපිත් classic වෙන වෙලාවල් එනවා.

තරුණ අපේ ජීවිත වෙලාවකට පාවෙන සරුංගල් වගේ..... අරමුණක් නැතුව ඔහේ පාවෙවී තියෙනවා. අරමුණක් හදාගෙන ඉස්සරහට යන්න උත්සාහ කරද්දී අපේ කකුල්වලින් අදින කල්‍යාණ මිත්‍රයෝ මේ සමාජයේ අනන්තයි අප්‍රමාණයි. එහෙමයි කියලා අපි නවතියිද? නැහැ. එන ඕනෙම ප්‍රශ්නෙකට කෙළින් මුහුණ දීල අම්මලා තාත්තලාගේ හිත නොරිදා අපේ අරමුණුවලට යන එකයි තරුණ අපේ ඉලක්කය.... වපර ඇස් වලින්ම අපි දිහා නොබලා යහපත් දෘෂ්ටි කෝණයකිනුත් අපි දිහා බැලුවොත් සමාජයට නරකක් වෙන එකක් නැහැ !

**සමාධි සංකල්පනා**

# කොන්දේසි රහිතව ප්‍රේම කරමු



පොඩි කාලේ ඉඳන් ආස කරපු චරිතයක් තමයි චේ ගුවේරා කියන්නෙ. මහ විසල් චරිතයකට එහෙම ආදරේ කරන්න හිතුණ හේතුව තමයි විප්ලවවාදී අදහස්වලට තිබුණ ආදරය. චේ මිනිස්සුන්ට කොන්දේසි විරහිතව ආදරේ කළා. ඔහු මැරෙන්නත් හේතු වුණේ ඒ ආදරය. ඉතින් අපිටත් බැරිද මිනිස්සුන්ට කොන්දේසි විරහිතව ආදරේ කරන්න.

දරය හැඩවෙන්නෙ ආත්මාර්ථකාමී හැගිමෙන් තොර වුණාම. ඒත් මිනිස්සු හැමදාමත් හිතුවේ ආදරය බදාගන්න. ආදරය ඇතුලේ අනෙකාව හිරකරන්න. ඒකයි මිනිස්සුන්ට ආදරය හැමදාමත් මග ඇරුණේ. ආදරයට සීමා නැ කිව්වට ඒවා වචන විතරයි. කොටුවෙන් පිට හිතන එකා දෙන්නා මේ සීමාවන් අතික්‍රමණය කරාට බහුතරය තාමත් එහෙමමයි. ඒක ඇතුළෙමයි. මිනිහෙක් තවත් මිනිහෙක්ට ආදරය කරනවා නම් කොහෙන්ද මේ තරම් උසාවි ගාණේ නඩු පෝලිම්.

මිනිස්සු ආදරය කරනවා කියන්නේ තමන්ටමයි. තමන් ආස දේවල් ළං කරලා බැදලා හිරකරන් ළඟම තියාගෙන ඒ සතුටු කරන්නේ තමන්වමයි. ඉතිං කොහෙද ආදරය ජීවමාන වෙන්නේ.

අනෙකාගේ සිනාවට වගේම කඳුළටත් ආදරය කරන්න පුළුවන් වුණ දවසක අපිට පුළුවන් ආදරය ගැන කතා කරන්න. ආදරය නිර්වචනය කරන්න.

මම ඔබට යෝජනා කරනවා ආයෙ ආයෙත් කොන්දේසි විරහිතව ආදරේ කරන්න. ඒ ආදරේ අයිතිය ඕනෑම කෙනෙකුට නතු කරගන්න නිදහස දෙන්න. එතකොට ලෝකෙම ලස්සන වේවි.

**හශාන් අනුරාධ මංචනායක**

# ඔබට විරහ ගිනි නොගෙනේවා...

මේ ලෝකේ වැඩිපුරම ඉන්නේ තමන් දැකපු හීන ලස්සනට පාට කරලා අනුන්ට දීපු අය. ජීවිතේ කියන්නේ ලැබීම්වලට වඩා නොලැබීම්වලට. මේ අහස යට මේ පොළව මත කොයිතරම් නම් ප්‍රේම කතා තිබුණත් ඒ කතාව හැබෑවක් වෙලා රන් හුයෙන් දෑඟිලි බඳින්න ලැබෙන්නේ කීයෙන් කී දෙනාටද...

විකසිත පෙම් පොකුරු පියුම්
ඔබේ පයට පොඩි වී ගියාදෙන්
පතිකුලයට අද මට පිටුපා යන
මගේ සොඳුරු ළඳුනේ...

ආදරේ සැබෑ ස්වරූපය දකින්න ලැබෙන්නේ දිනුවොත් නෙමෙයි පැරදුණොත්... අන්න එදාට තමා සැබෑ ආදරේ දකින්න පුළුවන්. තමන් පණ වගේ ආදරේ කළ යුවතිය තව පිරිමියකුගේ පතිනිය වෙලා යන දවසට තමන්ගේ ආදරේ ගැන හිතලා සතුටු වෙන්න හැමෝටම බෑ. ඇත්තටම ආදරේ කියන්නේ අයිති කරගන්න එකට නෙමෙයි. ඒත් අපිට බැරිත් එහෙම හිතන්නයි.

හිතේ කඳුළු බිඳු රෑ තනි යහනේ
ඉහ ඉද්දර හිඳ ඉකි බිඳිනා සඳ
ආදර සැමරුම් ප්‍රේම පුරාණේ
ඔබට විරහ ගිනි නොගෙනේවා...

මතකයන් ගොඩක් වෙලාවට හිතට එන්නේ මහ රෑට. ඒ වෙලාවට විතරයි අපිට මතකය මඟෑරලා යන්න බැරි. මතකයන් එක්ක කොයිතරම් අපි අසරණ වෙනවද... මම අසරණ වුණත් ඒ මතකය ඔබට දුකක් නොගෙනේවා. මේ කාරණාවම බන්ධුල නානායක්කාරවසම් ප්‍රවීණ රචකයාත් කියනවා

"සිටිනා කොදෙව්වක නුඹ සැප විඳී නම්...
මවෙතින් ලැබුණු ආදරයත් ලැබේ නම්...
මතකය නුඹට හිරිහැරයක් නොවේ නම්...
තව කුමකට ද දුක් ගී කල්පනාවන්..."

අපේ මතකය ඔබට දුකක් නෙමෙයි නම්, මම වගේම ඔහුත් ඔබට ආදරය කරනවා නම්, කොහේ හරි තැනක සතුටින් ඉන්නවා නම් ඊට වඩා දෙයක් මට ඕනෑ නෑ.

තනිකම රජයන පාළු විමානේ
ගොම්මන් කළුවර හඬා වැටෙද්දී
ඔබ දිවි අරණේ රුවන් විජිතයේ
මැණික් පහන් වැට දැල්වේවා...

විවාහය... එක්කෝ හරි යන තැන. නැත්නම් වරදින තැන. හැමදේම නැති වෙලා ජීවිතය කළුවරටම වැටිලා තියෙද්දිත්, මාව දාලා ගිය ඔබට වරදින්න එපා කියලා මම ප්‍රාර්ථනා කරනවා. මේ තරම් ආදරණීය ප්‍රාර්ථනාවක් කරන්න පුළුවන් සැබෑම ආදරවන්තයකුට විතරයි. ආදරය වෙනුවෙන් කැප වෙන මිනිස්සු සංසාරේ කොතනක හරි සැනසෙනවා...

**කණිෂ්ක මීගස්මුල්ල**

# හිමිදිරි පෙදෙස

**පසුගිය සතියේ මාතලේ මහත්මා ගාන්ධි අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති සාහිත්‍ය උලෙළට සමගාමීව පහන් ටැඹ සාමූහිකය විසින් 26 වැනිදා දිනය පුරා වැඩමුළු කිහිපයක්ම පවත්විණි. එහිදී කවිය මූලික කර ගනිමින් රත්න ශ්‍රී විජේසිංහ මහතා ආරම්භක දේශනය සිදු කළ අතර, එදිනම සවස වැඩමුළුවක් ද පවත්වන ලදි. මේ සඳහා සුහර්ෂණී ධර්මරත්න, රුවන් බන්දුජීව, අමරසිරි වික්‍රමරත්න, පුෂ්පා රම්ලානි, විජයානි නාලිකා යන ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඬුල්ලකගේ සහභාගිත්වය ද කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් විය.**



මාතලේ පැවැති පහන්ටැඹ සාහිත්‍ය උලෙළේදී
ජයග්‍රහණය කරන ලද කවි

## පිළිගැනීම

එම්බා බස් රථය
බලා හිඳී රතු ඉර
එනතුරා මා පිළිගන්න
කරව පය ඉක්මන්

**ගීතා මුණසිංහ**
**හුලංගමුව පාර, මාතලේ**

## සිහින පැතුම්

වියළි බිමට වැටුණු කොළයක්
දැකපු තුරු මුදුනක ළදල්ලක්
සුසුම් හෙලුවා බිම බලාගෙන
ආයෙත් හමු නොවන රිදුමක්...

පලාවන් පැළ ගොයමක්
අරුණාලොවක සහසැස්
පැතුමන් පුරයි සෙනෙහෙන්
පතාගෙන දිවි සවියක්

කදෝ පැණි එළි දහසක්
පෙරහැරක යන සිරියක්
හොඳින් විඳගෙන කවියක්
පිනි බිළිඳු සිත් සතොසින්...

අඳුරු රැයට තනි රකිමින්
සඳ දියට පෙම් බැඳි මොහොතක්
කුමුදුනියකගෙ සිනහවක්
මිහි මව් හදට සැපතක්...

**ගයානි කාවින්දිකා විමලරත්න**
**නාරංබැද්ද, හිරිවඩුන්න**

## සොඳුර ඒ මතක

කාලයත් ගඟක්
නොනැවත ගලන
මල් පෙතිත් අරන්
පහළට ඇදෙන...

රෑට තරුවට හඳට
දුක කියන
කඳුළු දී අහසකට
වැසි සදන...

පතුල සැඟවූ මතක
මිය නොයන
දිනෙන් දින ඔප වැටී
මිණි සැදෙන...

ඒ මිණි සේ මතක
සමඟින් දිනෙක
මගෙ සොහොන මත
මලක් ඇත පිපෙන
සොඳුර නුඹ විත්
එමල සිඹිනු මැන...

**උදේශිකා හේරත්**
**හපුවෙල, ගුන්නෑපාන**

## සැප

හිරු බැස යන විටදි
රිංගයි මගේ නිවසට
දෙදෙනෙකු පොල්කිච් කුරුලු
උන් විඩා නිවුමට

රෑ බෝ වී දිනක්
ආවේ නිවෙසට තෙමීගෙන
දැල්විම් විදුලි පානක්
දුටුවා නොදුටු දසුනක්

සිවිලිමේ වැන්ඩලියරේ
පොදියට ගුළිවී නිදන
කුරුල්ලන් දුටු කල
කියාගතිමි මටම
කොයින්ද සැපතක් මට!

**ජයන්ත අභයවර්ධන**
**පැලැන්වත්ත**
**පන්නිපිටිය**



## අම්මේ

සාක්කුව පතුලටම අත දමා
කාසි අතරින් කලතා
තාත්තා මා අත තැබුව
පැණිම පැණි රස ටොපියෙත්
ලුණු රසක්
දැනෙනවා අම්මේ අද මට

**ජී.අයි. චන්ද්‍රරත්න**
**එගොඩමුල්ල, අංකුඹුර**

## ඇණවුමක් ලද කවිය

වලාවක් පාව එයි,
දුර කවුළුවෙන් ඇසට...
දවස දිය වෙවී යයි
හලා සෙවණැලි අවට...
බොහෝ අරමුණු අතර
ඇවිද යනමුත් දසත
ලියා දෙන්නට නොහැක,
ඒ,
කවි,
කවිම හෙයින!

**ගීතාංජලී ආරියරත්න**
**උඩුපිහිල්ල, මාතලේ**

## අඬන්න හිතුනද

කඳුළු දකින්නට
ඉතිමං මොකටද
දෑස දකින විට
අඬන්න හිතුණද..

සිනහ නොවන්නට
විරාමයක් ගෙන
දෑස තෙමන්නට
සූදානම්..

මගේම තනිකම
මගේම සෙවනයි
සෙවන පිටින් යමි
පියාසලන්නට

**චන්ද්‍රදාස අබේනායක**
**පානදුර**

## සුසුම් පොදි දුන් හදක්

සිහිනයෙන් අවිදින් නෙතින් සිත සොරාගත්...
ප්‍රේමයක් විය හදේ බිඳක්වත් නොබිඳුනත්...
කාලයක් මුලුල්ලේ පෙම්කලත් සියල්ලක්..
වෙන්කලත් වෙන් උනත් තාම නෑ සැනසුමක්...

ප්‍රේමයක් ඉගැන්නු ඇඳුරු තුමියක් වුවත්...
මූසිලද ගුත්තිල ද සොයමි මම තව තවත්...
මියදෙන්න සිතෙන මුත් උනුහුමෙන් විටෙක් මත්...
බැදෙන්නද මිදෙන්නද සිතනවා තව තවත්...

කොහේ හෝ සිට අවුත් සුසුම් පොදි දුන් හදක්...
මියෙන තුරු රැක ගනිමි මතකයන් තව තවත්...
හිමි අහිමි බව දැනුනි,,,නෑ එයින් විඩාවක්...
නුඹ ගියත් කිසිදිනක නොයමි මම සිතින් වත්...

**තරිඳු සී. ප්‍රියංකර**

## අනාගත් ජීවිතය

කවි ලියන්නට හිතා
ආ ගමන අද උදේ
බසයෙ දුටු යුවතියකි
කිළිටි දරුවෙකු දරා

කවි සිතට ආ හැඟුම්
දුරගියා දුක හිතී
කවි තරම් රස නැතුව
අනාගත් ජීවිතය
දුටු සැනින් වියැකුණා
හදවතේ රස හැඟුම්

**H.k.G.W.**
**අත්තනායක**

## ආඩම්බරකාර නුඹට

මහා මුරුගසන් වරුසාව මැද
හිමිකමක් නොකියාම මම රැක්ක උඹ
දන්නවද හිත තාම නුඹ හොයන වග
එක මගක යන්න බැරි පා කුමට මට...

ජීවිතේ මගෙ නුඹයි නොකීවාට අද
හැමදාම නුඹ මගෙයි නෑ කිසිත් දුක
පාළුවක් දැනුනාම ඉඳහිටත් මට
සිහි වෙන්නේ හැම මොහොතෙ නුඹේ සඳවත...

ආඩම්බර කාර නුඹේ ඔය නෙත
කුමට මේ නාඩගම් දඟකාර හිත
මහ වැස්සෙ නුඹ කොහොම තනි කරන්නද මම
මේ තමයි නුඹේ මඟ පියනගන මම....

**නෙලුම් ඇලපත්ගම**
**නීති විද්‍යාලය**

## සැනසුමේ සේයා

සිතිජ මාලිගාවේ
දුර ඈත කවුලුවෙන්
බලා ඉන්නා නුඹේ ඡායා
සිතුවමක් සේ නෙතේ ඇඳුනා

සයුරු තෙර සොඳුරු බව
හුදෙකලාවේ බලා සිටි මට
තනිකමක් මා සිතේ ඇඳුනත්
සැනසුමක් එහි රැඳී තිබුණා

නුඹ වෙතට ළං වෙන්න
සැදු ඒ නිමේෂය
සයුර මැද සිර මැදිරි
කවුලුවක
මා නතර කෙරුවා

පෙර පැවති නිදහසේ
සිනාරැල් නුඹ අරන්
පසුතැවෙන්නට මතක
සෙයාම ඉතිරි කෙරුවා

**ඉරේෂා දුලාංජලී කල්දේරා**

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න**
'යොවුන් ජනතා' දිනමිණ
ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk

## කෙටි කතාව

# දෙලොවකට මැදි වූ පොඩිනම

කුඩා කල සිටම මහණවීමට තම හිත තුළ බලවත් කැමැත්තක් තිබූ අයුරු පොඩි හාමුදුරුවන්ට කල්පනා විය. පවුලේ කෙතරම් අග හිඟකම් තිබුණද තාත්තා එයට එකඟ නොවූ නමුත් තමා මහණ කරවීමට අම්මාගේ හිතේ බලවත් කැමැත්තක් තිබූ බව පොඩි හාමුදුරුවන්ගේ මතකයට ආවේ පන්සලේ බණ මඩුවේ හුදෙකලාව සිටින විටය.

හරිහැටි පාසල් අධ්‍යාපනයක් නොලැබූ තාත්තාට සමාජය පිළිබඳ මනා අවබෝධයක් තිබූ බැවින් එදා ඔහු තමා මහණ කරනවාට අකැමැති වුවත් අවසානයේ තත්තාට අම්මාගේ ඉල්ලීමට එකඟවීමට සිදුවූයෙන් මහණ වීමට හැකි විය.

"පොඩිනම කොහේද?...මෙහෙ ආවානං"

වහා සිටි තැනින් නැගිටි පොඩි හාමුදුරුවෝ ඉක්මනින් දිව ගියේ "එනවා ලොකු හාමුදුරුවනේ" කියමිනි.

"දැන් විශ්වවිද්‍යාලෙත් පටන් ගන්ට යනවා නේද? මේ සැරේත් කලින් හිටපු පන්සලේම නතර වෙනවද? නැත්නම් වෙනත් තැනකට යනවද? එහෙම යනවා නම් තවත් කිට්ටු පන්සලක් තියෙනවා. ඒකේ ලොකු හාමුදුරුවෝ මාත් එක්ක හිතවත්. එතන ඉන්නත් පුළුවන්."

ලොකු හාමුදුරුවෝ සංඝාවාසේ දොරට හේත්තු වී එහෙම කිව්වේ ඇයි දැයි ඇසීමට පොඩි හාමුදුරුවෝ ඉක්මන් වූයේ නැත.

"දැන් ඉන්න තැනත් හොඳයි වරදක් නෑ" පොඩි හාමුදුරුවන්ගේ පිළිතුරට ලොකු හාමුදුරුවෝ නිහඬව පන්සල් ගෙය දෙසට වඩින්නට වූහ.

විශ්වවිද්‍යාලයට ඇතුළු වී වසරක් යෑමටත් මත්තෙන් පොඩි හාමුදුරුවන්ගේ පියා මියගිය බැවින් තාත්තාට අයිතිව තිබූ ඉහළ වෙලේ වී දෙපෑලෙන් ලැබෙන අඳයෙන් යාන්තම් වසර පිරිමසා ගැනීමට හාල්ටික ලැබීම අම්මාට අස්වැසිල්ලක් වන බව පොඩි හාමුදුරුවන්ට සිහි විය.

"පොඩිනම අද මොනවද ඔයතරම් කල්පනා කරන්නේ" ලොකු හාමුදුරුවෝ ළඟට එනතෙක්ම පොඩි හාමුදුරුවන්ට නොදැනුනි.

"කල්පනා කරලා වැඩක් නෑ. එන හැමදේකටම මුහුණ දෙන්ට ඕන. සංසාරේ හැටි ඔහොම තමා. පොඩිනමට ඉගෙන ගන්ට මුදල් ගෙදරින් ගෙන්නා ගන්ට ඕන නෑ. ඒකට වියදං කරන්න මට පුළුවන්. ඇරත් මං නැති කාලෙට මේ පන්සල පොඩිනමටනේ. මේකේ හොඳ ආදායමක් තියෙනවා. ඒ ගැනත් හිතල වැඩකරන්ට ඕන."

ලොකු හාමුදුරුවෝ කීදෙයින් පොඩි හාමුදුරුවන්ගේ හිතට ඇති වූයේ මහත් වූ සහනයකි. මින් පසු තම මවටද කීයක් හෝ දීමට හැකියැයි සිතුවේය. සිවුරු හැරගොස් අම්මාටත් උදව්කළ හැකියි. නමුත් අධ්‍යාපනය අතරමඟ කඩාගැනීම ජීවිතේටම පාඩුවක්.

'අද පේරුදානේ වෙල්විදානේලාගේ දිහාවෙන් වාගේ.' පොඩි හාමුදුරුවෝ එහෙම හිතුවේ වෙල්විදානේගේ දියණිය හා මව ද දානේ රැගෙන පන්සල් වත්තට ඇතුළු වනු දුටු විටය. තරමක හැඩකාරියක වූ වෙල්විදානේගේ දුව පන්සලේ දහම් පාසලේ උගන්වන බව පොඩි හාමුදුරුවෝ දනියි. ඇය බාහිර උපාධිය ද හදාරන බව දන්නා හෙතෙම ඇය හා වැඩි හජනයක් පැවැත්වීමට ද නොගියේය.

"අද උපාසකම්මලාට වෙන්න ඇති දානේ" පොඩි හාමුදුරුවෝ එහෙම ඇහුවේ ලොකු උපාසකම්මාගෙනි.

"එහෙයි හාමුදුරුවනේ අද අපට දානේ. මේ දුවත් හිටිය එකේ එයත් අඬගහගෙන ආවා"

"ඒක හොඳයි උපාසකම්මේ. ඔය බුද්ධ පූජාව ලෑස්ති කරලා ගන්න. අපි බුදුගෙට යමු බුද්ධ පූජාව තියන්ට" කියමින් වෙනදාමෙන් පොඩි හාමුදුරුවෝ ඉස්සර විය.

උපාසකම්මා දානශාලාව තුළට ගියත් තිලකා එහි නොගොස් එළියේ රැඳුණේ තමා ඉන්නා නිසා විය යුතුයැයි පොඩි හාමුදුරුවන්ට නිකමට සිතුණි. මේ ඇය සමඟ කතා කිරීමට හොඳ අවස්ථාවක් යැයි සිතූවද උන්වහන්සේට ඉස්සර වීමට ඇති වූයේ ලජ්ජාවකි.

එවිටම වාගේ තිලකාගේ අම්මා දාන ශාලාවෙන් එළියට ආවේ දානේ රැගෙන පැමිණි කළමනා ටිකද රැගෙනය. තවමත් පොඩි හාමුදුරුවෝ දානශාලාවේ දොර ළඟය.

"එහෙනම් පොඩි හාමුදුරුවනේ අපි යන්නං" උපාසකම්මා දණ බිම ඔබා වැන්දේ පොඩි හාමුදුරුවන්ටය. තිලකාද මව අනුකරණය කරමින් හාමුදුරුවන්ට වැන්දාය.

පන්සලෙන් පිටත් වීමට මුලින්ම මිදුලට බැස්සේ තිලකාය. ඒ දෙස හොඳින් බලා සිටි පොඩි හාමුදුරුවෝ ඇයගේ විභාගය ගැන ඇසීමට සිතුවද එය අනවශ්‍ය දෙයක් යැයි සිතා නිහඬ වූහ. කෙසේ වෙතත් ඔවුන් පන්සල් වත්තෙන් පිට වන තුරු පොඩිනම සිටියේ ඒ දෙස බලාගනය.

"මොකද පොඩිනම නිකං ඇලි මැලි වෙලා? ඇඟට මොකුත් අමාරුවක්ද?" ලොකු හාමුදුරුවෝ එහෙම ඇහැව්වේ දානේ හැන්දක් පිඟානට බෙදාගනිමිනි.

"නෑ. එහෙම මොකුත් නෑ " අද බඩගින්නක් දැනෙන්නේ නෑ."පොඩිනමගේ ඒ කතාවට ලොකු හාමුදුරුවෝ කට කොනකින් හිනාවී දානය බෙදාගත්හ. ටික වේලාවක් නිහඬව දානේ ගනිමින් සිටි ලොකු හාමුදුරුවෝ" පොඩිනමගේ මේ අවසාන අවුරුද්ද නේද? ටිකක් මහන්සිවෙන්ට වෙයි. අනං මනං ඔළුවේ දාගන්නේ නැතුව. ඇරත් දැන් මටත් වයසයි. මේවා බලාකියා ගන්නට වෙන්නෙත් පොඩිනමටයි. මගෙන් පස්සේ ආයේ මේව්වා වෙන කාටවත්යැයි" කියාගෙන දානය වළඳා නැගිට්ටේ පුරුදු පරිදි සංඝාවාසයට යෑමටය.

"සිවුරු නම් අරින්න එපා පොඩි හාමුදුරුවනේ. ඒ ගැන හිතීමත් පාපයක්. ඔබ වහන්සේ මහණ කළේ ලොකු බලාපොරොත්තුවක් ඇතිවයි." අම්මා දවසක්දා ගෙදරදී තමන්ට කී ආකාරය පොඩි හාමුදුරුවන්ගේ හිතේ තවමත් පැලපැදියම් වී ඇත.

මෙසේ සිතමින් පොඩි හාමුදුරුවෝද දානය වළඳා නැගිට්ටේය.

"අද පොඩි හාමුදුරුවෝ හරියට වැළඳුවේ නෑ වාගේ. අසනීපයක්වත්දැයි" අසමින් පන්සලේ සීයා දානශාලාව අස්කරන්නට විය. මේ අතර කිසිත් නොකියා පොඩි හාමුදුරුවෝ කුටියට වැඩියේ දහසක් සිතුවිලි අතරට මැදිවය. ඇඳේ වැතිරුණ හාමුදුරුවන්ගේ දෑස ජනේලය අතරින් පෙනෙන හිස් අහස දෙසට යොමු වූයේ ඉබේටමය.

තිලකා සමඟ තනිපංගලමේ කතා කිරීමට අවස්ථාව ලැබුණත් තමන් ඒ අවස්ථාව හිතාමතාම මඟහැරි බවක් හාමුදුරුවන්ට දැනුණි. ඇය දහම් පාසැලේ ගුරුවරියක් වුවත් හාමුදුරුවෝ පන්සලට වඩින්නේ නිවාඩුවට පමණි. ඉරිදාට දහම් පාසලේ උගන්නන්ට කියා පැමිණිය හැකි නමුත් ලොකු හාමුදුරුවන් ඒ ගැන සැක හිතනු ඇතැයි සිතූ පොඩි හාමුදුරුවෝ 'කොහොම වුණත් තව මාස දෙකනේ විභාගෙට. ඒකත් ඉවසන එක හොඳයි. එතකොට කාගෙන්වත් ප්‍රශ්නයක් ඇතිවන්නේ නැතැයි' කල්පනා කළහ.

ලොකු හාමුදුරුවන් පන්සලේ වත්කම ගැන කීවේ තමන් සිවුරු හැරයතැයි යන සැකය ඇතිව බව පොඩි හාමුදුරුවන්ට තේරුනි. සිවුරු හැර ගියොත් මේ සියල්ල අහිමි වනවා පමණක් නොව ගෙදර අම්මා විඳින දුක බලා ඉඳීමටද සිදුවනවා යැයිද හාමුදුරුවන්ට සිහිවිය. එමෙන්ම ඇයට උදව්වක් කරන්නද ලැබෙන්නේ නැති බැවින් පන්සලේ තවදුරටත් සිටීම නුවණට හුරු බව පොඩි හාමුදුරුවන්ට සිතුණි.

එහෙත් දිනක් තිලකා තමාගේ යෝජනාවට එකඟ වුවහොත් තමන්ට සිවුරු හැර යෑමට සිදුවන්නේ යැයි සිතෙන විට පොඩි හාමුදුරුවන්ට ඇතිවන්නේ තැතිගැන්මකි. එසේ සිදු කළ හොත් ලොකු හාමුදුරුවන්ගේත් අම්මාගේත් සියලු බලාපොරොත්තු කැඩී ඉහිරී යනු ඇත.

එසේම පන්සලේඇති රුපියල් කෝටි ගණනක වස්තුව ද අහිමිවනවා පමණක් නොව අම්මාට මෙන්ම මල්ලිලාට හා නංගීට කිසිදු පිහිටාධාරයක් වීමට නොහැකි වන්නේ යැයි පොඩි හාමුදුරුවන්ට හැඟී ගියේය.

මෙවැනි මානසිකත්වයක් මත හෙතෙම අවසාන විභාගයට පෙනී සිටීම සඳහා විශ්වවිද්‍යාලයට යෑමට තීරණය කර ලොකු හාමුදුරුවන්ට ද ඒ ගැන කියා පසු දින කැලණිය බලා යෑමට සූදානම්ව උදෑසන ලොකු හාමුදුරුවන්ගේ පා නැමදීමට කුටියට ගිය උන්වහන්සේ ලොකු හාමුදුරුවන්ගේ දෙපා අල්ලා වැන්දේය. "අද විශ්වවිද්‍යාලයට යන්නද? යන්ට මුදල් එහෙම අඩුපාඩු තියෙනවා නං අන්න මගේ මේසේ ලාච්චුවේ සල්ලි ඇති. ගන්න ගානක් ගන්න. ඔළුව හොඳින් තියාගෙන හොඳින් විභාගයට ලියන්න ඕන." එහෙම කිව්වේ ලොකු හාමුදුරුවෝය.

ටික වේලාවකට පසු පොඩි හාමුදුරුවෝ සිය ගමන් මල්ලත් ඔසවාගෙන පන්සලෙන් පිටවූයේ සිතිවිලි සමුදායක් ද පොදි බැඳගෙනය. පන්සලේ සිට මඳ දුරක් පා ගමනින් යන පොඩි හාමුදුරුවෝ හදිසියේ අතරමඟදී දුටුවේ අතුපාරකින් පාරට පැමිණෙන තිලකාත් ඇගේ අම්මාත්ය. ඔවුන් බස්නැවතුමට යනවා විය යුතුයැයි හාමුදුරුවන්ට සිතුණි. ඒ සමගම වාගේ වාහන ශබ්දයක් ඇසී අම්මත් දුවත් ආපසු හැරී බලනවිට ඔවුන්ගේ නෙත ගැටුණේ බිම බලාගෙන වඩිනා පොඩි හාමුදුරුවෝය. වෙල්විදානලෑගේ උපාසකම්මා වහා නතර වී හාමුදුරුවන්ට වැන්දේය.

"මම මේ විශ්වවිද්‍යාලයට යන්න උපාසකම්මා. මේ කොහේද බැහැරක් ද? ඒ පොඩි හාමුදුරුවන්ගේ කටහඬය.

"දුවත් එක්ක ටවුමට යනවා හාමුදුරුවනේ"

"හා තිලකා දැන් විභාගේ ඉවරද" පොඩි හාමුදුරුවෝ ආයාසයෙන් එහෙම ඇහැව්වේ තිලකාගෙනි.

"තව මාස තුනක් විතර තියෙනවා. හාමුදුරුවනේ." ඇය එසේ කීවේ බිම බලමිනි.

"බාහිර කරන හින්දා විභාගේ ටිකක් අමාරුයි."

"ඔව් හාමුදුරුවනේ" තිලකා එසේ කියමින් මව සමඟ ගමන ඉක්මන් කළාය.

ඒ සමගම පාරේ ගමන් කළ ත්‍රීවීලරයක් හාමුදුරුවන් දැක නතර කළ බැවින් එහි නැගගත් පොඩි හාමුදුරුවන් බස් නැවතුමට විගසින් ගියේ කැලණියට යන බසය අල්ලා ගැනීමටය.

දහසකුත් සිතුවිලි හිතේ රඳවාගෙන යන පොඩි හාමුදුරුවන්ට ලොකු හාමුදුරුවන් මෙන්ම සිය මව කී දෙයද මතකයට නැගෙන්නට විය. ලොකු හාමුදුරුවන් ද අම්මාද මතකයට පැමිණිය ද තිලකා මතකයෙන් ඈත් කළ නොහැකි බවත් පොඩි හාමුදුරුවන්ට වැටහුණි.



ඒ.ඒ.එල්. ඩයස්
දඹුල්ල

2020 ඔක්තෝබර් 03 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.